**329 වන කාණ්ඩය - 03 වන කලාපය**
**தொகுதி 329 - இல. 03**
**Volume 329 - No. 03**

**2026 අගෝස්තු 20වන බ්‍රහස්පතින්දා**
**2026 ஓகஸ்ட் 20, வியாழக்கிழமை**
**Thursday, 20th August, 2026**

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**
විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් [තීරුව 387]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 390-442]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
මුස්ලිම් කාන්තා සෞඛ්‍ය සේවිකාවන්ගේ නිල ඇඳුම පිළිබඳ ගැටලු [තීරුව 442]
පිළිකා ප්‍රතිකාර සඳහා අත්‍යවශ්‍ය FILGRASTIM එන්නත් හිඟය [තීරුව 447]

**පලෙයි වන රක්ෂිතයේ එල්ටීටීඊ කඳවුරක් ඇති බව පැවසෙන සමාජ මාධ්‍ය පුවත්:**
මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 452]

**වරප්‍රසාද යෝජනා:**
පාර්ලිමේන්තුව තුළ අපහාසාත්මක වචන භාවිත කිරීම [තීරුව 457]

**ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදී [තීරු 458-560]

**කල් තැබීමේ යෝජනාව:**
මුස්ලිම් කාන්තා සෞඛ්‍ය සේවිකාවන් සඳහා වූ නිල ඇඳුම් පිළිබඳ සීමා ඉවත් කිරීම [තීරු 561-575]

**ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු** [තීර 575-584]


# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புகள்:**
அரசியலமைப்புக்கான இருபத்திரண்டாம் திருத்தம் சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள் [ப: 387]

**வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 390-442]**

**தனி அறிவித்தல் மூல வினா:**
முஸ்லிம் பெண் சுகாதார ஊழியர்களின் சீருடை தொடர்பான பிரச்சினைகள் [ப: 442]
புற்றுநோய்ச் சிகிச்சைக்கு அத்தியாவசியமான FILGRASTIM தடுப்பூசி பற்றாக்குறை [ப: 447]

**சமூக வலைத்தளங்களில் பளை வனப்பகுதியில் LTTE முகாம் உள்ளதாகக் கூறப்படும் செய்தி:**
பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரினது கூற்று [ப: 452]

**சிறப்புரிமைப் பிரேரணைகள்:**
பாராளுமன்றத்தினுள் இழிவான வார்த்தைப் பிரயோகம் மேற்கொண்டமை [ப: 457]

**பெண்களையும், இளம் ஆட்களையும் மற்றும் பிள்ளைகளையும் தொழிலுக்கமர்த்துதல் (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது [ப: 458-560]

**ஒத்திவைப்புப் பிரேரணை:**
முஸ்லிம் பெண் சுகாதார ஊழியர்களின் ஆடைக் கட்டுப்பாட்டு விதிமுறைகளை நீக்குதல் [ப: 561-575]

**வினாக்களுக்கு எழுத்துமூல விடைகள்** [ப:575-584]


# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:
Twenty Second Amendment to the Constitution Bill: Petitions to the Supreme Court [Col. 387]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 390-442]

QUESTION BY PRIVATE NOTICE:
Issues Regarding Uniform of Muslim Female Health Workers [Col. 442]
Shortage of FILGRASTIM Injection Essential for Cancer Treatment [Col. 447]

SOCIAL MEDIA REPORTS OF AN LTTE CAMP IN PALAI FOREST RESERVE:
Statement by Minister of Public Security and Parliamentary Affairs [Col. 452]

PRIVILEGE MOTIONS:
Use of Derogatory Language in Parliament [Col. 457]

EMPLOYMENT OF WOMEN, YOUNG PERSONS AND CHILDREN (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed [Cols. 458-560]

ADJOURNMENT MOTION:
Removal of Dress Code Restrictions of Muslim Female Health Workers [Cols.561-575]

WRITTEN ANSWERS TO QUESTIONS [Cols.575-584]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2026 අගෝස්තු 20වන බ්‍රහස්පතින්දා***
*2026 ஓகஸ்ட் 20, வியாழக்கிழமை*
*Thursday, 20th August, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්
### அரசியலமைப்புக்கான இருபத்திரண்டாம் திருத்தம் சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள்
### TWENTY SECOND AMENDMENT TO THE CONSTITUTION BILL: PETITIONS TO THE SUPREME COURT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2026 අගෝස්තු 19 දින මාගේ නිවේදනයෙහි සඳහන් පෙත්සම් තුනට අමතරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද තවත් පෙත්සම් හතරක පිටපත් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි.

## II

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
### பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
### MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2026 අගෝස්තු 20 බ්‍රහස්පතින්දා, එනම් අද දින අපර භාග 12.30 ට කාරක සභා කාමර අංක 2හි දී පැවැත්වීමට නියමිත බැවින්, ඊට පැමිණ සහභාගී වන ලෙස ගරු සාමාජික මන්ත්‍රිවරයන් සියලු දෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the Annual Performance Report of the Ministry of Education, Higher Education and Vocational Education for the year 2025 (Volume I - General Education, Volume II - Higher Education and Volume III - Vocational Education.)

I move that this Report be referred to the Sectoral Oversight Committee on Education, Manpower and Human Capital.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

The Note on Supplementary Allocations from the Development Activities Programme appearing under Expenditure Head No. 240 of the Department of National Budget for the period from 01.07.2026 to 31.07.2026 in terms of Section 6(1) of the Appropriation Act, No. 23 of 2025. - [The Hon. (Dr.) Harini Amarasuriya]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මම 2026 අංක 04 දරන පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කරමි.

මෙම පරිපූරක ඇස්තමේන්තුව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2022 වර්ෂය සඳහා දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

මෙම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ පරිසර අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව; සහ

(ii) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව.

මෙම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු චමින්ද ලලිත් කුමාර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු ලසිත් භාෂණ ගමගේ මහතා**
(மாண்புமிகு லசித் பாஷண கமகே)
(The Hon. Lasith Bhashana Gamage)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) වෙයන්ගොඩ, එස්සැල්ල, 'කාරුණික' යන ලිපිනයෙහි පදිංචි කේ.පී. සුමනසිරි කරුණානායක මහතාගෙන් ලැබුණු පෙත්සමක්; සහ

(2) කටාන, නැහෙනහිර කළුවාරිප්පුව, අංක 77 යන ලිපිනයෙහි පදිංචි පී.ඩී.ටී. වසන්ත මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)

ගරු කථානායකතුමනි, පැල්මඩුල්ල, ගොඩගම, උඩගම්මැද්ද යන ලිපිනයෙහි පදිංචි පී.ජී.පී. සෝමතිලක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නීතිඥ භාග්‍යා ශ්‍රී හේරත් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பாக்ய ஸ்ரீ ஹேரத்)
(The Hon. Bhagya Sri Herath, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මැදිරිගිරිය, මීගස්වැව, වඩිගවැව, අංක 4 දරන ලිපිනයෙහි පදිංචි ඩී.එම්.ඒ. දිසානායක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

*ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.*
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 -369/2025- (1), ගරු අජිත් පී. පෙරේරා මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

### නිදහස් වෙළඳ කලාප: විස්තර
### சுதந்திர வர்த்தக வலயங்கள்: விபரம்
### FREE TRADE ZONES: DETAILS

473/2025

**2.** **ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රට තුළ පිහිටුවා ඇති මුළු නිදහස් වෙළඳ කලාප සංඛ්‍යාව සහ එක් එක් කලාපයේ ක්‍රියාත්මක වන කර්මාන්තශාලා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම කර්මාන්තශාලාවල සිදු කරනු ලබන නිෂ්පාදනවල ස්වභාවය කවරේද;

(iii) එම නිෂ්පාදනවලට නිමි ඇඳුම් සහ අනෙකුත් අපනයන නිෂ්පාදන ඇතුළත් වන්නේද;

(iv) එම කර්මාන්තශාලාවල සේවය කරන පිරිමි සහ කාන්තා සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) පසුගිය වර්ෂ 05 තුළ එම නිෂ්පාදනවලින් උපයා ගන්නා ලද අපනයන ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අපනයන ආදායම වැඩිකර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග කවරේද;

(iii) අපනයනකරුවන් සිය අපනයන ප්‍රවර්ධනය කිරීමේදී මුහුණ දෙන ගැටලු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நாட்டில் நிறுவப்பட்டுள்ள மொத்த சுதந்திர வர்த்தக வலயங்களின் எண்ணிக்கை மற்றும் ஒவ்வொரு வலயத்திலும் இயங்குகின்ற தொழிற் சாலைகளின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(ii) அந்தத் தொழிற்சாலைகளில் மேற்கொள்ளப்படும் உற்பத்தியின் தன்மை யாது என்பதையும்;

(iii) அத்தகைய உற்பத்திகளில் தயார்செய்யப்பட்ட ஆடைகள் மற்றும் ஏனைய ஏற்றுமதி உற்பத்திகளும் உள்ளடங்குகின்றனவா என்பதையும்;

(iv) அந்தத் தொழிற்சாலைகளில் பணிபுரிகின்ற ஆண் மற்றும் பெண் ஊழியர்களின் எண்ணிக்கை வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) கடந்த 05 வருடங்களில் அத்தகைய உற்பத்திகள்மூலம் ஈட்டப்பட்ட ஏற்றுமதி வருமானங்களை வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) ஏற்றுமதி வருமானத்தை அதிகரிப்பதற்காக மேற்கொள்ள முடியுமான நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iii) ஏற்றுமதிப் பொருட்களை ஊக்குவிக்கும்போது ஏற்றுமதியாளர்கள் எதிர்நோக்கும் பிரச்சினைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

( இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House -

(i) the total number of Free Trade Zones established in the country and the number of factories operating in each zone, separately;

(ii) the nature of production carried out in those factories;

(iii) whether such production includes, ready-made garments and other export products; and

(iv) the number of male and female employees working in those factories, separately?

(b) Will he also inform this House the -

(i) export earnings generated from such products during the last five years, separately;

(ii) measures that can be taken to increase export earnings; and

(iii) problems faced by exporters in promoting their exports?

(c) If not, why?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i)

| | කලාපය | ක්‍රියාත්මක වන කර්මාන්තශාලා සංඛ්‍යාව |
|---|---|---|
| 01 | කටුනායක අපනයන සැකසුම් කලාපය | 81 |
| 02 | බියගම අපනයන සැකසුම් කලාපය | 55 |
| 03 | කොග්ගල අපනයන සැකසුම් කලාපය | 18 |
| 04 | මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපය | 05 |
| 05 | මහනුවර කර්මාන්ත උද්‍යානය | 14 |
| 06 | හොරණ අපනයන සැකසුම් කලාපය | 22 |
| 07 | වගවත්ත කර්මාන්ත උද්‍යානය | 04 |
| 08 | වගවත්ත කර්මාන්ත කලාපය | 01 |
| 09 | සීතාවක අපනයන සැකසුම් කලාපය | 24 |
| 10 | වතුපිටිවල අපනයන සැකසුම් කලාපය | 16 |
| 11 | මීරිගම අපනයන සැකසුම් කලාපය | 18 |
| 12 | මල්වත්ත අපනයන සැකසුම් උද්‍යානය | 05 |
| 13 | පොල්ගහවෙල අපනයන සැකසුම් කලාපය | 06 |
| 14 | මාවතගම අපනයන සැකසුම් කලාපය | 05 |
| 15 | බිංගිරිය අපනයන සැකසුම් කලාපය | 04 |
| 16 | එරාවූර් රෙදිපිළි නිෂ්පාදන කලාපය | 01 |
| | මුළු එකතුව | 279 |

(ii) අපනයන සැකසුම් කලාප තුළ පිහිටුවා ඇති ව්‍යවසායන් තුළ රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන, ටයර් නිෂ්පාදන, රබර් නිෂ්පාදන, විදුලි උපකරණ සහ උපාංග, ආහාර නිෂ්පාදන, මුද්‍රණ කර්මාන්තයට අදාළ නිෂ්පාදන, ඖෂධ නිෂ්පාදන, වෛද්‍ය උපකරණ, ප්‍රවාහන උපකරණ වැනි විවිධ නිෂ්පාදන සිදු කරනු ලැබේ.

(iii) ඔව්.

නිමි ඇඳුම් නිෂ්පාදනය අපනයන සැකසුම් කලාප තුළ සිදු කරනු ලබන ප්‍රධාන නිෂ්පාදන ක්‍රියාවලියකි.

(iv)

| | කලාපය | ක්‍රියාත්මක වන කර්මාන්ත ශාලා සංඛ්‍යාව | | සේවක සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|
| | | | පිරිමි | කාන්තා | විදේශිකයන් | මුළු සංඛ්‍යාව |
| 01 | කටුනායක අපනයන සැකසුම් කලාපය | 81 | 13,226 | 16,701 | 173 | 30,100 |
| 02 | බියගම අපනයන සැකසුම් කලාපය | 55 | 19,226 | 11,830 | 27 | 31,083 |
| 03 | කොග්ගල අපනයන සැකසුම් කලාපය | 18 | 3,070 | 7,675 | 01 | 10,746 |
| 04 | මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපය | 05 | 399 | 432 | 05 | 836 |
| 05 | මහනුවර කර්මාන්ත උද්‍යානය | 14 | 2,868 | 6,337 | 40 | 9,245 |
| 06 | හොරණ අපනයන සැකසුම් කලාපය | 22 | 3,409 | 562 | 56 | 4,027 |

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

| | කලාපය | ක්‍රියාත්මක වන කර්මාන්ත ශාලා සංඛ්‍යාව | | සේවක සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|
| | | | පිරිමි | කාන්තා | විදේශිකයන් | මුළු සංඛ්‍යාව |
| 07 | වගවත්ත කර්මාන්ත උද්‍යානය වගවත්ත කර්මාන්ත කලාපය | 04 01 | 504 982 | 229 100 | 02 4 | 735 1,086 |
| 08 | සීතාවක අපනයන සැකසුම් කලාපය | 24 | 11,762 | 12,103 | 28 | 23,893 |
| 09 | වතුපිටිවල අපනයන සැකසුම් කලාපය | 16 | 3,945 | 4,253 | 04 | 8,202 |
| 10 | මීරිගම අපනයන සැකසුම් කලාපය | 18 | 1,174 | 1,817 | 33 | 3,024 |
| 11 | මල්වත්ත අපනයන සැකසුම් උද්‍යානය | 05 | 645 | 1,867 | 02 | 2,514 |
| 12 | පොල්ගහවෙල අපනයන සැකසුම් කලාපය | 06 | 950 | 4,274 | 0 | 5,224 |
| 13 | මාවතගම අපනයන සැකසුම් කලාපය | 05 | 1,988 | 5,691 | 0 | 7,679 |
| 14 | බිංගිරිය අපනයන සැකසුම් කලාපය | 04 | 346 | 679 | 36 | 1,061 |
| 15 | එරාවූර් රෙදිපිළි නිෂ්පාදන කලාපය | 01 | 318 | 26 | 22 | 366 |
| | මුළු එකතුව | 279 | 64,812 | 74,576 | 433 | 139,821 |

(ආ) (i) අපනයන ආදායම ඇමෙරිකානු ඩොලර් මිලියන (FOB)

| | අපනයන සැකසුම් කලාපය | 2021 | 2022 | 2023 | 2024 | 2025 | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 01 | කටුනායක අපනයන සැකසුම් කලාපය | 16,594.60 | 18,462.78 | 14,113.21 | 15,228.95 | 16,398.91 | 80,798.45 |
| 02 | බියගම අපනයන සැකසුම් කලාපය | 6,589.66 | 6,402.36 | 5,400.42 | 5,934.52 | 6,086.91 | 30,413.87 |
| 03 | කොග්ගල අපනයන සැකසුම් කලාපය | 531.12 | 518.35 | 311.66 | 396.97 | 548.58 | 2,306.68 |
| 04 | මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපය | 5.77 | 8.93 | 33.18 | 24.11 | 13.18 | 85.18 |
| 05 | මහනුවර කර්මාන්ත උද්‍යානය | 46.50 | 34.25 | 19.10 | 38.15 | 55.17 | 193.17 |
| 06 | හොරණ අපනයන සැකසුම් කලාපය | 430.78 | 362.96 | 362.08 | 595.91 | 662.82 | 2,414.56 |
| 07 | සීතාවක අපනයන සැකසුම් කලාපය | 4,896.75 | 4,456.92 | 3,403.42 | 4,017.73 | 3,708.73 | 20,483.54 |
| 08 | වතුපිටිවල අපනයන සැකසුම් කලාපය | 984.99 | 1,228.86 | 1,094.54 | 1,052.43 | 1,387.15 | 5,747.97 |
| 09 | මීරිගම අපනයන සැකසුම් කලාපය | 441.47 | 340.80 | 323.02 | 315.84 | 398.61 | 1,819.73 |
| 10 | මල්වත්ත අපනයන සැකසුම් කලාපය | 412.68 | 504.84 | 105.04 | 144.03 | 153.07 | 1,319.67 |
| 11 | පොල්ගහවෙල අපනයන සැකසුම් | 766.92 | 728.87 | 807.10 | 814.90 | 827.50 | 3,945.28 |
| 12 | මාවතගම අපනයන සැකසුම් කලාපය | 931.26 | 675.10 | 284.08 | 452.63 | 239.89 | 2,582.96 |
| 13 | වයඹ ප්‍රාදේශීය කාර්යාලය (MAS Fabric Park Thulhiriya) | 94.54 | 306.46 | 208.09 | 243.65 | 283.37 | 1,136.12 |
| 14 | බිංගිරිය අපනයන සැකසුම් කලාපය | - | - | - | 11.98 | 53.75 | 65.73 |
| 15 | අපනයන කලාපවලින් බැහැර නිෂ්පාදන | 48,323.91 | 53,357.84 | 47,207.75 | 46,688.34 | 48,929.46 | 244,507.30 |

2021 සිට 2025 දක්වා ඒ ඒ කලාපවල අපනයන ආදායමේ එකතුව මම කෙටියෙන් කියන්නම්. 2021දී ඇමෙරිකානු ඩොලර් මිලියන 3,177.8යි; 2022දී ඇමෙරිකානු ඩොලර් මිලියන 3,310.5යි; 2023දී 2,605.1යි; 2024දී 2,873.37යි; 2025දී 3,042.42යි. *[බාධා කිරීමක්]* මේ ආදායම ඩොලර්වලින් ප්‍රකාශ කරන්නේ. 2024ට සාපේක්ෂව 2025දී ආදායම වැඩි වෙලා තිබෙනවා.

මේ තිබෙන්නේ BOI කලාප ඇතුළේ ප්‍රමාණය. BoI කලාපවලින් පිටත් යම් ප්‍රමාණයක් තිබෙනවා.

(ii) ශ්‍රී ලංකාවේ අපනයන ආදායම ඉහළ නැංවීම සඳහා ප්‍රධාන ක්ෂේත්‍ර හයක උපාය මාර්ග යෝජනා කර තිබෙනවා.

1. නිෂ්පාදනය සහ වෙළෙඳ පොළ විවිධාංගීකරණය - එකම නිෂ්පාදන කිහිපයකම හෝ සීමිත වෙළෙඳ පොළවලම රඳා නොසිට, ඉහළ අගයක් ගෙනෙන, දැනුම මත පදනම් වූ නව අපනයන ක්ෂේත්‍ර දෙසට යොමු වීම, නව වෙළෙඳ පොළවල් වෙත අපනයන සිදු කිරීම හා නිදහස් වෙළෙඳ ගිවිසුම් හරහා ගොඩ නැඟෙන නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම.
2. ෂ්පාදනවල අගය එකතු කිරීම හා නවෝත්පාදන දිරිගැන්වීම - නූතන තාක්ෂණය භාවිත කරමින් හා නව ක්‍රම හඳුන්වා දෙමින්, ලෝක වෙළෙඳ පොළේ ශ්‍රී ලාංකික නිෂ්පාදනවලට වඩා හොඳින් තරග කළ හැකි වන සේ ඒවා සකස් කිරීම.
3. අපනයනය සඳහා දරන කාලය හා වියදම අඩු කිරීම - වරාය, ප්‍රවාහන පද්ධති හා රේගු කටයුතු වඩා කාර්යක්ෂම කරමින් සියලුම අනුමැතීන් එක් ස්ථානයකින් ලබා ගත හැකි

ක්‍රමවේදය වන "ජාතික තනි වෙළෙඳ කවුළුව" ස්ථාපිත කිරීමේ කටයුත්තත් සිදු කරමින් තිබෙනවා.

4. අපනයනකරුවන්ට වෙළෙඳ පොළ ප්‍රවේශය පහසු කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම - නිවැරදි වෙළෙඳ පොළ තොරතුරු, ජාත්‍යන්තර ප්‍රමිතීන් හා සහතික ලබා ගැනීමට උපකාර, වෙළෙඳ නාම ගොඩනැඟීම සහ ඉලක්කගත ප්‍රවර්ධන වැඩසටහන් හරහා අපනයනකරුවන් ශක්තිමත් කිරීම.

5. ස්ථාවර හා විශ්වසනීය ආයෝජන පරිසරයක් ගොඩනැඟීම - අපනයන මූල්‍යකරණයට ප්‍රවේශය පහසු කිරීම, රෙගුලාසි සරල කිරීම සහ රජය හා පෞද්ගලික අංශය අතර සහයෝගීතාව වර්ධනය කිරීම.

6. ව්‍යාපාර වහාම ආරම්භ කිරීමට හැකිවන පරිදි සූදානම් කරන ලද ස්ථාන සහිත ආයෝජන කලාප අලුතෙන් සංවර්ධනය කිරීම - ආයෝජකයින්ට තම ව්‍යාපාර ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීම.

ඒත් එක්කම මේ සියලු කාරණා ඇතුළත් කරලා 2026-2030 උපාය මාර්ගික අපනයන සංවර්ධන සැලැස්ම අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ඉදිරිපත් කර තිබෙනවා. ඒක සමාජගත කර තිබෙනවා. ඒකට අනුව දැන් වැඩ කටයුතු කරමින් යනවා.

(iii) 1. විශ්වසනීය වෙළෙඳ පොළ තොරතුරු හිඟකම සහ විදේශ වෙළෙඳ පොළ ප්‍රවර්ධනය දුර්වල වීම.

2. නීති, රෙගුලාසි හා ක්‍රියාවලි සංකීර්ණ වීම සහ එකිනෙකට නොගැළපීමෙන් ඇති වන ගැටලු.

3. ප්‍රවාහන පිරිවැය සහ උපයෝගීතා සේවා පිරිවැය ඉහළ යෑම.

4. අමුද්‍රව්‍ය මිල අධික වීම.

5. කුසලතා හිඟකම සහ නැඟී එන අපනයන ක්ෂේත්‍රවලට ප්‍රමාණවත් ආයෝජන අඩුවෙන් ලැබීම.

6. මූල්‍ය පහසුකම් ලබා ගැනීමට අපහසු වීම.

7. පර්යේෂණ හා නවෝත්පාදන කටයුතු අවම මට්ටමක පැවතීම.

8. ඩිජිටල් පද්ධති හඳුන්වා දීම සහ ඒවා අනුගමනය කිරීමේ කාල ප්‍රමාදයන්.

9. ජාත්‍යන්තර තත්ත්ව සහතික ලබා ගැනීම දුෂ්කර හා මිල අධික වීම.

(ඈ) පැන නොනඟී.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, ඇමතිතුමාගේ උත්තර පරිශීලනය කරන අවස්ථාවේදී මට මේ කාරණය පෙනී යනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, 2021 වර්ෂයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 3,177ට තිබුණු අපනයන ආදායම 2025 වර්ෂයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 3,042ට අඩු වෙලා තිබෙනවා කියලා. ඒ විතරක් නොවෙයි. ඔබතුමා එය ප්‍රශ්නයක් ලෙස සලකන අවස්ථාවේදී කිව්වා, එහි ණය ප්‍රශ්න ගැන. ඒකට එක පිළියමක් ලෙස ආයෝජනය වැඩි කිරීමට හැකියාව තිබෙනවා කියාත් ඔබතුමා කිව්වා.

මම මේ ප්‍රශ්න අහලා තිබෙන්නේ මේ නිසායි. පිට රටත් එක්ක සම්බන්ධකම් තියාගෙන කටයුතු කරනකොට ඒ ප්‍රශ්නය කොයි ආකාරයෙන්ද බලපාන්නේ කියන කාරණයත් එක්කම මම අවතීර්ණ වනවා, සැබෑ ප්‍රශ්නයට. ඔබතුමන්ලාගේ Export Development Council of Ministers අදහස් කරලා තිබෙනවා, 2026 වර්ෂයේදී US Dollars 19 billion ලෙස තිබෙන අපනයන ආදායම් ඉලක්කය 2030 වර්ෂය වනකොට US Dollars 36 billion දක්වා වැඩි වනවා කියලා. ඒ කියන්නේ, අපේ දළ දේශීය නිෂ්පාදනයේ වර්ධන වේගය සියයට 4ත්, 5ත් අතර තිබෙන අවස්ථාවක එවැනි ඉලක්කයක් අපට සාක්ෂාත් කරන්න අවශ්‍ය නම්, දළ දේශීය නිෂ්පාදනයේ සියයට 12ක හෝ 14ක වැඩි වීමක් තිබෙන්න අවශ්‍යයි. විෂය භාර ඇමතිතුමා වශයෙන් ඔබතුමාට කරුණාකරලා කියන්න පුළුවන්ද, මෙවැනි දත්ත ඉදිරිපත් කිරීම තුළ අපි ව්‍යාජ ලෝකයකට ගමන් කරනවා නොවෙයිද කියලා. මොකද, සැබෑ මට්ටමේ අපනයන ආදායමක් වැඩි කර ගැනීම ඇත්තටම මේ වෙලාවේ අවශ්‍යයි. හැබැයි, මෙවැනි දත්ත ඉදිරිපත් කිරීම තුළ ඉලක්කය සපුරන්න බැරි උත්තර අනවශ්‍ය ලෙස ලබා දෙනවා කියන එක ඔබතුමා පිළිගන්නවාද? මීට වඩා debureaucratization තුළින් අපේ අපනයන ආදායම වැඩි කරන්න හැකියාවක් ලැබෙයි කියා මම සැබැවින් විශ්වාස කරනවා.

දැන් ඔබතුමාට හොඳ සභාපතිවරයෙක් ඉන්නවා. ඒ, දුමින්ද හුලංගමුව මහතා. ඔහු වරලත් ගණකාධිකාරිවරයෙක් වශයෙන් සිටිනවා. සුලක්ෂණ ජයවර්ධනත් අපේ අමාත්‍යාංශයේ වැඩ කර තිබෙන නිසා ඔහුත් දක්ෂයෙක් ලෙස මා සලකනවා. එහෙම නම්, අපේ අපනයන ආදායම වැඩි කරන්න ඔබතුමා කටයුතු කරන්නේ කොයි ආකාරයෙන්ද කියන ප්‍රශ්නයට ප්‍රායෝගික පිළිතුරක් මේ අවස්ථාවේදී මම බලාපොරොත්තු වනවා.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ඒ ප්‍රශ්නය ඇසීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, ගරු මන්ත්‍රීතුමනි. පළමුවෙන්ම මම සඳහන් කරන්න ඕනෑ, මේ දීලා තිබෙන දත්ත 2021 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා වූ දත්ත බව. ඒවා 2020 වර්ෂයේ දත්ත නොවෙයි. මේවා තිබෙන්නේ ආයෝජන කලාප ඇතුළේ. දැන් ආයෝජන කලාපවලින් පිටතත් BoI සංඛ්‍යායාවක් තිබෙනවා. ඒක අන්තර්ගත වෙන්නේ නැහැ. *[බාධා කිරීමක්]* මම ඒක තමයි මේ සඳහන් කළේ. ගරු මන්ත්‍රීතුමනි, සමහර දේවල් BoI කලාප ඇතුළේ reorganize වෙනවා. සමහර ආයෝජන කලාප මෙතැනින් එළියට යනවා. එහෙම නැත්නම් තවත් තැන්වලට වෙනස් වෙනවා. එවැනි තත්ත්වයන්, ව්‍යුහාත්මක වෙනස්කම් මේක ඇතුළේ තිබෙනවා. නමුත්, සමස්තයක් වශයෙන් ගත්තාම අපේ අපනයන ආදායම වැඩි වෙලා තිබෙනවා. ඒ අපනයන ආදායම වැඩිවීමේ එකම කාරණය ඇඟලුම් හා BoI companiesම නොවෙයි. අපිටත් අවශ්‍ය කරනවා, එක් තැනකට හිර වෙලා තිබෙනවාට වඩා විවිධාංගීකරණයකට - diversification එකකට - යාමට. ඒ නිසාම තමයි 2026-2030 දක්වා වූ අපේ අපනයන සංවර්ධන සැලැස්ම, සාම්ප්‍රදායික අපනයනත්, ඒ වාගේම ඒ වෙනුවට වටිනාකම් එකතු කරන අපනයනත්, නව ක්ෂේත්‍රත් ඉලක්ක කරගෙන විවිධාංගීකරණය කරන්න සකස් වෙලා තිබෙන්නේ. ඒ වෙනුවෙන් අපි දැන් සැලසුමක් එක්ක යන්නේ. ඔබතුමා සඳහන් කරනවා වාගේ ඒ දේවල්වල අඩුපාඩු තිබෙනවා නම් අපි ඒවාත් හදා ගන්න අවශ්‍යයි.

ගරු මන්ත්‍රීතුමනි, එතැනදී අපේ පළමුවැනි ඉලක්කය තමයි, වෙළෙඳ පොළ විවිධාංගීකරණය. දැනට අපේ කේන්ද්‍රගත වෙලා තිබෙන ඇඟලුම්වලින් - අපේ අපනයනවලින් - සියයට 25ක් විතර ඇමෙරිකා එක්සත් ජනපදයට යනවා. ඒ වාගේම, යුරෝපා සංගමයට යනවා. විශේෂයෙන්ම සබ්-සහරා අප්‍රිකානු කලාපය අපි විවෘත කර ගන්න බලාපොරොත්තු වෙනවා.

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

ඊළඟට, භාණ්ඩ විවිධාංගීකරණයටත් අපි උත්සාහ කරනවා. මොකද, භාණ්ඩ විවිධාංගීකරණයේදීත් පැති දෙකක් තිබෙනවා. එකක් තමයි, අපට කරගන්න බැරි නිෂ්පාදන අපි කරමින් යන එක. දැන් විශේෂයෙන්ම අපි තාක්ෂණය ඉලක්ක කරගත්ත ප්‍රවේශයට එන්නට ඕනෑ. අපි දශක දෙක තුනක් තිස්සේම මේ සාම්ප්‍රදායික අපනයනම ඔස්සේ තමයි ගිහිල්ලා තිබෙන්නේ. ඒක නිසා භාණ්ඩ විධියටත් අපි විවිධාංගීකරණය කරනවා. ඒ වාගේම තමයි, value chain එකත් පුළුල් කරන්න උත්සාහ කරන්න ඕනෑ. ඒක තමයි උපාය මාර්ගික වශයෙන්, ප්‍රධාන වශයෙන් සංක්ෂිප්තව කියන්නට තිබෙන්නේ. ඒ නිසා මේ ඉලක්ක ලබා ගැනීම සඳහා තමයි අපි එන දුෂ්කරතාවලට මුහුණ දෙමින් වැඩ කටයුතු කරමින් ඉන්නේ.

ඊළඟට ගරු මන්ත්‍රීතුමා අහපු කාරණය ගත්තොත්, ආයෝජකයන්ගේ ප්‍රශ්නවලදී ඒගොල්ලන්ගේ පැත්තෙන් ඉදිරිපත් කරන කාරණා තමයි මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ. අපි ඒවා හඳුනාගෙන ඒවාට උත්තර ලබා දෙන්න මැදිහත් වනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දෙවැනි අතුරු ප්‍රශ්නයට යන්න ඉස්සෙල්ලා,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න. අතුරු ප්‍රශ්නය යටතේ තවත් අතුරු ප්‍රශ්නයක් නැවත අහන්න බැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නයට උත්තර ලැබුණේ නැහැ නේ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම බැහැ. එතුමා ලබා දුන් පිළිතුර ගැන ඔබතුමා සෑහීමකට පත් වෙන්න ඕනෑ. ඔබතුමා දැන් දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න. එහෙම නැත්නම් මේක විවාදයක් බවට පත් වෙනවා. ඔබතුමා දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න. *[බාධා කිරීමක්]* ඔබතුමාට දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න පුළුවන්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Speaker, as the next Supplemenaty Question, I would like to ask about the foreign countries we are trying to get investments from. Hon. Minister, you did not answer my first Supplementary Question. As the second Question, I would like to ask this. If you are saying there is a drop in dollar investments, I would love to see an increase.

The best thing is, you have a very responsive Opposition. As we had run the country, we know about the difficulties. Now, you do not have trade unions being called upon to hold placards. That is not a weakness of the Opposition, but it is the strength of showing that we are a pro-Sri Lankan Opposition.

What is the net foreign currency contribution that is there? Also, owing to the fact that there is a migration of roughly about 300,000 people per year, which is our labour force, there is no labour-intensive operation to attract them to Sri Lanka. So, on that basis, are you not looking at introducing light engineering, like Vietnam and Thailand are doing? At this particular moment, what is the prospective aspect of the Government to attract such light engineering in order to achieve the targeted US Dollars 36 billion in export earnings because, now, it is far from reality?

If you have a 5 per cent growth and if you are looking at a 12 per cent growth to achieve such targets, do not escape from answering this. Being a responsible Minister, please respond as to how we could have a net foreign contribution because, in April, 2028, Sir, we have to pay US Dollars 3.9 billion on foreign loans.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, please finish asking your second Supplementary Question. You have already taken two minutes to ask your second Supplementary Question.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
When we ask questions, it has to be within two minutes. When a Government Member takes more than two minutes, there is no problem.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon Member, please strictly adhere to the rules.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I am sorry. I also have been in Parliament for 30 years and can understand -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Within two minutes, you have to ask a question. Hon. Member, please!

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Do not disrespect us because we are asking questions that are relevant.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
No, no, Hon. Member.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Minister, the Hon. Speaker is saying that your answer in response to my question should be quick.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
Okay, I will be quick.

Sir, it is not that I did not answer Question No. 1, but I answered it. The data was from 2021 to 2025.

Your second Supplementary Question was about the net foreign contribution. In the past also, we had been dealing with such a situation. Now, we are focusing more on the net value addition. Specially, when it comes to garment and other industries, of course, the value addition is relatively low. We are moving onto other areas as well. - *[Interruption.]* Yes, that is it. The net foreign contribution comes in investments, earnings et cetera. So, it varies; it is not limited to one area. So, we focus on diversity of these investments, maybe, in earnings or investments.

Then, with regard to the labour force, we are moving ahead with the promotion of the traditional labour force, while increasing their competency to match the global demand. Those people are not leaving the country, but we are placing our labour in strategically important places. So, as a result, our foreign remittances will also go up.

Sir, during the last seven-month period, more than US Dollars 5 billion had been remitted to Sri Lanka. It is more likely that the same pattern would continue. So, by the year end, we could easily hit that target of US Dollars 9 billion as well. Therefore, we will pay attention to our labour force.

Finally, if we take the models used by countries, every country has its own method, be it Vietnam or Thailand. It does not mean that we have to do the same thing. This is our country and we decide what it should be based on our competencies and strategies. That is what we are really doing. Therefore, we will achieve that particular target.

Thank you.

## 2023 සිට සිගරැට් සඳහා බදු සංශෝධන: විස්තර
2023இலிருந்து சிகரெட்டுகள் மீதான வரித் திருத்தம்: விபரம்
REVISION OF TAXES ON CIGARETTES FROM 2023: DETAILS

654/2025

**3. ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2023 වර්ෂයේ සිට මේ දක්වා දුම්වැටි සඳහා බදු සංශෝධනය කර ඇති වාර ගණන කොපමණද;

(ii) එම සංශෝධන කවරේද;

(iii) දුම්වැටි සඳහා අය කරන බදුවලින් වාර්ෂිකව රජයට ලැබෙන ආදායම කොපමණද;

(iv) අවසන් වරට සිදු කරන ලද බදු සංශෝධනයේදී දුම්වැටි කාණ්ඩයේ එක් නිෂ්පාදනයක් (සිගරැට්ටුවක්) සඳහා අය කරන ලද බදු මුදල කොපමණද;

(v) බදු වැඩි කිරීමට පෙර එම එක් නිෂ්පාදනයක වෙළෙඳ පොළ මිල කොපමණද;

(vi) බදු සංශෝධනයෙන් පසු එක් නිෂ්පාදනයක වෙළෙඳ පොළ මිල කොපමණද;

(vii) දුම්වැටි නිෂ්පාදන මත බදු අය කිරීම මඟින් අපේක්ෂා කරන අරමුණු කවරේද;

(viii) රජයේ ආදායම වැඩි කර ගැනීමේ අරමුණින් දුම්වැටි නිෂ්පාදනය වැඩි කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2023ஆம் ஆண்டிலிருந்து இதுவரை சிகரெட்டுகள் மீதான வரி எத்தனை தடவைகள் திருத்தப்பட்டுள்ளது என்பதையும்;

(ii) அத்திருத்தங்கள் யாவை என்பதையும்;

(iii) சிகரெட்டுகள்மீது அறவிடப்படும் வரிகள்மூலம் அரசாங்கத்துக்குக் கிடைக்கும் வருமானம் எவ்வளவு என்பதையும்;

(iv) இறுதியாக மேற்கொள்ளப்பட்ட வரித் திருத்தத்தின்போது புகைப்பொருள் வகை சார்ந்த ஓர் உற்பத்திக்கு (சிகரெட்) அறவிடப்பட்ட வரித் தொகை எவ்வளவு என்பதையும்;

(v) வரி அதிகரிப்புக்கு முன்னர் மேற்படி உற்பத்தி யொன்றின் சந்தை விலை யாது என்பதையும்;

(vi) வரித் திருத்தத்துக்குப் பின்னர் உற்பத்தி யொன்றின் சந்தை விலை யாது என்பதையும்;

(vii) சிகரெட் உற்பத்திகள்மீது வரி அறவிடுவதன் மூலம் எதிர்பார்க்கப்படும் நோக்கங்கள் யாவை என்பதையும்;

(viii) அரசாங்கத்தின் வருமானத்தை அதிகரிக்கும் நோக்கத்துடன் சிகரெட் உற்பத்தியை அதிகரிப்ப தற்கு வசதி அளிப்பதற்கு நடவடிக்கை எடுக்கப் படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House -

(i) the number of times taxes on cigarettes have been revised from the year 2023 to date;

(ii) the aforesaid revisions;

[ගරු නිතිඥ දයාසිරි ජයසේකර මහතා]

(iii) the annual revenue received by the Government from the taxes levied on cigarettes;

(iv) the amount of tax levied on one product in the cigarette category (one cigarette) during the last tax revision;

(v) the market price of an aforesaid product before the tax increase;

(vi) the market price of a product after the tax revision;

(vii) the objective expected of levying taxes on cigarette products; and

(viii) whether actions will be taken to provide the necessary facilities to increase cigarette production with the aim of increasing government revenue?

(b) If not, why?

**ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)

ගරු කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i)
- නිෂ්පාදන බද්ද - අවස්ථා හතරක් සංශෝධනය කර ඇත.
- එකතු කළ අගය මත බද්ද - එක්වරක් සංශෝධනය කර ඇත.
- සංස්ථාපිත ආදායම් බද්ද - එක්වරක් සංශෝධනය කර ඇත.

(ii)

| දුම්වැටි මත බදු සංශෝධනය | | |
|---|---|---|
| **බලපැවැත්වෙන දිනය** | **බදු වර්ගය** | **වැඩිවීම/ සංශෝධනය** |
| 2023 ජනවාරි 01 | නිෂ්පාදන බද්ද | සියයට 20 කින් වැඩි විය. |
| 2023 ජූලි 01 | නිෂ්පාදන බද්ද | සියයට 20කින් වැඩි විය. |
| 2024 ජනවාරි 01 | නිෂ්පාදන බද්ද | වාර්ෂික උද්ධමනය මත පදනම් වූ දර්ශකගත කිරීමේ යන්ත්‍රණය යටතේ සියයට 14කින් වැඩි විය. |
| 2024 ජනවාරි 01 | එකතු කළ අගය මත බද්ද | සියයට 15 සිට සියයට 18 දක්වා වැඩි විය. |
| 2025 ජනවාරි 11 | නිෂ්පාදන බද්ද | වාර්ෂික උද්ධමනය මත පදනම් වූ දර්ශකගත කිරීමේ යන්ත්‍රණය යටතේ සියයට 5.9කින් වැඩි විය. |
| 2025 අප්‍රේල් 01 | සංස්ථාපිත ආදායම් බද්ද | සියයට 40 සිට සියයට 45 දක්වා වැඩි විය. |

(iii) පසුගිය වසර තුන තුළ දුම්වැටි මඟින් උපයාගත් ආදායම පහත දැක්වේ.

දුම්වැටි මඟින් උපයාගත් බදු ආදායම (රු. මිලියන)

| වර්ෂය | වක්‍ර බදු | | | | සෘජු බදු |
|---|---|---|---|---|---|
| | නිෂ්පාදන බද්ද | එකතු කළ අගය | සමාජ ආරක්ෂණ දායකත්ව | මුළු වක්‍ර බදු | සංස්ථාපිත ආදායම් බදු* |
| 2023 | 117,467 | 16,680 | 756 | 134,903 | 13,971 |
| 2024 | 117,145 | 25,686 | 3,730 | 146,561 | 18,314 |
| 2025 | 101,173 | 30,669 | 3,705 | 135,547 | 19,969 |

*සංස්ථාපිත ආදායම් බදු ගණනය කිරීම් සඳහා අදාළ තක්සේරු වර්ෂ පදනම් කර ගෙන තිබේ: 2022/2023,2023/2024 සහ 2024/2025

(iv) 2025 ජනවාරි 11 වන දින සිට ක්‍රියාත්මක වන නවතම නිෂ්පාදන බදු සංශෝධනයෙන් පසු, සිගරැට්ටුවක් මත අය කෙරෙන සමස්ත බදු ප්‍රමාණය පහත දැක්වේ:

| දිග කාණ්ඩය | සිගරැට්ටුවක් සඳහා වන සමස්ත බද්ද (නිෂ්පාදන බද්ද, එකතු කළ අගය මත බද්ද සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද ඇතුළුව) (රු.) |
|---|---|
| මි.මී. 72 - මි.මී. 84 (ජේ පී ගෝල්ඩ් ලීෆ්) | 109.95 |
| මි.මී. 67 - මි.මී. 72 (ජේ පී ගෝල්ඩ් ප්‍රෝ) | 95.88 |
| මි.මී. 60 - මි.මී. 67 (ජේ පී ගෝල්ඩ්) | 69.15 |
| මි.මී. 60 නොඉක්මවන (කැප්ස්ටන්) | 26.59 |

(v)

| දිග කාණ්ඩය | වෙළෙඳපොළ මිල (බදු සංශෝධනයට පෙර) (රු.) |
|---|---|
| මි.මී. 72 - මි.මී. 84 (ජේ පී ගෝල්ඩ් ලීෆ්) | 150.00 |
| මි.මී. 67 - මි.මී. 72 (ජේ පී ගෝල්ඩ් ප්‍රෝ) | 125.00 |
| මි.මී. 60 - මි.මී. 67 (ජේ පී ගෝල්ඩ්) | 100.00 |
| මි.මී. 60 නොඉක්මවන (කැප්ස්ටන්) | 35.00 |

(vi)

| දිග කාණ්ඩය | වෙළඳපොළ මිල (බදු සංශෝධනයෙන් පසු) (රු.) |
|---|---|
| මි.මී. 72 - මි.මී. 84 (ජේ පී ගෝල්ඩ් ලීෆ්) | 160.00 |
| මි.මී. 67 - මි.මී. 72 (ජේ පී ගෝල්ඩ් ප්‍රෝ) | 135.00 |
| මි.මී. 60 - මි.මී. 67 (ජේ පී ගෝල්ඩ්) | 105.00 |
| මි.මී. 60 නොඉක්මවන (කැප්ස්ටන්) | 40.00 |

(vii) දුම්වැටි මත බදු පැනවීමේ අරමුණු වන්නේ රජයේ ආදායම් උත්පාදනය කරන අතරම, දුම්කොළ පරිභෝජනයෙන් පැන නගින සෞඛ්‍ය සේවා වියදම් සහ වෙනත් සමාජීය හා ආර්ථික පිරිවැය වැනි අහිතකර බාහිර බලපෑම්වල පිරිවැය අන්තර්ග්‍රහණය කර ගැනීමයි.

(viii) නැත. ඉහත (vii) යටතේ පැහැදිලි කර ඇති පරිදි, දුම්වැටි මත බදු පැනවීමේ මූලික අරමුණ වන්නේ දුම්කොළ පරිභෝජනයෙන් ඇතිවන අහිතකර බාහිර බලපෑම් අන්තර්ග්‍රහණය කර ගැනීමයි. ඒ අනුව, ඉහත (ii) යටතේ දක්වා ඇති පරිදි, 2023 වසරේ සිට රජය විසින් අවස්ථා කිහිපයකදීම දුම්වැටි මත පනවා ඇති බදු සංශෝධනය කර ඇත. මෙම බදු සංශෝධනවල ප්‍රතිඵලයක් ලෙස, සමස්ත දුම්වැටි නිෂ්පාදනය 2022 වසරේ දී බිලියන 2.8 සිට 2025 වසර වන විට බිලියන 1.9 දක්වා සියයට 32කින් පහත වැටී ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, පිළිතුර ලබා දීම සම්බන්ධයෙන් මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

සිගරට් සහ මත්පැන් මත පනවන බදු විශේෂයෙන් කරුම බදු විධියට තමයි හඳුන්වන්නේ. එහෙම කියන්න හේතුවක් තිබෙනවා. WHO වාර්තා අනුව වසරකට 13,000-20,000 අතර පිරිසක් සිගරට් බීමෙන් මිය යනවා කියලා සඳහන් කර තිබෙනවා. දුම්වැටි සහ මත්පැන් පානය නිසා ඇති වෙලා තිබෙන තත්ත්වයත් එක්ක ලංකාවේ, per week, 250 දෙනෙකුට cancers ඇති වෙනවා කියලා සඳහන්ව තිබෙනවා. ගරු කථානායකතුමනි, 2022 වර්ෂයේ 35,835 දෙනෙකු මේ හේතුව නිසා රෝගී වෙලා තිබෙනවා. ඒ අතරින් 16,398ක් පිරිමි, 19,457ක් කාන්තාවන්. දැන් කාන්තාවන් විශාල වශයෙන් සිගරට් පානයට - smoking සඳහා - ඇබ්බැහි වෙලා තිබෙනවා. සියයට 72ක් විතර මේ ක්‍රියාවලියට සම්බන්ධ වෙලා තිබෙනවා කියලා තමයි සඳහන් වෙන්නේ.

අනෙක් කාරණය මේකයි, ගරු කථානායකතුමනි. රුපියල් 160ක් වන සිගරට් එකකට ආණ්ඩුව රුපියල් 109ක බද්දක් ගහනවා. මේ විධියට බැලුවාම අතිවිශාල බදු ප්‍රමාණයකුත් ගන්නවා.

අනෙක් පැත්තෙන්, සිගරට් විශාල ප්‍රමාණයක් හොර පාරෙන් එනවා. සිගරට් විශාල ප්‍රමාණයක් detection centresවලදී හසු වෙනවා. ලංකාවට හොරෙන් සිගරට් විශාල වශයෙන් ගෙන්වනවා. ඒ වාගේම සමහර කුඩා වෙළෙඳ සැල්වලට ගිහින් බැලුවාම පෙනෙනවා, "Gold Leaf" cigarette packet එකේ, "Dunhill" cigarette packet එකේ නම දාලා කුඩා සිගරට් විකුණන ආකාරය. මම ඒ ගැන හරියටම දන්නේ නැහැ. මොකද, මම සිගරට් බොන කෙනෙක් නොවෙයි. නමුත් තිබෙන තත්ත්වයත් එක්ක මම මේවා කියන්නේ.

කුඩා සිගරට් එකක් ගෙනැල්ලා ඒ පැකට්වල දාලා විකුණනවා. හැබැයි, වෙළෙන්දා දන්නවා, දෙන්නේ මොකක්ද කියලා. ගන්න කෙනාත් දන්නවා, දෙන්නේ මොකක්ද කියලා. එහෙම නීති විරෝධී - illicit - විධියට සිගරට් ලංකාවට ගෙන්වන එක වැළැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට ඔබතුමන්ලාට වැඩ පිළිවෙළක් නැද්ද?

ඒ වාගේම, cancer වැලඳුණු මිනිසුන්ට ප්‍රතිකාර කිරීමට සිගරට් සඳහා අය කරන බදු මුදල්වලින් යම්කිසි දායකත්වයක් ලබා දෙන්න ආණ්ඩුව විධියට ඔබතුමන්ලාට බලාපොරොත්තුවක් නැද්ද කියා ගරු නලින්ද ජයතිස්ස සෞඛ්‍ය අමාත්‍යතුමාත් සභාවේ සිටින මේ අවස්ථාවේදී මම අහනවා. අපේ රටේ cancer patientsලාට විශාල ප්‍රශ්නයක් තිබෙනවා. එක පැත්තකින්, ඔවුන්ට අවශ්‍ය කරන බෙහෙත් ටික ගන්න බැහැ. අනෙක් පැත්තෙන්, බෙහෙත් නැහැ. ඒ වාගේම එම බෙහෙත්වලට විශාල වියදමක් යනවා. ඒ නිසා මිනිසුන් smoking සඳහා සිගරට් මිල දී ගැනීම තුළ හම්බ වෙන බදු ආදායමෙන් යම්කිසි මුදලක් විශේෂයෙන්ම cancer patientsලා වෙනුවෙන් යෙදවීමට සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා වැඩ පිළිවෙළක් හදන්න පුළුවන්ද කියා මා ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහනවා.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දැක්වූ කරුණු ද සලකා බලා තමයි දැනටමත් අප කටයුතු කරන්නේ. මොකද, බදු විධියට අය කර ගන්නා මුදල් තමයි සෞඛ්‍ය කටයුතු සඳහා යොදවන්නේ. ඒ වෙනුවෙන් විශාල මුදලක් යොදවනවා. ඒ වාගේම නීති විරෝධීව මේ රටට සිගරට් ගෙන්වන එක නවත්වන්න පියවර ගෙන තිබෙනවාද කියා ඔබතුමා ඇහුවා. ගරු මන්ත්‍රීතුමනි, මේ වන කොට අපි කලින් තිබුණාට වඩා ඉතාම කාර්යක්ෂම විධියට එම කටයුතු සිදු කරනවා. ඔබතුමාත් දකින්න ඇති, පසුගිය වකවානුව තුළ ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව විශාල වැටලීම් ප්‍රමාණයක් කළ බව. නීති විරෝධී විධියට මේ රටට ආ සිගරට් එම වැටලීම් හරහා මහා පරිමාණයෙන් අත්අඩංගුවට ගත්තා. එසේ අත්අඩංගුවට ගෙන ඒවා විනාශ කළා.

ඊට අමතරව, මහ ජනතාවට මම කියන්න කැමැතියි, ඔබත් ඒ ගැන දන්නවා නම්, ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවට ඒ පිළිබඳව දැනුම් දෙන්න කියලා. එහෙම නීති විරෝධී විධියට ගෙන්වූ සිගරට් විකුණන තැන් තිබෙනවා නම්, ඒවා ගෙන්වන තැන් තිබෙනවා නම් ඒ ගැන දැනුම් දෙන්න. ඒ අනුව අපි වහාම වැටලීම් කර අත්අඩංගුවට ගැනීමේ කටයුතු සිදු කරනවා. ඒ අනුව මේ වන කොට විධිමත් යන්ත්‍රණයක් ක්‍රියාත්මක වෙනවා, නීති විරෝධී ලෙස මෙරටට සිගරට් ගෙන ඒම නැවැත්වීම සඳහා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

අද වන කොට ඔබතුමන්ලා ලංකාවේ මත්පැන්වලට පනවා තිබෙන බද්ද කොච්චරද බලන්න. උදාහරණයක් හැටියට ගත්තොත්, ගල් අරක්කු බෝතලයක් අද රුපියල් 3,700කට තමයි වෙළෙඳ පොළේ විකිණෙන්නේ. ඒකෙන් රුපියල් 2,200ක් ආණ්ඩුව බදු විධියට අය කර ගන්නවා. එතකොට බෝතලේ ගණන කොච්චරද කියලා සොයා ගන්න පුළුවන්. අද ඔබතුමන්ලා කොයි තරම් සංඛ්‍යා දත්ත ගැන කිව්වත්, ගම්වලට ගිහිල්ලා බැලුවාම, ග්‍රාමීය මට්ටමෙන් ගත්තාම පෙනෙනවා මිනිසුන්ගේ අතේ සල්ලි නැති බව. කරවල වෙළෙඳ සැලකට ගිහිල්ලා බැලුවොත්, වෙනදා කිලෝ එකක් ගත්තු මිනිහා දැන් ගන්නේ කරවල ග්‍රෑම් 100යි. මොකද, මිනිසුන්ගේ අතේ සල්ලි නැහැ. මම ඊයේ පෙරේදා ව්‍යාපාරික ස්ථානයකට ගිහින් කථා කරලා බැලුවා. ඒ සහෝදරයා කිව්වා, ඒ රෙස්ටුරන්ට් එකේ රුපියල් 200,000ක විතර බිස්නස් එකක් තිබෙනවා, හැබැයි පහුවදා උදේට බඩු ටික ගන්න රුපියල් 190,000ක් යනවා, එතකොට රුපියල් 10,000යි දවසට තිබෙන්නේ කියලා. එතැන පස්දෙනෙක් වැඩ කරනවා. ඉතින් ඔහු අහනවා, "මම කොහොමද මේ තත්ත්වයට මුහුණ දෙන්නේ?" කියලා. රුපියල් 3,700 ගල් අරක්කු බෝතලයෙන් රුපියල් 2,200ක් තමුන්නාන්සේලා බදු විධියට අය කර ගත්තාට පස්සේ මිනිසුන්ට බොන්න වෙන්නේ illicit liquor. ඒ කියන්නේ, නීති විරෝධී මත්පැන්. නීති විරෝධී මත්පැන් බීම නිසා 2026 ජනවාරි මාසයේදී වෙන්නප්පුව, වයික්කාල ප්‍රදේශයේ 7දෙනෙකු මැරුණා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ප්‍රධාන ප්‍රශ්නයෙන් අසා තිබෙන්නේ දුම් වැටි ගැන. දැන් අතුරු ප්‍රශ්නයෙන් අහන්නේ මත්පැන් ගැන.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
කමක් නැහැ. බද්ද එන්නේ එකට නේ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, ඔබතුමා -

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මා ඉහත කී කාරණය සම්බන්ධව ඔබතුමන්ලා ගන්නා පියවර මොකක්ද, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි? මොකද, නීති විරෝධී මත්පැන් වැඩි වෙනවා, සාමාන්‍යයෙන් පොඩි මිනිහා බොන "ගල්" බෝතලයේ මිල වැඩි වුණු ගමන්. ඒ නිසා ඔබතුමන්ලා ඒ සඳහා මොකක් හරි ක්‍රමවේදයක් හදනවාද? මොකද, මේකත් අද දැවැන්ත සෞඛ්‍ය ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
ගරු මන්ත්‍රීතුමා අහන අතුරු ප්‍රශ්නය, ඉදිරිපත් කළ ප්‍රධාන ප්‍රශ්නයට අදාළ ප්‍රශ්නයක් නොවුණත් මම පිළිතුරක් දෙන්නම්. ඇත්තටම මේ ප්‍රශ්නය අදාළ නැහැ. ඒක වෙනම කාරණයක් නේ. දුම්වැටි ගැන අහලා, මත්පැන් ගැන දැන් අහන්නේ.

ඇත්තටම, නීති විරෝධී මත්පැන් ප්‍රවර්ධනය වීම මර්දනය කරන්න රජය විධියට විශේෂයෙන්ම සුරාබදු දෙපාර්තමේන්තුව වැඩ පිළිවෙළක් යොදලා තිබෙනවා. ඔබතුමා කියන විධියට, මත්පැන් මිල අඩු කරලා, ඒ තුළින් මත්පැන් ප්‍රවර්ධනය කිරීම නිසා ගැමි කාන්තාව, පවුල පීඩනයට පත් වෙනවා. ඒ පැති ගැනත් අපි සලකා බලන්න ඕනෑ. නීති විරෝධී මත්පැන් මර්දනය කරන්න අපි පැහැදිලිවම අවශ්‍ය කටයුතු කරලා තිබෙනවා. මත්පැන්වලින් එන ආදායම ඉතාම නිවැරදිව අය කර ගන්න මේ වෙනකොට කටයුතු කරමින් තිබෙනවා. සුරාබදු දෙපාර්තමේන්තුවේ ආදායම් ඉලක්ක, ලබාගෙන තිබෙන ජයග්‍රහණ තුළින් ඒක පැහැදිලිවම පෙනෙනවා. රජය විධියට ඒ සඳහා නිවැරදි වැඩ පිළිවෙළක් නිවැරදි දැක්මක් ඇතිව කරගෙන යනවාය කියන එක තමයි මට උත්තරය විධියට දෙන්න තිබෙන්නේ.

## තල්විටිගල ජලාශ ව්‍යාපෘතිය: විස්තර
### தல்விட்டிகல நீர்த்தேக்கக் கருத்திட்டம்: விபரம்
### THALVITIGALA RESERVOIR PROJECT: DETAILS

706/2025

**4. ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) තල්විටිගල ජලාශ ව්‍යාපෘතිය ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම ව්‍යාපෘතියේ අරමුණු කවරේද;

(iii) ඉහත ව්‍යාපෘතියට අදාළව කොන්ත්‍රාත් අත්සන් කරන ලද සමාගම්වල නම් කවරේද;

(iv) මේ දක්වා එම ව්‍යාපෘතිය සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(v) මේ වනවිට ඉහත ව්‍යාපෘතිය නතර කර ඇති බව දන්නේද;

(vi) එම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தல்விட்டிகல நீர்த்தேக்கக் கருத்திட்டம் ஆரம்பிக் கப்பட்ட திகதி யாது;

{ii) மேற்படி கருத்திட்டத்தின் நோக்கங்கள் யாவை;

(iii) மேற்படி கருத்திட்டத்துக்கான ஒப்பந்தத்தில் கைச்சாத்திட்டுள்ள கம்பனிகளின் பெயர்கள் யாவை;

(iv) இதுவரை மேற்படி கருத்திட்டத்துக்காகச் செலவிடப்பட்டுள்ள பணத்தொகை யாது;

(v) தற்போது மேற்படி கருத்திட்டம் இடைநிறுத்தப் பட்டுள்ளமையை அறிவாரா;

(vi) மேற்படி கருத்திட்டம் தொடர்பில் எடுக்கப்படும் எதிர்கால நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) the date on which the Thalvitigala Reservoir Project was initiated;

(ii) the objectives of the said project;

(iii) the names of the companies which have signed contracts for the said project;

(iv) the amount of money that has been spent on the said project so far;

(v) whether he is aware that the said project has been halted by now; and

(vi) the steps that will be taken in future regarding the said project?

(b) If not, why?

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) මෙම ව්‍යාපෘතිය 2028.05.10 දින ආරම්භ කර ඇත.

(ii)
- වාර්ෂිකව මෙගාවොට් 51.6ක විදුලිය බලය ජනනය කිරීම.
- බත්මැඩිල්ල අමුණ හරහා වාරි ජලය කාර්යක්ෂමව සැපයීම.
- වසර පුරා හෙක්ටයාර 810ක වගා බිම් සඳහා ප්‍රමාණවත් වාරි සැපයුම ලබාදීම.
- අලුතින් හඳුනාගත් හෙක්ටයාර 400ක පමණ නව වගා බිම් සංවර්ධනයට අවශ්‍ය අතිරික්ත ජලය ලබාදීම.
- කෘෂිකාර්මික, විදුලි බල හා පාරිසරික අවශ්‍යතා සපුරාලමින් ජලය නැවත මහවැලි පද්ධතියට යොමු කිරීම.
- රන්ටැඹේ සිට මිනිපේ දක්වා මහවැලි ජල පද්ධතියේ පහළ ප්‍රදේශවල හෙක්ටයාර 8,000කට අධික වගා බිම්වලට ප්‍රතිලාභ ලැසසීම.
- 40 MCM ජල ප්‍රමාණයක් රන්ටැඹේ ජලාශයට මුදාහැර අතිරේක විදුලි බල උත්පාදනයට දායක වීම.
- අනාගතයේ පහළ උමාඔය ජල හරවා යැවීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වුවහොත් එම ජලය රන්දෙනිගල ජලාශයට හරවා වැඩි විදුලි බල උත්පාදනයක් සිදු කිරීම.

(iii) සෘජු ශ්‍රමය යොදා ගන්නා ලදී.

(iv) රුපියල් මිලියන 726.44කි. (2024 වර්ෂය තෙක්)

(v) ඔව්.

රටේ පැවති මූල්‍ය අර්බුද හේතුවෙන් මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති - RAMP - කමිටුවේදී දෙන ලද උපදෙස් අනුව මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතු තාවකාලිකව නවතා දමා ඇත.

(vi) මෙම ව්‍යාපෘතිය සඳහා ශක්‍යතාවක් පවතින බැවින් රජයේ උපදෙස් ලැබුණු පසු ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - PMU - නැවත පිහිටුවා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර නැවත ආරම්භ කිරීම.

(ආ) ඉහත පිළිතුර අනුව අදාළ නොවේ.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය අහන්නේ වාරිමාර්ග සම්බන්ධයෙනුයි. විශේෂයෙන්ම අවුරුදු 76ක ශාපයක් තිබුණු කාලයේ හැදුණු දැවැන්ත බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියක් වන මහවැලි ව්‍යාපෘතියේ අවසාන අදියරේ තමයි අපි ඉන්නේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා නියෝජනය කරන කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්පිතිගම, ඇහැටුවැව, ගල්ගමුව, මහව, අඹන්පොළ, යාපහුව යන ප්‍රදේශවලට මහවැලි මහ ඇළෙන් ජලය ලබා ගෙන හෙක්ටෙයාර 12,500ක භූමි ප්‍රමාණයක් අස්වැද්දීමටත්, කුඩා වැව් 100කට ආසන්න ප්‍රමාණයක් පෝෂණය කිරීමටත් මෙම ව්‍යාපෘතිය යටතේ සැලසුම් කර තිබෙනවා. වර්තමාන රජය යටතේ මෙම දැවැන්ත මහවැලි ව්‍යාපෘතියේ අවසන් කිරීමට ඉතිරිව පවතින්නේ සියයට 2ක, සියයට 3ක වැනි කොටසක් පමණයි. ඒ කියන්නේ, වයඹ මහඇල ව්‍යාපෘතිය සහ උතුර දක්වා මහවැලි ජලය රැගෙන යන ප්‍රධාන උමං මාර්ගයට සම්බන්ධ ඇළ මාර්ග පද්ධතියයි. මෙම ව්‍යාපෘති දෙක තමයි දැන් අවසන් කරන්න තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මම ඔබතුමාගෙන් මේ පිළිබඳව දැනගන්න කැමතියි. වයඹ මහ ඇළ ව්‍යාපෘතිය සම්බන්ධව මේ වන විට පවතින ප්‍රගතිය කුමක්ද? මෙම වයඹ මහ ඇළ ව්‍යාපෘතියේ වැඩ කටයුතු කවදා වනවිට අවසන් කරන්න පුළුවන්ද? එමෙන්ම, පොල්පිතිගම ප්‍රදේශය සශ්‍රීය කිරීම සඳහා මහවැලි ජලය ලැබෙන්නේ කවදාද කියලාත් දැන ගන්න කැමතියි.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා වැදගත් ප්‍රශ්නයක් ගරු සභාවට යොමු කළා. නමුත්, මහවැලි ව්‍යාපෘතියේ අවසාන අදියර නිම කිරීමට ඔබතුමා සඳහන් කළ පරිදි සියයට දෙකක, තුනක ප්‍රතිශතයක් නොවෙයි තිබෙන්නේ. මේ වෙනුවෙන් ඉතා විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා.

උතුරු පළාත් ඇළ, මිනිපේ වාරිමාර්ග ව්‍යාපෘතිය සහ වයඹ ඇළ යනුවෙන් ප්‍රධාන ව්‍යාපෘති තුනක් තිබෙනවා. මෙයින් ප්‍රධානම ඇළ මාර්ගය උතුරු පළාත් ඇළයි. මේකෙදි විශාල ලෙස මුදල් නාස්තියක් සිදු වෙලා තිබෙනවා. විශේෂයෙන්ම කඳු විදින්න ගෙනාපු යන්ත්‍ර වෙනුවෙන් අපිට වෙනමම රුපියල් කෝටි ගණනක මුදලක් ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා, නිරපරාදේ. එවැනි මුදල් නාස්තියක් සිදු වෙලා තිබෙනවා. උතුරු පළාතේ සංවර්ධන වැඩ කටයුතුවලට පමණක් රුපියල් මිලියන 32ක මුදලක් වෙන් කර තිබෙනවා. පසුගිය අවුරුද්දේ කිලෝමීටර 28ක දිගින් යුත් tunnel එකක වැඩ අවසන් කළා. තවත් වැඩ ගොඩාක් කරන්න තිබෙනවා. ඒ සඳහා මුදල් වෙන් කරලා තිබෙනවා. නමුත්, තවමත් වැඩ නිම කිරීමට ඉතිරි වෙලා තිබෙන ප්‍රමාණය විශාලයි.

ගරු කථානායකතුමනි, වයඹ ඇළ ව්‍යාපෘතිය ගත්තොත්, මෙම ව්‍යාපෘතිය පසුගිය කාලයේ දී අතහැර දමා තිබුණා. මේ කටයුත්ත කරන්න බැහැ කියන තැනට මෙම ව්‍යාපෘතිය විසි කරලා තිබුණේ. ඒ අනුව අපි පුළුල් සංවාදයක් හදා ගත්තා. සංවාදයක් හදා ගෙන, වයඹ පළාත් ඇළ ව්‍යාපෘතියේ වැඩ කටයුතු නැවත වතාවක් ආරම්භ කිරීම සඳහා වත්මන් රජය තීන්දුවක් අරගෙන තිබෙනවා.

ඊට අදාළ මූලික කටයුතු මේ වෙනකොට ආරම්භ කර තිබෙනවා. ඒ අනුව ලබන වසර තුළ මේ සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කරලා වයඹ පළාත් මහ ඇළ ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කිරීමට තමයි සැලසුම් කර තිබෙන්නේ. විශේෂයෙන්ම ලේනදොර දක්වා tunnel එක කිලෝමීටර 8ක දුරක් ගහන්න තිබෙනවා. ඒක තමයි ටිකක් ලොකුවට තිබෙන කාරණාවෙක් විධියට තිබෙන්නේ. ඊට පස්සේ තව කහල්ල රක්ෂිතයට අදාළ වැඩ කොටස් ප්‍රමාණයක් තිබෙනවා. ඒ කටයුතු සියල්ල ආරම්භ කරලා ඉදිරියට අරගෙන යන්න මේ වෙනකොට රජය විධියට තීන්දුවක් අරගෙන තිබෙනවා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාගේ පිළිතුරේදී වයඹ පළාත් මහ ඇළ ව්‍යාපෘතිය නතර වෙලා තිබුණා කියලා කියපු එක මම පිළිගන්නේ නැහැ. වැමැඩිල්ල ජලාශයේ සිට ඉදි කිරීම් සියයට 90ක් විතර, වයඹට එපිටින් මධ්‍යම පළාතේ ඉදි කිරීම් අවසන් වෙලා තිබුණේ. ඒ කියන්නේ මේ ව්‍යාපෘතියම තමයි. එතකොට ඒකේ ඉතිරි කොටස තමයි කරන්න තිබුණේ. හැබැයි, නතර වෙලා තිබුණා කියන එක මම පිළිගන්නේ නැහැ. අනෙක් එක, මම ප්‍රතිශතයක් විධියට කිව්වා නේ. 1970 දශකයේ මහවැලි ගඟ පොල්ගොල්ලෙන් හරවපු තැන ඉඳලා ගත්තාම සමස්ත මහවැලි ව්‍යාපෘතියේ ඉතාම සුළු කොටසක් තමයි මේ ඉතිරි වෙලා තිබෙන්නේ.

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් අහන දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. අද සමස්ත වාරි පද්ධතියේ කුඩා වැව්, ඇළවල්, අමුණු විශාල ප්‍රමාණයක් ප්‍රතිසංස්කරණය කරන්න අවශ්‍ය වෙලා තිබෙනවා. ඔබතුමන්ලා රජයක් විධියට පසුගිය අය වැයෙනුත් මේ කුඩා වැව්, අමුණු ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධයෙන් කථා වුණා, මුදල් වෙන් කළා, මම දැක්කා. මේ වෙනකොට ඒ සම්බන්ධයෙන් ප්‍රගතියක් තිබෙනවාද? නියෝජ්‍ය ඇමතිවරයා විධියට ඒ ප්‍රගතිය ගැන ඔබතුමාට කියන්න තිබෙන්නේ මොනවාද?

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු මන්ත්‍රීතුමනි, මෙහෙමයි. කඳු විදින, පොළොව හිල් කරන යන්ත්‍රයක් වෙනුවෙන් නිරපරාදේ රුපියල් කෝටි 700ක් වීනයට ගෙවන්න අපට සිද්ධ වෙලා තිබෙනවා. ඒ යන්ත්‍රයෙන් අපි කිසිම ප්‍රයෝජනයක් ගත්තේත් නැහැ. අන්න එහෙම තමයි, නාස්ති කරලා තිබෙන්නේ. මේ කිව්වේ එකම එක සිද්ධියක් විතරයි. එතකොට, ගිය අවුරුද්දේ විතරක් උතුරු පළාත් ඇළ ව්‍යාපෘතියට රුපියල් මිලියන 32,000ක් ආණ්ඩුව වෙන් කරන්නේ ඇයි? මේක සියයට 98ක මට්ටමට ගිහිල්ලා තිබෙනවා නම්, ඒ සා විශාල මුදල් ප්‍රමාණයක් එක ව්‍යාපෘතියකට විතරක් වෙන් කරන්න අවශ්‍ය නැහැ. හැබැයි, රුපියල් මිලියන 32,000ක් වෙන් කරලාත් වැඩේ අවසන්ද? වැඩේ අවසන් නැහැ. තවත් අතිවිශාල වැඩ ප්‍රමාණයක් ඒකේ කරන්න තිබෙනවා. මිනිපේ ඇළ ව්‍යාපෘතිය, උතුරු පළාත් ඇළ ව්‍යාපෘතිය, වයඹ පළාත් මහ ඇළ ව්‍යාපෘතිය කියලා මේකේ ව්‍යාපෘති තුනක් තිබෙනවා. ඇත්තටම මේ කටයුත්ත සල්ලි නැතුව නතර වෙලා තිබුණේ.

මේ සඳහා විශාල ණය ප්‍රමාණයක් ගත්තා. ඒ ණයත් ඉවරයි, වැඩේ ඉවරත් නැහැ. වැඩේ අතරමැද්දෙන් කඩාකප්පල් වුණා. ඒ තත්ත්වයත් එක්ක තමයි මේ ව්‍යාපෘති සම්පූර්ණයෙන් නතර වෙලා තිබුණේ. නතර වෙලා තිබුණු ව්‍යාපෘති තමයි නැවත වතාවක් ආරම්භ කරලා තිබෙන්නේ. අපේ ආණ්ඩුව යටතේ එම ව්‍යාපෘති ක්‍රියාත්මක කරලා, අනිවාර්යයෙන්ම ඒවා සාර්ථක කරනවා. අපි මේ වෙනකොට ඒ සඳහා තීන්දු තීරණ අරගෙන තිබෙනවා. මේ වෙනකොට ඊට අදාළ වැඩ ආරම්භ කර තිබෙනවා.

## තැපැල් දෙපාර්තමේන්තුව: 2015 සිට මෙහෙයුම් ලාභය/අලාභය
## தபால் திணைக்களம்: 2015இலிருந்து தொழிற்பாட்டு இலாபம்/நட்டம்
## DEPARTMENT OF POSTS: OPERATIONAL PROFIT/ LOSS FROM 2015

986/2025

**5. ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා තැපැල් දෙපාර්තමේන්තුව ලැබූ මෙහෙයුම් ලාභය/අලාභය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) මේ වනවිට ක්‍රියාත්මක වන තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(iii) අලුතින් ස්ථාපිත කිරීමට අපේක්ෂිත තැපැල් කාර්යාල කවරේද;

(iv) නව තැපැල් කාර්යාලයක් ස්ථාපිත කිරීමේදී සලකා බලනු ලබන කරුණු කවරේද;

(v) මේ වනවිට දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(vi) දෙපාර්තමේන්තුව සතු වාහන සංඛ්‍යාව සහ ඉන් වෙන්දේසි කිරීමට නිර්දේශ කර ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(vii) එම දෙපාර්තමේන්තුව ශක්තිමත් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு முதல் இற்றைவரை தபால் திணைக்களம் பெற்றுக்கொண்ட தொழிற்பாட்டு இலாபம்/நட்டம் ஆண்டுவாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(ii) தற்போது இயங்கும் தபால் நிலையங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(iii) புதிதாகத் தாபிப்பதற்கு எதிர்பார்க்கப்படும் தபால் நிலையங்கள் யாவை என்பதையும்;

(iv) புதிய தபால் நிலையமொன்றைத் தாபிக்கும் போது கவனத்திற்கொள்ளப்படும் விடயங்கள் யாவை என்பதையும்;

(v) தற்போது திணைக்களத்தில் நிலவும் வெற்றிடங் களின் எண்ணிக்கை யாது என்பதையும்;

(vi) திணைக்களத்திடம் உள்ள வாகனங்களின் எண்ணிக்கை மற்றும் அவற்றுள் ஏலம் விடுவதற் குப் பரிந்துரைக்கப்பட்டுள்ள வாகனங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(vii) மேற்படி திணைக்களத்தை வலுப்படுத்துவதற் காக மேற்கொள்ளப்படவுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House the -

(i) operational profit/loss of the Department of Posts in each year, separately from 2015 up to now;

(ii) number of post offices that are currently operational;

(iii) names of the post offices that are expected to be newly established;

(iv) factors that are being taken into consideration when establishing a new post office;

(v) number of vacancies that exist in the Department at present;

(vi) number of vehicles that belong to the Department and the number of vehicles that have been recommended for auction therefrom; and

(vii) measures that will be taken to strengthen the Department?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)

| වර්ෂය | ආදායම (රු.මිලියන) | වියදම (පුනරාවර්තන) (රු.මිලියන) | පරතරය (රු.මිලියන) |
|---|---|---|---|
| 2015 | 6,711 | 11,756 | -5045 |
| 2016 | 6,578 | 12,284 | -5706 |
| 2017 | 6,993 | 12,599 | -5602 |
| 2018 | 7,710 | 12,897 | -5187 |
| 2019 | 8,376 | 13,721 | -5345 |
| 2020 | 6,361 | 14,019 | -7658 |
| 2021 | 7,152 | 13,962 | -6810 |
| 2022 | 9,269 | 16,101 | -6832 |
| 2023 | 13,627 | 16,843 | -3215 |
| 2024 | 14,109 | 18,269 | -4168 |
| 2025 | 13,455 | 20,810 | -7355 |
| 2026.06.30 | 7,234 | 10,423 | -3189 |

(ii) අධි ශ්‍රේණි තැපැල් කාර්යාල - 52

පළමු පෙළ තැපැල් කාර්යාල - 294

දෙවන පෙළ තැපැල් කාර්යාල - 301

මුළු තැපැල් කාර්යාල සංඛ්‍යාව - 647

ඊට අමතරව උප තැපැල් කාර්යාල 3,282ක් ක්‍රියාත්මක වෙනවා.

(iii) තැපැල් කාර්යාල අලුතෙන් ස්ථාපිත කරන්න යෝජනාවක් නැහැ, ගරු කථානායකතුමනි.

අපි පසුගිය වසරේදී තැපැල් කාර්යාල සහ උප තැපැල් කාර්යාල 14ක,- අපි කුලියට හිටපු තැන් කිහිපයක් තිබුණා. සමහර ඒවායේ අලුත් ඉදිකිරීම් කළා. ඊට අමතරව, තැපැල් කාර්යාල අලුතෙන් ස්ථාපනය කරන්න අදහසක් නැහැ. තිබෙන ඒවා නවීකරණය කිරීම සහ ඒවායේ අලුත් ගොඩනැඟිලි ඉදිකිරීම තමයි කරන්නේ.

(iv) නව තැපැල් කාර්යාලක් ස්ථාපිත කිරීමේදී සලකා බලනු ලබන කරුණු පහත පරිදි වේ.

- එම ප්‍රදේශයට නව තැපැල් කාර්යාලයක් ස්ථාපනය කිරීමට අදාළ සේවා අවශ්‍යතාව
- අදාළ ප්‍රදේශයේ ජනගහන ඝනත්වය
- යෝජිත ස්ථානයේ සිට පවත්නා තැපැල්/උප තැපැල් කාර්යාලයන් අතර දුර ප්‍රමාණය
- තැපැල් කාර්යාලයක් පිහිටුවීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ප්‍රමාණවත් පරිදි සලසා ගැනීමට ඇති හැකියාව

(v) ස්ථිර සේවක පුරප්පාඩු සංඛ්‍යාව - 4,753

ලියාපදිංචි ආදේශක පුරප්පාඩු සංඛ්‍යාව - 3,128

ඒ අනුව මුළු පුරප්පාඩු සංඛ්‍යාව 7,881ක් වෙනවා.

(vi) දෙපාර්තමේන්තුව සතු වාහන සංඛ්‍යාව 250කි.

වෙන්දේසි කිරීම සඳහා නිර්දේශිත වාහන නැහැ.

(vii) දෙපාර්තමේන්තුව ශක්තිමත් කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග පහත පරිදි වේ.

- ආදායම් විවිධාංගීකරණය - තැපැල් දෙපාර්තමේන්තුවට නව ආදායම් උත්පාදන කරන COD, SL Post Courier, EMS, TDS, AD-Mail වැනි සේවාවන් හඳුන්වා දීම.
- මෙහෙයුම් ක්‍රියාවලිය නවීකරණය කිරීම.
- ඩිජිටල් පරිවර්තනය - දැනටමත් අපි පාලන හා ප්‍රතිචාර ඒකකයක් - CRU එකක් - ස්ථාපනය කරලා ඒ කටයුතු කරගෙන යනවා.

(ආ) අදාළ නොවේ.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ස්තුතියි, ගරු ඇමතිතුමනි.

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

තැපැල් දෙපාර්තමේන්තුවේ සේවය කරන සේවකයන් ඇඟිලි සලකුණු තබා සේවයට වාර්තා කිරීමේ දී ඒ අයට ප්‍රායෝගික ගැටලු රාශියක් ඇති වෙලා තිබෙනවා කියලා වාර්තා වෙලා තිබෙනවා. ප්‍රධාන ගැටලුවක් වන්නේ මෙයයි. තැපැල් දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරින් අනෙක් රජයේ කාර්යාල වාගේ උදේ 8 ඉඳලා හවස 4 වෙනකල් පමණක් සේවය කරන්නේ නැහැ. සමහර වෙලාවට ඔවුන්ට පැය 24ම සේවය කරන්නට සිදු වනවා. විශේෂයෙන් ලිපි, පාර්සල් යනාදිය ප්‍රවාහනය කිරීම සිදු කරන අංශවල සේවය කරද්දී පාන්දර 3.00, 4.00 වෙනකල් සේවය කරන්නට සිදු වනවා. ඇඟිලි සලකුණ තබා සේවයට වාර්තා කිරීම නිසා, අත්තිකාල දීමනා ලබා ගැනීමේ දී ගැටලු ඇති වෙනවා. අතිකාල සේවය කළ බවට ඇඟිලි සලකුණු යන්ත්‍රයේ සටහන් වෙලා නැහැ කියලා ඒ අයට කියනවා. ඒ නිසා අමතර අතිකාල සේවයේ යෙදෙන අය සඳහා ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ මොකක් හරි ක්‍රමවේදයක් හදලා තිබෙනවාද?

***[මෙම අවස්ථාවේදී ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා සභා ගර්භයට පැමිණියේය.]***

*[இச்சந்தர்ப்பத்தில் மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் சபாமண்டபத்துட் பிரவேசித்தார்.]*

*[At this stage, the Hon. President Anura Kumara Dissanayake entered the Chamber.]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, පසුගිය අවුරුද්දේ අගෝස්තු මාසයේ පමණ මේ ප්‍රශ්නය සැලකිය යුතු මට්ටමකට සාකච්ඡා වුණා. තැපැල් දෙපාර්තමේන්තුවේ අතිකාල ඇතුළු දීමනා ලබා ගැනීමේදී ඉතාම අවිධිමත් ක්‍රමයක් පැවතුණේ. ඒ අනුව තමයි විශේෂයෙන්ම මධ්‍යම තැපැල් හුවමාරුවට ඇඟිලි සලකුණු යන්ත්‍ර සවි කළේ. නියමිත පරිදි ලබා ගන්නා අතිකාල ඇතුළු අනෙකුත් දීමනා ලබා ගැනීමට එයින් කිසිම ආකාරයකින් ඔවුන්ට කිසිදු බාධාවක් ඇති වන්නේ නැහැ. අපි තැපැල්පතිතුමා සහ වෘත්තිය සමිති නියෝජිතයන් එක්ක සාකච්ඡා කරලා වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. තවත් අඩුපාඩු තිබෙනවා නම් හදන්න පුළුවන්.

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

ගරු මන්ත්‍රීතුමනි, රජය හැටියට මේ සේවය වඩා කාර්යක්ෂම කරන්න අපට අවශ්‍යයි. තැපැල් දෙපාර්තමේන්තුවේ ආදායමට වඩා පුනරාවර්තන වියදම වැඩියි. දැනටමත් මිලියන 7,000ක පමණ පරතරයක් පවතිනවා. භාණ්ඩාගාරයෙන් තමයි ඒ මුදල දරන්නේ. එහෙම නම් මේ ලබා දෙන මුදල විධිමත්ව, හරි විධියට ලබා දෙන්න ඕනෑ. ඒ සඳහා විධිමත් ක්‍රමවේදයක් තමයි හදලා තිබෙන්නේ. ඒකෙදි සමහර වෙලාවට යම් කෙනෙකුට අවිධිමත් විධියට මුදල් ගන්න බැරි වෙන්න පුළුවන්. නමුත් විධිමත්භාවය තුළ වැඩ කරන අයට යම් අසාධාරණයක් වෙනවා නම් අපි ඒක ගැන සලකා බලනවා. විශේෂයෙන්ම ඇඟිලි සලකුණු යන්ත්‍රය සකස් කළාට පස්සේ සමහර තැපැල් සේවකයන්ට ප්‍රශ්නයක් ඇති වුණා. ඔවුන් යම් ක්‍රමයක් හදාගෙන හිටියා, කාර්යාලයීය දුම්රිය සහ බස් රථ භාවිත කරලා ඒ වෙලාව adjust කරගන්න. අපි ඒකත් කරලා දුන්නා. අපි පුළුවන් තරම් නම්‍යශීලී වුණා. නමුත් ඇඟිලි සලකුණු යන්ත්‍රය කියන එක රජයේ ප්‍රතිපත්තියක් හැටියට කාලයක් තිස්සේ ක්‍රියාත්මක කරන්න හදපු එකක්. අපි ඒක ක්‍රියාත්මක කළා. ඒ යටතේ තව ප්‍රශ්න තිබෙනවා නම් සාකච්ඡා කරන්න පුළුවන්.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, පසුගිය කාලයේ දිගින් දිගටම මේ ගැන කථා කළා. ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව මඟින් ඇමෙරිකා එක්සත් ජනපද තැපැල් සේවයට ගෙවූ ඩොලර් ලක්ෂ 6කට වැඩි මුදලක් හැකර්ලා අතට ගිහිල්ලා ඒ මුදල දැන් නැති වෙලා තිබෙනවා. මහා භාණ්ඩාගාරයේ ඩොලර් මිලියන 2.5ක මුදලක් අස්ථානගත වීම වාගේම තමයි මේ සිද්ධියත්. රජය විසින් රටේ ජනතාවට මේ ගැන පැහැදිලි උත්තරයක් තවම ලබා දීලා නැහැ. ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවෙන් ඇමෙරිකා එක්සත් ජනපද තැපැල් සේවයට ගෙවූ ඩොලර් ලක්ෂ 6කට වැඩි මුදලක් හැකර්ලා විසින් ගත්තා කියනවා. දැන් රටේ ජනතාව තුළ ගොඩනැඟෙමින් තිබෙන මතය වන මේ හැකර්ලා රජය විසින් නිර්මාණය කරන හැකර්ලාද කියන එක රජයක් විධියට ඔබතුමන්ලාට තවම නිවැරදි කරන්න බැරි වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මෙය ඔබතුමාගේ විෂයට අයිති දෙයක් නිසා ඔබතුමාගේ අමාත්‍යාංශයට මේ සම්බන්ධව මොකක් හරි පැහැදිලි උත්තරයක් ලැබිලා තිබෙනවාද? මේක ගැන FBI එකට වාර්තා කරලා තිබෙනවා, තවත් නොයෙකුත් ආයතනවලට වාර්තා කරලා තිබෙනවා කියනවා අපි දැක්කා. නමුත් තවම මේ ගැන පැහැදිලි උත්තරයක් ලැබිලා නැහැ. මේ නිසා ඩොලර් ලක්ෂ 6කට වැඩි මුදලක් අතුරුදහන් වෙලා තිබෙනවා. මේ, අපේ රටේ සල්ලි; රජයේ සල්ලි. මේ සම්බන්ධව ඔබතුමාට දෙන්න පුළුවන් උත්තරය මොකක්ද, ගරු ඇමතිතුමනි?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය සාමාන්‍යයෙන් කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා අහන වර්ගයේ ප්‍රශ්නයක් නොවෙයි, එතුමා වටේ ඉන්න අනෙක් අය ඒ වාගේ ඒවා ඇහුවාට. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා, වෙච්ච සිදුවීම මොකක්ද කියලා. තැපැල් දෙපාර්තමේන්තුවේ යම් මුදලක් අස්ථානගත වීම පිළිබඳව කිව්වේ වෘත්තීය සමිතිවත්, විපක්ෂයේ මන්ත්‍රීවරුන්වත් නොවෙයි. ඉස්සෙල්ලා මම තමයි හෙළිදරව් කළේ, මෙහෙම පැමිණිල්ලක් අපට ලැබිලා තිබෙනවා, අපි ඒ ගැන විමර්ශන කරමින් යනවා, ඒ අනුව මෙන්න මෙවැනි මුදලක් අස්ථානගත වීමක් පිළිබඳ අපට වාර්තා වෙලා තිබෙනවා කියලා. ඒ වනකොටත් මේ සම්බන්ධව අපි තැපැල් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පරීක්ෂණයක් ආරම්භ කරලා තිබුණා. ඒ වාගේම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවටත් මේ ගැන කරුණු වාර්තා කළා. ඒ පරීක්ෂණ සිදු වනවා. ඒ අනුව කොතැනද වරද සිදු වුණේ කියන එක සම්බන්ධයෙන් සොයා බලා - යම් පරීක්ෂණ ක්‍රියාවලියක අවසානයකුත් තිබෙනවා - අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සූදානම්. ගරු මන්ත්‍රීතුමනි, ඒක අපිම හොයාගෙන, අපිම හෙළිදරව් කරපු දෙයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 6 -1218/2025- (1), ගරු එස්.එම්. මරික්කාර් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## ශ්‍රී ලාංකිකයින්ට ඊශ්‍රායලයේ රැකියා අවස්ථා: තෝරා ගැනීමේ ක්‍රමවේදය

## இஸ்ரேலில் இலங்கையர்களுக்கு வேலைவாய்ப்புகள்: தேர்ந்தெடுக்கும் வழிமுறை

## JOB OPPORTUNITIES FOR SRI LANKANS IN ISRAEL: SELECTION PROCESS

1667/2025

**7. ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මේ වන විට ඊශ්‍රායලයේ රැකියාවල යෙදී සිටින ශ්‍රී ලාංකිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ශ්‍රී ලාංකිකයින් සඳහා ඉදිරියේදී නව රැකියා අවස්ථා ඊශ්‍රායලයෙන් ලැබී තිබේද;

(iii) එසේ නම්, ඒ සඳහා ශ්‍රමිකයින් තෝරා ගන්නා ක්‍රමවේදය කවරේද; යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தற்போது இஸ்ரேலில் தொழிலில் ஈடுபட்டுள்ள இலங்கையர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) எதிர்காலத்தில் தொழிலில் ஈடுபடுவதற்காக இலங்கையர்களுக்கு இஸ்ரேலில் புதிய வேலைவாய்ப்புகள் கிடைத்துள்ளனவா என்பதையும்;

(iii) ஆமெனில், அதற்காகப் பணியாளர்களைத் தேர்ந்தெடுக்கும் வழிமுறை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs, Foreign Employment and Tourism:

(a) Will he inform this House -

(i) the number of Sri Lankans currently employed in Israel;

(ii) whether new job opportunities have been made available in Israel for Sri Lankans in the future; and

(iii) if so, the procedure adopted in selecting workers for such job opportunities?

(b) If not, why?

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)

(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)

ගරු කථානායකතුමනි, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 2026.08.02වන දිනට ඊශ්‍රායලයේ සේවය කරන ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් සංඛ්‍යාව 30,291ක් වේ.

(ii) දැනට අපි protocols 7ක් අත්සන් කරලා තිබෙනවා. අන්තිම protocol එක තමයි 2025.12.22වැනි දා අත්සන් කරපු ප්‍රොටෝකෝලය.

වාණිජ හා සේවා ප්‍රොටොකෝලය නමින් තමයි ඒ ප්‍රොටොකෝලය හඳුන්වන්නේ. දැනට අපට quotas 3,000ක් ලැබිලා තිබෙනවා. ඒ 3,000 අතර ගත්තොත්, සම්මුඛ පරීක්ෂණ සම්පූර්ණ කළ 881ක් අතරින් 726ක් තෝරාගෙන විදේශගත කිරීමට අදාළ කටයුතු සම්පූර්ණ කර තිබෙනවා.

මීට අමතරව පහත සඳහන් ක්ෂේත්‍ර යටතේ නව රැකියා අවස්ථා ලැබී ඇත.

1. හෝටල් ගෘහ පාලනය
2. ආපනශාලා
3. නිෂ්පාදන

මේ සම්බන්ධ තොරතුරු පහතින් දැක්වේ.

Summary Report on Israel Recruitments as at 12.08.2026

| Sector | Quota | The date of signing the Agreement | No. of selectees (Lottery Draw) | Departures | | |
|---|---|---|---|---|---|---|
| | | | | 2025 | 2026 | Total |
| Hotel and house-keeping | 2000 | 2024.09.13 | 3420 | 1301 | 1007 | 2308 |
| Restaurant | 2000 | 2024.01.14 | 1956 | 1059 | 88 | 1147 |
| Manufacturing | 2000 | 2024.11.17 | 1289 | 13 | 612 | 625 |
| Commerce and Service | 3000 | 2025.12.22 | 726 | | 0 | 0 |
| Total | | | | 2,373 | 1707 | 4080 |

(iii) දැනට අපි ප්‍රොටොකෝල් 7කට අත්සන් තබා තිබෙනවා. එක, නිවාස පාදක සාත්තු සේවය. Caregivers කියලා අපි ඔවුන් හඳුන්වනවා. දෙවැනි එක, කෘෂිකාර්මික - agriculture - අංශය. තුන්වැනි එක, ඉදිකිරීම් ක්ෂේත්‍රය. ඉදිකිරීම් ක්ෂේත්‍රය ගත්තොත්, එතැන කාණ්ඩ තුනක් තිබෙනවා. ඉදිකිරීම් - construction, යටිතල පහසුකම් - infrastructure - සහ ප්‍රතිසංස්කරණය - renovation - කියන කාණ්ඩ තුන ඒ යටතේ තිබෙනවා. හතරවැනි එක, හෝටල් ගෘහපාලනය - hotel and housekeeping. පස්වැනි එක, ආපනශාලා - restaurants. හයවැනි එක, නිෂ්පාදන - manufacturing. හත්වැනි එක, වාණිජ හා සේවා - commerce and service sector. 2025 දෙසැම්බර් මාසයේදී අපි අත්සන් කළේ මේ කාණ්ඩ යටතේ වූ ගිවිසුම.

මීට අදාළ තෝරා ගැනීමේ ක්‍රමවේදය ගත්තොත්, පළමුවෙනි එක තමයි, www.slbfe.lk කියන වෙබ් අඩවිය. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ එම website එක අපි open කරනවා. ඒකට අදාළ කරන දැන්වීම් අපි notice board එක හරහාත් කරනවා. ඒ වාගේම අපේ official Facebook එක හරහාත් දැන්වීම් කරනවා. බොහෝ තරුණයින් අතර Facebook page එකත්, ඒ වාගේම අපේ www.slbfe.lk කියන page එකත් ඉතා ප්‍රබලව භාවිත වන නිසා ඒ හරහාත් ඔවුන් apply කරනවා. නමුත්, මීට කලින් තිබුණු ක්‍රමවේදය තමයි, ඕනෑ තරම් applications ප්‍රමාණයක් භාර දෙන්න පුළුවන් වීම. දැන් අපට quotas ලැබෙන ප්‍රමාණය අනුව සීමිත ප්‍රමාණයක් තමයි ඇතුළු කර ගන්නේ. හේතුව, එළියේ තදබදය අඩු කිරීමට අදාළව අපි සීමාසහිත අයදුම්කරුවන් ප්‍රමාණයක් තමයි කැඳවන්නේ.

දෙවැනි කාරණාව මෙයයි. එතැනදී අපි මූලික සුදුසුකම් සඳහා සම්මුඛ පරීක්ෂණය පවත්වනවා. ඒ වාගේම ඒගොල්ලන්ට fitness test එකක් පවත්වනවා. Fitness test එකට අදාළ කරන කටයුත්තත් අපි සම්පූර්ණ කරනවා. ඊළඟට, අපි තෝරා ගත් පිරිසගේ ලේඛනය PIBA එකට e-mails මඟින් යවනවා. PIBA එකෙනුත් ලංකාවට ඇවිල්ලා සම්මුඛ පරීක්ෂණ පවත්වනවා. විශේෂයෙන්ම එක එක ක්ෂේත්‍ර අනුව තමයි ඒක තීරණය වන්නේ. ඒ සම්මුඛ පරීක්ෂණයත් එක්ක තෝරාගත් ලැයිස්තුව නැවත යවමින් එතැනදී සියයට 75ක සංඛ්‍යාවකට ලොතරැයි ක්‍රමය හරහා ඒ රැකියාව ලබා ගැනීමට අදාළ ගිවිසුම් ප්‍රකාරව අපේ එකඟතාව තිබෙනවා.

සාමාන්‍යයෙන් සියයට 75ක විතර පිරිසක් තමයි ඒ සඳහා අපි තෝරා ගන්නේ. ඒ වාගේම එක් අවස්ථාවකදී පමණක් lottery එකට ඇතුළත් කරන්න පුළුවන් කියන එකඟතාව තිබුණත්, අපි ආණ්ඩුවක් විධියට සානුකම්පිතව මේ සඳහා මැදිහත් වෙමින් අවස්ථා කිහිපයක්ම අරන් දීලා තිබෙනවා. නමුත්, ගිවිසුම් ප්‍රකාරව ගත්තොත්, එක අවස්ථාවකදී පමණයි lottery එකට ඇතුළත් කරන්න පුළුවන් වන්නේ.

(ආ) අදාළ නොවේ.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**

(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)

(The Hon. Chamara Sampath Dasanayake)

ගරු කථානායකතුමනි, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත හරහා 2026.05.22 දින ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් තමයි මම මේ තොරතුරු ලබා ගත්තේ. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත හරහා ලබා ගත් මේ ලිපියේ තිබෙන විධියට දැනට 3,422ක්, bartender, shuttering carpenter, tile mason වැනි තනතුරු සඳහා යෑමට අවශ්‍ය වෛද්‍ය පරීක්ෂණ කරලා, පොලිස් වාර්තා අරගෙන විදේශගත වීමේ බලාපොරොත්තුවෙන් ඉන්නවා. ගරු කථානායකතුමනි, ඒ වාගේම ඊශ්‍රායල රජයත්, අපේ රජයත් මේ ශ්‍රමිකයින් සම්බන්ධයෙන් ගිවිසුමක් අත්සන් කර තිබෙනවා. ඒ ගිවිසුම හරහා ඊශ්‍රායලයේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ වැඩ කටයුතු සඳහා

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

ශ්‍රී ලාංකිකයින් 14,000ක් යැමට නියමිතව ඉන්නවා. මේ තොරතුරු දුන්නේ, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත හරහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන්. මේ තොරතුරු අනුව 2024 වර්ෂයේදී වඩු කාර්මිකයෝ 1,201ක් යවා තිබෙනවා, 2025 වර්ෂයේදී 1,167ක් යවා තිබෙනවා, මේ අවුරුද්දේදී 77ක් යවා තිබෙනවා. Ceramic tilers 2024 වර්ෂයේදී 605ක් යවා තිබෙනවා, 2025 වර්ෂයේදී 494ක් යවා තිබෙනවා, මේ අවුරුද්දේ 54ක් යවා තිබෙනවා. කම්බි නැවීම් සම්බන්ධයෙන් වැඩ කරන්න 2024 වර්ෂයේදී 2,244ක් යවා තිබෙනවා, 2025 වර්ෂයේදී 1,936ක් යවා තිබෙනවා, මේ වර්ෂයේදී 32ක් යවා තිබෙනවා. කපරාරු කිරීම් සම්බන්ධව වැඩ කරන්න 2024 වර්ෂයේදී 1,237ක් යවා තිබෙනවා, 2025 වර්ෂයේදී 631ක් යවා තිබෙනවා, මේ අවුරුද්දේ 29ක් යවා තිබෙනවා.

ගරු කථානායකතුමනි, 2024 වර්ෂයේ ගිය ප්‍රමාණයට වඩා හරි අඩක් 2025 වර්ෂයේදී අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම මේ 2026 වර්ෂයේදී, 2024 සහ 2025 වර්ෂවලට වඩා සියයට 90ක විතර ප්‍රමාණයකින් විදේශ රටවලට යන ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. ඒ නිසා විශාල පිරිසක් උද්ඝෝෂණ කරමින්, උපවාස කරමින් පෝලිම්වල ඉන්නවා. නමුත් රජයෙන් විදේශ රටවලට යවන ප්‍රමාණයට වඩා වැඩියි, පෞද්ගලික ආයතනවලින් විදේශ රටවලට යවන ප්‍රමාණය.

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. ගරු ජනාධිපතිතුමාත් දැන් මේ සභාවේ වාඩි වෙලා ඉන්නවා. එතුමාත් මේ පාර්ලිමේන්තුවට ආපු දවසේ මට මෙවැනි ප්‍රශ්නයක් අහන්නට ලැබීමත් සතුටක්. ගරු ජනාධිපතිතුමනි, අපේ රටේ පොඩි ප්‍රශ්නයක් තිබෙනවා.

2025දී රජයෙන් විදේශ රටවලට යවපු ප්‍රමාණය, 2024දී යවපු ප්‍රමාණයට වඩා අඩු වෙලා තිබෙනවා. 2026දී ඒ ප්‍රමාණය ඊටත් වඩා අඩු වෙලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්නය අහලා අවසන් කරන්න. ඔබතුමා කියන කාරණය පැහැදිලියි.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ තමයි මම මේ තොරතුරු ලබා ගත්තේ. මා ළඟ මේ තිබෙන්නේ විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් දීපු ලිපිය. ඕනෑ නම් මම මේ ලිපිය සභාගත කරන්නම්. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නයෙන් මම ඒ කාරණය ගැන දැනගන්න කැමතියි.

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)
ගරු කථානායකතුමනි, ඊශ්‍රායල රජය විසින් යම්කිසි තීරණයක් අරගෙන තිබුණා. ඒ සම්බන්ධව අපට ලිපියක් ලැබුණා, 2026.01.06 දිනට අදාළව. විශේෂයෙන් G-to-G sectors හරහා අත්සන් තබපු construction, renovation, infrastructure කියන අංශ ගත්තොත්, විශේෂයෙන්ම construction, renovation කියන අංශ දෙකට අදාළව private sector එකට 40,000ක quota එකක් ඊශ්‍රායල රජය විසින් ලබා දෙනවා කියලා යම්කිසි එකඟතාවක් දක්වපු ලිපි අපේ ළඟ තිබෙනවා.

විශේෂයෙන්ම පසුගිය පෙබරවාරි මාසයේ සිට තමයි මැද පෙරදිග යුද්ධය පටන් ගත්තේ. යුද්ධය පටන් ගැනීම නිසා ඒ රටේ ඇති වුණු තත්ත්වයත් එක්ක ඔවුන් තාවකාලිකව යම්කිසි එකඟතාවකට ඇවිත් තිබුණා, 40,000ක් බඳවා ගන්නවා කියලා. 40,000ක් බඳවා ගන්නවාය කියන ඒ තීරණයත් එක්ක තමයි private sector එකට ලංකාවෙන් කට්ටිය බැඳෙන්න පටන් ගත්තේ. එතැනදී 5,404ක් private sector එක හරහා ඊශ්‍රායලයට ගිහිල්ලා තිබෙනවා, construction sector එකට අදාළව. විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වෙච්ච කාටවත් එහෙම යන්න කියලා අපි බල කළේ නැහැ. කවුරු හරි තමන්ගේ පෞද්ගලික කැමැත්තෙන් එහෙම ගියා නම් ඒකට අදාළ කරන අවස්ථාව තිබුණා. නමුත් මේ G-to-G agreement quota එක සහ private sector quota එක කියන්නේ කාරණා දෙකක්.

අපි මේ සම්බන්ධව දිගින් දිගටම PIBA එක සමඟ සාකච්ඡා කළා. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වාගේ එකක් තමයි PIBA කියන්නේ. ඒ ආයතනය තමයි අපිත් එක්ක G-to-G agreementsවලට අත්සන් තබන්නේ. ඒ ආයතනය තමයි අපිත් එක්ක මේ සාකච්ඡා ටික කරගෙන යන්නේ. PIBA එකත් එක්ක අපි දිගටම සාකච්ඡා කළා. PIBA එකත් අපි ඉදිරිපත් කරපු කරුණු කාරණා සම්බන්ධව යම්කිසි එකඟතාවකට ඇවිත් තිබුණා. අපි මෑතකදී දැනගත්තා, PIBA එක පෞද්ගලික බඳවා ගැනීම් තාවකාලිකව නතර කරලා තිබෙනවා කියලා. එළියේත් යම්කිසි ප්‍රශ්නය වගයක් ඇති කර තිබෙනවා මම දැක්කා, රජයට ලැබෙන quota එක එළියට දෙනවාද කියන එක සම්බන්ධයෙන්. එහෙම දෙයක් කිසිසේත්ම වෙන්නේ නැහැ. රජයට ලැබෙන quota ඒ විධියටම තිබෙනවා. අපි සමහර ක්ෂේත්‍ර - විශේෂයෙන්ම hotel sector එක වාගේ ක්ෂේත්‍ර - ගත්තාම quota එක ඉක්මවාත් බඳවා ගැනීම් කරලා තිබෙනවා. එතැනදී අපි කිසිසේත්ම private sector සහ Government කියන දෙක එක විධියට සලකන්නේ නැහැ. ඒ දෙකක්. නමුත් එතැන ප්‍රශ්නයක් තිබෙනවා. විශේෂයෙන්ම private sector එක හරහා යනකොට අපි යම්කිසි නියාමනයක් කරලා තිබෙනවා. නමුත් ඒ නියාමනය ඉක්මවා ගිහිල්ලා, පුද්ගලයන් ඊට වඩා අධික මුදලක් ගෙවනවා නම් අපි එහෙම කරන්න එපා කියනවා. ඒකට අදාළව කටයුතු කරන අපේ පැමිණිලි මධ්‍යස්ථානයක් තිබෙනවා. එතැනට ගිහිල්ලා ඒ ගැන පැමිණිලි කරන්න පුළුවන්. අපි ඒ සියලු කටයුතු සකස් කර තිබෙනවා. දැනටමත් තුන්දහස් ගණනක් ඊශ්‍රායලයට යන්න බලාගෙන ඉන්නවා. එලෙස යන්න බලාගෙන ඉන්න පාර්ශ්වයට අදාළවත් අඛණ්ඩව කටයුතු කරලා, අපි ඒ සම්බන්ධව විසඳුමක් ලබා දෙන්න මැදිහත් වෙනවා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, දෙවැනි අතුරු ප්‍රශ්නයත් අහන්න.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු කථානායකතුමනි, ළමයින්ට ඒ රටට යන්න බලාපොරොත්තුවක් තිබෙනවා කියන එක ඔබතුමාට දැන් තේරෙන්න ඇති. ගරු කථානායකතුමනි, නියෝජ්‍ය ඇමතිතුමා කථා කරනකොට කිව්වා, පිටස්තර ඉන්න මනුස්සයෙකුට විවිධ විධියට හිතන්න පුළුවන් කියලා. පිටස්තර ඉන්න මනුස්සයෙකුට ඕනෑ විධියකට හිතන්න පුළුවන්. මොකද, පන්දහස් ගණනක් agencyවලින් ගිහිල්ලා, රජයෙන් තුන්සිය ගණනක් යනකොට ඕනෑම කෙනෙක් එහෙම හිතනවා නේ. පෞද්ගලික agencyවලින් යවනකොට අනිවාර්යයෙන්ම විදේශ සේවා නියුක්ති කාර්යාංශය ඒ වෙනුවෙන් මැදිහත් වෙන්නම ඕනෑ.

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. අපේ රටේ 30,000ක් ඊශ්‍රායලයේ ඉන්නවා නේ. ඔබතුමා පළමුවැනි අතුරු ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් 30,000ක් ඉන්නවාය කිව්වා. 30,000ක් කියන්නේ ලොකු ප්‍රමාණයක්. ඊශ්‍රායලය කියන්නේ අපේ රටට විදේශ ආයෝජන විශාල ප්‍රමාණයක් එන රටක්. මොකද, ඊශ්‍රායලයේ වැඩ කරන ශ්‍රමිකයෙකුට රුපියල් ලක්ෂ 7ක, 8ක පඩියක් ලැබෙනවා නේ. නමුත් දැන් ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. කෘෂිකර්ම ක්ෂේත්‍රයේ සහ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ රැකියා සඳහා ඊශ්‍රායලයට ගිය අය දැන් වෙනත් රැකියාවලට ගිහිල්ලා තිබෙනවා.

එහෙම වෙනත් රැකියාවලට ගිය අයව සරණාගතයෝ හැටියට ලංකාවට පටවන්න ලැහැස්ති වෙනවා. දැන් එහෙම 7,000ක් විතර ලංකාවට පටවන්න ලැහැස්තියි. හැබැයි, මේකට ඉන්දියාව මැදිහත් වෙලා තිබෙනවා. ඉන්දියාව මැදිහත් වෙලා ඉන්දියානු ශ්‍රමිකයන්ව එලෙස එරටට පටවන එක යම්කිසි විධියකින් නවත්වා ගැනීමක් සිදු කරලා තිබෙනවා. ඊශ්‍රායලයේ ඉන්න අපේ ශ්‍රමිකයන්ගේ ඉල්ලීමක් තිබෙනවා, ඉන්දියාව මැදිහත් වුණා හා සමානව අපේ ආණ්ඩුවත් මැදිහත් වෙලා ඒ අයව බේරා ගන්න කියලා. මම හිතන විධියට, ඇමතිතුමා පසුගිය කාලයේ ඊශ්‍රායලයට ගිහින් තිබෙනවා. එකවර 7,000ක් ලංකාවට ආවොත් ප්‍රශ්නයක් ඇති වෙන්න පුළුවන්. ඒ තමයි, විදේශ ශ්‍රමිකයන්ගේ මුදල් ලංකාවට එන්නේ නැති වන එක. එම නිසා ඒ අයව බේරා ගන්න කියලා ඊශ්‍රායලයේ ඉන්න ශ්‍රමිකයෝ කියනවා. ගරු කථානායකතුමනි, එක් එක් ක්ෂේත්‍රවල හිටපු අය ඊශ්‍රායලයට ගියාට පසුව ඔවුන් එක් එක් රැකියාවලට මාරු වෙනවා. ඒ සම්බන්ධව අපේ රජය තවම මැදිහත් වෙලා නැහැ. නමුත්, බංග්ලාදේශය, ඉන්දියාව වාගේ රටවල් ඒ වෙනුවෙන් මැදිහත් වෙලා තිබෙනවා. අපේ රටටත් එහෙම මැදිහත් වෙන්න කියලා ඊශ්‍රායලයේ ඉන්න ශ්‍රමිකයන්ගේ ඉල්ලීමක් තිබෙනවා.

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)

ගරු කථානායකතුමනි, මෙතැන ප්‍රශ්න දෙකක් තිබෙනවා. සමහර දේවල් පරණ පුරුද්දටම කියනවා. ඒ කියන්නේ, සමහර දේවල් අතීතයේ කරපු විධියටම එතුමා කියන්න පටන් ගත්තා. මම හිතන විධියට, ඒක අපේ ආණ්ඩුවට ගැළපෙන්නේ නැහැ. මනුෂ නානායක්කාර හිටපු අමාත්‍යවරයාගේ කාලයේ යම්කිසි ලියුමක් නිකුත් කර තිබුණා, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට. විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් පිළිවෙළට ජීව දත්ත එකතු කරමින්, සම්මුඛ පරීක්ෂණ පවත්වාගෙන PIBA එකට යොමු කරන්න තිබුණු ඒ අවස්ථාවේදී පවා මනුෂ නානායක්කාර හිටපු අමාත්‍යවරයා ලියුමක් නිකුත් කර තිබෙනවා. මම ඒ ලියුම සභාගත කරන්නම්. දැනටමත් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙන් මේ සම්බන්ධව විමර්ශනයක් පවත්වනවා. "මම list එකක් යවන්නම්, ඒ list එක ඔයගොල්ලන් PIBA එකට යොමු කරන්න" කියන කාරණාව ඒ ලිපියේ සඳහන් කර තිබෙනවා. ඒක minute කරපු, official ලියුමක්. 2023.11.08වන දින මනුෂ නානායක්කාර මැතිතුමා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපතිතුමාට යවන ලද එම ලියුම මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

මෙතැන තිබෙන ප්‍රශ්නය තමයි, සමහර දේවල් පරණ විධියටම හිතන එක. එහෙම හිතුවොත් ඒක සාධාරණයි තමයි. නමුත්, අපේ ආණ්ඩුවට ඒක කිසිසේත්ම අදාළ නැහැ. අපි සියලු දේවල් විනිවිදභාවයක් සහිතව කරන්නේ.

ඒ වාගේම තමයි, දේශපාලන රැකවරණ, එහෙම නැත්නම් refugee status ඉල්ලපු කට්ටියගේ ප්‍රශ්නය ගැනත් මෙහිදී සඳහන් කර තිබුණා. ගරු කථානායකතුමනි, අපගේ වත්මන් විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා විපක්ෂයේ හිටපු කාලයේ, එවකට හිටපු කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යවරයාගෙන් මේ උත්තරීතර සභාවේදීම ප්‍රශ්න කර තිබුණා, මෙවන් අවස්ථාවක් ලැබී තිබෙන මොහොතේ ඇයි ඒකට අදාළ කරන මැදිහත්වීම ආණ්ඩුව කරන්නේ නැත්තේ කියලා. ඒක දෙන්නේ යම්කිසි සීමිත කාල වකවානුවකට. ගරු කථානායකතුමනි, එතැනත් ප්‍රශ්නයක් තිබෙනවා. විශේෂයෙන්ම කෘෂිකර්ම ක්ෂේත්‍රයට යවපු පිරිස ගත්තොත්, ඒක ගිය අයගේ වැරැද්දක් කියලා මම හිතන්නේ නැහැ. නමුත් හරි විධියට පැහැදිලි කරලා නොවෙයි ඔවුන් යැව්වේ. ඒ නිසා ඔවුන්ට ගිහිල්ලා ඒ රස්සාව කරන්න බැරි වුණා. එම නිසා ඒ අය එළියේ විවිධ තැන්වල වැඩ කරන්න පටන් ගත්තා. ඒ නිසා ඔවුන්ට refugee status දෙන්න පටන් ගත්තා. ඊළඟට, ඒ රටින්ම සමාව දීමට අදාළව යම්කිසි කාලයක් ලබා දුන්නා. අපි විපක්ෂයේ හිටපු කාලයේ මේ සම්බන්ධව කථා කළා. නමුත්, ඒ කාල වකවානුව ගත්තොත්, එය යම්කිසි සීමිත කාලයක්, ගරු කථානායකතුමනි. ඒ සීමිත කාලය තුළ තමයි amnesty එක ලබා දෙන්නේ. මෙතුමාගේ සහෝදර, ඒ හිටපු අමාත්‍යවරයාගේ කාලයේ ඒ සම්බන්ධව මැදිහත් වුණේ නැහැ. නමුත්, අපි මේ සම්බන්ධව සාකච්ඡා කළා වාගේම ඒ ගැනත් කථා කරනවා. ඔවුන්ට නිල වශයෙන් කුමන හෝ ආකාරයකින් ඒ රටේ රස්සාවක් කරන්න, නැත්නම් විකල්ප මාර්ගයක් සලසා දීම සඳහා ආණ්ඩුවක් විධියට අපි මැදිහත් වෙනවා. පසුගිය වතාවේ මම එරටට ගිය වෙලාවේදීත් ඔය සම්බන්ධව සඳහන් කර තිබුණා. ඉදිරියේදීත් මොකක් හෝ amnesty period එකක් රටක් විධියට අපට ලබා දෙනවා නම් අපි රජයක් විධියට ඒ සඳහා මැදිහත් වෙන්නට සූදානම්.

විශේෂයෙන් සඳහන් කළ යුතු තවත් කාරණාවක් තිබෙනවා. මම ඒ ගැනත් සඳහන් කරන්නම්. මම කලින් කිව්ව පාර්ශ්වයට අදාළ කරන ඒ සමාව අරගෙන දුන්නේ නැත්තේ ඒ වෙනුවට තව 6,000ක් ලංකාවෙන් යවන්නට ඔවුන් සැලසුම් සහගතව යම්කිසි වැඩක් කරලා තිබුණු නිසායි. ඒ අවස්ථාවේදී එළියෙන් සල්ලි අරගෙන තිබුණා. විවිධ දූෂණ, වංචා සිද්ධ වෙලා තිබුණා. ඔවුන්ව යැවීමට අදාළව තමයි අර පාර්ශ්වයට සමාව දුන්නේ නැත්තේ; ඊට අදාළ මැදිහත්වීම අපේ රටින් කළේ නැත්තේ. ඉතාම නිහතමානීව ඒ රජයෙන් ඒ අවස්ථාව අපට ලබා දුන්නත්, එවකට හිටපු අමාත්‍යවරයා වන මනුෂ නානායක්කාර මැතිතුමා ඇතුළු ඒ අදාළ පාර්ශ්වකරු මේකට අදාළ කරන මැදිහත්වීම කළේ නැහැ. නමුත්, අපට ලැබෙන උපරිම අවස්ථා පාවිච්චි කරමින් අපි ඒ අදාළ පාර්ශ්වයට සාධාරණයක් ඉෂ්ට කිරීමට ආණ්ඩුවක් විධියට මැදිහත් වන්නට සූදානම්. දිගින් දිගටම මේ සම්බන්ධව අපේ සියලුම සාකච්ඡාවලින් කරුණු මතු කර ගනිමින් සිටිනවා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මොකක්ද, ඔබතුමාගේ point of Order එක ගරු මන්ත්‍රීතුමා?

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

Point එක මම කියන්නම්, ඔබතුමා මට මයික් එක දෙනවා නම්.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

විදේශ කටයුතු ඇමතිවරයා සභාවේ සිටියදී නියෝජ්‍ය ඇමතිවරයා උත්තර දෙනවා. එක්කෝ, විදේශ කටයුතු ඇමතිවරයාට උත්තර දෙන්න කියන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම පුළුවන්, ගරු මන්ත්‍රීතුමනි. ඒක ප්‍රශ්නයක් නොවෙයි. ඒක point of Order එකකුත් නොවෙයි.

## කුරුණෑගල-හබරණ දුම්රිය මාර්ග ව්‍යාපෘතිය: විස්තර
குருநாகல் - ஹபரணை புகையிரத வீதிக் கருத்திட்டம்: விபரம்
KURUNEGALA-HABARANA RAILWAY PROJECT: DETAILS

2182/2026

**8.ගරු සුනිල් රත්නසිරි මහතා**
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) කුරුණෑගල-හබරණ දුම්රිය මාර්ග ව්‍යාපෘතිය ආරම්භ කරන ලද වර්ෂය කවරේද;
(ii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය කොපමණද;
(iii) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ගිවිසුම්ගත වූ සමාගම කවරේද;
(iv) ව්‍යාපෘති කාලසීමාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ව්‍යාපෘතිය සඳහා අත්පත් කර ගැනීමට යෝජිත ඉඩම් කැබලි සංඛ්‍යාව කොපමණද;
(ii) එයින් වන්දි ගෙවා අත්පත් කරගෙන ඇති ඉඩම් කැබලි සංඛ්‍යාව කොපමණද;
(iii) වන්දි ගෙවා අත්පත් කරගත් ඉඩම් වර්තමානයේ භුක්ති විඳින පාර්ශ්වයන්/පුද්ගලයන් කවරේද;
(iv) මෙම ව්‍යාපෘතියේ සමස්ත ප්‍රගතිය කවරේද;
(v) ව්‍යාපෘතිය තවදුරටත් ඉදිරියට කරගෙන යාමට අදහස් කරන්නේද;
(vi) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) குருநாகல் - ஹபரணை புகையிரத வீதிக் கருத்திட்டம் ஆரம்பிக்கப்பட்ட ஆண்டு யாது என்பதையும்;
(ii) அதற்காக மதிப்பிடப்பட்ட மொத்தச் செலவு யாது என்பதையும்;
(iii) மேற்படி கருத்திட்டத்தை நடைமுறைப் படுத்துவதற்காக ஒப்பந்தம் செய்யப்பட்ட கம்பனி யாது என்பதையும்;
(iv) மேற்படி கருத்திட்டத்தின் காலவரையறை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி கருத்திட்டத்துக்காகக் கையகப்படுத்துவதற்கு உத்தேசிக்கப்பட்டுள்ள காணித் துண்டுகளின் எண்ணிக்கை யாது என்பதையும்;
(ii) அவற்றுள் இழப்பீடு செலுத்திக் கையகப்படுத்தப்பட்டுள்ள காணித் துண்டுகளின் எண்ணிக்கை யாது என்பதையும்;
(iii) இழப்பீடு செலுத்தி கையகப்படுத்தப்பட்ட காணிகளை தற்போது இருப்பாட்சி **செய்யும்** தரப்பினர்/நபர்கள் யாவர் என்பதையும்;
(iv) மேற்படி கருத்திட்டத்தின் ஒட்டுமொத்த முன்னேற்றம் யாது என்பதையும்;
(v) மேற்படி கருத்திட்டத்தை தொடர்ந்தும் முன்னெடுத்துச் செல்ல உத்தேசிக்கப்படுகின்றதா என்பதையும்;
(vi) இன்றேல், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he inform this House -
(i) the year in which the Kurunegala-Habarana Railway Project was initiated;
(ii) the estimated total cost for the aforesaid project;
(iii) the company contracted to implement the project; and
(iv) the duration of the project?

(b) Will he also inform this House -
(i) the number of plots of land proposed to be acquired for the project;
(ii) the number of plots of land acquired, out of those proposed after paying compensation;
(iii) the parties/individuals currently occupying the lands acquired after paying compensation;
(iv) the overall progress of this project;
(v) whether it is intended to continue with the project; and
(vi) if not, the reasons therefor?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා (ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Prasanna Gunasena - Deputy Minister of Transport and Highways)
ගරු කථානායකතුමනි, ප්‍රවාහන සහ මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 2016 වර්ෂයේ.
(ii) ඇමෙරිකානු ඩොලර් මිලියන 947.9කි.
(iii) එම්.එස්. චයිනා එස්ටේට් කන්ස්ට්‍රක්ෂන් ඉංජිනියරින් කෝපරේෂන්ස් ලිමිටඩ්.

(iv) 2016 සිට 2023.02.28 දක්වා

(ආ) (i) ඉඩම් කැබලි 4,400යි.

(ii) ඉඩම් කැබලි 149ක් සඳහා මූලික වන්දි මුදල් ගෙවා ඇතත් රජයට අත්පත් කරගෙන නැත.

(iii) හිමිකරුවන් විසින්.

(iv) මෙම ව්‍යාපෘතිය අත්හිටුවන අවස්ථාව වන විට දුම්රිය මාර්ග ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා අවශ්‍ය ඉඩම් කැබලි 4,400න් - හෙක්ටෙයාර 350න් - ඉඩම් කැබලි 4,392ක භුක්තිය භාරගෙන රජය අත්පත් කරගෙන ඇත. ඉඩම් කැබලි 1,964ක වන්දි පරීක්ෂණ පවත්වා, ඉඩම් කැබලි 936ක 10 (1)(අ) තීරණය ලබා දී ඇති අතර, වන්දි මුදල් ගෙවා අත්පත් කරගෙන නැති ඉඩම් කැබලි ගණන 149කි. වන්දි වශයෙන් ගෙවා ඇති මුදල රුපියල් මිලියන 282කි. මෙම ව්‍යාපෘතිය සඳහා මේ දක්වා රජය දරා ඇති වියදම රුපියල් මිලියන 880ක් වන අතර, ඉඩම් අත්කර ගැනීමේ ප්‍රගතිය සියයට 68කි.

(v) නැත.

(vi) මහා පරිමාණ ව්‍යාපෘති නැවත ක්‍රමෝපායකරණය සහ වේගවත් කිරීම සම්බන්ධව අංක අමප-022/604/1286/22 හා 2022.09.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් ලබා දී ඇති නියෝග පරිදි රට තුළ පවතින ආර්ථික හා මූල්‍ය දුෂ්කරතා කෙරෙහි අවධානය යොමු කරමින් අදාළ කමිටුව මෙම ව්‍යාපෘතිය පිළිබඳව පොදු තීරණයක් ගන්නා ලෙස දැනුම් දීම පරිදි කුරුණෑගල-හබරණ දුම්රිය මාර්ග ව්‍යාපෘතියේ කටයුතු 2023.02.28 දිනෙන් අත්හිටුවා ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු සුනිල් රත්නසිරි මහතා**
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)

ගරු කථානායකතුමනි, කුරුණෑගල-හබරණ දුම්රිය මාර්ග ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනය අවසාන වුණේ 2009 දෙසැම්බර් මාසයේ. එතැන් සිට අද වෙනකොට වසර 17කට ආසන්න කාලයක් ගෙවිලා තිබෙනවා. 2024 දක්වා ගත්තොත්, වසර 15ක කාලයක් ගෙවිලා තිබෙනවා. එම ව්‍යාපෘතිය සඳහා ජනතාවගේ බදු මුදල්වලින් රුපියල් මිලියන 880ක් වෙන් කර තිබෙනවා. ඒ තරම් විශාල මුදලක් එම ව්‍යාපෘතිය සඳහා නිකරුණේ වියදම් කරලා, පටන් ගත්ත අයම එම ව්‍යාපෘතිය අතරමඟ නතර කර දමා තිබෙනවා.

ඒ නිසා ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය වෙන්නේ, මේ ව්‍යාපෘතිය අතරමඟ නතර කර දාලා තිබෙනවා නම් ඒ වෙනුවෙන් විකල්ප ක්‍රියාමාර්ගයක් ඔබ අමාත්‍යාංශය මඟින් ගැනීමට කටයුතු කරනවාද කියන එකයි.

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)

ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ පරිදි, 2016දී මෙම ව්‍යාපෘතිය ආරම්භ කරලා 2023 වසරේ දෙවැනි මාසය වෙනකොට, රුපියල් මිලියන 880ක් වියදම් කරලා එය වැඩ අවසන් කරන්නේ නැතුව නවත්වා දමා තිබෙනවා. මේ ව්‍යාපෘතිය පටන් ගන්නේ සහ වැඩ අවසන් නොකර අවසන් කරන්නේ 2024 සැප්තැම්බර් මාසයට කලින්. ඒ කියන්නේ, මේ පාලනය එන්න කලින්. එතකොට මේ ව්‍යාපෘතිය නැවත පටන් ගැනීමේදී සාධක කිහිපයක් ගැන අපි අවධානය යොමු කළ යුතු වෙනවා. ඉදිරියේදී අපට පුළුවන් ත්‍රිකුණාමලය වරාය දියුණු වෙන්නේ කෙසේද, කොළඹ දක්වා භාණ්ඩ ප්‍රවාහනය කිරීමට මොන මොන අවශ්‍යතා මත වෙනවාද කියන කාරණය මත මේ ව්‍යාපෘතිය කොච්චර ඉක්මනින් පටන් ගන්නවාද කියන එක පිළිබඳව තීරණය කරන්න.

මඟී ප්‍රවාහනය ගැන සලකා බලනවා නම්, අපි පටන් ගෙන තිබෙනවා, කුරුණෑගල ඉඳලා දඹුල්ල දක්වා ඉදිවෙන අධිවේගී මාර්ගය. ඒ කියන්නේ, මධ්‍යම අධිවේගී මාර්ගයේ 4වන අදියර. අපි ලංසු කැඳවන්න පටන් ගත්තා, මේ මාසයේ 7වැනි දා. ලබන මාසයේ 10වැනි දා වාගේ වෙනකොට ලංසු කැඳවීම අවසන් වෙනවා. මෙහි කිලෝමීටර 38.5ක දුරක් තිබෙනවා, රුපියල් බිලියන 190ක වාගේ දැවැන්ත ව්‍යාපෘතියක්. අපි හිතනවා, අවුරුදු 3ක් ඇතුළත එය අවසන් කරන්න පුළුවන් වෙයි කියලා. ඒ ප්‍රමාණය අවසන් කිරීම සඳහා ඉදිරි වසර 3 ඇතුළත මුදල් වෙන් කරනවා. ඒ ප්‍රතිලාභ ලැබෙන්නෙත් ඒ පාරේ ගමන් කරන ජනතාවට.

ඊට අමතරව දුම්රිය විදුලිකරණය වෙනුවෙනුත් ඉදිරි අවුරුදු තුන ඇතුළත මුදල් වියදම් කරනවා. මේ සඳහා වෙන් කරන මුදල් ප්‍රමාණය ගත්තොත්, ප්‍රධාන line එකේ මරදානේ සිට රාගම දක්වා විදුලිකරණය වෙනුවෙනුත්, අලුතින් කෝච්චි ගෙනෙන්න සහ එහි signal system එක වෙනුවෙනුත් දළ වශයෙන් ඩොලර් මිලියන 380ක් වාගේ මුදලක් වෙන් කරන්න සිදු වෙනවා. ඊළඟට, coastal line එක ගත්තොත්, මරදානේ ඉඳලා පානදුර දක්වා කොටසට ඩොලර් මිලියන 648ක් වාගේ මුදලක් වෙන් කරන්න සිදුවෙනවා. මරදානේ ඉඳලා මාලපැල්ල දක්වා කොටසට ඩොලර් මිලියන 849ක් වාගේ මුදලක් වෙන් කරන්න සිදු වෙනවා. ඔක්කොම ගත්තාම දළ වශයෙන් ඩොලර් මිලියන 1,877ක් වාගේ දැවැන්ත මුදල් ප්‍රමාණයක් අපට ඉදිරි අවුරුදු තුන හතර ඇතුළත මේ ව්‍යාපෘති වෙනුවෙන් වෙන් කරන්න සිද්ධ වෙනවා. අධිවේගී මාර්ග වෙනුවෙන්, දුම්රිය විදුලිකරණය වෙනුවෙන් ඒ වාගේ මුදල් ප්‍රමාණයක් වෙන් වෙනවා. මේ හැම එකම අපි ලංකාවේ මුදල්වලින් හැදුවත්, - උදාහරණයක් විධියට විදුලිකරණය වෙනුවෙන් ලංකාවේ මුදල් වැය යන්නේ බිලියන 600ක් නම් - සාමාන්‍යයෙන් තුනෙන් දෙකක වාගේ ප්‍රමාණයක foreign component එකක් තිබෙනවා. ඩොලර් විධියට රටෙන් එළියට යනවා. එතකොට 1,877ක් නම් ඒකෙන් දළ වශයෙන් ඩොලර් මිලියන 1,200ක් විතර ඉදිරි අවුරුදු තුන ඇතුළත රටෙන් එළියට යනවා. ඒ කාරණාත්, ත්‍රිකුණාමලය වරායේ භාණ්ඩ ප්‍රවාහනයේදී කොච්චර බහලුම් ප්‍රමාණයක් එනවාද, ඒක කොච්චර ආකාරයට දියුණු වෙනවාද කියන කාරණාත් සලකා බලා තමයි ගරු කථානායකතුමනි, මේ ව්‍යාපෘතිය ආරම්භ කරන්න අපට සිද්ධ වෙන්නේ.

**ගරු සුනිල් රත්නසිරි මහතා**
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)

ගරු කථානායකතුමනි, මේ කාරණය පිළිබඳව ඔබතුමාත් හොඳින්ම දැනුවත්ව සිටිනවා. පොළොන්නරුවේ කොටලීය පාලම සහ ගල්ලැල්ල පාලම ඉදි කිරීමේ කටයුතු පසුගිය රජයන් විසින් අතහැර දමලා තිබුණා, ඔවුන්ට මුදල් නැහැ කියන කාරණය පදනම් කරගෙන. නමුත් වසර එකහමාරක් වාගේ කෙටි කාල සීමාවක් තුළ ප්‍රවාහන, මහාමාර්ග අමාත්‍යාංශය විශාල පරිවර්තනයක් සිදුකරලා අද කොටලීය පාලමත් හැදෙනවා; ගල්ලැල්ල පාලමත් හැදෙනවා.

ඒ විතරක් නොවෙයි ගරු කථානායකතුමනි. පොළොන්නරුව ඩිපෝව වසර 54කට පස්සේ කාපට් කරලා ඒ කටයුතු සියල්ල අවසාන කර තිබෙනවා. එළඹෙන සැප්තැම්බර් 03වැනි දා ගරු බිමල් රත්නායක අමාත්‍යතුමා මේ සියල්ල නිරීක්ෂණය කිරීම සිදු

[ගරු සුනිල් රත්නසිරි මහතා]

කරනවා. ඊළඟට, කදුරුවෙල දුම්රිය පොළ යාචකයන් නැවතී සිටින ස්ථානයක් බවට පත් වෙලා තිබුණා; ඉතාම අපිරිසිදු පරිශ්‍රයක් බවට පත් වෙලා තිබුණා. ගරු කථානායකතුමනි, හඳුනා ගත් දුම්රිය පොළවල් නවීකරණය කිරීම යටතේ කදුරුවෙල දුම්රිය පොළ අද ඉතාම ලස්සනට නවීකරණය වෙලා තිබෙනවා, පෞද්ගලික ව්‍යාපාරික මහතෙකුගේ ධන පරිත්‍යාගයෙන්. ඒ පිළිබඳව මා ස්තුතිය ප්‍රකාශ කරනවා.

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දුම්රිය පොළවල් නවීකරණය කළාට දුම්රිය මාර්ගයේ දිග වැඩි කිරීම සඳහා සහ අලුතින් දුම්රිය එන්ජින් කට්ටල රට තුළට ගෙනැල්ලා දුම්රිය ප්‍රවාහන කටයුතු පුළුල් කිරීම සඳහා වැඩ පිළිවෙළක් අමාත්‍යාංශය සතුව තිබෙනවාද?

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)

ගරු කථානායකතුමනි, දුම්රිය මාර්ගයේ දිග වැඩි කිරීම සඳහා අවධානය යොමු වෙලා නැහැ. නමුත් දුම්රිය මාර්ගය ද්විත්ව මාර්ගයක් විධියට දියුණු කිරීමේ වැඩ පිළිවෙළක් යනවා. පොල්ගහවෙල සිට කුරුණෑගල දක්වා ඉදිකිරීම් කටයුතු අපි පටන් ගන්නවා. ඒ වාගේම දුම්රිය එන්ජින් ප්‍රමාණය ගත්තොත්, අපි මේ වෙනකොට power sets පහක් ගන්න ඇණවුම් කරලා ප්‍රසම්පාදන කටයුතු පටන් අරගෙන දැන් ඒ කටයුතු bid evaluation stage එකේ තිබෙන්නේ. අපි හිතනවා, මේ අවුරුද්ද ඇතුළත අපට ඒ කොන්ත්‍රාත්තුව පිරිනමා ගන්න පුළුවන් වෙයි කියලා.

අපි බලාපොරොත්තු වෙනවා, 2027 අය වැයෙන් එන්ජින් කට්ටල පහක් සඳහා මුදල් වෙන් කරගන්න. ඒ වාගේම දෙපැත්තට යන්න පුළුවන් - bidirectional, short distance දුවන්න පුළුවන් දුම්රිය යම් කිසි ප්‍රමාණයක් ඇණවුම් කරන්නත් බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම දැන් අපි මැදිරි තුනකින් යුතු සැහැල්ලු දුම්රිය කට්ටල තුනක් ලංකාවේ එකලස් කරන්න පටන් ගෙන තිබෙනවා. ජුනි 8වැනි දා ලංසු කැඳවීම පටන් අරගෙන ජූලි 1වැනි දා වෙනකොට ලංසු කැඳවීම අවසන් කර තිබෙනවා.

එම ප්‍රසම්පාදනය සඳහා ඉදිරිපත් කළ ලංසු evaluate කරන stage එකේ තිබෙන්නේ. අපි හිතනවා ඉදිරි මාස කිහිපය - මේ අවුරුද්ද - ඇතුළත ඒකත් පිරිනමා ගන්න අපට පුළුවන් වෙයි කියලා. මේ ආකාරයෙන් තමයි අපි අලුතින් දුම්රිය එන්ජින් සහ දුම්රිය ප්‍රමාණය වැඩි කර ගැනීමේ කටයුතු කරගෙන යන්නේ.

## "දිට්වා" සුළි කුණාටුවෙන් පීඩාවට පත් පුත්තලම දිස්ත්‍රික්කයේ ඉස්සන් වගාකරුවන්: වන්දි
### "தித்வா" சூறாவளியால் பாதிக்கப்பட்ட புத்தளம் மாவட்ட இறால் செய்கையாளர்கள்: இழப்பீடு
### PRAWN FARMERS IN PUTTALAM DISTRICT AFFECTED BY CYCLONE "DITWAH": COMPENSATION

2185/2026

**9. ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)

ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් පුත්තලම දිස්ත්‍රික්කයේ ඉස්සන් වගාකරුවන්ට සිදුවූ හානි සම්බන්ධයෙන් වන්දි ලබාදීමේ වැඩ පිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, එම වැඩ පිළිවෙළ කවරේද;

(iii) ඉස්සන් කර්මාන්තය රටට විදේශ විනිමය ගෙන එන ප්‍රධාන කර්මාන්තයක් වන බැවින්, එම කර්මාන්තයේ සංවර්ධනය සඳහා වැඩ පිළිවෙළක් තිබේද;

(iv) එසේ නම්, එම වැඩ පිළිවෙළ කවරේද;

(v) ඉස්සන් වගාකරුවන්ගේ නිෂ්පාදන අපනයනය කිරීමේදී පවතින ගැටලු හඳුනාගෙන තිබේද;

(vi) එසේ නම්, එම ගැටලු විසඳීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ″தித்வா″ சூறாவளி காரணமாக புத்தளம் மாவட்டத்திலுள்ள இறால் செய்கையாளர்களுக்கு ஏற்பட்ட சேதங்களுக்கு இழப்பீடு வழங்குவதற்கு ஏதேனுமொரு வேலைத்திட்டம் உள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி வேலைத்திட்டம் யாது என்பதையும்;

(iii) இறால் தொழிற்றுறை நாட்டுக்கு அந்நியச் செலாவணியை ஈட்டித்தரும் பிரதான தொழிற்றுறைகளில் ஒன்றாக இருப்பதனால், மேற்படி தொழிற்றுறையை முன்னேற்றுவதற்கான வேலைத்திட்டமொன்று உள்ளதா என்பதையும்;

(iv) ஆமெனில், மேற்படி வேலைத்திட்டம் யாது என்பதையும்;

(v) இறால் செய்கையாளர்களின் உற்பத்திகளை ஏற்றுமதி செய்வதில் நிலவும் பிரச்சினைகள் இனங்காணப்பட்டுள்ளனவா என்பதையும்;

(vi) ஆமெனில், மேற்படி பிரச்சினைகளுக்குத் தீர்வு காண்பதற்காக மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries, Aquatic and Ocean Resources:

(a) Will he inform this House -

(i) whether there is a programme to provide compensation to prawn farmers in the Puttalam District for the damages caused by Cyclone "Ditwah";

(ii) if so, the said programme;

(iii) whether there is a programme for the development of prawn industry, since it is a major industry that generates foreign exchange to the country;

(iv) if so, the said programme;

(v) whether the problems encountered in exporting the products of prawn farmers have been identified; and

(vi) if so, the measures that have been taken to resolve the said problems?

(b) If not, why?

**ගරු රත්න ගමගේ මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரத்ன கமகே - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Rathna Gamage - Deputy Minister of Fisheries, Aquatic and Ocean Resources)

ගරු කථානායකතුමනි, ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් පුත්තලම දිස්ත්‍රික්කයේ ඉස්සන් වගාකරුවන්හට සිදු වූ හානිය සඳහා වන්දි මුදල් ලබා දීම සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කර ඇති අතර, මේ වනවිට කුඩා පරිමාණ නිෂ්පාදන ඒකක 316ක් සඳහා රුපියල් මිලියන 125.2ක වන්දි මුදල් ලබා දී ඇත. මධ්‍යම පරිමාණ නිෂ්පාදන ඒකක සඳහා වන්දි මුදල් ලබා දීමේ කටයුතු මේ වනවිටත් සිදු කරමින් පවතී.

(iii) ඔව්.

(iv)
- ඉස්සන් අභිජනනාගාර සහ ගොවිපළ රෝග හඳුනා ගැනීම සහ පාලනය කිරීම සඳහා පුත්තලම, කිලිනොච්චිය සහ මඩකලපුව යන වෙරළබඩ ජලජීවී වගා ව්‍යාප්ති හා අධීක්ෂණ ඒකක ස්ථාපිත කර ඇත.
- ඉස්සන් නිෂ්පාදනය සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා දීම සහ යහපත් කළමනාකරණ වගා පිළිවෙත් යාවත්කාලීන කර ඇති අතර, එම පිළිවෙත් අනුගමනය කරමින් වගාව සිදු කරන ආකාරය පිළිබඳව වගාකරුවන් දැනුවත් කිරීම් කටයුතු සිදු කිරීම.
- ඉස්සන් කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා මඩකලපුව සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කයන්හි සුදුසු ඉඩම් හඳුනා ගෙන එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් පවතී.
- ඉස්සන් කර්මාන්තය වෙනුවෙන් Shrimp Industry Information System - SIIS - දත්ත පද්ධතියක් සකස් කර ඉස්සන් කර්මාන්තයේ දත්ත යාවත්කාලීන කරමින් පවතී.
- ජලජීවී වගා කළමනාකරණ බලපත්‍ර මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ නිකුත් කිරීමට කටයුතු කරමින් පවතී. මෙමඟින් ජලජීවී වගා කළමනාකරණ බලපත්‍ර කඩිනමින් නිකුත් කිරීමට සැලසුම් කර ඇත.

(v) ඔව්.

(vi) ඉස්සන් සඳහා දේශීය වෙළෙඳ පොළේ හොඳ මිලක් ලැබීම හේතුවෙන් අපනයනය නොකොට නිෂ්පාදනය දේශීය වෙළෙඳ පොළට ඉදිරිපත් කිරීමට යොමු වී තිබීම අපනයනයට ප්‍රධාන අභියෝගයකි. දේශීය පරිභෝජනය සඳහා වසරකට ඉස්සන් මෙට්‍රික්ටොන් 9,000ක් පමණ අවශ්‍ය වන අතර, මෙම ප්‍රමාණය ඉක්මවා නිෂ්පාදනය වැඩි කිරීම තුළින් අපනයනය ද වැඩි වේ යැයි අපේක්ෂා කරමි.

තවද, SPF *P. Monodon* සඳහා දේශීය වෙළෙඳ පොළේ වැඩි ඉල්ලුමක් පවතින නිසා එම ඉස්සන් නිෂ්පාදනය වැඩි කිරීමට කටයුතු කර ඇත. මෙතෙක් SPF *P. Monodon* ඉස්සන් අභිජනනාගාර එකක් පමණක් පැවති අතර, මේ වනවිට තවත් එක් අභිජනනාගාරයක් සඳහා ද අවසර ලබා දී ඇත.

ඉහත කරුණුවලට අමතරව දේශීය නිෂ්පාදනය වැඩි කිරීම සඳහා පහත ක්‍රියාමාර්ග ද ගෙන ඇත.

- සූර්ය බලශක්තිය වැනි විකල්ප පුනර්ජනනීය බලශක්ති ක්‍රම භාවිත කිරීම මඟින් ඉස්සන් නිෂ්පාදනයේ වියදම අඩු කර ගැනීමට වගාකරුවන් දැනුවත් කිරීම.
- ජෛව ආරක්ෂණ ක්‍රමවේදය හා රෝග පාලනය සම්බන්ධයෙන් අධීක්ෂණ කටයුතු කාර්යක්ෂම කර පවත්වා ගෙන යෑම.
- ඉස්සන් කර්මාන්තය වෙනුවෙන් Shrimp Industry Information System - SIIS - දත්ත පද්ධතියක් සකස් කර ඉස්සන් කර්මාන්තයේ දත්ත හා තොරතුරු පාර්ශ්වකරුවන් අතර හුවමාරු කර ගැනීමට කටයුතු කිරීම.

(ආ) අදාළ නොවේ.

**ගරු අජිත් අගලකඩ මහතා**
(மாண்புமிகு அஜித் அகலகட)
(The Hon. Ajith Agalakada)

ගරු කථානායකතුමනි, මා ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් අසන පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

මා මුලින්ම ස්තුතිවන්ත වෙනවා, ගරු අමාත්‍යතුමාටත්, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාටත්, අමාත්‍යාංශයේ නිලධාරින්ටත්, ඉස්සන් කර්මාන්තයට ආපදා තත්ත්වයකදී වෙච්ච බරපතළ හානියක් වෙනුවෙන් ඉතිහාසයේ පළමු වතාවට විශාල මුදලක් වෙන් කිරීම ගැන. ඒක ශක්තියක් වෙලා තිබෙනවා, ඉස්සන් කර්මාන්තය ඉදිරියට ගෙන යන්න. නමුත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, අපේ දිස්ත්‍රික්කයට සහ ඉස්සන් කර්මාන්තය සිදු කරන සෑම දිස්ත්‍රික්කයකටම බලපාන ගැටලුවක් තිබෙනවා. ඒ තමයි, ඉස්සන් කර්මාන්තයට රෝග දෙකක් බලපා තිබීම. ඒ නිසා අපේ රටේ ඉස්සන් කර්මාන්තය යම් යම් අවස්ථාවල බිඳ වැටෙනවා. එම රෝගවලින් එකක් තමයි, "සුදු පුල්ලි" රෝගය - White Spot Syndrome. එය විශාල බලපෑමක් වෙලා තිබෙනවා, එම කර්මාන්තය ඉදිරියට පවත්වාගෙන යෑමට. ඒ වාගේම, "සුදු බෙටි" - EHP - රෝගයත් බලපා තිබෙනවා. ඉස්සන් කර්මාන්තය අපේ රටට ඩොලර් ගෙනෙන කර්මාන්තයක්. හැබැයි, අඛණ්ඩව ඒ සැපයුම දෙන්න අපට බැරි වෙලා තිබෙනවා, මෙන්න මේ කියපු රෝග දෙක නිසා. මේවා එම කර්මාන්තය බරපතළ ලෙස බිඳ වැටීමට හේතුවක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ රෝග පාලනය කරගෙන මේ කර්මාන්තය මෙතැනින් එහාට රැක ගන්න ඔබතුමන්ලා ගෙන තිබෙන ක්‍රියාමාර්ගය සහ වැඩ පිළිවෙළ කුමක්ද කියා දැනගන්න කැමැතියි.

**ගරු රත්න ගමගේ මහතා**
(மாண்புமிகு ரத்ன கமகே)
(The Hon. Rathna Gamage)

ගරු කථානායකතුමනි, ගරු අජිත් ගිහාන් මන්ත්‍රීතුමා සඳහන් කරපු ඒ රෝග දෙක පැතිරෙන්නේ ජලය අපවිත්‍ර වූ විටයි. අපි දිගින් දිගටම මේ පිළිබඳව feasibility study එකක් කළා. අපට ආපු වාර්තාවල තිබෙන්නේ ජලය අපවිත්‍ර වීමේ හේතුවෙන් මේ තත්ත්වය ඇති වෙනවා කියලායි. එම නිසා අපි ඒ ගැටලුව නිරාකරණය වෙනුවෙන් 2026/2027 වර්ෂ සඳහා රුපියල් මිලියන 3,845.7ක මුදලක් වෙන් කළා. එහෙම වෙන් කළේ, මුහුදු ජලය පොම්ප කර ගොඩබිම පැත්තට ගන්නත්, අනෙක් පැත්තෙන් fresh water එක් කර ගන්නත්. එතකොට sea water සහ fresh water මිශ්‍ර කරලා අපට පුළුවන් අවශ්‍ය පරිදි ලවණතාව සකස් කර ගන්න. ඉස්සන් වගාවට අවශ්‍ය ලවණතාව සකස් කරලා එම කර්මාන්තය හොඳින් කරගෙන යන්න දැන් කටයුතු කර තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා, අපි ඒ වෙනුවෙන් රුපියල් මිලියන 3,845.7ක්, ඒ කියන්නේ රුපියල් බිලියන 4කට ආසන්න ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා.

[ගරු රත්න ගමගේ මහතා]

ඒ වාගේම ඉස්සන් නිෂ්පාදනයේ අඩුවක් අපි දැක්කා, ගරු මන්ත්‍රීතුමනි. පසුගිය දවස්වල අපි අදාළ නිලධාරින් අපේ අමාත්‍යාංශයට කැඳවපු වෙලාවේ අපට ඒ සම්බන්ධයෙන් තොරතුරු ලැබුණා. ඒ නිසා ඒ සම්බන්ධයෙන් නැවත feasibility study එකක් කරන්න අපි තවත් රුපියල් මිලියන 100ක් වෙන් කළා.

ඒ වාගේම, ඉස්සන් අපනයනකරුවන්ගේත් ගැටලු තිබුණා. ඉස්සන් අපනයනකරුවන්ගේ ගැටලු සම්බන්ධයෙන් කථා කරන්න අපි ගරු මුදල් නියෝජ්‍ය අමාත්‍යතුමා සමඟ ඉදිරියේදී සාකච්ඡාවක් යොදාගෙන තිබෙනවා. එහිදී අපි අදහස් කරනවා, ඉස්සන් අපනයනකරුවන් මුහුණ දී තිබෙන ප්‍රශ්න ගැනත් සාකච්ඡා කරන්න. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා වාගේම "දිට්වා" සුළි කුණාටුවෙන් පස්සේ අපි ඒ අය වෙනුවෙන් මේ විධියේ මුදලක් - ඉතිහාසයේ වැඩිම මුදල - වෙන් කළා. ඔබතුමා සඳහන් කළ රෝග දෙක මැඩ පැවැත්වීමට අදාළවත් රුපියල් බිලියන 4ක මුදලක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම, ඉස්සන් කර්මාන්තයේ බිඳ වැටීම සම්බන්ධව ශක්‍යතා අධ්‍යයනයක් කරන්න රුපියල් මිලියන 100ක් වෙන් කර තිබෙනවා. ඊට අමතරව, ඒ අය මුහුණ දීලා තිබෙන ගැටලු - බදු ගැටලු වෙන්න පුළුවන්, නිෂ්පාදන ගැටලු වෙන්න පුළුවන් - පිළිබඳව සාකච්ඡා කරන්න ගරු මුදල් නියෝජ්‍ය ඇමතිතුමා සමඟ සාකච්ඡාවක් ලබා දීලා තිබෙනවා. ඒ අනුව මැත කාලීනව ඉස්සන් කර්මාන්තයේ නියුතු අයට වැඩිම සැලකිල්ලක් දැක්වූයේ අපේ රජයයි කියා අපි විශ්වාස කරනවා.

**ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මේ දිනවල විශේෂයෙන්ම කථා බහට ලක් වෙනවා, ඒ වාගේම අද උදෑසනත් මාධ්‍ය තුළින් වාර්තා වුණා, අපේ මත්ස්‍ය නිෂ්පාදනය - මත්ස්‍ය සම්පත - අඩු වෙලා තිබෙනවා කියලා; මත්ස්‍ය ගහනය අඩු වෙලා තිබෙනවා කියලා; අවශ්‍යතාවට අදාළව මත්ස්‍ය සම්පත රටට එන්නේ නැහැ කියලා. ඒක ඇත්තක්ද? එහෙම නැත්නම්, මේ එල් නිනෝ තත්ත්වය අපේ රටේ මත්ස්‍ය නිෂ්පාදනය වැඩි වීමට හෝ අඩු වීමට බලපා තිබෙනවාද? එහෙම තත්ත්වයක් ගැන ඔබතුමන්ලාට අවබෝධයක් තිබෙනවාද? එහෙම ගැටලුවක් බලපා තිබෙනවාද කියා මම දැන ගන්න කැමැතියි.

**ගරු රත්න ගමගේ මහතා**
(மாண்புமிகு ரத்ன கமகே)
(The Hon. Rathna Gamage)

ගරු කථානායකතුමනි, ගරු අජිත් ගිහාන් මන්ත්‍රීතුමා ඒ ප්‍රශ්නය අහන කොට මට මතක් වුණේ, විරහ වේදනාව විඳින කොට තරුණ පෙම්වතුන්ගෙන් අහන, "මුහුදේ එක මාළුවාද ඉන්නේ?" කියන ප්‍රශ්නය. ඒත්, ඇත්තටම මම අද උදේත් මාධ්‍යවලින් දැක්කා, මුහුදේ මාළු නැහැ කියලා කථාවක් කියනවා. ධීවරයින් සහ එක එක සංවිධාන එවැන්නක් ප්‍රකාශ කරනවා. "මුහුදේ ඉන්නේ එක මාළුවාද?" කියලා ඉස්සර කාලයේ විරහ වේදනාව විඳින පෙම්වතුන්ගෙන් ඇහුවාට, මුහුදේ මාළු අඩුයි කියන කථාවේත් මොකක්දෝ ඇත්තක් තිබෙනවා වාගේ නේද? මේ පිළිබඳව අපට ලැබෙන තොරතුරු අනුව එසේ වන්නේ එල් නිනෝ තත්ත්වයේ බලපෑම නිසාද කියන ප්‍රශ්නයත් තිබෙනවා. ඒ වාගේම සාගරය සම්බන්ධව ලෝක ප්‍රවණතාවකුත් තිබෙනවා. ඒ කියන්නේ, සාගරයේ ජලජ ශාක, ඇල්ගී ප්‍රමාණයේ - ප්ලවාංග ප්‍රමාණයේ - හිඟයක් තිබෙනවා. ප්ලවාංග ප්‍රමාණය තිබුණොත් තමයි සූර්යාලෝකය ලැබෙන විට කාබන්ඩයොක්සයිඩ් වායුව මගින් ප්‍රභාසංශ්ලේෂණ ක්‍රියාවලිය සිද්ධ වෙන්නේ. ප්‍රභාසංශ්ලේෂණ ක්‍රියාවලිය අඩු වන කොට මත්ස්‍යයන්ට සුදුසු වාසස්ථාන ගොඩනැඟෙන්නේ නැහැ. ඒ නිසා මත්ස්‍ය ගහනයේ හිඟතාවක් තිබෙනවා. ඊට අමතරව, සාගර ජලය දූෂණය වීම නිසා ඇති වන තත්ත්වයකුත් තිබෙනවා. තවත් එක් හේතුවක් තිබෙනවා. එය තමයි, අපේ ධීවර ප්‍රජාව භාවිත කරන පන්න ක්‍රම.

සමහර පන්න ක්‍රම ගැළපෙන්නේ නැහැ. ඒ වාගේම, පන්න ක්‍රම ක්‍රියාත්මක කිරීමේදී discipline නැතුව කටයුතු කරනවා නේ. ඒ discipline රකින්නේ නැති ප්‍රශ්න තිබෙනවා. ඒ හින්දා අපි නීතිය ක්‍රියාත්මක කරනවා. සමහර තැන්වල ඩයිනමයිට් ගහනවා. එතකොට පළාතම විනාශයි. කුඩා මාළුවාගේ ඉඳලා විනාශ වෙලා යනවා. ඒ මාළු ලොකු වෙන කොට නේ, කිලෝ ගණනක් බර වෙන්නේ. පසුගිය දවස්වල අපි NARA ආයතනය සමඟ පර්යේෂණයක් කළා. එහිදී දැන ගත්තා, බර කිලෝ 10ක් දක්වා වැඩෙන්න පුළුවන් බල පැටව් ගෑම් 200, 300 කාලයේදීම විනාශ වෙලා යන බව. Light-coarse fishingවලදීත් උන් හසු වෙනවා. මත්ස්‍ය ගහනය අඩු වීමට මේකත් එක හේතුවක්. මේ විධියේ ක්‍රමවේද හින්දා අපි විශේෂයෙන්ම NARA ආයතනයත් එක්ක මේ පිළිබඳව සාකච්ඡා කරලා නීති විරෝධී පන්න ක්‍රම නතර කිරීමට අදාළව නීතිය ක්‍රියාත්මක කරන්නේ කොහොමද කියන එක ගැන විශේෂයෙන්ම පොලිස්පතිතුමා, නාවික හමුදාපතිතුමා මේ පාර්ලිමේන්තු සංකීර්ණයට කැඳවා සාකච්ඡා කළා. අපි නීතිය ක්‍රියාත්මක කරනවා.

ඊළඟට, එල් නිනෝ තත්ත්වය සම්බන්ධයෙනුත් කියන්න ඕනෑ. එහිදී සිදු වන දේ බොහොම පැහැදිලියි, ගරු කථානායකතුමනි. ගෝලීය උෂ්ණත්වය වැඩි වන කොට මොකද වෙන්නේ? සාමාන්‍යයෙන් ජල පෘෂ්ඨයයි, වායු පෘෂ්ඨයයි ගත්තොත්, වායු පෘෂ්ඨයේ ඝනත්වය වැඩියි. ඝනත්වය වැඩි වුණාම සූර්යයාගෙන් ලැබෙන ආලෝකයත් එක්ක ජල පෘෂ්ඨයට සංවහනයක් නොවෙයි සංනයනයක් වෙන්නේ. ජල පෘෂ්ඨයට තාපය ආසන්න වන කොට අධික තාපයක් තිබෙන මතුපිට පෘෂ්ඨය ආසන්නයේ සිටින මත්ස්‍ය ගහනවලට එය දරා ගන්න බැරි වෙනවා. සාමාන්‍යයෙන් මත්ස්‍යයන්ට තිබෙන්නේ සියුම් සමක්. ඒ නිසා මත්ස්‍ය සමට අධික තාපය දරා ගන්න බැහැ. ඒ හේතුවෙන් මත්ස්‍ය ගහන බොහෝ දුරට සාගරයේ ගැඹුරට යනවා. සාගර ගැඹුරට යන නිසා මත්ස්‍ය ගහනවල පිහිටීම වෙනස් වෙලා තිබෙනවා. එම නිසා සාම්ප්‍රදායිකව අපේ ධීවරයන් නෙළාගෙන එන මාළු අස්වැන්නේ අඩුවක් තිබෙනවා. අපි ඒක පිළිගෙන තිබෙනවා. ගරු අජිත් ගිහාන් මන්ත්‍රීතුමනි, එම නිසා මත්ස්‍ය ගහනවල අඩුවක් තිබේද, මත්ස්‍ය ගහනවල පිහිටීම වෙනස් වෙලා තිබේද, ඇයි එහෙම වෙලා තිබෙන්නේ, මේ තත්ත්වය වළක්වා ගන්නේ කොහොමද කියන කාරණා ගැන ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් ලබා දීමේ කටයුත්ත මමත්, ගරු ඇමතිතුමාත් NARA ආයතනයට භාර දුන්නා. ඒ සම්බන්ධයෙන් වන ශක්‍යතා අධ්‍යයන වාර්තාව NARA ආයතනය අද සවස් වරුවේ අමාත්‍යාංශයේ ලේකම්තුමාට ලබා දෙනවා. මත්ස්‍ය හිඟයක් තිබේද, ඇයි හිඟ වෙන්න හේතුව, ඒ සඳහා තිබෙන පිළියම් මොනවාද, ඒ සඳහා ඉදිරියේදී ගත යුතු පියවර කුමක්ද කියන එක සම්බන්ධයෙන් එතැන් සිට කටයුතු කරන්න අපි සූදානම්.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මගේ point of Order එක මෙයයි. මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන කොට මිනිත්තු 3ක් ගිය අවස්ථාවේ ඔබතුමා කිව්වා, "ඉක්මන් කරන්න" කියලා. නමුත්, මේ අතුරු ප්‍රශ්නයට පිළිතුරු දෙන්න මිනිත්තු 11යි, තත්පර 35ක් ගත වුණා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒ කාලය අතුරු ප්‍රශ්න ඇසීම සඳහා පමණයි. පිළිතුරු දීමේදී නොවෙයි. ඒ නිසා එය point of Order එකක් නොවෙයි. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්නයක් අහන්න උපරිමව ලබා දෙන්න පුළුවන් විනාඩි 2යි. ඒ නිසා එතැන point of Order එකක් නැහැ. ඔබතුමා කරුණාකර අසුන් ගන්න.

## විදුහල්පතිවරුන් ලෙස සේවය කරන නිලධාරීන්: දීමනා සහ උසස්වීම්
## அதிபர்களாகச் சேவையாற்றும் உத்தியோகத்தர்கள்: கொடுப்பனவுகளும் பதவியுயர்வுகளும்
## OFFICERS SERVING AS PRINCIPALS: ALLOWANCES AND PROMOTIONS

2191/2026

**10. ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)
අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මෙරට පාසල් පද්ධතියේ විදුහල්පතිවරුන් ලෙස සේවය කරන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට, ශ්‍රී ලංකා විදුහල්පති සේවයට සහ ශ්‍රී ලංකා ගුරු සේවයට අයත් නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) විදුහල්පතිවරයෙකු ලෙස කටයුතු කිරීමේදී ඉහත සේවා 3ට අයත් නිලධාරීන්ට වැටුපට අමතරව හිමි වන දීමනා එක් එක් සේවාව අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට අයත් නිලධාරීන්ගේ උසස්වීම් සඳහා ජාතික පාසලක විදුහල්පතිවරයෙකු ලෙස සේවය කිරීම අත්‍යවශ්‍ය වන්නේද;

(iv) එසේ නම්, එලෙස සේවය කළ යුතු කාල සීමාව කොපමණද;

(v) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියට පත් වන නිලධාරියෙකු II ශ්‍රේණියට සහ I ශ්‍රේණියට උසස්වීම සඳහා ගත වන කාලය කොපමණද;

(vi) එම උසස්වීම් සඳහා එම නිලධාරීන් විසින් සම්පූර්ණ කළ යුතු සුදුසුකම් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) இந்நாட்டின் பாடசாலைக் கட்டமைப்பில் அதிபர்களாகச் சேவையாற்றும் இலங்கை கல்வி நிருவாக சேவை, இலங்கை அதிபர் சேவை, இலங்கை ஆசிரியர் சேவையைச் சார்ந்த உத்தியோகத்தர்களின் எண்ணிக்கை வெவ் வேறாக யாது என்பதையும்;

(ii) மேற்படி 03 சேவைகளைச் சார்ந்த உத்தியோகத்தர்கள், அதிபர்களாகச் சேவையாற்றும்போது, அவர்கள் பெறும் சம்பளத்துக்கு மேலதிகமாக அவர்களுக்கு உரித்தாகும் கொடுப்பனவுகள், ஒவ்வொரு சேவைக்கேற்ப வெவ்வேறாக யாவை என்பதையும்;

(iii) இலங்கை கல்வி நிருவாக சேவை உத்தியோகத்தர்கள் பதவியுயர்வு பெறும் பொருட்டு, தேசிய பாடசாலையொன்றின் அதிபராகச் சேவையாற்றியிருப்பது கட்டாயமானதா என்பதையும்;

(iv) ஆமெனில், அவ்வாறு சேவையாற்றவேண்டிய கால வரையறை யாது என்பதையும்;

(v) இலங்கை அதிபர் சேவையின் தரம் IIIக்கு நியமனம்பெறும் ஓர் உத்தியோகத்தர் தரம் IIக்கும், தரம் Iக்கும் பதவியுயர்வு பெறுவதற்கு எவ்வளவு காலம் எடுக்கும் என்பதையும்;

(vi) மேற்படி பதவியுயர்வுகளைப் பெறுவதற்காக மேற்படி உத்தியோகத்தர்கள் கொண்டிருக்க வேண்டிய தகைமைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) the number of officers serving as principals in the school system of the country, who belong to the Sri Lanka Educational Administrative Service, the Sri Lanka Principals' Service and the Sri Lanka Teachers' Service, separately;

(ii) the allowances payable to officers of each of the above three services in addition to their salary while serving as principals, stated separately for each service;

(iii) whether it is mandatory for officers belonging to the Sri Lanka Educational Administrative Service to have served as a principal of a National School to become eligible for promotions;

(iv) if so, that period of service;

(v) the period of time taken for an officer appointed to Grade III of the Sri Lanka Principals' Service to be promoted to Grade II and Grade I; and

(vi) the required qualifications that be fulfilled by such officers to become eligible for the said promotions?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මෙරට පාසල් පද්ධතියේ ජාතික හා පළාත් පාසල්වල ස්ථිර විදුහල්පති තනතුරේ රාජකාරි කරන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ, ශ්‍රී

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

ලංකා විදුහල්පති සේවයේ හා ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරින් පිළිබඳ තොරතුරු පහත දක්වා ඇත.

| ස්ථිර විදුහල්පති තනතුරේ සිටින නිලධාරීන්ට අයත් සේවය | ජාතික පාසල් සේවයේ නියුතු සංඛ්‍යාව | පළාත් පාසල් සේවයේ නියුතු සංඛ්‍යාව | මුළු සංඛ්‍යාව |
|---|---|---|---|
| ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය | 133 | 27 | 160 |
| ශ්‍රී ලංකා විදුහල්පති සේවය | 139 | 7,125 | 7,264 |
| ශ්‍රී ලංකා ගුරු සේවය (වැඩ බලන විදුහල්පතිවරුන් ලෙස සේවය කළද නිත්‍ය සේවය ගුරු සේවය වන නිලධාරින්) | - | 2,494 | 2,494 (2024.04.30 දිනට) |

(ii) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ පත්වීම් බලධරයා විසින් පාසලක ස්ථිර විදුහල්පති තනතුරට විධිමත් ලෙස පත් කර ඇති ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරින් සඳහා පහත පරිදි විදුහල්පති දීමනාව ගෙවනු ලැබේ.

| පාසල් වර්ගය | දීමනාව (රුපියල්) |
|---|---|
| I AB | 8,000 |
| I C | 5,500 |
| 2 වර්ගය | 4,500 |
| 3 වර්ගය | 4,000 |

- එමෙන්ම දුෂ්කර හා අතිදුෂ්කර පාසල්වල සේවය කරන විදුහල්පතිවරුන් සඳහා දුෂ්කර දීමනාව ගෙවනු ලැබේ.
- ජාතික පාසල්වල ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරින් වෙත වැටුපට අමතරව හිමි වන දීමනා පහත පරිදි වේ.

| අනු අංකය | විදුහල්පති තනතුරට අනුමත සේවය හා ශ්‍රේණිය | වැටුප් හා සාමාන්‍ය දීමනාවලට අමතරව විදුහල්පති තනතුර සඳහා ලැබෙන දීමනා. |
|---|---|---|
| 01 | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය I ශ්‍රේණිය | ඉන්ධන දීමනාව ප්‍රවාහන දීමනාව විශේෂ දීමනාව} විදුහල්පති දීමනාව} මෙම මුදල රුපියල් 25,000.00 උපරිමයකට යටත්ව (රා.ප.ව. 18/2015(v) ) |
| 02 | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය II/III ශ්‍රේණිය | විශේෂ දීමනාව} විදුහල්පති දීමනාව } මෙම මුදල රුපියල් 25,000.00 උපරිමයකට යටත්ව (රා.ප.ව. 18/2015(v) ) |

(iii) අංක 2141/6 හා 2019.09.16 දිනැති ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථාවේ 2 වන සංශෝධනයේ 10.1.1. වගන්තිය අනුව ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියේ නිලධාරින් වසර 06ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව II ශ්‍රේණියටත්, 10.2.1. වගන්තිය අනුව ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් II ශ්‍රේණියේ වසර 06ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව I ශ්‍රේණියටත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් උසස් කරනු ලැබේ. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා අධ්‍යාපන රිපාලන සේවයේ නිලධාරින්ගේ උසස්වීම් සඳහා ජාතික පාසලක විදුහල්පතිවරයෙකු ලෙස සේවය කිරීම අත්‍යවශ්‍ය නොවේ.

(iv) අදාළ නොවේ.

(v) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියට පත්වන නිලධාරියෙකු II ශ්‍රේණියට උසස්වීම සඳහා ගතවන කාලය වසර 06ක් වන අතර, එම නිලධාරියා II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස්වීම සඳහා ගත වන කාලය වසර 06ක් වේ.

(vi) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියට පත්වන නිලධාරියෙකු II ශ්‍රේණියට උසස්වීම සඳහා පහත සුදුසුකම් සපුරාලිය යුතු වේ.

- සේවයේ ස්ථිර කර තිබීම
- උසස් කිරීම් සඳහා සුදුසුකම් ලබන දිනට සේවයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර 06ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු අතර, වැටුප් වර්ධක 06ක් උපයාගෙන තිබීම.
- නියමිත දිනට 1වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.
- අනෙක් රාජ්‍ය භාෂාව සමත්ව තිබීම.
- සන්ධාන භාෂාව සමත්ව තිබීම
- අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර 06 තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම
- රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 අනුව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.
- ධාරිතා සංවර්ධන පුහුණු පාඨමාලාව 1 සමත් වී තිබීම.

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ II ශ්‍රේණියේ නිලධාරියෙකු I ශ්‍රේණියට උසස්වීම සඳහා පහත සුදුසුකම් සපුරාලිය යුතු වේ.

- උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට සේවයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර 06ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු අතර, වැටුප් වර්ධක හය 06ක් උපයා ගෙන තිබීම.
- නියමිත දිනට 2වන කාර්යක්ෂමතා ඉඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.
- අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර 06 තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
- රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 අනුව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.
- උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට අවම වශයෙන් පහත සඳහන් එක් සුදුසුකමක් හෝ සම්පූර්ණ කර තිබීම.
  - පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව (PGDE)
  - අධ්‍යාපනවේදී උපාධිය (B.Ed)
  - පාසල් කළමනාකරණ ඩිප්ලෝමාව (DSM)
  - පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමාව (PGDEM)

ධාරිතා සංවර්ධන පුහුණු පාඨමාලාව 2 සමත් වී තිබීම.

(ආ) අදාළ නොවේ.

**ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)

ගරු කථානායකතුමනි, මගේ ප්‍රශ්නයට ඉතා පැහැදිලි, විස්තරාත්මක පිළිතුරක් ලබා දීම පිළිබඳව ගරු අගමැතිතුමියට ස්තුතිවන්ත වෙනවා.

මගේ පළමුවන අතුරු ප්‍රශ්නය වෙන්නේ මෙයයි. ගරු අග්‍රාමාත්‍යතුමිය ලබා දුන් පිළිතුරට අනුව, ශ්‍රී ලංකාවේ පාසල්වලට විදුහල්පතිවරුන් ලෙස සේවය කිරීම සඳහා තෝරා පත් කර ගනු ලබන්නේ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සහ ගුරු සේවයේ ඉන්න සුදුසුකම් ලත් නිලධාරින්. මෙහිදී ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරින් වාගේම ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරින් විදුහල්පතිවරුන් ලෙස තෝරා පත් කිරීමේ දී මූලිකවම සලකා බලනු ලබන්නේ ඔවුන් සතු අධ්‍යාපන සුදුසුකම් - paper qualifications. ගරු අගමැතිතුමියනි, සමහර අවස්ථාවල මෙවැනි පත් කිරීම් කරනකොට යම් යම් ගැටලු ඇති වෙන බව අපි දැකලා තිබෙනවා.

ගරු අගමැතිතුමියනි, ඔබතුමිය ලබා දුන් පිළිතුරෙහි සඳහන් කරුණු අනුව කියනවා නම්, සාමාන්‍යයෙන් ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරියෙක් ගුරු සේවයේ ඉඳලා විදුහල්පති සේවයට එනවා. ඒ විදුහල්පති සේවයට එන ගුරුවරයා IIIවන ශ්‍රේණියේ සිට IIවන ශ්‍රේණියටත්, ඉන්පසු Iවන ශ්‍රේණිය දක්වාත් උසස් වීමට වසර 12ක කාලයක් ගත වෙනවා. ඒ ගත කරන කාලය තුළ විදුහල්පතිවරයෙක්, නියෝජ්‍ය විදුහල්පතිවරයෙක් වශයෙන් ඔහු සැලකිය යුතු අත්දැකීම් ප්‍රමාණයක් ලබා ගන්නවා.

මම ගරු අගමැතිතුමියගෙන් අහන පළමු අතුරු ප්‍රශ්නය මෙයයි. පාසල්වලට විදුහල්පතිවරුන් තෝරා පත් කර ගැනීමේදී මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් වෙනත් කාර්යසාධන දර්ශක මත පදනම් වෙච්ච කරුණු ඉදිරියේ දී සලකා බැලීමට අපේක්ෂා කරනවාද? විදුහල්පතිවරයෙක් සතු විය යුතු මූලික කාරණා තමයි මානව සම්පත් කළමනාකරණය. ඒ වාගේම විදුහල්පතිවරයෙකු ලෙස කටයුතු කිරීමේ දී ඒ පාසල සංවර්ධනය කරා ගෙන ගිය ස්වභාවය සහ ඒ ඉතිහාසය පිළිබඳ කරුණු ඇතුළු කාර්යසාධක දර්ශක සලකා බැලීමට අපේක්ෂා කරනවාද කියන එක මම දැනගන්න කැමතියි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, විදුහල්පතිවරු පත් කිරීම සෑහෙන කාලයක සිට විධිමත් විධියට සිද්ධ වෙලා නැහැ.

ඒ නිසාම අපි මේ වෙලාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව එක්කත් කථා කරමින්, මේ කටයුතු පිළිවෙළක් කිරීම සහ විධිමත් කිරීම සඳහා සාකච්ඡා ආරම්භ කර තිබෙනවා. ඒ වාගේම සාමාන්‍ය අධ්‍යාපනයේ කරන ප්‍රතිසංස්කරණ තුළ මානව සම්පත් කළමනාකරණ කියන කුලුන යටතේ දැනට පවතින ක්‍රමය සමාලෝචනය කරලා, ඒ circulars සියල්ල සමාලෝචනය කරලා, කමිටුවක් හරහා ගරු මන්ත්‍රීතුමා කියපු විධියට විශේෂයෙන්ම විදුහල්පතිවරු පත් කිරීමේදී paper qualificationsවලට එහා ගිහිල්ලා වෙනත් කරුණු බැලිය යුතුයි කියන එකට අපිත් එකඟ වෙනවා. ඒ කටයුත්ත විධිමත් කිරීම සඳහා දැනට පවතින ක්‍රමය අධ්‍යයනය කරලා, සමාලෝචනය කරලා, රාජ්‍ය සේවා කොමිසමත් එක්ක සාකච්ඡා කරලා මේ තත්ත්වය වෙනස් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)

ගරු අග්‍රාමාත්‍යතුමියනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

දැන් නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරන්න ආරම්භ කරලා තිබෙනවා. ඒ පිළිබඳව ලොකු ප්‍රසාදයක් රට ඇතුළේ තිබෙනවා, ගරු අගමැතිතුමියනි. එතැනදී විදුහල්පතිවරයාගේ භූමිකාවට ඉතා වැදගත් තැනක් ලැබෙනවා. විශේෂයෙන්ම ගත්තොත්, නව අධ්‍යාපන ප්‍රවණතා එක්ක තාක්ෂණික දැනුම සහ තාක්ෂණික මෙවලම් භාවිතය, පාසල් ඇතුළේ මානව සම්පත් කළමනාකරණය, පාසල් ඇතුළේ විනය පවත්වා ගෙන යෑම සහ ලෝකයේ තිබෙන ගෝලීය සහ සමාජයීය ප්‍රවණතා එක්ක විදුහල්පති භූමිකාව බල ගැන්වීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය පැත්තෙන් ඔබතුමියලා අරගෙන තිබෙන සහ ගැනීමට අපේක්ෂා කරන පියවර මොනවාද කියලා දැන ගැනීමට කැමැතියි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, අපි පුහුණු වැඩසටහන් ගණනාවක් සංවිධාන කරමින් යනවා. ගරු මන්ත්‍රීතුමා කියපු කාරණයට, ඒ ධාරිතා වර්ධනය සිදු විය යුතුයි කියන එකට අපි සම්පූර්ණයෙන්ම එකඟයි. ඒ සඳහා අපි විධිමත් වැඩ පිළිවෙළක් හදලා ඒ වෙනුවෙන් ජාතික අධ්‍යාපන ආයතනය ඇතුළු ආයතන තව ශක්තිමත් කිරීමටත් වැඩ පිළිවෙළක් 2027දී ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයට අදාළ නොවුණත් ඔබතුමාගේ අවසරය ඇතිව මම තවත් කාරණයක් කියන්න ඕනෑ.

ඊයේ මෙතැනදී විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුගෙන් අසත්‍ය කථාවක් කියැවුණා. මේ මාසයේ ගුරුවරුන්ගේ වැටුප් හිමි වෙන්නේ නැහැ කියලා, විදුහල්පතිවරුන්ගේ ප්‍රශ්නයක් එක්ක. ඒ මන්ත්‍රීතුමා යම් කිසි කාරණාවක් ඉදිරිපත් කළා. ඒ ගැනත් කියන්න මම මේක අවස්ථාවක් කර ගන්නවා. ඒක සම්පූර්ණ බොරුවක්. ගුරුවරුන්ගේ වැටුප සම්බන්ධයෙන් කිසිම ප්‍රශ්නයක් නැහැ. ඔවුන්ට නිසි වේලාවට, නිසි විධියට වැටුප් ලැබෙනවා කියන correction එකත් කරන්න මම මේ අවස්ථාව යොදා ගන්නවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දෙවන වටය.

## කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව: කාලගුණ විද්‍යා දත්ත රැස් කිරීම සහ හුවමාරු කිරීම

### வளிமண்டலவியல் திணைக்களம்: வானிலைத் தகவல்களைச் சேகரித்தலும் பரிமாறலும்

### DEPARTMENT OF METEOROLOGY: COLLECTION AND SHARING OF METEOROLOGICAL DATA

369/2025

**1. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු අජිත් පී. පෙරේරා මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு அஜித் பீ. பெரேரா சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Ajith P. Perera)

ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ සේවය කරන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තුව විසින් කාලගුණික තොරතුරු රැස්කරනු ලබන ක්‍රම සහ එක් දිනකදී දත්ත ලබා ගනු ලබන වාර ගණන වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) දෙපාර්තමේන්තුව විසින් ලබා ගන්නා තොරතුරු හුවමාරු කරගනු ලබන ජාත්‍යන්තර ආයතන කවරේද;

(iv) කාලගුණ තොරතුරු ලබා ගැනීම සඳහා භාවිත කරනු ලබන ක්‍රම සහ දත්ත, ජාත්‍යන්තර ආයතන සමඟ හුවමාරු කර ගැනීම ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූල වන්නේද;

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(v) එම දෙපාර්තමේන්තුව වැඩි දියුණු කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வளிமண்டலவியல் திணைக்களத்தில் பணியாற்றும் ஊழியர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி திணைக்களத்தால் வானிலைத் தகவல்கள் சேகரிக்கப்படுகின்ற முறைமைகள் மற்றும் ஒரு நாளில் தரவுகள் பெற்றுக்கொள்ளப்படும் தடவைகளின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(iii) திணைக்களம் தாம் பெற்றுக்கொள்ளும் தகவல்களைப் பரிமாறிக்கொள்ளும் சர்வதேச நிறுவனங்கள் யாவை என்பதையும்;

(iv) வானிலைத் தகவல்களைப் பெறுவதற்காகப் பயன்படுத்தப்படுகின்ற முறைமைகள் மற்றும் தரவுகளை சர்வதேச நிறுவனங்களுடன் பரிமாறிக்கொள்வது சர்வதேச தர நியமங்களுக்கு அமைவாக இடம்பெறுகின்றதா என்பதையும்;

(v) மேற்படி திணைக்களத்தை முன்னேற்றுவதற்காக எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Defence:

(a) Will he inform this House -

(i) the number of employees working at the Department of Meteorology;

(ii) the methods by which the Department collects meteorological information and the number of times such data is collected within a day, separately;

(iii) the names of the international organizations with which the information collected by the Department is shared;

(iv) whether the methods used to collect meteorological information and the data shared with international organizations conform to international standards; and

(v) the steps that will be taken to improve the Department?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) සේවක සංඛ්‍යා තොරතුරු - 2026 අගෝස්තු 04 දිනට අනුමත සේවක සංඛ්‍යාව - 466/දැනට සිටින සේවක සංඛ්‍යාව - 323

| | තනතුර | සේවය | ශ්‍රේණිය / පන්තිය | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු | සටහන් |
|---|---|---|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | | | | | | | |
| 1 | අධ්‍යක්ෂ ජනරාල් | ශ්‍රී.ලං.විද්‍යා.සේ | විශේෂ | 1 | 1 | 0 | |
| 2 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | ශ්‍රී.ලං.විද්‍යා.සේ | විශේෂ | 1 | 0 | 1 | |
| 3 | අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.විද්‍යා.සේ | I | 4 | 4 | 0 | |
| 4 | අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේ | I | 1 | 1 | 0 | |
| 5 | ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ | I | 1 | 1 | 0 | |
| 6 | නියෝජ්‍ය අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.විද්‍යා.සේ | II | 7 | 3 | 4 | |
| 7 | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේ | II / III | 1 | 1 | 0 | |
| 8 | කාලගුණ විද්‍යාඥ | ශ්‍රී.ලං.විද්‍යා.සේ | I / II / III | 34 | 25 | 9 | |
| 9 | ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ | II / III | 1 | 1 | 0 | |
| 10 | අභ්‍යන්තර විගණක | ශ්‍රී.ලං.ග.සේ | II/III | 1 | 0 | 1 | |
| 11 | ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු | ශ්‍රී.ලං.ඉ.සේ | I | 1 | 0 | 1 | |
| 12 | ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු | ශ්‍රී.ලං.ඉ.සේ | II/III | 2 | 2 | 0 | |
| 13 | සිවිල් ඉංජිනේරු | ශ්‍රී.ලං.ඉ.සේ | II | 1 | 1 | 0 | |
| | උප එකතුව | | | 56 | 40 | 16 | |
| | තෘතීයික මට්ටම | | | | | | |
| 14 | පරිපාලන නිලධාරී | ක.සේ.නි.සේ. | අධි ශ්‍රේණිය | 1 | 0 | 1 | ද්විතීයක පදනම මත අනුයුක්ත කර ඇති [illegible] වැඩබලන පදනම මත තනතුර ආවරණය කර ඇත. |
| 15 | ජ්‍යෙෂ්ඨ කාලගුණ විද්‍යා නිලධාරී | ශ්‍රී.ලං.තා.සේ ශ්‍රී.ලං.තා.සේ | විශේෂ | 22 | 12 | 10 | |
| 16 | ජ්‍යෙෂ්ඨ විදුලි සංදේශ හා රේඩාර් තාක්ෂණික නිලධාරී | ශ්‍රී.ලං.තා.සේ | විශේෂ | 2 | 1 | 1 | |
| 17 | භාෂා පරිවර්තක | පරි.සේ | | 2 | 0 | 2 | |
| 18 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | තො.තා.සේ. | 2-II/I | 1 | 1 | 0 | |
| | උප එකතුව | | | 28 | 14 | 14 | |
| | ද්විතීයික මට්ටම | | | | | | |
| 19 | සංවර්ධන නිලධාරී | සං.නි.සේ. | I / II / III | 19 | 18 | 1 | |
| 20 | කාලගුණ විද්‍යා නිලධාරී / නිරීක්ෂක | ශ්‍රී.ලං.තා.සේ | I /II/ III | 174 | 104 | 70 | බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවා ඇත. |
| 21 | විදුලි සංදේශ හා රේඩාර් තාක්ෂණික නිලධාරී | ශ්‍රී.ලං.තා.සේ | I / II / III | 14 | 6 | 8 | බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවා ඇත. |
| 22 | සැලසුම් ශිල්පී | ශ්‍රී.ලං.තා.සේ | I | 1 | 0 | 1 | |
| 23 | පුස්තකාලයාධිපති | ශ්‍රී.ලං.පු.සේ | III | 1 | 0 | 1 | |
| 24 | කළමනාකරණ සේවා නිලධාරී | ක.සේ.නි.සේ. | I / II / III | 31 | 26 | 5 | |
| 25 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | තො.තා.සේ. | 3-III/II/I | 1 | 1 | 0 | |
| | උප එකතුව | | | 241 | 155 | 86 | |
| | ප්‍රාථමික මට්ටම | | | | | | |
| 26 | රියදුරු | ඒ.රි.සේ. | II / III | 12 | 9 | 3 | |
| 27 | තාක්ෂණික සහකාර (විදුලි හා ඉලෙක්ට්‍රොනික) | දෙපාර්තමේන්තුගත | | 2 | 0 | 2 | |
| 28 | වඩු කාර්මික | දෙපාර්තමේන්තුගත | I / II | 2 | 1 | 1 | |
| 29 | පෙදරේරු | දෙපාර්තමේන්තුගත | | 1 | 1 | 0 | |
| 30 | ජලනළ කාර්මික | දෙපාර්තමේන්තුගත | I/II/III | 1 | 1 | 0 | |
| 31 | කාර්මික ශිල්පී | දෙපාර්තමේන්තුගත | I / II | 3 | 2 | 1 | |
| 33 | නිවාඩු නිකේතන භාරකරු | දෙපාර්තමේන්තුගත | | 1 | 1 | 0 | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 34 | කාර්යාල කාර්ය සහායක | කා.ස.සේ. | I/ II / III | 25 | 15 | 10 | |
| 35 | කාලගුණ විද්‍යා සහායක | දෙපාර්තමේන්තුගත | I/II/III | 94 | 84 | 10 | පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවා ඇත. |
| | උප එකතුව | | | 141 | 114 | 27 | |
| | මුළු එකතුව | | | 466 | 323 | 143 | |

සාරාංශය

| | තනතුරු කාණ්ඩය | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| 1 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 56 | 40 | 16 |
| 2 | තෘතියික මට්ටම | 28 | 14 | 14 |
| 3 | ද්විතියික මට්ටම | 241 | 155 | 86 |
| 4 | ප්‍රාථමික මට්ටම | 141 | 114 | 27 |
| එකතුව | | 456 | 323 | 143 |

(ii)

| නිරීක්ෂණ ක්‍රම | මිනුම් ගනු ලබන පරාමිතීන් | සාමාන්‍ය නිරීක්ෂණ වාර ගණන |
|---|---|---|
| භූමිය ආශ්‍රිත කාලගුණ නිරීක්ෂණ මධ්‍යස්ථාන (නිලධාරින් විසින් මෙහෙයවනු ලබන) මධ්‍යස්ථාන 24 | වායු උෂ්ණත්වය, වායුගෝලීය පීඩනය, ආර්ද්‍රතාව, සුළං වේගය හා දිශාව, වර්ෂාපතනය, වලාකුළු ප්‍රමාණය හා වර්ගය, දෘශ්‍යතාව සහ කාලගුණික සංසිද්ධි | ප්‍රධාන නිරීක්ෂණ මධ්‍යස්ථාන 16ක දිනකට නිරීක්ෂණ 8ක්, පැය 3ක පරතරයකින් (UTC 00,03,06,09.12,15,18 සහ 21) මධ්‍යස්ථාන 8ක පැයකට වරක් නිරීක්ෂණ සිදු කරනු ලැබේ. |
| ස්වයංක්‍රීය කාලගුණ මධ්‍යස්ථාන (AWS ) මධ්‍යස්ථාන 20 | උෂ්ණත්වය, ආර්ද්‍රතාව, වායු පීඩනය, සුළං, වර්ෂාපතනය සහ සූර්ය විකිරණය | සෑම මිනිත්තු 10කට වරක් |
| ස්වයංක්‍රීය වර්ෂාමාන (ARG ) මධ්‍යස්ථාන 126 | වර්ෂාපතනය | සෑම මිනිත්තු 10කට වරක් |
| අතින් ක්‍රියාත්මක වර්ෂාමාන | දෛනික වර්ෂාපතනය | දිනකට එක් වරක්, සාමාන්‍යයෙන් දේශීය වේලාවෙන් පෙ.ව 8.30ට |
| ඉහළ වායුගෝලීය (නියමු බැලුම්) නිරීක්ෂන මධ්‍යස්ථාන 4 | ඉහළ වායුගෝලීය මට්ටම්වල සුළං වේගය හා දිශාව | දිනකට තුන් වරක්, UTC 00, 06 සහ 12ට |
| කාලගුණ විද්‍යාත්මක චන්ද්‍රිකා (ඉන්දියාව, ජපානය සහ චීනය මඟින් සපයනු ලබන චන්ද්‍රිකා දත්ත සහ වෙබ් අඩවිය හරහා ලබා ගත හැකි නිෂ්පාදිත දත්ත) | වලාකුළු ආවරණය, වලාකුළු මුදුනේ උෂ්ණත්වය, ජල වාෂ්පය, මුහුදු මතුපිට උෂ්ණත්වය සහ වර්ෂාපතන ඇස්තමේන්තු | භූස්ථාවර චන්ද්‍රිකා මඟින් සෑම මිනිත්තු 10-15කට වරක් |
| ශ්‍රී ලංකාව ආවරණය වන අකුණු හඳුනාගැනීමේ ජාලය (සංවේදක 9) | වලාකුළුවල සිට භූමිය දක්වා අකුණු සහ වලාකුළු අභ්‍යන්තර අකුණු | අඛණ්ඩව (තත්කාලීනව) |

(iii) කාලගුණ විද්‍යාත්මක දත්ත ප්‍රධාන වශයෙන් පහත සඳහන් ආයතන ඔස්සේ හුවමාරු කරනු ලැබේ.

ලෝක කාලගුණ විද්‍යා සංවිධාන තොරතුරු පද්ධතිය සහ එහි නවීකරණය කරන ලද සංරචක මඟින්.

නිරීක්ෂණ සහ පුරෝකථන තොරතුරු ආසන්න තත්කාලීනව හුවමාරු කිරීම සඳහා ගෝලීය විදුලි සන්දේශ පද්ධතිය මඟින්.

නව දිල්ලියේ කලාපීය විශේෂිත කාලගුණ විද්‍යා මධ්‍යස්ථානය සහ කලාපීය ඒකාබද්ධ බහු-උවදුරු පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතිය (RIMES) විසින් සම්බන්ධීකරණය කරනු ලබන කලාපීය දත්ත හුවමාරු යන්ත්‍රණ මඟින්.

(iv) කාලගුණ තොරතුරු ලබා ගැනීම සඳහා භාවිතා කරනු ලබන ක්‍රමවේද සහ දත්ත ජාත්‍යන්තර ආයතන සමඟ හුවමාරු කර ගැනීම ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව වේ.

(v) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති දෙකක් මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී.

- දේශගුණික ඔරොත්තු දීමේ බහු-අදියර වැඩසටහන් ප්‍රවේශ ව්‍යාපෘතිය (ලෝක බැංකු ණය): එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ උපදේශනය යටතේ ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය මඟින් කාලගුණ විද්‍යාත්මක නිරීක්ෂණ පද්ධතිය ඇතුළුව දෙපාර්තමේන්තුවේ අංශ කිහිපයක් නවීකරණය කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. මෙම ව්‍යාපෘතිය 2026 වර්ෂය අවසන් වන විට නිම කිරීමට නියමිතය.
- ඩොප්ලර් කාලගුණ රේඩාර් ව්‍යාපෘතිය (JICA) ආධාර: ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය ආධාර යටතේ පුත්තලම කාලගුණ විද්‍යා කාර්යාල පරිශ්‍රයේ ඉදි කිරීම් කටයුතු මේ වන විට සිදු කෙරෙමින් පවතින අතර, එය 2027 ජූලි මාසය වන විට නිම කිරීමට සැලසුම් කර ඇත.

මෙම ප්‍රධාන වැඩසටහන්වලට අමතරව, ලෝක කාලගුණ විද්‍යා සංවිධානය සහ ප්‍රාදේශීය ඒකාබද්ධ බහු-උවදුරු පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතිය ඇතුළු ජාත්‍යන්තර සංවිධාන කිහිපයක් විසින් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ පුරෝකථන හැකියාවන් වැඩිදියුණු කිරීම අරමුණු කර ගත් ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

(ආ) අදාළ නොවේ.

## බම්බලපිටිය මුස්ලිම් කාන්තා විද්‍යාලයේ අබලන් ගොඩනැඟිලි: ප්‍රතිසංස්කරණය
## பம்பலப்பிட்டி முஸ்லிம் மகளிர் கல்லூரியில் பழுதடைந்த நிலையிலுள்ள கட்டடங்கள்: புனரமைப்பு
## DELAPIDATED BUILDINGS AT MUSLIM LADIES' COLLEGE, BAMBALAPITIYA: RENOVATION

1218/2025

**6. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු එස්.එම්. මරික්කාර් මහතා වෙනුවට)**
**(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு எஸ்.எம். மரிக்கார் சார்பாக)**
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. S. M. Marikkar)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) බම්බලපිටිය මුස්ලිම් කාන්තා විද්‍යාලයේ මේ වනවිට ඇති ගොඩනැඟිලි සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගොඩනැඟිලි අතරින් ගොඩනැඟිලි කිහිපයක් වර්ෂ 75කට වඩා පැරණි බව දන්නේද;

(iii) එම ගොඩනැඟිලි අතරින් මේ වනවිට භාවිතයට අපහසු සහ අබලන් ගොඩනැඟිලි සංඛ්‍යාව කොපමණද;

(iv) එම ගොඩනැඟිලි ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කර තිබේද;

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(v) එසේ නම්, එම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනු ලබන කාල වකවානු කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) பம்பலப்பிட்டி முஸ்லிம் மகளிர் கல்லூரியில் தற்போதுள்ள கட்டடங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) அக்கட்டடங்களுள் பல கட்டடங்கள் 75 ஆண்டுகளையும்விடப் பழமையானவை என்பதை அறிவாரா என்பதையும்;

(iii) அக்கட்டடங்களுள் தற்போது பயன்படுத்த முடியாமலும் பழுதடைந்த நிலையிலும் உள்ள கட்டடங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) அக்கட்டடங்களைப் புனரமைப்பதற்கான வேலைத்திட்டமொன்று தயார்செய்யப்பட்டுள்ளதா என்பதையும்;

(v) ஆமெனில், அவ்வேலைத்திட்டம் எக்காலப் பகுதியில் செயற்படுத்தப்படும் என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) the number of buildings currently available in the Bambalapitiya Muslim Ladies' College;

(ii) whether she is aware that several buildings among them are more than 75 years old;

(iii) out of the said buildings, the number of those that have become dilapidated and unusable;

(iv) whether there is an arrangement in place to renovate those buildings; and

(v) if so, the timeframe during which such arrangement will be implemented?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
**சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
**Answer tabled:*

(අ) (i) ගොඩනැඟිලි 8කි.

(ii) ගොඩනැඟිලි 03ක් වර්ෂ 75කට වඩා පැරණි ගොඩනැඟිලි වේ.

(iii) මේ වන විට භාවිතයට අපහසු සහ අබලන් ගොඩනැඟිලි සංඛ්‍යාව 03කි.

(iv) ඔව්.

(v) 2025 අප්‍රේල් මස ප්‍රාථමික අංශයේ ගොඩනැඟිල්ල අලුත්වැඩියාව සඳහා රුපියල් මිලියන 4.88ක ප්‍රතිපාදන වෙන් කර දී මෙම වසරේදී එම කර්මාන්තයේ වැඩ අවසන් කර ඇත.

දැනට ඇස්තමේන්තු ලැබී ඇති මෙම විද්‍යාලයේ L හැඩති සිව්මහල් ගොඩනැඟිල්ලේ ව්‍යුහාත්මක අලුත්වැඩියාව සඳහා 2026 පෙබරවාරි මස 27 දින රුපියල් මිලියන 7.90ක් වෙන් කර බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සඳහා අනුඥ නිවේදන (Notice of Sanction) ලබා දී ඇත.

විද්‍යාලයේ ආදී සිසුවියන් හා පරිත්‍යාගශීලීන්ගේ ධන පරිත්‍යාගයෙන් හා අධ්‍යාපන අමාත්‍යාංශ ප්‍රතිපාදන මත 2027 වසර සඳහා මහල් 8න් සමන්විත බහුකාර්ය ගොඩනැඟිල්ලක් ඉදි කිරීමට ව්‍යාපෘති සැලැස්මක්, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ අතර, එම ව්‍යාපෘති සැලසුම සංශෝධන සහිතව නැවත ඉදිරිපත් කරන ලෙස දන්වා ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න, ගරු කේ. කාදර් මස්තාන් මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### මුස්ලිම් කාන්තා සෞඛ්‍ය සේවිකාවන්ගේ නිල ඇඳුම පිළිබඳ ගැටලු
### முஸ்லிம் பெண் சுகாதார ஊழியர்களின் சீருடை தொடர்பான பிரச்சினைகள்
### ISSUES REGARDING UNIFORM OF MUSLIM FEMALE HEALTH WORKERS

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27 (2)இன்கீழ் கௌரவ சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரிடம் கேள்வி கேட்பதற்கு அனுமதித்ததற்கு நன்றி!

எமது நாட்டில் சில நாட்களாக விரும்பத்தகாத சில செயற்பாடுகளால் அதிகமாகப் பாதிக்கப்பட்டவர்கள் முஸ்லிம் பெண்கள்! முஸ்லிம் பெண்களின் ஆடை பொது இடங்களிலும் அரச நிறுவனங்களிலும் தொடர்ந்து விமர்சனத்துக்கு உள்ளாக்கப்பட்டு வருவது மிகவும் கவலைக்கிடமான விடயமாகும். இது தேசிய ஒற்றுமைக்கும் இன ஒருமைப்பாட்டுக்கும் பாரியதோர் அச்சுறுத்தலாகும். இன்று முஸ்லிம் பெண்கள் கல்வித்துறையில் அதிகம் ஈடுபடுவதுடன் சிறந்த பெறுபேறுகளையும் பெறுகின்றனர். இருப்பினும், அரச துறையிலுள்ள ஆடைக் கட்டுப்பாடு காரணமாக, அவர்களை இஸ்லாமிய கலாசார ஆடை அனுமதிக்கப்பட்ட ஆசிரியர் தொழில் போன்ற தொழில்களுக்கு மாத்திரம் மட்டுப்படுத்துவது தேசிய மனிதவள துஷ்பிரயோகமாகும். குறிப்பாக, நாடளாவிய ரீதியில் சுகாதாரத்துறையில் 700க்கும்

அதிகமான முஸ்லிம் பெண்கள் வைத்தியர்களாகக் கடமையாற்றி, பாரிய பங்களிப்பை வழங்கி வருகின்றனர். இருப்பினும், தாதியர்களாகவும் இதர வைத்தியத்துறையில் பணியாளர்களாகவும் பணிபுரிய முஸ்லிம் யுவதிகள் ஆர்வமாகவும் உரிய தகைமைகளுடனும் முன்வந்தாலும், நடைமுறையிலுள்ள சுற்றுநிருபங்கள் அவர்களை குறித்த சேவையில் இணைந்து நாட்டுக்குப் பணிபுரிவதைத் தடுக்கின்றன.

கல்முனை வடக்கு ஆதார வைத்தியசாலையில் புதிதாக நியமிக்கப்பட்ட 9 பெண் உதவி சுகாதாரப் பணியாளர்கள், இலங்கையின் அரசியலமைப்பால் உறுதிசெய்யப்பட்ட தங்களுடைய மத, கலாசார ஆடையை அணிந்து, தமது கடமையை முன்னெடுக்க அனுமதி மறுக்கப்பட்டதுடன், சமூகங்களைக் கூறுபோடும் வகையில் நியாயமற்ற முறையில் அவர்கள் இரவோடு இரவாக இடமாற்றமும் செய்யப் பட்டுள்ளார்கள். இது நாட்டின் சமத்துவத்தையும் ஜனநாயக உரிமையையும் கேள்விக்குறியாக்கியுள்ளது. இதன் அடிப் படையில் நான் பின்வரும் கேள்விகளைக் கேட்கின்றேன்:

1. சுகாதார நிறுவனங்களில் பணிபுரியும் சிவில் உத்தியோகத்தர்களின் சமய அல்லது கலாசார ஆடை தொடர்பாக தற்போதும் நடைமுறையிலுள்ள சட்டம் அல்லது நிருவாக விதிமுறைகள் எவை என்பதை அமைச்சர் இச்சபைக்குத் தெரிவிப்பாரா?
2. 2022.11.30ஆம் திகதிய 26/2022ஆம் இலக்க பொது நிருவாக சுற்றறிக்கைமூலம் 2019.06.26ஆம் திகதிய 13/2019(I) ஆம் இலக்க சுற்றறிக்கை மற்றும் 2022.09.27ஆம் திகதிய 05/2022ஆம் இலக்க சுற்றறிக்கை என்பன உடனடியாக இரத்துச் செய்யப்பட்டதையும், பதவிநிலைத் தர அதிகாரி களுக்கான 08/89ஆம் இலக்க சுற்றறிக்கையும், சீருடை கட்டாயமாக்கப்பட்ட உத்தியோகத்தர் களுக்குப் பொருந்தும் ஏனைய சுற்றறிக்கைகளும் தொடர்ந்து செல்லுபடியாகுமெனக் குறிப்பிடப் பட்டுள்ளதையும் அரசாங்கம் உறுதிப்படுத்துமா? பலதரப்பட்ட சுகாதார உத்தியோகத்தர்களின் ஆடை தொடர்பில் தற்போது நடைமுறையிலுள்ள சுற்றறிக்கை, சேவைப் பிரமாணம், சட்டம் அல்லது ஒழுங்குவிதி எது என்பதை கௌரவ அமைச்சர் சபைக்குச் சமர்ப்பிப்பாரா?
3. அரச நிறுவனங்களில் சமய அல்லது கலாசார ஆடை தொடர்பாக உத்தியோகத்தர்களுக்கு இடையே ஏற்படக்கூடிய முரண்பாடுகளைத் தீர்ப்பதற்கும், சட்ட பூர்வமான அதிகாரமின்றி எந்தவோர் உத்தியோகத் தரும் தனது சமய அல்லது கலாசார அடையாளத்தின் காரணமாக கடமையிலிருந்து தடுக்கப்படாதிருப்பதை உறுதிசெய்வதற்கும் சுகாதார அமைச்சு அனைத்து அரச வைத்தியசாலைகள் மற்றும் சுகாதார நிறுவனங் களின் தலைவர்களுக்கு ஏதேனும் எழுத்துமூல வழிகாட்டல் அல்லது பணிப்புரை வழங்கியுள்ளதா?
4. முஸ்லிம் பெண் சுகாதார ஊழியர்களின் சீருடை தொடர்பான பிரச்சினை எதிர்காலத்தில் இந்த நாட்டில் தலைதூக்காமல் இருக்க அரசாங்கம் எடுக்கும் நடவடிக்கை என்ன? மேலும், அரசியலமைப்புக்கு முரணாகவுள்ள சுற்றுநிருபங்கள் அனைத்தையும் திரும்பப்பெற்று, அரசியலமைப்பின் ஊடான சமய சுதந்திரம், சட்டத்தின்முன் சமத்துவம், சமயத்தை வெளிப்படுத்தும் சுதந்திரம் மற்றும் ஒருவரது கலாசாரத்தை அனுபவித்து மேம்படுத்தும் சுதந்திரம் என்பன உறுதிப்படுத்தப்பட வேண்டும். இவற்றைக் கருத்திலெடுத்து முரண்பாடுகளைக் களையும் விதத்தில் இது தொடர்பில் சுயாதீன ஆணைக்குழு ஒன்றை அமைக்க முடியுமா?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, ගරු කාදර් මස්තාන් මන්ත්‍රීතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර දෙන්නට කලින් මම මේ කාරණය කියන්න ඕනෑ. ඊයේත් සභාව කල් තබන අවස්ථාවේ ඇසූ ප්‍රශ්නයට, කල්මුණ උතුර රෝහලේ මතු වුණු ගැටලුවක් සම්බන්ධයෙන් මම පිළිතුරු ලබා දුන්නා. අද උදේ වරුවේ ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නයත්, ඊළඟට සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවත් එකම කරුණක් සම්බන්ධයෙන් තමයි තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, එක එක මන්ත්‍රීවරු ඒ තිබෙන අවස්ථා පාවිච්චි කරලා; ස්ථාවර නියෝග 27(2) යටතේ හෝ සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්නයක් හෝ යෝජනාවක් හැටියට එකම ප්‍රශ්නය ඉදිරිපත් කළාම, මම එකම උත්තරය ලබා දිය යුතුද, එහෙම නැත්නම් කලින් දුන් පිළිතුරෙන් සෑහීමකට පත් වෙනවාද කියන එක සම්බන්ධව මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. මට උත්තරය කියවන්න පුළුවන්. නමුත්, අද හවසත් මේ ප්‍රශ්නයම වෙනත් මන්ත්‍රීවරයකු විසින් යොමු කර තිබෙනවා. ගරු මන්ත්‍රීතුමාගේ අයිතියට මම ගරු කරනවා. නමුත්, ඊයේ අපේ කාරියප්පර් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු ප්‍රශ්නයට මම සැලකිය යුතු වෙලාවක් අරගෙන මේ චක්‍රලේඛ සියල්ලම පිළිබඳ පැහැදිලි කළා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

එකම කාරණාවක් සම්බන්ධයෙන් නැවත නැවත විවාද කිරීමෙන් සහ කරුණු කාරණා කථා කිරීමෙන් සභාවේ කාලය පිළිබඳ ගැටලුවක් පැන නඟිනවා. ලේකම් මණ්ඩලය ඒ ගැන සැලකිලිමත් වෙන්න අවශ්‍යයි. ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න ලබා දීම සහ සභාව කල් තබන අවස්ථාවේදී ඉදිරිපත් කරන ප්‍රශ්න ලබා දීම දැනුවත්භාවයකින් කරන්න ඕනෑ. නැත්නම් එකම දවස තුළ එකම දේ කථා වෙන්න පුළුවන්.

ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට පිළිතුර ඉදිරිපත් කරන්න පුළුවන්.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ගරු කාදර් මස්තාන් මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. නිල ඇඳුම යන්න සම්මත කර ඇති ඇඳුමක් වන අතර, එමඟින් එම නිලයේ අනන්‍යතාව ආරක්ෂා කෙරෙනවා. එසේම සෞඛ්‍ය අමාත්‍යාංශය තුළ නිල ඇඳුම් කමිටුවක් ක්‍රියාත්මක වන අතර ඉන් එක් එක් නිලයට අදාළ නිල ඇඳුම සම්මත කර ගෙන තිබෙනවා. එලෙස සම්මත කරනු ලැබ ඇති නිල ඇඳුමෙහි යම් වෙනසක් සිදු කරනු ලබන්නේ නම් එම නිල ඇඳුම් කමිටුවට ඉදිරිපත් කර අනුමත කර ගත යුතු වෙනවා.

2, 3. සෞඛ්‍ය ක්ෂේත්‍රය සැලකීමේදී සේවකයන් සඳහා නිල ඇඳුම් ලබා දී ඇත්තේ පොදුවේ එක් එක් නිලධාරි කාණ්ඩ රෝගීන්ට සහ මහජනතාවට පහසුවෙන් හඳුනා ගැනීමට අමතරව සනීපාරක්ෂාව තහවුරු කිරීමත් අදාළ කරගෙනයි. එනම්, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිල ඇඳුම් සකස් කිරීමේදී රෝගී සත්කාරක සේවා පහසුවෙන් සිදු කිරීම මෙන්ම

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

රෝගකාරක විෂ බීජ පැතිරීම පාලනය කිරීමත් සැලකිල්ලට ගෙන තිබෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශය තුළ නිල ඇඳුම් හිමි සේවාවන් පහත පරිදි වන අතර ඔවුන්ට නිල ඇඳුම් දීමනාවකුත් ගෙවනවා.

හෙද නිලධාරි, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනි, මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරි, මැලේරියා බරවා මර්දන සහායක, මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරි, කීට විද්‍යා සහකාර, පාසල් දන්ත චිකිත්සක, ඊට අමතරව කනිෂ්ඨ සෞඛ්‍ය කාර්ය මණ්ඩලය, සෞඛ්‍ය කාර්ය සහායක, රෝහල් ඕවර්සියර්, අරක්කැමි, කරනැවැමි, කාර්යාල කාර්ය සහායක, පාපැදි පණිවුඩකරු, මුරකරු, රසායනාගාර සහයක සහ ඉසින යන්ත්‍ර ක්‍රියාකරු.

මේ වන විට අප සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් මේ අයට නිල ඇඳුම් දීමනාව ලෙස හෙද නිලධාරින්ට රුපියල් 30,000ක්, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරියන්ට රුපියල් 28,000ක්, මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරින්ට රුපියල් 30,000ක්, මැලේරියා බරවා මර්දන සහායක ඇතුළු ඒ නිලධාරින්ට රුපියල් 20,600ක්, ඊට අමතරව සෞඛ්‍ය කාර්ය සහායකයන් වෙනුවෙන් රුපියල් 18,600ක් ලබා දෙනවා.

නිල ඇඳුම් දීමනාව ලබා දෙන්නේ නිල ඇඳුම් කමිටුව විසින් සම්මත කරන ලද නිල ඇඳුමකට ගෙවන්නයි.

4. රාජ්‍ය සේවකයින්හට නිල ඇඳුම් අනුමත කර අදාළ දීමනා ගෙවීම සිදු කරනු ලබන්නේ අදාළ නිලයේ රාජකාරි විධිමත්ව හා ක්‍රමවත් සිදු කර ගැනීමට හැකි වන අයුරින් වන අතර, එය සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ වේ.

ගරු කථානායකතුමනි, මීට වැඩිමනත් වශයෙන් මම කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්නම්.

1989 පෙබරවාරි 1වැනි දා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ වැඩ බලන ලේකම්වරයා නිකුත් කරපු චක්‍රලේඛයක් තිබෙනවා, මාණ්ඩලික ශ්‍රේණිවල නිලධාරින්ගේ නිල ඇඳුම සම්බන්ධයෙන්. ඒකේ තිබෙන්නේ මාණ්ඩලික ශ්‍රේණිවලට අයත් සියලු රාජ්‍ය නිලධාරින් සහ සංස්ථා නිලධාරින් සිය කාර්යාලයට පැමිණීමේදී සහ රාජකාරි කටයුතු කිරීමේදී අඳින්න ඕනෑ ඇඳුම පිළිබඳවයි. 2019දී ඒ චක්‍රලේඛයට යම් සංශෝධනයක් ගෙනැල්ලා තිබෙනවා. අන්න ඒ සංශෝධනය තමයි සමහර කෙනෙක් වරදවා උපුටා දක්වන්නේ. ඒකේ තිබෙනවා, රජයේ නිලධාරින් රාජකාරි වේලාව තුළ ස්වකීය කාර්යාල පරිශ්‍රය තුළට ඇතුළු වීමේදී පිරිමි නිලධාරින් මේ විධියටත්, කාන්තා නිලධාරිනියන් මේ විධියටත් ඇඳගෙන එන්න ඕනෑය කියලා. ගරු මන්ත්‍රීතුමනි, එහි දෙවැනි කොටස තිබෙන්නේ, "දැනටමත් නිල ඇඳුමක් හෝ නිල ඇඳුම් දීමනා ලබන නිලධරයන් තමන්ගේ අනුමත නිල ඇඳුමින් සැරසී රාජකාරියේ යෙදී සිටිය යුතුයි" කියලායි. 2019 ඒ චක්‍රලේඛය 2022දී සංශෝධනය වුණේ නැහැ, ඔය කියන හැටියට. සමහර අමාත්‍යාංශවල කාර්යාලවලට ඇතුළු වීමේදී ඒ කාන්තාවන්ට සාරිය හෝ ඔසරිය පමණක් ඇඳලා එන්න ඕනෑය කියලා යම් සංවාදයක් පැන නැඟිලා තිබුණා. එතැනදි තමයි, "ඒ රජයේ නිලධරයන් ස්වකීය කාර්යාල පරිශ්‍රයට පැමිණීමේදී හා රාජකාරියේ යෙදී සිටියදී රාජ්‍ය සේවයේ ගෞරවය රැකෙන ආකාරයේ සුදුසු කාර්යාලයීය ඇඳුමකින් සැරසීමට ඉඩ දිය යුතුය. තවද, එය ක්ෂේත්‍ර රාජකාරි සඳහා ද ඇතුළත් විය යුතුය" කියලා තිබුණේ.

ගරු මන්ත්‍රීතුමනි, මේක ඇතුළත් වන්නේ රජයේ නිලධරයන්ට මිසක් නිල ඇඳුම් අඳින අයට නොවෙයි. නිල ඇඳුම් දීමනාව ලබන, නිල ඇඳුම් අඳින අයට හිමි නිශ්චිත නිල ඇඳුමක් පවතිනවා. ඒකට කැලි අඩු කරන්න හරි, එකතු කරන්නට හරි නිල ඇඳුම් කමිටුවේ අනුමැතියකින් තොරව හැකියාවක් නැහැ. මේක තමයි තත්ත්වය. මේ චක්‍රලේඛය අපි නිකුත් කරපු එකක් නොවෙයි. 2019දී රවුෆ් හකීම්, රිසාඩ් බදියුදීන්, සජිත් ප්‍රේමදාස ඇතුළු අය එවකට ඇමතිවරුන් විධියට සිටි ආණ්ඩුවකින් එය කරලා තිබෙන්නේ. බොහොම පැහැදිලිව එම චක්‍රලේඛයේ කියලා තිබෙනවා, "නිල ඇඳුමක් හෝ නිල ඇඳුම් දීමනා ලබන නිලධරයන් තමන්ගේ අනුමත නිල ඇඳුමින් සැරසී සිටිය යුතුයි" කියලා. මේ මත පදනම් වෙලා තමයි දැනට රාජ්‍ය සේවයේ කටයුතු සිදු වන්නේ. දැන් මේ සිදුවීම පදනම් කරගෙන කොතැනක හරි යළිත් කුඩා දේශපාලන කණ්ඩායම් විසින් ජාතිවාදය වපුරන්න හදනවා නම්, ඒ හරහා සෞඛ්‍ය සේවාව බිඳ වට්ටන්න හදනවා නම්, අපි ඒකට ඉඩ දෙන්නේ නැහැ.

මම සතුටු වනවා, මුස්ලිම් ජාතික තරුණියන් - කාන්තාවන් - රාජ්‍ය සේවයට, සෞඛ්‍ය සේවයට යම් ප්‍රමාණයකින් වැඩියෙන් එන්න පටන් අරගෙන තිබීම ගැන. ඔබට සංස්කෘතික අනන්‍යතාවක් පවතිනවා. ඔබේ ඇඳුමේ අනන්‍යතාවක් පවතිනවා. ඒවාත් අපි සැලකිල්ලට ගන්නවා. නමුත් චක්‍රලේඛ පවතිනවා. ඒ අනුව තමයි රාජ්‍ය සේවයට කටයුතු කරන්න සිදු වන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඒ චක්‍රලේඛ වෙනස් කරනවා නම් ඔබතුමාට යෝජනාවක් ගෙනෙන්න පුළුවන්, පාර්ලිමේන්තුවේදී හෝ පිටතදී අපි මේ ගැන සාකච්ඡා කරමු කියලා. ඇත්තටම සෞඛ්‍ය කාර්ය සහායකයන් අපි බඳවා ගත්තේ කිසිදු දේශපාලන මැදිහත්වීමකින් තොරව. කිසිම මන්ත්‍රීවරයෙකුගේ ලියුමකට නොවෙයි අපි ඒ අය බඳවා ගත්තේ. මම සතුටු වනවා, ඒ තරුණියන් ඒ රැකියාවලට පැමිණීම සම්බන්ධයෙන්. නමුත් එතැන දේශපාලන කණ්ඩායම් කිහිපයක් මැදිහත් වෙලා යළිත් ජාතිවාදය ඇවිස්සීමට සහ සෞඛ්‍ය සේවය කඩාකප්පල් කිරීමට කටයුතු කළා. තාවකාලික පියවරක් හැටියට මම ඒ අය ආසන්නතම රෝහලකට අනුයුක්ත කරලා තිබෙනවා, මේ ප්‍රශ්නය විසඳා ගන්නා තෙක්. අපි ඉදිරියේදී බලමු, ඒ චක්‍රලේඛවලට මොකද කරන්නේ, ඒ කටයුතු කරන්නේ කොහොමද කියලා.

ඊයේත් මම මේ ප්‍රශ්නයට උත්තර ලබා දුන්නා. අදත් මේ උත්තරය ලබා දෙනවා. නැවත හවසත් මේ උත්තරය ලබා දිය යුතු නැහැ කියලා මා හිතනවා. ගරු කථානායකතුමනි, කරුණාකරලා ඔබතුමාගේ අවධානයට යොමු කරනවා, එකම ප්‍රශ්නයට මේ විධියට උත්තර ලබා දීම සම්බන්ධයෙන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හවස මේ සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කිරීමේදී උදේ ගරු අමාත්‍යතුමා ලබා දුන් උත්තරය refer කළා නම් හොඳයි.

ගරු කාදර් මස්තාන් මන්ත්‍රීතුමාට පොඩි කරුණු පැහැදිලි කිරීමක් කර ගන්න පුළුවන්.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)

கௌரவ சபாநாயகர் அவர்களே, பதில் வழங்கியமைக்கு கௌரவ அமைச்சர் அவர்களுக்கு நன்றி கூறிக் கொள்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்கள் இந்த விடயத்தில் தெளிவாக இருக்கிறார். முஸ்லிம் பெண்கள் இவ்வாறான தொழில்களுக்கு வருவதற்குத் தடையாக இருப்பது ஆடை தொடர்பான விடயம்தான். நீள காற்சட்டையையும் நீள கையுள்ள ஆடையையும் 'ஹிஜாப்'ஐயும் அணிவதற்கு அனுமதி கொடுத்தால், அவர்கள் சகல துறைகளிலும் சேவையாற்று வார்கள். முஸ்லிம் நாடுகளில் இவ்வாறான ஆடைகளுடன் முஸ்லிம் பெண்கள் விளையாட்டுப் போட்டிகளில்கூட கலந்துகொள்கின்றார்கள்.

சுற்றறிக்கைகளில் எவ்வாறு இருந்தாலும், Awoof vs. Janadipathi Balika Vidyalaya and Others என்ற 2014/VI-SRI-LR-339ஆம் இலக்க வழக்கில், உயர் நீதிமன்றம் அரசியலமைப்பின் குறித்த உறுப்புரையைப் பாதுகாக்கும் விதமாக தீர்ப்பு வழங்கி இருக்கிறது. இவற்றைக் கருத்திலெடுத்து, இந்த ஆடை தொடர்பான விடயத்தைச் சட்டமாக்க வேண்டும். முஸ்லிம் பெண்கள் அணியும் ஆடை யாரையும் அவமானப் படுத்தும் வகையில் அமைந்தது அல்ல; அது அழகானது. அதற்காக நாங்கள் மற்றைய ஆடைகளைக் குறை சொல்லவில்லை. நீங்கள் சுயாதீன ஆணைக்குழுவொன்றை அமைத்து, இதனைச் சட்டமாக்கினால் யார் ஆட்சிக்கு வந்தாலும் எந்தப் பிரச்சினையும் ஏற்படாது. இந்தச் சமூகத்தின் பெரும்பாலான வாக்குகளையும் பெற்றுத்தான் நீங்கள் ஆட்சிக்கு வந்திருக்கின்றீர்கள். எனவே, இது சம்பந்தமாக ஆணைக்குழுவொன்றை நியமித்து, இதற்கு அனுமதி பெற்றுத்தருமாறு தயவாகக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ඇත්තටම අපි කීයටවත් මේක ඡන්ද ප්‍රශ්නයක් කරගන්නේ නැහැ. සමාජයක් වෙනස් වනකොට යම් යම් දේවල් වෙනස් වෙන්න ඕනෑ, චක්‍රලේඛ නීති වෙනස් වෙන්න ඕනෑ. ඒකට තමයි පාර්ලිමේන්තුව පවතින්නේ. ඒ ප්‍රදේශ නියෝජනය කරන ඔබතුමන්ලාගේ පක්ෂවල එකතුවකුත් පවතිනවා. මේ සම්බන්ධව විවිධාකාරයෙන් යෝජනා දෙන්න පුළුවන්. ඒ යෝජනා සෞඛ්‍යයට ගැළපෙන්නේ කොහොමද, රාජ්‍ය සේවයට ගැළපෙන්නේ කොහොමද කියන එක ගැන සාකච්ඡා කරන්න පුළුවන්. මොකද, ඇත්තටම අපි දැන් වැඩ කරන්නේ අපි ගෙනාපු චක්‍රලේඛයක් මත නොවෙයි, 2019දී නිකුත් කරපු චක්‍රලේඛයක් මත. 2019දීත් මේ තත්ත්වය මෙලෙසම තිබුණා. ඒ වෙලාවේ නිකුත් කරපු චක්‍රලේඛය ඒ ආකාරයෙන්ම ආරක්ෂා කිරීමට තමයි රජයේ නිලධාරින් කටයුතු කරන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා.

## II

## පිළිකා ප්‍රතිකාර සඳහා අත්‍යවශ්‍ය FILGRASTIM එන්නත් හිඟය
## புற்றுநோய்ச் சிகிச்சைக்கு அத்தியாவசியமான FILGRASTIM தடுப்பூசி பற்றாக்குறை
## SHORTAGE OF FILGRASTIM INJECTION ESSENTIAL FOR CANCER TREATMENT

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

මට අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි. මට පෙනෙන විධියට සෞඛ්‍ය ඇමතිතුමාට තමයි අද වැඩිපුර ප්‍රශ්න යොමු වන්නේ. මේකත් ඉතා වැදගත් ප්‍රශ්නයක්, ගරු සෞඛ්‍ය ඇමතිතුමනි.

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා ඉදිරිපත් කරන ප්‍රශ්නය මෙයයි.

කීමොතෙරපි, ඇට මිදුලු බද්ධ කිරීම - bone marrow transplantation - ඇතුළු පිළිකා ප්‍රතිකාර සඳහා අත්‍යවශ්‍ය වන filgrastim කියන එන්නත දැනට මහරගම අපේක්ෂා රෝහල ඇතුළු රජයේ රෝහල් පද්ධතිය තුළ හිඟව පවතින බව රෝගීන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් විසින් මා වෙත දැනුම් දී ඇත.

ගරු කථානායකතුමනි, මීට අමතරව "Daily Mirror" පත්තරයේ පළ කරන ලද ලිපි දෙකක් මම **සභාගත*** කරනවා. ඒ, 2026 අගෝස්තු 18 දින පළ කරන ලද ලිපි දෙකක්. ඒකේත් මේ කාරණාව සඳහන්ව තිබෙනවා.

මෙහිදී මා පහත ප්‍රශ්න යොමු කරනවා.

1. Filgrastim එන්නත මහරගම අපේක්ෂා රෝහල ඇතුළු රජයේ රෝහල්වල දැනට හිඟද, නොමැතිද යන්නත්, එසේ නම් එම හිඟයට ලක්ව ඇති රෝහල් මොනවාද සහ එම හිඟය ආරම්භ වූයේ කවදා සිටද යන්නත් ගරු අමාත්‍යවරයා සඳහන් කරන්නේද?
2. රජයේ රෝහල් පද්ධතිය තුළ දිනකට සහ මාසයකට සාමාන්‍යයෙන් භාවිත වන filgrastim එන්නත් ප්‍රමාණය කොපමණද? එම ප්‍රමාණයෙන් මහරගම අපේක්ෂා රෝහලේ දෛනික සහ මාසික භාවිතය කොපමණද?
3. මෙම හිඟය පියවීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය හෝ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව - SPC එක - විසින් filgrastim එන්නත් ඇණවුම් කර තිබේද? එසේ නම් ඇණවුම් කර ඇති ප්‍රමාණය කොපමණද, ඇණවුම ලබා දුන් දිනය කවදාද, සැපයුම්කරු කවුරුන්ද සහ එම එන්නත් රෝහල් වෙත ලැබීමට අපේක්ෂිත දිනය කවදාද?
4. එම ඇණවුම් කරන ලද ප්‍රමාණය වත්මන් භාවිතය අනුව කොපමණ කාලයක් සඳහා ප්‍රමාණවත් වේද? ඉදිරි මාස කිහිපය සඳහා ප්‍රමාණවත් තොගයක් පවත්වාගෙන යාමට ගෙන ඇති පියවර මොනවාද?
5. රජය හෝ SPC එක විසින් අවසන් වරට filgrastim එන්නතක් ගත්තේ කොපමණ මිලකටද? එම මිලට අදාළ සැපයුම්කරු, මිලදී ගත් ප්‍රමාණය සහ ප්‍රසම්පාදන දිනය ගරු අමාත්‍යවරයා හෙළි කරන්නේද?
6. රජයේ රෝහල්වල පවතින ඖෂධ හිඟය හේතුවෙන් රෝගීන්ට පෞද්ගලික ඔසුසල් හෝ වෙනත් පෞද්ගලික සැපයුම්කරුවන්ගෙන් filgrastim එන්නත මිලදී ගැනීමට සිදුව ඇති බව රජය දන්නේද? එසේ නම් එක එන්නතක් රුපියල් 17,000ත්, රුපියල් 23,000ත් අතර මිලකට අළෙවි වන බවට ලැබී ඇති තොරතුරු සත්‍යයද?

   ඒ කියන්නේ, "Daily Mirror" පත්තරයේ තිබෙන කාරණය.
7. Filgrastim වැනි කීමොතෙරපි සහ අනෙකුත් පිළිකා ප්‍රතිකාර සඳහා අත්‍යවශ්‍ය ඖෂධ හිඟ වීම හේතුවෙන් ඇතැම් රෝගීන්ගේ ප්‍රතිකාර කල් දැමීමට, වෙනස් කිරීමට හෝ ප්‍රතිකාරවලට බාධාවීම් සිදුව තිබේද? එසේ නම් එමගින් බලපෑමට ලක් වූ රෝගීන් සංඛ්‍යාව කොපමණද?
8. මෙම අත්‍යවශ්‍ය ඖෂධය අඛණ්ඩව රජයේ රෝහල් තුළින් ලබා ගත හැකි බව සහතික කිරීම සඳහා ගෙන ඇති හදිසි හා දිගු කාලීන පියවර මොනවාදැයි ගරු අමාත්‍යවරයා මෙම සභාවට දැනුම් දෙන්නේද?

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට මම මේකත් එක්කම "Daily Mirror" පත්තරයේ පළ කරන ලද මේ ලිපිත් ලබා දෙන්නම්. මේ ඖෂධය පිළිබඳව සමහර රෝහල්වල දැනට ගැටලුවක් පවතින එක ගැන මෙහි සඳහන් කර තිබෙනවා. Neupogen කියන vaccine එකත් දැන් බෑග්වල ගෙනැල්ලා රුපියල් 20,000ට, රුපියල් 23,000ට සමහර තැන්වල විකුණනවා. රෝගීන්ට දැන් ඒ ඖෂධයත් ඒ විධියට මිලට ගන්න සිදු වෙලා තිබෙනවා. මේ ප්‍රශ්නය වහාම විසඳන්න ඕනෑ. මම doctor කෙනෙක් නොවෙයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා doctor කෙනෙක්. මෙම රෝගීන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් විසින් මට ලබා දුන් තොරතුරුයි මම මේ කියන්නේ. කීමොතෙරපි වාගේ ප්‍රතිකාර කරන රෝගියෙකුට මේ injection එක දුන්නේ නැත්නම් ඒ රෝගියාගේ immunity එක අඩු වනවා කියලා doctorsලා අතර මතයක් තිබෙනවා.

මේක භයානක තත්ත්වයකට එන්න පුළුවන්. ඒ නිසා තමයි මම මේ ප්‍රශ්න ටික ඇමතිතුමාට හදිසියේ ඉදිරිපත් කළේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මේ ප්‍රශ්නය ඉදිරිපත් කළාට ඔබතුමාට බොහොම ස්තුතියි. ගොඩක් අය මේ ප්‍රශ්නය වටේ ඇවිදිමින් හිටියා. නමුත්, ඔබතුමා මේ ප්‍රශ්නය නිශ්චිතව ඉදිරිපත් කර තිබෙනවා. Filgrastim එන්නත අපට අවශ්‍ය කරන්නේ පිළිකා රෝගීන් සඳහායි. Chemotherapy ලබා දෙනකොට සාමාන්‍යයෙන් සුදු රුධිරාණු ප්‍රමාණය අඩු වෙනවා. එතකොට ඒ අය ආසාදනවලට ගොදුරු වීමේ හැකියාව වැඩියි. ඒ නිසා සාමාන්‍යයෙන් chemotherapy ලබා දෙනකොට මේ ඖෂධය ලබා දිය යුතුයි. මොකද, එතකොට සුදු රුධිරාණු - neutrophils - වැඩි වෙලා ආසාදනවලට ඔරොත්තු දීමේ හැකියාවක් ඇති වනවා. එතකොට ඔබතුමාට පැහැදිලි ඇති, chemotherapy drug එක තිබුණාට වැඩක් වෙන්නේ නැහැ, filgrastim නැත්නම් කියන එක. සමහර වෙලාවට අපිට ඒක ලබා දිය නොහැකි තත්ත්වයක් එනවා.

ගරු කථානායකතුමනි, මම එතුමා අහන ප්‍රශ්නවලට උත්තර දෙන්නම්. මෙම ඖෂධය සම්බන්ධයෙන් රජයේ රෝහල්වල ජූලි මස සිට හිඟයක් පවතින අතර, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සැපයුම් කල්ගත වීම මත ඉල්ලුම් කළ රෝහල් සඳහා ප්‍රාදේශීය මිලදී ගැනීමට අවසර ලබා දී තිබෙනවා.

මේ 300 micrograms filgrastim injection එක අපට අවශ්‍ය කරන්නේ සාමාන්‍යයෙන් අවුරුද්දකට ලක්ෂ 3ක් පමණ. මාසික අවශ්‍යතාව 27,500ක් පමණ වනවා. දෛනික අවශ්‍යතාව 900ක් පමණ වනවා. මහරගම අපේක්ෂා රෝහලට මාසිකව 9,750කුත්, දෛනිකව 325ක පමණ අවශ්‍යතාවකුත් පවතිනවා.

2026 වර්ෂය සඳහා අපි මේ vials 310,000ක් ගෙන්වන්න කටයුතු කළා. 2027 වර්ෂය සඳහා 330,000ක් ගැනීමට අනුමැතිය ලබා දී තිබෙනවා. ඒ අනුව, අපේ වෛද්‍ය සැපයුම් අංශය විසින් 2025 ජනවාරි 21වැනි දා තමයි 2026 වර්ෂයට ඇණවුම දුන්නේ, ගරු මන්ත්‍රීතුමනි. ඒ කියන්නේ, මාස නවය හමාරකට කලින්. 2027 වර්ෂය සඳහා වෛද්‍ය සැපයුම් අංශය විසින් ඇණවුම ලබා දී තිබෙන්නේ 2025.12.22වැනි දා. එතකොට ඔබතුමාට පෙනෙනවා ඇති, මාස දොළහ හමාරකට වැඩි කාලයකදී 2027 වර්ෂයට අවශ්‍ය කරන ඇණවුම අපේ වෛද්‍ය සැපයුම් අංශය මඟින් ලබා දී තිබෙන බව. 2026 වර්ෂයේ ඇණවුම ලබාගෙන තිබෙන්නේ Slim Pharmaceuticals (Pvt.) Limited කියන ආයතනයයි. ඔවුන් ගෙන එන්නේ Kexing Biopharm කියන චීන සමාගමේ ඖෂධයක්. ඒ අනුව, 2026.05.18වැනි දා ඔවුන් විසින් සැපයුමට නියමිත 310,000ක් වන vials ප්‍රමාණයෙන් 160,000ක් ලංකාවට ගෙනාවා. මේක අපි clear කරගෙන භාර දීමට සියල්ල සූදානම් කර තිබුණේ. 2027 ඇණවුම හිමි වෙලා තිබෙන්නේ ABC Pharma Services (Pvt.) Limited කියන ආයතනයට. ඒ අනුව, ඔවුන් ඉන්දියාවේ Reliance Life Sciences කියන ආයතනය නිෂ්පාදනය කරන vials 330,000ක් 2026 අගෝස්තු මාසයේදී ගෙන ඒමට නියමිත වෙලා තිබුණා.

2026 වර්ෂය සඳහා වසරක අවශ්‍යතාවද, 2027 වර්ෂය සඳහා වසරක පුරෝකථන අවශ්‍යතාවද වෛද්‍ය සැපයුම් අංශය විසින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ඇණවුම් කර තිබෙනවා. ඒ අනුව, අපි ඇණවුම් කර තිබෙන ප්‍රමාණය ගත්තොත්, 165,000ක් කියන්නේ මාස 6කට අවශ්‍ය vials ප්‍රමාණය. 2026 ඇණවුම සඳහා ජූලි 28වන දින නික්ෂේපණ 160,000ක තොගයක් සැපයුම්කරු විසින් සැපයූ අතර, එය ලියාපදිංචි ඖෂධයේ අවශ්‍යතා සපුරා නොමැති බැවින් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ නියමය අනුව ප්‍රතික්ෂේප වුණා. මේ කථාව මෙන්න මෙහෙමයි.

මේ 160,000ක ඖෂධ තොගය සියල්ල clear කරගෙන රට තුළට ගත්තාට පස්සේ මේ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් ආවා. මේ තිබෙන syringe එකේ label එක හරියට තිබුණේ නැහැ. ඕක තමයි ප්‍රශ්නය. ඒ syringe එක තිබෙන cardboard pack එකේ label එක තිබුණාට prefilled syringe එකේ label එක නැහැ, ගරු කථානායකතුමනි. එතකොට දැනට ජාතික ඖෂධ නියාමන අධිකාරියේ තිබෙන තත්ත්වයන් අනුව, එහි තිබෙන කොන්දේසි අනුව මේ ප්‍රසම්පාදනය major deviation එකක්. සමහර minor deviations නම් අපට සලකා බලන්න පුළුවන්. නමුත්, මේක major deviation එකක්. එතකොට මෙතැන තමයි දැන් මේ ප්‍රශ්නය හිර වෙලා තිබෙන්නේ. අපි කලින් ඇණවුම් කර තිබෙනවා. සැපයුම්කරු නියමිත කාලයේදී මේ ඖෂධය ලංකාවට ගෙනැල්ලා තිබෙනවා. හැබැයි, මේ ඖෂධය ගෙනැල්ලා මේක පරීක්ෂා කර බැලීමේදී label එක නැහැ. එතකොට label එක නැතිව ඒ එක් එක් ඖෂධය අපේ විශේෂඥ වෛද්‍යවරු සහ වෛද්‍යවරු භාවිත කරන්න කැමැතිද, නැද්ද කියන ප්‍රශ්නය තිබෙනවා. ඇත්තටම අපේ ඖෂධ ප්‍රසම්පාදනයේ හිර වෙන එක තැනක් තමයි, මේ සැපයුම.

මෙවැනි ආකාරයට යම් ඖෂධයක් රට තුළට ගෙනාවාට පස්සේ එහි ගුණාත්මකභාවයේ ප්‍රශ්නයක් හෝ මෙවැනි labelsවල ප්‍රශ්නයක් මත ගැටලුවකට මැදි වුණොත් ඊළඟ සැපයුම එනතෙක් අපට ඉන්න සිද්ධ වෙනවා. ඒ නිසා තාවකාලික හිඟයක් පවතිනවා. මම පිළිගන්නවා, ඒක රෝගීන්ට ප්‍රශ්නයක් කියලා. ඒ නිසා අපි මේ සැපයුම්කරුට දැන් දැනුම් දීලා තිබෙනවා, ගුවන් මඟින් ඉක්මනට යම් ඇණවුම් ප්‍රමාණයක් ගෙන එන්නට කියලා. ඒ වාගේම, 2027 වර්ෂයට ඇණවුම් බාර ගත් කෙනාටත් අපි දන්වා තිබෙනවා, කඩිනමින් මේවා සපයන්න කියලා. මේ විධියට තමයි මේ ප්‍රශ්නයට අපි පිළිතුරු සොයාගෙන යන්නේ.

ගරු මන්ත්‍රීතුමනි, මෙන්න මේ විධියට තමයි අපේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සහ නීති පද්ධතිය තුළ මේ ප්‍රශ්නය යම් ප්‍රමාණයකට හිර වෙලා තිබෙන්නේ. මේ රෝගීන් අපහසුතාවට පත් වන ආකාරයට ඒ කටයුතු සිද්ධ වෙලා තිබෙනවා. එම නිසා එක පැත්තකින් අපි මේ රෝගීන්ගේ ජීවිත පිළිබඳව සලකා බලන්න ඕනෑ. අනෙක් පැත්තෙන් මේ තිබෙන නීතිමය සහ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳව සලකා බලන්න ඕනෑ. Label එක නැතිව මේ ඖෂධය රෝහල්වලට නිකුත් කිරීමේ හැකියාවක් දැනට ජාතික ඖෂධ නියාමන අධිකාරියට නැහැ. විශේෂයෙන්ම 2022-2024 වාගේ කාලවල මේ රටේ ඖෂධ සැපයීම් ක්‍රියාවලියේ කරපු ඉතාම නරක සහගත දේවල් නිසා අපේ ආයතන පද්ධතිය අඩපණ කරලා තිබෙන්නේ. මෙවැනි ආකාරයේ හදිසි අවශ්‍යතාවකදී තීන්දුවක්

ගත නොහැකි ආකාරයට මේවා හිර කර තිබෙනවා. ඇත්තටම මම හිතනවා, මේ සම්බන්ධයෙන් කඩිනමින් - සතියක් විතර යනකොට - යම් ප්‍රමාණයක් ගෙන්වා ගන්න පුළුවන්කම ලැබෙයි කියලා. අපේ NMRA එකත්, SPC එකත්, MSD එක ඇතුළු සෞඛ්‍ය අමාත්‍යාංශයට සම්බන්ධ සියලු අය අමාත්‍යාංශ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් මේ ගැන සාකච්ඡා වට කිහිපයක් පවත්වමින්, රෝගීන්ට මේ තිබෙන අපහසුතා මඟහරවා ගැනීම සඳහා කටයුතු කරමින් ඉන්නවා කියන කාරණය මම සඳහන් කරන්න කැමැතියි.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා සඳහන් කළ ආකාරයට මීට මාස දොළහකට කලිනුයි, මාස නවයකට කලිනුයි ඇණවුම් කරපු ඖෂධ මැයි මාසයේ නේ, ආවා කියලා කිව්වේ. එතකොට ඇණවුම් කරපු දවසේ ඉඳන් ඒ ඖෂධ ලැබෙන්න මාස තුන හතරක කාලයක් ගත වෙලා තිබෙනවා. ජනවාරි මාසයේ දාපු order එකක් මැයි මාසයේ ආවා කියන කාරණයක් ඔබතුමා කිව්වා නේ. දැනට අපේක්ෂා රෝහලේ පමණක් එම එන්නත් අවශ්‍යතාව මාසයකට 9,000ක් පමණ වනවා. දැනට ලංකාව තුළට මේ එන්නත් ඇවිල්ලා තිබුණාට, ඔබතුමා කියපු ආකාරයට පසුගිය කාලයේ ඇස්වල පෙනීම නැති වන තරමට දුන්නු බෙහෙත සම්බන්ධයෙන් රාජ්‍ය නිලධාරිනුත් භය වෙලා ඇති කියන එක මම පිළිගන්නවා. හැබැයි, මේ වෙනුවෙන් දැනට බෙහෙතක් තිබෙනවා නම් රුපියල් 23,000ක් දීලා ඒවා ගන්න එක නවත්වන්න ඕනෑ. ඒ වෙනුවෙන් දැනට ගෙනැල්ලා තිබෙන බෙහෙත් එක හරි ඔබතුමා කියනවා වාගේ air freight කරලා, වහාම ගෙනැල්ලා අවශ්‍ය quantity එක දෙන්න පුළුවන් නම් ගැටලුවක් නැහැ. හැබැයි, යාපනයේ රෝහල්වලත්, අනෙක් රෝහල්වලත් මේ සම්බන්ධයෙන් ගැටලුවක් තිබෙනවා. එම නිසා අඩුම තරමින් මේ සම්බන්ධයෙන් කුමන හෝ කමිටුවක් පත් කරලා, මේ පිළිබඳව අධ්‍යයනයක් කරලා, මේකට වහාම විසඳුමක් දෙන්න පුළුවන් ක්‍රමවේදයක් හොයන්න කියන එක තමයි මම කියන්නේ. මොකද, නැත්නම් මේකෙන් වෙන්නේ අමාත්‍යාංශය හරහා ඔබතුමා ගන්න මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙනකල් සාමාන්‍ය අසරණ මිනිස්සුන්ට රුපියල් 23,000ක් දීලා මේ බෙහෙත් ගන්න වන එකයි. අමාත්‍යාංශයේ නිලධාරින් මොනවා කිව්වත් අපේ රටේ ජනතාවට මේ සම්බන්ධයෙන් සහනයක් දෙන්න ඔබතුමාට වගකීමක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු මන්ත්‍රීතුමා කියන්නේ ඇත්ත, ගරු කථානායකතුමනි. එම රෝගීන් පිළිබඳව වගකීම් භාරගෙන තමයි අපි ඒ වෙනුවෙන් මැදිහත් වෙමින් ඉන්නේ. ඒ නිසා තමයි මම මේ සම්බන්ධයෙන් විසඳුම් කිව්වේ. එක විසඳුමක් හැටියට තිබෙන්නේ Sri Lanka College of Oncologists සහ Sri Lanka College of Haematologists කියන අපේ විශේෂඥ වෛද්‍යවරුන්ගේ ආයතන දෙක විසින් යම් නිර්දේශයක් ලබා දුන්නොත්, NMRA එකට ඒ සම්බන්ධයෙන් සලකා බලන්න පුළුවන්ද කියන එකයි. ඒ පිළිබඳව අපි සාකච්ඡා කරමින් ඉන්නවා.

ඒ වාගේම තමයි, මේකේ labelling process එක. ඇත්තටම චීනයට යවලා මේක යළි ගෙන්වා ගන්න සාමාන්‍ය ක්‍රමවේදයට අනුව සති හයක් විතර ගත වෙනවා. ඒ සියලු පැති සලකා බලමින් තමයි අපි කටයුතු කරන්නේ. මෙන්න මේ වාගේ ඉතාම ප්‍රායෝගික ප්‍රශ්නයකට තමයි සෞඛ්‍ය අමාත්‍යාංශය විසඳුම් හොයමින් යන්නේ. බොහොම ස්තුතියි, මෙවැනි ප්‍රශ්නයක් මතු කිරීම සම්බන්ධයෙන්.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු කාදර් මස්තාන් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)

මම Health Ministerගෙන් මෙන්න මේ කාරණය අහනවා. මන්නාරමට තිබෙන්නේ general hospital එකයි. ඒකට intern medical officersලා දෙනවා කියලා,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඒක point of Order එකක් නොවෙයි.

අමාත්‍යාංශ නිවේදන, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය ගරු ආනන්ද විජේපාල මහතා.

## පලෙයි වන රක්ෂිතයේ එල්ටීටීඊ කඳවුරක් ඇති බව පැවසෙන සමාජ මාධ්‍ය පුවත්: මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## சமூக வலைத்தளங்களில் பளை வனப்பகுதியில் LTTE முகாம் உள்ளதாகக் கூறப்படும் செய்தி: பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரினது கூற்று
## SOCIAL MEDIA REPORTS OF AN LTTE CAMP IN PALAI FOREST RESERVE: STATEMENT BY MINISTER OF PUBLIC SECURITY AND PARLIAMENTARY AFFAIRS

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

ගරු කථානායකතුමනි, පසුගිය දින කිහිපය පුරාම සමාජ මාධ්‍ය ඔස්සේ වීඩියෝවක් සංසරණය වුණා. ඒ සම්බන්ධයෙන් මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු ඇමතිවරයා හැටියට මම කරුණු පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි. ඒ සමාජ මාධ්‍ය හෙළිදරව්ව තිබුණේ, "පලෙයි කැලේ එල්ටීටීඊ පුහුණු කඳවුරක් ගැන ඇස් උඩ යන ප්‍රබල හෙළිදරව්වක්" යනුවෙන්. මෙහි සඳහන් වුණා, එහි පුහුණු කඳවුරක් සහ බෝම්බ නිෂ්පාදන කම්හලක් තිබෙනවාය කියලා. ඒ කාරණය ඒත්තු ගන්වන්න හැදුවා. ඒක මේ සමාජය නොමඟ යවන්න කරපු ප්‍රකාශයක්. මේ පිළිබඳව

[ගරු ආනන්ද විජේපාල මහතා]

විමර්ශනයක් සිද්ධ කළා. ඒ විමර්ශනය අනුව පැහැදිලි වුණා, කනගරායම්පුර බටහිර, මුක්කප්පන්, අක්කරායන්කුලම් අක්කර දහයක භූමි ප්‍රමාණයක් කනගරායම්පුර බටහිර පදිංචි ත්‍යාගරාසා විසින් එළිපෙහෙළි කර තිබෙනවාය කියලා.

එහි කොන්ක්‍රීට් කණු යොදා වැටක් සකස් කර තිබෙනවා. අඩි 32 x 32 ප්‍රමාණයේ ගොඩනැඟිල්ලක් තිබෙනවා. එය තට්ටු තුනක ගොඩනැඟිල්ලක්. හතරවැනි තට්ටුව ඉදි කරමින් පවතිනවා. එහි පළමුවැනි මහලේ සහ දෙවැනි මහලේ ජූකි මැෂින් 22ක් දමලා ඇඟලුම් කර්මාන්තශාලාවක් පවත්වාගෙන යනවා. ඒ අක්කර 10 තුළ කෝමාරිකා සහ එළවළු වගා කර තිබෙනවා. ඒ ප්‍රදේශයේ අය එහි රැකියා කරමින් සිටිනවා.

ඒ ව්‍යාපාරය Nature Farming නමින් සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබෙනවා. එම පුද්ගලයා විසින් වගා කර තිබෙන එම ඉඩම පසුකාලීනව අක්කර 10න් එහාට ගිහින් අක්කර 21ක් දක්වා එළි පෙහෙළි කරගෙන එම ගොවිපළ පවත්වාගෙන ගොස් තිබෙනවා. ඒ ගොවිපළ සම්බන්ධයෙන් තමයි සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රචාරණයක් පළ වුණේ. ඒ ප්‍රචාරණය හරහා ඔවුන් උත්සාහ කර තිබුණා, එතැන එල්ටීටීඊ පුහුණු කඳවුරක් සහ බෝම්බ නිෂ්පාදන කම්හලක් තිබෙනවාය, ඒ සම්බන්ධයෙන් රජය නිහඬව ඉන්නවාය කියලා කියන්න. එය, මේ ප්‍රකාශය කළ පුද්ගලයා විසින් හොයා ගත් කාරණයක් හැටියට හුවා දක්වමින් සමාජය නොමඟ යවන්න, ජාතීන් අතර අසමගිය වපුරන්න කටයුතු කරන ස්වභාවයක් තමයි ඒ තුළින් පැහැදිලි වුණේ. අපි මේ පිළිබඳව සොයා බැලුවා. ඒ අනුව එතැන ගොවිපළක් පවත්වාගෙන යන බව හෙළි වුණා. හැබැයි, ඒ ගොවිපළ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබුණා. ඇත්ත වශයෙන්ම ඒක පලෙයි වන රක්ෂිතයට අයත් ඉඩමක් බව, ඒකට ත්‍යාගරාසා ඇතුළු පුද්ගලයින් හතරදෙනෙකු ඇතුළු වෙලා මේ ෆාම් එක පවත්වාගෙන යනවා කියන කාරණය තමයි මේ පිළිබඳ විමර්ශනයේදී හෙළි වුණේ. මේ සම්බන්ධයෙන් රජය පැත්තෙන් ගත් ක්‍රියාමාර්ග මොනවාද කියලා මා කෙටියෙන් හරි පැහැදිලි කරන්න අවශ්‍යයි.

මේ ගොවිපළ සම්බන්ධයෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වෙලා තිබෙනවා. ඒ අනුව ත්‍යාගරාසා කියන පුද්ගලයා ඇතුළු තවත් හතරදෙනෙකුට එරෙහිව නඩු පවරලා තිබෙනවා. පසුව ඔවුන් රුපියල් ලක්ෂ 5ක ශරීර ඇප මත මුදා හැර තිබෙනවා. ඊට පස්සේ අධිකරණය ඔවුන්ට තහනම් නියෝගයක් දීලා තිබෙනවා, ඒ භූමියට ඇතුළු වෙන්න එපා කියලා. ඊට පසුව 2026.02.17 වන දින සැකකරුවන් අධිකරණයට මෝසමක් ඉදිරිපත් කරලා ඒ අතුරු තහනම ඉවත් කරගෙන තිබෙනවා. ඉදිරි නඩු දිනය 2026.08.25 දිනට යෙදී තිබෙනවා. මේ ගොවිපළ තිබෙන්නේ රජය සතු ඉඩමක කියලායි රජයේ පාර්ශ්වයෙන් කියන්නේ; වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් කියන්නේ. නමුත් ඔහු කියන්නේ, ඒක ඔහුගේ සහෝදරයෙකුට අයත් ඉඩමක් කියලායි.

මේ සම්බන්ධයෙන් අපි දෙවැනි නඩුව පවරා තිබෙන්නේ, 2026.03.13වැනි දා. අඩවි වන නිලධාරින්ට ලද තොරතුරක් අනුව පරීක්ෂා කිරීමේදී සැකකරුට අයත් භූමිය තුළ තිබී සලකුණු නොකළ, බලපත්‍ර නොමැති කළුවර, පලු, වීර, මිල්ල, බුරුත ආදී දැව තොගයක් අත්අඩංගුවට ගෙන තිබෙනවා. ඒ සම්බන්ධයෙනුත් ඔහුට නඩුවක් පවරා තිබෙනවා. ඒ නඩුවත් විභාග වෙනවා. ඊළඟට තවත් නඩුවක් පවරා තිබෙනවා. එම පුද්ගලයා විසින් එළි කරන ලද ඉඩම පරීක්ෂා කිරීමේදී ඉඩමට යාබද තවත් ස්ථාන දෙකක කැලය එළි පෙහෙළි කරමින් තිබුණා. ඒ නිසා ඔහුට නැවතත් වන සංරක්ෂිතය එළි පෙහෙළි කිරීම සම්බන්ධයෙන් අධිකරණයට ඉදිරිපත් කර තිබෙනවා. ඒ තුන්වැනි නඩුව. ඊට පස්සේ 2026.03.24 දින ගරු අධිකරණයට කරුණු වාර්තා කරමින් අක්කර 10ට අමතරව තවත් අක්කර 11ක භූමි ප්‍රමාණයක් එළි පෙහෙළි කළා කියලා සැකකරුට විරුද්ධව නඩු පැවරීමක් සිද්ධ කළා. ඒ අනුව ඔහුට දී තිබුණු ඇප අවලංගු කරලා දින 14 ක් රක්ෂිත බන්ධනාගාරගත කරලා තිබෙනවා. එවිට ඔහු අභියාචනයක් ඉදිරිපත් කර තිබෙනවා, ඒක පෞද්ගලික ඉඩමක් කියලා.

ඊට අමතරව විශේෂ කාර්ය බලකායට ලැබුණු තොරතුරක් අනුව ඒ භූමිය පරීක්ෂා කරන්න යාමේදී එහි හිටපු පිරිස විශේෂ කාර්ය බලකායේ නිලධාරින්ට බාධා කර තිබෙනවා. රාජකාරියට බාධා කිරීමට එරෙහිවත් නඩුවක් පවරා තිබෙනවා. මේ ආකාරයට අධිකරණ ක්‍රියාමාර්ග හතක් ගෙන තිබියදී තමයි, එම ඉඩමේ සහ එම ගොඩනැඟිල්ලේ එල්ටීටීඊ පුහුණු කඳවුරක් සහ බෝම්බ නිෂ්පාදන කර්මාන්තශාලාවක් පවත්වාගෙන යන බවට හැඟවෙන ආකාරයේ වීඩියෝ පටයක් සමාජ මාධ්‍ය තුළ සංසරණය කරවීමට එක්තරා පුද්ගලයෙක් කටයුතු කර තිබුණේ. ඒකෙදි මතු කර තිබුණේ, මේ සම්බන්ධව ආණ්ඩුව නිහඬව ඉන්නවා, ආණ්ඩුව දන්නේ නැහැ වාගේ අදහසක්. උතුරු පළාතේ, පලෙයි කැලයේ එල්ටීටීඊ පුහුණු කඳවුරක් තිබෙනවා, බෝම්බ නිෂ්පාදනාගාරයක් තිබෙනවා වාගේ අදහසක් සමාජය තුළ නිර්මාණය කරලා, ආණ්ඩුව මේ ගැන ඇහුම්කන් දෙන්නේ නැහැ, හොයා බලන්නේ නැහැ, ඒ පිළිබඳව කටයුතු කරන්නේ නැහැ කියන අදහස දෙමින් සමාජය තුළ වෛරය වාගේම ජාතීන් අතර අසමගිය පතුරවන්න තමයි ඒ පුද්ගලයා කටයුතු කරලා තිබුණේ.

ඉතින්, මේ සම්බන්ධයෙන් රජයේ පාර්ශ්වයෙන් අධිකරණ ක්‍රියාමාර්ග හතක් අරගෙන තිබෙනවා, මේ පුද්ගලයා කියන්න පෙරාතුව. ඒ වාගේම, ඔහුගේ වත්කම් පිළිබඳ විමර්ශනයක් සිද්ධ වෙනවා. ඒ වාගේම, ඔහු ව්‍යාජ ලෙස මුදල් තැන්පතු භාර ගැනීම සම්බන්ධයෙන් විමර්ශනයකුත් සිද්ධ වෙමින් පවතිනවා. මේ කාරණා පිළිබඳව රජය මේ ආකාරයට මැදිහත් වෙමින් තිබියදී තමයි සමාජ මාධ්‍ය ඔස්සේ මේ ප්‍රකාශය කළේ. කොළඹ පිහිටි හෝටලයකදී, අන්තර් මහාද්වීපික මානව හිමිකම් කොමිසමේ විධායක අධ්‍යක්ෂ යැයි කියා ගන්නා සංගීත් ජයසේකර මහතා විසින් මාධ්‍ය හමුවක් පවත්වමින් තමයි මේ ප්‍රකාශය කළේ. මේ සම්බන්ධයෙන් විමර්ශනයක් කළා, ත්‍රස්ත විමර්ශන කොට්ඨාසය විසින්. විමර්ශනයක් කරලා මේ පුද්ගලයා ගෙනැවිල්ලා මේ පිළිබඳව පැහැදිලි කිරීමක් කරගැනීමට අවශ්‍යයි කියලා, ඒ කටයුත්ත දැන් දින දෙකකට පෙරාතුව ආරම්භ කළා. ත්‍රස්ත විමර්ශන කොට්ඨාසයෙන් මේ ප්‍රදේශයට ගිහිල්ලා විමර්ශනයක් කළා. ඒ විමර්ශනය අනුව තහවුරු වුණා, කිසිදු ආකාරයේ LTTE පුහුණු කඳවුරක් හෝ බෝම්බ නිෂ්පාදන කර්මාන්තශාලාවක් නොවෙයි, එය සාමාන්‍ය ගොවිපළක් බව. ඒ නිසා ජාතීන් අතර අසමඟිය ඇති කරන සහ සමාජය නොමඟ යන ආකාරයේ ප්‍රකාශ කරමින් කටයුතු කිරීම සම්බන්ධයෙන් ඊයේ දිනයේ මේ පුද්ගලයා අත්අඩංගුවට ගනු ලැබුවා.

විශේෂයෙන් ඔහු කවුද කියලාත් මේ සභාවට ප්‍රකාශ කරන්නට අවශ්‍යයි. ඔහුගේ නම රඹුක්කේවල අදිකාරම්ගේ සංගීත් ජයසේකර. ඔහු සතුව තිබුණා අංක 801433573V දරන හැඳුනුම්පත. ඒක ව්‍යාජව සකස් කරපු හැඳුනුම්පතක්. ඔහු හැඳුනුම්පත් දෙකක් භාවිත කරනවා. මේ හැඳුනුම්පත් ඔස්සේ අපි විමර්ශනය සිද්ධ කළා. ඔහු එක් වෙලාවක වෛද්‍යවරයෙක් වශයෙන් පෙනී සිටිනවා. එය, වෛද්‍ය කියන තනතුර ව්‍යාජ ලෙස භාවිත කිරීමක්. ඔහු අන්තර් මහාද්වීපික මානව හිමිකම් කොමිසමේ විධායක අධ්‍යක්ෂ නමින් සඳහන් කළත් එවැනි තනතුරක් ඔහුට කවුරුත් පිරිනමලා නැහැ. මේ පුද්ගලයා කරන ලද ප්‍රකාශය ඇත්තටම බරපතළ ප්‍රකාශයක්. මේක වගකීම් විරහිතව කරන ලද ප්‍රකාශයක්. මොහුගේ ලිපිනයන් පිළිබඳ

සොයා බැලුවාම ඔහු වරින් වර ලිපින 7ක් භාවිත කර තිබෙනවා. ඒ වාගේම, මොහු පිළිබඳව ඔහුගේ හැඳුනුම්පත් හරහා පරීක්ෂා කර බලපුවාම මොහු අපරාධ චෝදනා 3කට සැකකරුවෙක් බවට අධිකරණය ඉදිරියේ කරුණු වාර්තා වෙලා තිබෙනවා. එක් චෝදනාවක් තමයි, ඉඩමකට ව්‍යාජ ලේඛන සකසා ඉඩම විකිණීම සම්බන්ධයෙන් වැලිකඩ පොලිස් ස්ථානය විසින් අධිකරණයට කරුණු වාර්තා කර තිබීම. දෙවැනි චෝදනාව ගත්තොත්, නීති විරෝධී රැස්වීමක සාමාජිකයකු වීම, ඉඩමකට අයුතු ඇතුළු වීම, බලයෙන් ලබා ගැනීම. මොහු අන් අයෙකු ලෙස පෙනී සිටිමින් පොලිස් නිලධාරින්ට සාපරාධී බලහත්කාරය පෑම සම්බන්ධයෙන් වැලිකඩ පොලිස් ස්ථානය විසින්ම අධිකරණයට කරුණු වාර්තා කර තිබෙනවා. තවත් චෝදනාවක් තිබෙනවා. ව්‍යාජ ඔප්පු මඟින් වංචනිකව දේපළ අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් පොලිස් විශේෂ කාර්යාංශය විසින් නුගේගොඩ මහෙස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කර තිබෙනවා. මේ පුද්ගලයාගේ පසුබිම මේ ආකාරයයි. මේ පුද්ගලයා දැනට ලිපින 7ක් භාවිත කරමින් තමයි ඒ කටයුතු කර තිබෙන්නේ. ව්‍යාජ හැඳුනුම්පත් දෙකක් භාවිත කර තිබෙනවා. මේ පුද්ගලයා මීට පෙර යම් අමාත්‍ය හෝ මන්ත්‍රී කාර්ය මණ්ඩල උපදේශකවරයකු ලෙස කටයුතු කරමින් ඉඳලාත් තිබෙනවා. මේ පිළිබඳ තවදුරටත් විමර්ශන පවත්වමින් සිටිනවා. දැනට මේ පුද්ගලයා අත්අඩංගුවට අරගෙන දින 14ක් රක්ෂිත බන්ධනාගාරගත කර තිබෙනවා. මේ පිළිබඳ විමර්ශන ඉදිරියටත් පැවැත්වෙනවා.

කිසිදු ත්‍රස්තවාදී සංවිධානයකට සංවිධානය වෙන්න කිසිදු ආකාරයේ ඉඩකඩක් දෙන්නේ නැහැ වාගේම, එවැනි ත්‍රස්තවාදී සංවිධාන සංවිධානය වෙනවා යැයි දඩමීමා කරමින් ජාතිවාදය අවුස්සන්නත්, ආගම්වාදය අවුස්සන්නත් කිසිදු ආකාරයේ ඉඩකඩක් දෙන්නේ නැහැ කියන කාරණය මා මෙම සභාවට අවධාරණය කරන්න කැමැතියි, ගරු කථානායකතුමනි. අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් බොහොම ස්තුතියි.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගෙන් පැහැදිලි කර ගැනීමක් කරගන්න පුළුවන්ද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒක point of Order එකක් නොවෙයි. *[බාධා කිරීමක්]* හොඳයි. ඔබතුමාගේ point of Order එක මොකක්ද කියන්න.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
එතුමා ඉඩ දෙනවා නම් මම ප්‍රශ්නය අහනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, එහෙම බැහැ.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
නැහැ, නැහැ. එතුමාගෙන් අහන්නේ, ඔබතුමාගෙන් නොවෙයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ පාර්ලිමේන්තුව පවත්වන්නේ මගේ විධානවලට අනුව, ගරු මන්ත්‍රීතුමනි. එහෙම අහන්න බැහැ. *[බාධා කිරීම්]* ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක කියන්න ඕනෑ. ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමනි, points of Order නඟන්න පුළුවන් වෙන්නේ සභාවේ පැවැත්ම සහ මොනවා හෝ තිබෙන ගැටලුවක් සම්බන්ධවයි. වහාම ගරු මන්ත්‍රීතුමා කියවන්න. *[බාධා කිරීම්]* ඔබතුමාගේ point of Order එක කියන්න, ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමනි.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු කථානායකතුමනි, මම ඇමතිතුමාගෙන් දැනගන්න කැමැතියි, මේ අක්කර 10ක් කැලය කපලා ගොඩනැඟිල්ලක් හදනකල් ආණ්ඩුවේ නිලධාරින්, ආණ්ඩුව බලාගෙන හිටියේ මොකද කියලා. නඩු පවරන ඒවායි, අත්අඩංගුවට ගන්න ඒවායි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමනි, මන්ත්‍රීවරයකු විසින් රීති ප්‍රශ්න අහන්න පුළුවන් වන්නේ, ඡන්දයක් ප්‍රකාශ කිරීමට බෙදීමක් පවතින විටක දී හැර, පාර්ලිමේන්තුවේ කවර හෝ කටයුත්තක දී නිවැරදි ක්‍රමවේද අනුගමනය කරනු ලැබ තිබේ ද හෝ කරනු ලබමින් තිබේ ද යන්න පිළිබඳවයි. එහෙම තමයි ස්ථාවර නියෝගවල "රීති ප්‍රශ්න" යටතේ සඳහන්ව තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මෙච්චර කල් පාර්ලිමේන්තුවේ ඉඳලාත් රීති ප්‍රශ්නයක් අහන්න දන්නේ නැහැ නේ. *[බාධා කිරීම්]*

ප්‍රධාන වැඩකටයුතු.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආනන්ද විජේපාල අමාත්‍යතුමා.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු කථානායකතුමනි, එතුමා ප්‍රශ්නයක් ඇහුවා. ඒ ගැන පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මගේ ප්‍රකාශය අහගෙන ඉඳලා නැහැ. අපි ඔහුට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග 7ක් අරගෙන තිබෙනවා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
කොයි කාලයේ ද?

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
2026 වර්ෂය ආරම්භයේ ඉඳලා දිගින් දිගටම ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. මේ අවුරුද්දේ මාස 8ක් ගත වෙලා තිබෙනවා. පෙබරවාරි, මාර්තු, අප්‍රේල් ආදි වශයෙන් ඔහුට විරුද්ධව දිගින් දිගටම ක්‍රියාමාර්ග ගෙන තිබෙනවා; වරෙන්තු නිකුත් කර තිබෙනවා; දින 14ක් රඳවාගෙන ඉඳලා තිබෙනවා. ඔහු අභියාචනා ඉදිරිපත් කර තිබෙනවා. අපි ඔහුට එරෙහිව දිගින් දිගටම කටයුතු කර තිබෙනවා. එම නිසා අප ඔහුට එරෙහිව කටයුතු කරලා නැහැ කියන්න බැහැ. අධිකරණ ක්‍රියාමාර්ග 7ක් අරගෙන තිබෙනවා. එම ක්‍රියාමාර්ග 7 සම්බන්ධයෙනුත් මම මේ අවස්ථාවේ ප්‍රකාශ කළා. ඔබතුමා හැන්සාඩ් වාර්තා අරගෙන කියවා ගත්තා නම් හරි කියලායි මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී යෝජනා, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

## වරප්‍රසාද යෝජනා
## சிறப்புரிமைப் பிரேரணைகள்
## PRIVILEGE MOTIONS

### පාර්ලිමේන්තුව තුළ අපහාසාත්මක වචන භාවිත කිරීම
### பாராளுமன்றத்தினுள் இழிவான வார்த்தைப் பிரயோகம் மேற்கொண்டமை
### USE OF DEROGATORY LANGUAGE IN PARLIAMENT

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා විසින් තමාගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2026 ජූලි 07 දින වරප්‍රසාද ප්‍රශ්න යටතේ පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය."

**ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු. ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

## ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ (සංශෝධන) පනත් කෙටුම්පත
## பெண்களையும், இளம் ஆட்களையும் மற்றும் பிள்ளைகளையும் தொழிலுக்கமர்த்துதல் (திருத்தம்) சட்டமூலம்
## EMPLOYMENT OF WOMEN, YOUNG PERSONS AND CHILDREN (AMENDMENT) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
ගරු කථානායකතුමනි, කම්කරු අමාත්‍යතුමා වෙනුවෙන්, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Hon. (Mrs.) Saroja Savithri Paulraj to start the Debate. You have 13 minutes.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்றும் அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

[පූ.භා. 11.50]

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය (කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ் - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj - Minister of Women and Child Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ

(සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ විවාදය අද පවත්වනු ලබනවා. ශ්‍රී ලංකාවේ, ළමා ශ්‍රමය සම්බන්ධ නීති රීති ක්‍රියාත්මක කරන ආයතනය හැටියට කටයුතු කරන්නේ කම්කරු දෙපාර්තමේන්තුවයි.

ළමා ශ්‍රමයට අදාළ කම්කරු පනත් සහ රෙගුලාසි ගණනාවක් තිබෙනවා. විශේෂයෙන්ම 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ පනත ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය සම්බන්ධයෙන් අදාළ වෙනවා. එම පනතට අදාළ සංශෝධනයි අද දිනයේ ඉදිරිපත් කරනු ලබන්නේ. 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ පනත යටතේ වන වැරැදිවලට අදාළව දඩ මුදල් සංශෝධනය කිරීම තමයි මෙහිදී සිදු වන්නේ. විශේෂයෙන් දරුවන් සේවයේ යෙදවීම - ළමා ශ්‍රමය ලබා ගැනීම - සම්බන්ධ වැරැදි සඳහා මේ වන විට පවතින දඩ මුදල් සංශෝධනය කිරීම සඳහා තමයි මෙම පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙන්නේ.

මෙහිදී මා කිව යුතු විශේෂ කාරණයක් තිබෙනවා. මේ පනත සඳහා 1956 ඉඳන් වරින් වර සංශෝධන රාශියක් ඉදිරිපත් වෙලා තිබෙනවා. 1964 අංක 43, 1973 අංක 29, 1984 අංක 32, 2003 අංක 8, 2006 අංක 24 සහ 2021 අංක 2 යන පනත් මඟින් මෙම පනත සංශෝධනය වෙලා තිබෙනවා. ඊට අමතරව 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥා පනතේ වගන්ති කිහිපයකත්, 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක පනතේත් ළමා ශ්‍රමය යෙදවීම සම්බන්ධව කරුණු සඳහන් වෙලා තිබෙනවා. ලංකාවේ කම්කරු නීතිය අනුව 2021ට පෙර තිබුණේ වයස අවුරුදු 14ට අඩු දරුවෙකු සේවයේ යෙදවීම වැරැදියි කියන එකයි. නමුත්, 2021 අංක 2 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ (සංශෝධන) පනත අනුව 2021 ඉඳන් එම වයස් සීමාව වයස අවුරුදු 16 දක්වා, එනම් අනිවාර්ය අධ්‍යාපන වයස දක්වා වැඩි කර තිබෙනවා.

ඒක සාධනීය තත්ත්වයක්. ලෝකය පුරා පිළිගැනීම අනුව වයස අවුරුදු 18ට අඩු අය දරුවන් සේ සැලකෙනවා. ළමා ශ්‍රමය යෙදවීම කියන කාරණාවේදී වයස අවුරුදු 16ට අඩු අය ළමා ශ්‍රමය ලබා ගැනීම සඳහා යොදවා ගැනීම වැරැදියි කියා අද වන විට අර්ථ දක්වා තිබෙනවා. වයස අවුරුදු 16ට අඩු අය අනිවාර්යයෙන්ම සේවයේ යෙදවීම වැරැදි වන අතරම, වයස අවුරුදු 16ත්, 18ත් අතර දරුවන් පවා සේවයේ - අන්තරායකර රැකියා, අවදානම් සහගත රැකියා සහ අනාරක්ෂිත රැකියාවල - යෙදවීම අනිවාර්ය වරදක් බවට පත් වෙනවා. ඒ නිසා වයස අවුරුදු 16ත්, 18ත් අතර දරුවන් පවා මේ විධියට අවදානම්කාරී රැකියාවල යොදවන්න බැහැ.

වර්තමානයේදී අපි කථා කරන කොට කියනවා, ළමයින්ගේ ආරක්ෂාව, සෞඛ්‍ය, සදාචාරාත්මක හානි වාගේම අධ්‍යාපනයට බලපාන රැකියාවල යොදවා ගැනීම කිසිසේත් කරන්න බැහැ කියන එක. හැබැයි, අද ලංකාව දිහා බලන කොට විතරක් නොවෙයි, ලෝකයම දිහා බලන කොට අපට ඉතා පැහැදිලිව පෙනෙන්න තිබෙන දෙයක් තමයි, ලෝකය පුරා සිටින ළමයින්ගෙන් මිලියන 138ක් මේ වන කොට ළමා ශ්‍රමය ලබා ගැනීම සඳහා යොදා ගන්නවා කියන එක. ඒ පිළිබඳව කාරණා කිහිපයක් කියන්න ඕනෑ. ළමා ශ්‍රමය වගේම බලහත්කාර ශ්‍රමයේ යෙදවීම, දරුවන් වහල් වෙළඳාමේ යෙදවීම සහ අන්තරායකර - අනාරක්ෂිත - රැකියාවල යෙදවීම ගත්තොත්, ඇත්තටම ලංකාව විතරක් නොවෙයි, ලෝකයම අනුමත කරපු කම්කරු නීති අනුව විශේෂයෙන්ම ILO Convention Nos. 138 සහ 182 අපරානුමත කරපු රටක් හැටියට, ළමා අයිතිවාසිකම් පිළිබඳව සම්මුතියට අත්සන් කරපු රාජ්‍යයක් හැටියට අපට අනිවාර්ය වගකීමක් තිබෙනවා, ළමා මෙහෙකාර සේවයට, ශ්‍රමය සූරා කෑමට ඉඩ නොදී ළමයින් ආරක්ෂා කිරීමට. මේ ජාත්‍යන්තර නීති අපරානුමත කරපු අපි, මේ ගෙනැවිත් තිබෙන සංශෝධන පනත් කෙටුම්පත තුළින් බලාපොරොත්තු වෙනවා, මේ වැරැදි ලංකාව තුළ නැවත වතාවක් සිදු වීම අවම කිරීමට පමණක් නොව අවසන් කිරීමට සහ ලංකාව විශේෂයෙන්ම ළමා ශ්‍රමය අවසන් කරපු රාජ්‍යයක් බවට පත් කිරීමට. එහිදී මේ ගනු ලබන ක්‍රියාමාර්ග ඉතා වැදගත් වනවා.

මේ දක්වාම රුපියල් දසදහසක් වැනි සුළු මුදලක දඩයක් තමයි දිගටම පැවතිලා තිබෙන්නේ. අපි එය රුපියල් ලක්ෂය දක්වා වැඩි කරන අතර, මෙහි සඳහන් පරිදි අධිකරණය විසින් නියම කරනු ලබන සෙසු දණ්ඩනයන්ටද මෙම සංශෝධනය ඇතුළත් කරනවා. මෙතෙක් පැවතුණු ලිහිල් නීති පද්ධතිය තුළ ළමා ශ්‍රමය සූරා කෑම, ළමයින් අන්තරායකර - අවදානම් සහගත - රැකියා සඳහා යොදා ගැනීම කියන එක දිගින් දිගටම සිද්ධ වෙලා තිබෙනවා.

ඒ වාගේම, අපි තවත් කාරණාවක් කියන්න ඕනෑ. ඇත්තටම, ළමා ශ්‍රමය යොදා ගැනීමට තහනම් කරපු රැකියා ක්ෂේත්‍ර 51ක් - රැකියා 51ක් නොවෙයි, රැකියා ක්ෂේත්‍ර 51ක් - හඳුනා ගෙන තිබුණා. ඒ රැකියා ක්ෂේත්‍ර 51 මේ වන කොට රැකියා ක්ෂේත්‍ර 71ක් දක්වා වැඩි කර තිබෙනවා. එමඟින්, අනාරක්ෂිතව ගෘහ සේවයේ යෙදවීම, අනෙකුත් කර්මාන්තශාලාවල, පතල්වල, ගැඹුරු සාගරය තුළ, මත්ද්‍රව්‍ය ප්‍රවාහනය හා මත්ද්‍රව්‍ය ජාවාරම්වල යොදා ගැනීම, සදාචාර විරෝධී රැකියාවල, විශේෂයෙන්ම ලිංගික ශ්‍රමය ලබා ගැනීම සහ ස්පා වැනි ආයතනවල දරුවන් යොදවා ගැනීම වැනි කාරණාත් ආවරණය වීමක් සිද්ධ වෙනවා. රැකියා ක්ෂේත්‍ර 51 රැකියා ක්ෂේත්‍ර 71ක් දක්වා පුළුල් කිරීම තුළින් අප බලාපොරොත්තු වන්නේ, දරුවන්ට ආරක්ෂාව ඇති කිරීමයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකාවේ බොහෝ ස්ථානවල දරුවෙකු ශ්‍රමය වැගිරීමේ කාර්යයකට යොදවන්නේ සහ යෙදවෙන්නේ ඇයි කියන කාරණය ගෙන බලමු. ලංකාවේ විතරක් නොවෙයි, ලෝකයේම තත්ත්වයත් ඒකම තමයි. ළමා ශ්‍රමය වගුරන්න සිදු වන්නේම දරිද්‍රතාව කියන කාරණාව මතයි. ඒක නිසා ආණ්ඩුව හැටියට අපි පැහැදිලි ප්‍රතිපත්තියක ඉන්නවා, දරිද්‍රතාව තුරන් කිරීමටත්, මා පිය රැකවරණය සහිත දරුවෙකු ගොඩනැඟීමට අවශ්‍ය වටපිටාව සකස් කිරීමටත්. අපි ඒ වෙනුවෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා. ඇත්තටම ලංකාවේ අනිවාර්ය අධ්‍යාපන වයස වෙච්ච අවුරුදු 16 දක්වා දරුවන්ගේ අධ්‍යාපනය සුරක්ෂිත කිරීමටත්, අනාරක්ෂිත හේතු මත විශේෂයෙන්ම ආර්ථික අපහසුතා මත දරුවන් පාසලෙන් පිටමං වීම කියන තත්ත්වය අවම කර ගැනීමට සහ වළක්වා ගැනීමටත් ගත හැකි සියලු ක්‍රියාමාර්ග අපි අධ්‍යාපන පද්ධතිය තුළ ගනිමින් ඉන්නවා. ඒ වාගේම ළමා හා කාන්තා කාර්යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, කම්කරු අමාත්‍යාංශය හැටියටත් අපි ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා.

එතැනදී, මේ දරුවන් අයිති වෙන්නේ කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයට විතරක් නොවෙයි. අධ්‍යාපන අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, කම්කරු අමාත්‍යාංශය සහ අනෙකුත් අමාත්‍යාංශ - අපි සියලුදෙනාම - ආණ්ඩුවක් හැටියට, රාජ්‍ය ප්‍රතිපත්තියක් හැටියට දරුවන් ආරක්ෂා කර ගැනීම වගකීමක් සේ සලකා කටයුතු කරනවා. කොළඹ නගරය බැලුවත්, වෙනත් ඕනෑම තැනක වුණත් කඩ බක්කියක වැඩට යොදවා ගන්න පුංචි කොලු පැටියෙක් අරගෙන බැලුවොත්, ගෙවල්වල මෙහෙකාර සේවයේ නිරතව ඉන්න යුවතියක් අරගෙන බැලුවොත් - ගෙවල්වල කුලී වැඩට යොදවා ගන්න, නැත්නම් ගෙවල්වල වැඩට යොදවා ගන්න - එක්කෝ වතුකරයෙන් ගෙනාපු කෙනෙක්, එහෙම නැත්නම් දුගී පැලකින්, දුප්පත් පවුලකින් ආපු කෙනෙක්. ඒ දරුවන්ට අධ්‍යාපනය කියන අයිතිය විතරක් නොවෙයි, ජීවත් වීමේ මූලික අයිතිය පවා අහිමි වෙච්ච තත්ත්වය පසුගිය කාලය තුළ අපි දැක්කා. අනාරක්ෂිත, අවදානම් සහ අනතුරුදායක රැකියා කියන

[ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහතා]

ක්ෂේත්‍රයට ගෘහ සේවයේ යෙදවීම කියන එකත් ඇතුළත් වෙනවා. බර වැඩ කරන්න, කඩේ පොළේ යන්න, වාහනවලට භාණ්ඩ පටවන්න, හෝටල්වල සේවය කරන්න, කර්මාන්තශාලාවල වැඩ කරන්න, ලොකු කෘෂි කාර්මික බිම්වල වැඩ කරන්න, තවත් නොයෙකුත් ආවතේව කටයුතු කරන්න ළමයින් යොදා ගෙන තිබෙන අවස්ථා අපි දකිනවා. මේ හැම දරුවෙකුගේම අධ්‍යාපන අයිතිය අපි සුරක්ෂිත කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වර්තමානයේ අපට ලැබිලා තිබෙන සංඛ්‍යා දත්ත එක්ක මම පොඩ්ඩක් කථා කරන්න කැමතියි. 2024 ජන හා නිවාස සංගණන සංඛ්‍යාලේඛන අනුව ලංකාවේ මුළු ජනගහනයෙන් වයස අවුරුදු 14 දක්වා වූ ජනගහනය 4,506,839ක් වෙනවා. වයස අවුරුදු 15-19 අතර ජනගහනය 1,795,038ක් වෙනවා. වයස අවුරුදු 16 දක්වා වූ අනිවාර්ය අධ්‍යාපන වයස තුළ සිටින හැම ළමයෙක්ම ඉගෙන ගන්න ඕනෑ කියන එක ප්‍රවර්ධනය කිරීම සඳහා අපි ආණ්ඩුව හැටියට දීර්ඝ ක්‍රියාවලියක් අරගෙන තිබෙනවා. ඒ වෙනුවෙන් පසුගිය වසර තුළ අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ට පාසල් උපකරණ ලබාගැනීම සඳහා රුපියල් 6,000ක දීමනාවක් ලබා දීලා තිබෙනවා. එහිදී ලංකාව ඇතුළේ නිදහස් අධ්‍යාපනය ආරක්ෂා කරන්න කැපවෙච්ච හැම කෙනෙකුටම අපි ස්තුතිවන්ත වෙනවා. පාසල් දරුවන්ට පාසල් නිල ඇඳුම් ලබා දීම, පෙළ පොත් ලබා දීම කියන ක්‍රියාවලිය දිගටම සිද්ධ වුණා. ඒවාත් එක්ක අපි ආණ්ඩුව හැටියට මේ වෙනකොට අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ට පාසල් පාවහන් වවුචර් ලබා දීම සහ එතැනින් එහාට බාලිකාවන්ට සනීපාරක්ෂක තුවා ලබා දීම දක්වා වූ දීර්ඝ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කර තිබෙනවා.

කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයේ මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය හරහා දරුවන්ට අනිවාර්ය අධ්‍යාපනය ලබා දීමේදී, පෙර පාසල් අධ්‍යාපනය කියන එකත් ඉතාම වැදගත් වෙනවා. විශේෂයෙන් වයස අවුරුදු 0-5 අතර කාලය අපි මුල් ළමාවිය කියලයි සලකන්නේ. වයස අවුරුදු 3 -5 අතර මුල් ළමාවියේ පෙර පාසල් අධ්‍යාපනය ලබන කාලය තුළ දරුවාට එකතු වන ආකල්ප, දරුවාගේ කුසලතා වර්ධනය, සමාජානුයෝජනය වර්ධනය කිරීම සඳහා ක්‍රියාකාරකම් පාදක අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා අපි කටයුතු කරලා තිබෙනවා. අපි මේ රජය භාර ගනිද්දී ඇත්තටම පෙර පාසල් දරුවන්ගේ උදෑසන ආහාර වේල සඳහා ලබා දී තිබුණේ රුපියල් 60ක මුදලක්. අපි ඒක මේ වෙනකොට රුපියල් 100 දක්වා වැඩි කරලා තිබෙනවා. පෙර පාසල් දරුවන් සඳහා ලබා දෙන ආහාර වේල ලබා ගන්නා ළමයින්ගේ ප්‍රමාණය අපි 165,000 දක්වා වැඩි කරලා තිබෙනවා. විශේෂයෙන් උස, බර අඩු දරුවන් හඳුනාගෙන ඒ දරුවන්ට උදෑසන ආහාර වේල ලබා දෙනවා. පාසලේ ප්‍රාථමික ශ්‍රේණිවල දරුවන්ටත් උදෑසන ආහාර වේල ලබා දීමේ ක්‍රියාවලිය සිද්ධ වෙනවා. මේ ආදි වශයෙන් අපි ප්‍රවර්ධනය කරපු වැඩ පිළිවෙළ එපමණකින් නැවතිලා නැහැ. සියලු දරුවන්ට මේ අයිතිවාසිකම් ලබා දෙන්න ඕනෑ නිසාම අපි මේ වෙනකොට ආයතනගත දරුවන්, විශේෂයෙන් පරිවාස නිවාසවල ඉන්න, ළමා නිවාසවල ඉන්න අතහැරුණු දරුවන් සඳහා අපි රුපියල් 5,000ක දීමනාවක් ලබා දෙනවා. ඔවුන්ට "අර්ථ" ඉතුරුම් ගිණුම් ආරම්භ කරලා මුදල් තැන්පත් කරලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, අපි දරුවන්ගේ මුල් ළමාවිය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් හදා, නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට ඇතුළත් කර අනිවාර්යයෙන්ම දරුවන් පාසල්ගත කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරනවා. ඒ වාගේම ඔවුන්ට වෘත්තිය අධ්‍යාපනය ලබා දීම, තාක්ෂණික අධ්‍යාපනය ලබා දීම සහ භාෂා අධ්‍යාපනය ලබා දීම කියන කාරණා පිළිබඳවත් අපි දීර්ඝ වැඩ පිළිවෙළක් හදා තිබෙනවාය කියන කාරණයත් මම සඳහන් කරන්න කැමැතියි.

நான் இவ்வேளையில் கூற விரும்புகின்ற முக்கியமான விடயமொன்று இருக்கின்றது. இலங்கை முழுவதும் சிறுவர் பராமரிப்பு நிலையங்களில் வாழுகின்ற 10,000 சிறுவர்களில் 4,000 பேருக்கு பிறப்புச் சான்றிதழ் இல்லாதபடியால், எங்களுடைய அரசாங்கத்தால் வழங்கப்படுகின்ற 5,000 ரூபாய் கொடுப்பனவைக்கூட அவர்களுக்கு வழங்க முடியாமல் இருக்கின்றது. அவர்களுக்கு உத்தேச வயதுச் சான்றிதழ்களை அல்லது தோராய வயதுச் சான்றிதழ்களைத் தயாரிப்பதற்கான நடவடிக்கைகளை மேற்கொண்டு, 'அர்த்த' எனும் பெயரில் தேசிய சேமிப்பு வங்கிமூலம் வழங்கப்படும் 5,000 ரூபாய் கொடுப்பனவை நாங்கள் வழங்கி வருகின்றோம். சிறுவர்களுக்குக் கட்டாயக் கல்வியை உறுதிப்படுத்துவதன் மூலம்தான் பாலியல் சுரண்டல் மற்றும் உழைப்புச் சுரண்டலில் இருந்து அவர்களை மீட்டுக்கொள்ள முடியுமென நாம் முழுமையாக நம்புகின்றோம். இந்த உத்தேச வயதுச் சான்றிதழ்களைத் தயாரிப்பதற்கு நாங்கள் பிரேரித்தபோது, அது தொடர்பில் திரிபுபடுத்தப்பட்ட செய்திகளைப் பரப்பியதுடன், எங்களுடைய அரசாங்கத்தின் செயற்பாடுகளை இழிவுபடுத்துவதற்கான பிரசாரங்களும் நடைபெற்றன.

நான் இவ்வேளையில் கூறவிரும்புகின்ற விடயம் என்னவென்றால், இலங்கையில் வாழ்கின்ற அனைத்துச் சிறுவர்களுக்கும் பாதுகாப்பானதொரு நாட்டைக் கட்டியெழுப்புவதற்காகவே எங்களுடைய அரசாங்கம் முன்னின்று செயற்படுகின்றது என்பதைத்தான். கல்வி என்பது கட்டாயம்! சிறுவர்களை யாசகம் பெறுவதற்குப் பயன்படுத்துவதற்கோ, வீட்டுப் பணிகளில் ஈடுபடுத்துவதற்கோ, அபாயகரமான பாதுகாப்பற்ற தொழில்களில் ஈடுபடுத்துவதற்கோ எவருக்கும் முடியாது. அவர்களின் பாதுகாப்பை உறுதிப்படுத்துவதற்காகவே நாங்கள் இந்த திருத்தச் சட்டமூலத்தைக் கொண்டுவந்து இருக்கின்றோம். இலங்கையில் அங்கீகரிக்கப்பட்ட சர்வதேச தொழிலாளர் அமைப்பின் 138ஆவது சமவாயம் மற்றும் 182ஆவது சமவாயத்தின் மூலமும், மோசமான வடிவங்களிலான சிறுவர் உழைப்பு சமவாயத்தில் கூறப்பட்டுள்ள - நாங்கள் ஏற்றுக்கொண்டு இருக்கின்ற - உறுதிப்பாடுகளுடன் சிறுவர்களுக்குப் பாதுகாப்பான ஒரு நாட்டைக் கட்டியெழுப்புவது அவசியமாகும்.

நான் முக்கியமானதொரு விடயத்தை தெரிவிக்க விரும்புகின்றேன். திரிபுபடுத்தப்பட்ட செய்திகள்மூலம் எங்களுடைய நல்ல நடவடிக்கைகளை மீள திருப்புவதற்கு நாங்கள் இடமளிக்க மாட்டோம். அதேபோல, வதந்திகளைப் பரப்பி, சிறுவர்களுக்காக முன்னெடுக்கும் எங்களுடைய செயற்பாடுகளை மீள திருப்புவதற்கோ, இந்த அரசாங்கத்தைக் கொச்சைப்படுத்தி, இழிவுபடுத்தி எங்களுடைய நடவடிக்கைகளை முறியடிப்பதற்கோ, ஒடுக்குமுறைக்குள் தள்ளுவதற்கோ எவராலும் முடியாது. ஆகவே, இலங்கை நாட்டில் வாழும் அனைத்துச் சிறுவர்களுக்கும் பாதுகாப்பு வழங்கும் இவ்வாறான நடவடிக்கைகளை மென்மேலும் நடைமுறைப்படுத்துவோமென நான் கூற விரும்புகின்றேன்.

අද දින සම්මත කරනු ලබන මේ සංශෝධන පනත් කෙටුම්පත හරහා ලංකාවේ දරුවන්ගේ අනාගත සුබ සිද්ධිය සඳහා කටයුතු කරනු ලබනවා. ඒ අනුව ළමා ශ්‍රමය අහෝසි කිරීමටත්, අන්තරායකර රැකියාවලින් දරුවන් ගලවා ගැනීම සඳහාත් වන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙනවා. හැබැයි, පාසල් කාලයෙන් පසුව තමන්ගේම ගෙදර තමන්ගේ මව්පියන්ට උදවු කිරීම ළමා ශ්‍රමය සූරාකෑමක් හැටියට හෝ ළමා ශ්‍රමය භාවිත කිරීමක් හැටියටමේ තුළින් කොයිම වෙලාවකවත් අදහස් කෙරෙන්නේ

නැහැ. දරුවන්ගේ කුසලතා වර්ධනය කරගන්න, දෙමව්පියන් සමඟ සාමූහික ක්‍රියාකාරකම්වල යෙදෙන්න දරුවන්ට තිබෙන අයිතිය ජාත්‍යන්තර වශයෙනුත් පිළිගෙන තිබෙනවා. හැබැයි, මොනම වෙලාවකවත් අනර්ථකාරී, අන්තරායකර අවදානම් රැකියාවල දරුවන් යොදවන්න බැහැ. මෙම පනත් කෙටුම්පත සම්මත වීම හරහා එසේ ළමා ශ්‍රමය සූරාකෑම කියන කාරණය අහෝසි වෙනවා පමණක් නොවෙයි, එවැනි ක්‍රියා සම්බන්ධයෙන් දැඩි දණ්ඩන පමුණුවා රටේ නීතිය ක්‍රියාත්මක කිරීමේ වටපිටාව ආරක්ෂා වෙනවා කියන එකත් මම මතක් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට වේලාව ලබා දීම සම්බන්ධව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Chief Government Whip?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට යම් කරුණක් මතු කරන්නට අවසර ලබා දෙන්න.

ඊයේ දවසේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසි දෙවන සංශෝධනයට අදාළව පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් දැනුවත් කිරීම සඳහා විපක්ෂ නායකවරයා විසින් ශ්‍රී ලංකා නීතිඥ සංගමයට ආරාධනා කරලා, මන්ත්‍රීවරුන් කැඳවීම සම්බන්ධයෙන් වන සාකච්ඡාවක් පාර්ලිමේන්තුවේදී සිදු වුණා. විසි දෙවන සංශෝධනය සම්බන්ධව විවිධාකාරයේ අදහස් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් අතර තිබෙන්න පුළුවන්. ඒ වාගේම අවශ්‍ය ඕනෑම වෙලාවක ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපතිවරයා හෝ එම කණ්ඩායම පාර්ලිමේන්තුවෙන් එළියේදී හෝ විපක්ෂ නායක කාර්යාලයේදී හෝ මුණ ගැසෙන්නට විපක්ෂ නායකතුමාට අයිතියක් තිබෙනවා. ගරු සභානායකතුමා ඊයේ පැහැදිලි කළේ පාර්ලිමේන්තුවේ පවතින ක්‍රමවේදය අනුව, අපේ සම්ප්‍රදාය අනුව විපක්ෂ නායකවරයාට පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් සියලු දෙනාම එහෙම කැඳවන්නට අයිතියක් නැහැ කියන කාරණය පිළිබඳවයි. මම හිතන විධියට ඒක මේ මුළු සභාවම පිළිගත්තා.

නමුත් අද දවසේදී ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපතිවරයා විසින් විපක්ෂ නායකවරයාට ඉදිරිපත් කර තිබෙන ලිපියක් මාධ්‍යවලට නිකුත් කර තිබෙනවා. එම ලිපියේ සඳහන් වෙනවා, “However, in light of the proceedings in Parliament today, i.e. 19.08.2026, and the position of the Government expressed threat,....." යනුවෙන්. "Position of the Government expressed threat”. පාර්ලිමේන්තුවේ සභානායකවරයා මේ පාර්ලිමේන්තු සම්ප්‍රදාය සහ ක්‍රමවේදය පිළිබඳව අදහස් දැක්වීම ආණ්ඩු පක්ෂයේ තර්ජනයක් හැටියට සඳහන් කරලා මෙසේ ලිපියක් එවීම පාර්ලිමේන්තු සම්ප්‍රදායයට කොතරම් ගැළපෙනවාද කියන එක අපි තීන්දු කරන්නට ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මන්ත්‍රීවරු විවිධ අදහස් දක්වනවා. නමුත් ඒ කිසිම අවස්ථාවක තර්ජනයක් තිබුණේ නැහැ. අපි කිව්වේ ක්‍රමවේදය මෙන්න මේකයි කියන එකයි. එහෙම අවස්ථාවකදී ශ්‍රී ලංකා නීතිඥ සංගමය වාගේ එකක්, එහි සභාපතිවරයා විපක්ෂ නායකවරයාට කියනවා නම්, "position of the Government expressed threat" කියලා, ඒක පාර්ලිමේන්තු සම්ප්‍රදායය සම්බන්ධයෙන්, පාර්ලිමේන්තුවේ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් ඒ තරම් සුදුසු දෙයක් නොවෙයි. ඒ නිසා එම කාරණය සම්බන්ධයෙන් මම මේ සභාවේ අවධානය යොමු කරවන්න කැමැතියි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, what is your point of Order, Hon. Ajith P. Perera? Make it very short, please.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Leader of the Opposition?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ නලින්ද ඇමතිතුමා මේ කාරණාව පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් මම බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

මම ඊයේ දවසේත් ඉතාම පැහැදිලිව කරුණු කිහිපයක් ඉදිරිපත් කළා. නමුත් සුපුරුදු ආකාරයට විවිධ මාධ්‍ය හරහා ඒවා විකෘති කර තිබෙනවා. ඒ කියන්නේ ලක්ෂ 220ම ගොනාට අන්දන්න. විශේෂයෙන්ම නීතිඥ සංගමයේ සභාපතිතුමාට මා ආරාධනා කිරීමේ ඒ සියලු ලිපි ගොනු සභාගත කළා. එතුමාත් සමඟ ඒ ලිපි ගනුදෙනු කරන අතරතුර, ඒවා පිළිබඳව ගරු කථානායකතුමාවත් මා දැනුවත් කර තිබෙනවා. ඒ වාගේම නීතිඥ සංගමයත්, ඒ දැනුවත් කිරීම් පිළිබඳව ගරු කථානායකතුමාවත්, ගරු සභානායකතුමාවත් දැනුවත් කර තිබෙනවා. ඒ සියලු ලිපි ටික තියෙනවා. මම කටයුතු කළේ සදාචාරසම්පන්නව. මේ ලිපි කිසිම දෙයක් මම මාධ්‍යවලට දුන්නේ නැහැ. නමුත් දැන් මම හැම ලිපියක්ම, - මොකද, දැන් පෙන්වන්න හදනවා නේ, මේ විපක්ෂ නායකවරයාගේ ආරාධනාව කියලා; විපක්ෂ නායකවරයාගේ යෝජනාව කියලා. විපක්ෂ නායකවරයා මේ සභා ගර්භයේදී කිව්වේ මොකක්ද? ගරු කථානායකතුමාගෙන් ඉල්ලීමක් කළා, 225දෙනාම මේකට සම්බන්ධ කරන්න කියලා. මේක මගේ පෞද්ගලික ආරාධනාවක් නොවෙයි. මට එහෙම ආරාධනා කරන්න අයිතියකුත් නැහැ. මම කටයුතු කළේ පහසුකම් සපයන්නෙක් හැටියටයි. විශේෂයෙන්ම මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන පමණක් නොවෙයි, දිගින් දිගටම ගරු විනිසුරුවන් උපරිමාධිකරණවලට, අභියාචනාධිකරණයට, ශ්‍රේෂ්ඨාධිකරණයට පත් නොකිරීම කියන මේ කාරණා දෙකම

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

පිළිබඳවයි අපි කියන්නේ. විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැනයි, මේ කාරණයයි යන දෙකම පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ 225දෙනාම දැනුවත් කරන්න කියන යෝජනාව, ලිපි සහිතව අපි ඉදිරිපත් කළා. ඒ වාගේම මම පසුගිය පාර්ලිමේන්තු අවස්ථාවේ මේ සභා ගර්භයේ එම කරුණු කාරණා ඉදිරිපත් කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ 12.00ටයි යෙදිලා තිබුණේ, ඒ රැස්වීම. ඊයේ දවසෙත් සභාවේ ඒක ගැන කථා කරලා මම මොකක්ද කිව්වේ? මම කිව්වේ, ඒකට සහභාගි වෙන්න කියලා කථානායකතුමා හරහා මේ 225දෙනාටම ආරාධනා කරන්න කියන එකයි. දැන් මේක විකෘති කරලා, හරවලා තිබෙනවා, ඇත්ත වශයෙන්ම මේක විපක්ෂ නායකවරයාගේ ආරාධනාවක් කියලා. ඒක සම්පූර්ණයෙන්ම වැරදියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟ කාරණාව වශයෙන් මම කියන්න කැමැතියි -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, Hon. Leader of the Opposition, that is the clarification.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I have given you enough time.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම විනාඩියයි ගන්නේ.

නීතිඥ සංගමය ඊයේ ලිපියක් එවනවා. විශේෂයෙන්ම ඒ ලිපියට පදනම් වන්නේ ඊයේ දිනයේ - 2026.08.19වන දා - මේ පාර්ලිමේන්තු සභා ගර්භය තුළ ක්‍රියාත්මක වුණු සංවාදය පිළිබඳවයි. නීතිඥ සංගමය කියනවා, "අපි කරපු යෝජනාව කාලෝචිත යෝජනාවක්, එහි ජාතික වැදගත්කම පිළිබඳව සැලකිල්ලට අරගෙන මේ consensus එකක් තියෙන්න ඕනෑ" කියලා. එතකොට, ඊයේ දවසේ ඒගොල්ලෝ කියනවා, "position of the Government expressed threat" කියලා. ඒ කියන්නේ, ඊයේ දිනයේ බොහොම පැහැදිලිව මේ පිළිබඳව රාජ්‍ය පාර්ශ්වයෙන්, ආණ්ඩු පක්ෂයේ යම්කිසි තර්ජනාත්මක ස්ථාවරයක් තිබුණා කියලා. ඉතින් මමත් කියනවා, එහෙම දෙයක් තිබුණා. ඊයේ දිනයේ මේ සභා ගර්භයේ සියලු ක්‍රියාකාරකම් පිළිබඳව කථා කරපු සමහර ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියලා බොහොම තර්ජනාත්මක විධියට තමයි කථා කළේ කියන එක. එතකොට ඒ වාගේ තර්ජනයක් සිදු වෙනකොට නීති සංගමයේ සභාපතිවරයාට අයිතියක් නැද්ද, තමන්ට දැනෙන දේ ප්‍රකාශ කරන්න? මම අහනවා, මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් භාෂණයේ නිදහස නතර කරලා තියෙනවාද කියලා. ඒක කියන්න බැරිද? ඒක fundamental right එකක්. ඒ fundamental right එක මේ මොන විධායකයකටවත්, මොන තුනෙන් දෙකකටවත් යටපත් කරන්න බැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay. You have made it fairly clear, Hon. Sajith Premadasa.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම ඉතාම පැහැදිලිව කියන්න කැමැතියි, කරුණාකරලා මේ සාකච්ඡාවට මුල පුරන්න කියලා. මේක හොඳ දෙයක්. මේක අපි අයිති කර ගන්න යන්නේ නැහැ. ඒ නිසා මේ පිළිබඳව සිදු කළ යුත්තේ තර්ජනාත්මක අදහස් ඉදිරිපත් කිරීමක් නොවෙයි. පැහැදිලිවම කථානායකවරයා පහසුකම් සපයන්නා හැටියට මේ පිළිබඳව හොඳ උගත්, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay. Hon. Ajith P. Perera, you are on your feet.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට විනාඩියක් දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Ajith P. Perera has been on his feet for a long time now.

Okay, Hon. Sajith Premadasa, I will give you a few more seconds.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
බොහොම ලස්සනට coordinate කරනවා, mike off වෙන එක.

ඒක නම් බොහොම දක්ෂ විධියට වෙනවා. කවුද දන්නේ නැහැ, mikes off කරන්න දාලා තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I have given you ample time.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමා check කරලා බලන්නකෝ. ආණ්ඩුව පැත්තෙන් කථා කරනකොට ඉක්මනට රූප රාමුවලට යනවා. මේ පැත්තෙන් කථා කරනකොට කැපෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Now, I will call upon the Hon. Ajith P. Perera. He has been on his feet for some time.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මම විශේෂයෙන්ම කියන්න කැමැතියි, පැහැදිලිවම මේ තර්ජනාත්මක ස්වරූපය තිබුණු බව. නීතිඥ සංගමය අද මේ හමුවට සහභාගි වෙන්නේ නැහැ, වෙනත් දවසක් ලබා දෙන්න කියලා තිබෙනවා. හැබැයි, රජයේ මාධ්‍ය දැන් පටන් අරගෙන ඉවරයි, නීතිඥ සංගමය අපේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළාය කියන්න. ඒ නිසා ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් එවා ඇති 2026.08.19 දිනැති මේ ලිපිය මම **සභාගත*** කරනවා.

මොකද, නීතිඥ සංගමයේ සභාපතිවරයා මේකේ කියනවා, "Government expressed threat" කියලා. ඒ කියන්නේ, රජය විසින් කරන ලද තර්ජනාත්මක ක්‍රියා පිළිබඳව බොහොම පැහැදිලිව මේ ලිපියේ තිබෙනවා. මමත් මේ ලිපිය අනුමත කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Ajith P. Perera, you have been on your feet. If you have to say something, take a few seconds because the Hon. Leader of the Opposition had made himself clear.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙක්. මේ මගේ 34වැනි අවුරුද්ද. මම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්, තුන්වැනි වාරයට. මේ රටේ රාජ්‍ය කටයුතුවලදී ශ්‍රී ලංකා නීතිඥ සංගමය ස්වාධීන ආයතනයක් හැටියට කටයුතු කරනවා. නීතිඥයින් වන අප නීතිඥ සංගමයේ සාමාජිකයෝ වනවා. අපත් කටයුතු කරලා තිබෙනවා, රාජ්‍ය කටයුතුවලදී. මේ පාර්ලිමේන්තුවට අපව කැඳවා තිබෙනවා; අපේ මතය අහලා තිබෙනවා. ඊයේ දිනයේ සභානායකතුමා විසින් හැල්ලුවට ලක් කරපු හැටි, සමහර මන්ත්‍රීතුමියලා කරපු තර්ජනයන්, ඔවුන්ට දැනෙනවා නම් තර්ජනයක් කියලා, ඔවුන්ට ඒ අදහස කියන්න පුළුවන්. වැදගත්ම කාරණය මෙයයි. ශ්‍රී ලංකා නීතිඥ සංගමය වෘත්තීය සමිතියක් නොවෙයි, මේ රටේ ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින ආයතනයක්. අපි ඔවුන්ට ගරු කළ යුතුයි, ඔවුන්ට සවන් දිය යුතුයි, ඔවුන් කියන දේ අපි ඇසිය යුතුයි. එච්චරයි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Yes, Hon. Chief Government Whip?

---

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක ඉල්ලීමක්ද, යෝජනාවක්ද කියන එක ගැටලුවක් නොවෙයි. අපට ඒ ගැන විවාදයක් නැහැ. ඒක එහෙම වෙන්නත් පුළුවන්, නොවෙන්නත් පුළුවන්. ඒ වාගේම විපක්ෂ නායකතුමා මේකේ පහසුකම් සපයන්නාද, යෝජකයාද වෙන්නේ කියන එකත් ප්‍රශ්නයක් නැහැ. ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපතිවරයා සහ විපක්ෂ නායකතුමා එකම ආකාරයේ අදහසක් ප්‍රකාශ කළා, මේ පාර්ලිමේන්තුවේ සිදු වුණු විවාදයක් සම්බන්ධයෙන්, අදහස් දැක්වීමක් සම්බන්ධයෙන්, එය තර්ජනාත්මකයි කියලා. ඒ වාගේම ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ විධායක සභාව නියෝජනය කරන අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාත් ඒක අනුමත කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැබැයි පාර්ලිමේන්තුවේ ක්‍රමවේද, සම්ප්‍රදායයන් සහ රීති ප්‍රකාරව ආණ්ඩු පක්ෂය පැත්තෙන් සභානායකවරයා, අගමැතිතුමිය හෝ මම හෝ කවුරු හෝ කරුණු දැක්වූවාම ඒක තර්ජනයක් හැටියට ගැනීම පාර්ලිමේන්තු සම්ප්‍රදායයට කොතරම් අනුකූල වෙනවාද? එහෙම නම්, මේ පාර්ලිමේන්තුවේ මීට කලින් ඕනෑ තරම් විවාද සිද්ධ වෙලා තිබෙනවා නේ. මීට වඩා උණුසුම් විවාද සිද්ධ වෙලා තිබෙනවා. නමුත් ඒ කොයිම අවස්ථාවකදීවත් පාර්ලිමේන්තුවේදී සිදු කරන ලද කථා බහක් හෝ කරුණු ඉදිරිපත් කිරීමක් තර්ජනයක් හැටියට දක්වා ලිපි ඉදිරිපත් වෙලා, මාධ්‍ය නිවේදන ඉදිරිපත් වෙලා නැහැ, ගරු විපක්ෂ නායකතුමනි. ඔබතුමාට ඒක කියන්න පුළුවන්කමක් තිබෙනවා. ඔබතුමාගේ මතය සහ ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ ඒ වචන එකම වීම ගැන මම කරුණු දක්වන්න යන්නේ නැහැ. නමුත් එහෙම සම්ප්‍රදායයක් මා දන්නා හැටියට නැහැ. අපි කරුණු ඉදිරිපත් කළාට පස්සේ එය තර්ජනයක් හැටියට ගැනීමක් මීට කලින් සිදු වෙලා නැහැ. ඔබතුමාට විපක්ෂ නායක කාර්යාලයේදී හෝ ඕනෑ තැනකදී සාකච්ඡා කරන්න පුළුවන්කම තිබෙනවා. ඒ තිබෙන රීතිය තමයි අපි ඊයේ ඉදිරිපත් කළේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

This Debate is closed. Now, I called upon you to speak.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

He mentioned my name. Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Okay, I will give you a few seconds. I gave you a lot of time.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නලින්ද ජයතිස්ස ඇමතිතුමාගේ ප්‍රකාශයට මම විරුද්ධ වෙනවා. විපක්ෂ නායකයාට කියන්න පුළුවන්, හැබැයි නීතිඥ සංගමයේ සභාපතිවරයාට, ඔහුට දැනෙන ආකාරයට අදහස ඉදිරිපත් කරන්න බැහැයි කියන කාරණය මම ප්‍රතික්ෂේප කරනවා. මම එක දෙයක් කියන්න

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

කැමැතියි. සජිත් ප්‍රේමදාසත්, රජීව් අමරසූරියත් - දෙගොල්ලන්ම - මේ රටේ පුරවැසියන්. පුරවැසියන්ට එක හා සමානව සැලකීම රටේ උත්තරීතර නීතිය තුළ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ සඳහන් වෙනවා. ඒ නිසා ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. All citizens are equal. රජීව් අමරසූරිය මැතිතුමාට වෙනත් වරප්‍රසාදයකුයි, මට තවත් වරප්‍රසාදයකුයි කියලා දෙකක් නැහැ. ඒ නිසා එතුමාගේ අදහස්වලට ගෞරව කරන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Now, we will move onto the Debate on the Employment of Women, Young Persons and Children (Amendment) Bill. You are listed to speak, Hon. Leader of the Opposition and you have been allotted six minutes.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I will speak after the Hon. (Mrs.) Rohini Kumari Wijerathna.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. (Mrs.) Rohini Kumari Wijerathna. You have ten minutes.

[අ.භා. 12.19]

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව මුලින්ම ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, පාසල් දැරියන්ට සනීපාරක්ෂක තුවා ලබා දීම පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ මහපෙන්වීම මත පසුගිය රජය විසින් බලාත්මක කළ බව. ඒ වාගේම පාසල් දරුවන්ට දිවා ආහාරය ලබා දීමට වෙන් කරන මුදල රුපියල් 100ක් කිරීම ප්‍රමාණවත් නැහැ කියලා මම හිතනවා. මේ නිසා අද වනකොට ආහාර සපයන්නන් එයින් ඉවත් වීමේ අවදානමක සහ තීරණයක ඉන්න බව මතක් කරමින්, අද විවාදයේ මගේ කථාව ආරම්භ කරනවා.

විශේෂයෙන්ම ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ 138 හා 182 යන සම්මුති දෙකම ළමා ශ්‍රමිකත්වය තුරන් කිරීමේ අරමුණින් සකස් කරන ලද ඒවා. එයින් 138වන සම්මුතියෙන් කියන්නේ, Minimum Age Convention සම්බන්ධවයි. 1973දී අපි ඒක අපරානුමත කළා. ඒ වාගේම 182වන සම්මුතියෙන් කියන්නේ, Worst Forms of Child Labour Convention පිළිබඳවයි. එය 1999දී අපි අපරානුමත කළා. අද මේ පනත් කෙටුම්පතේ අරමුණ තමයි, ඉහත සඳහන් කළ ආකාරයේ කටයුතුවල යෙදෙන්නන්ට ලබා දෙන දඬුවමෙහි කොටසක් වන දඩ මුදල රුපියල් 10,000 සිට රුපියල් 100,000 දක්වා ඉහළ දැමීම. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තටම මේ දඩ මුදල වැඩි කිරීමෙන් පමණක් මේ තත්ත්වය වළක්වාගන්න පුළුවන්ද කියන ප්‍රශ්නය අපි ඉස්සරහ තිබෙනවා.

විශේෂයෙන්ම ළමයින් අඩු වයසින් පාසල හැර යන්නේ ඇයි? ඇමතිතුමියත් ඊට හේතු කාරණා ගණනාවක් ඉදිරිපත් කළා. දරුවෙක් ළමා ශ්‍රමිකයෙක් වෙන්නේ ඇයි කියන ප්‍රශ්නයට විසඳුම සොයන තාක්කල් මෙය යථාර්ථයක් නොවන බව මම මේ ගරු සභාවට මතක් කරන්න ඕනෑ. විශේෂයෙන්ම බුද්ධ ධර්මය ගත්තාම, NPP ආණ්ඩුව බුද්ධ ධර්මය පිළිගන්නවාද කියලා මම දන්නේ නැහැ. මොකද, ගස් ගල්වලට වඳින අය හැටියටයි කිව්වේ. බුද්ධ ධර්මයේ මූලික පදනම තමයි, හේතුඵලවාදය. මේ හේතුඵලවාදය අනුව, හේතුවට පිළියම සොයන්නේ නැතුව, ඵලයට පිළියම සෙවීමෙන් ඵලක් වෙනවා කියලා මම හිතන්නේ නැහැ. එම නිසා මේ ප්‍රශ්නයේදී මීට හේතුව සොයා ඊට පිළියම් යෙදෙව්වේ නැති වුණොත් සිද්ධ වන්නේ, වෙනත් ආකාරයකින් මෙම ප්‍රශ්නය නැවත වතාවක් පැනනැඟිය හැකි වීමයි. මෙහිදී ළමයෙක්, ළමා ශ්‍රමිකයෙක් වෙන්නේ ඇයි කියන එකට පිළියම් සෙවීම ඉතාම වැදගත් කියන කාරණය මම කියන්නට ඕනෑ. ඒකේ අංක එක හැටියට ආර්ථික අපහසුතා සහ පවුලේ දරිද්‍රතාව කියන එක තිබෙන බවත් මම මේ වෙලාවේ මතක් කරන්නට ඕනෑ. ජනතාව තමන්ගේ මූලික අවශ්‍යතා පිරිමහගත නොහැකිව ඉන්නවා වාගේම, විශේෂයෙන්ම ආහාරවල තිබෙන මිලත් අධිකයි. ඊළඟට සෞඛ්‍ය ප්‍රශ්න ගත්තාම, අද වනකොට බෙහෙත් සොයාගන්න නැහැ, ක්ලිනික්වල බෙහෙත් නැහැ, ඒ වාගේම මේ වනකොට විල්ගමුව වාගේ ප්‍රදේශවලට වකුගඩු රෝගීන්ට ලබා දෙන ආධාර ලැබෙන්නේ නැහැ කියලා ඒ ප්‍රදේශවල ජනතාව කියනවා. ඒ වාගේම "දිට්වා" සුළි කුණාටුවෙන් අනාථ වුණු අයගේ නිවාස ප්‍රශ්න මේ වන තෙක් විසඳිලා නැහැ. මෙන්න මේ වාගේ මූලික අවශ්‍යතා පවුල තුළ ගොඩනැඟෙනකොට දරුවන් අධ්‍යාපනය හැරයන්න ලැහැස්ති වනවා.

ඊළඟට, අධ්‍යාපන වියදම ඉහළ යෑම ගැනත් මම කියන්න ඕනෑ. නිදහස් අධ්‍යාපනය කියලා තිබුණත්, ඇත්තටම ඒක නමට විතරද තිබෙන්නේ කියන එක පිළිබඳව අද ගැටලුවක් තිබෙනවා. ඇත්තටම අධ්‍යාපනය නිදහස්ද කියන ප්‍රශ්නය ගැන අපට කථා කරන්න සිද්ධ වනවා. මොකද, දරුවෙකුට අපොස (උසස් පෙළ) සඳහා තමන් කැමැති විෂයයක් කරන්න අද හැම පාසලකම පුළුවන්ද කියන ගැටලුව තිබෙනවා. ඒ වාගේම අධ්‍යාපනය ලබන දරුවන්ගේ ප්‍රවාහන වියදම, ටියුෂන් පන්තිවලට යන වියදම, ඒ වාගේම පොත් පත්වල අධික මිල හේතුවෙන් පවුල්වලට ඒ ප්‍රශ්නවලට මුහුණ දෙන්න බැරි නිසා දරුවන් පාසල් හැර යනවා.

ඊළඟට, පවුල් පසුබිම ගැනත් කියන්න ඕනෑ. දරුවන්ගේ සුරක්ෂිතභාවය පිළිබඳව තිබෙන ගැටලුව ගත්තාම, එතැනදීත් දරුවන් පාසල හැර යෑම තුළින් ළමා ශ්‍රමිකයෙක් වෙලා පවුලට අදායම සොයන්න යනවා. විශේෂයෙන්ම දෙමව්පියන්ගේ ගැටලු, පවුල් ආරවුල්, ගෘහස්ථ හිංසනය වාගේ දේවල් ගත්තාම, දරුවෝ පාසල විතරක් නොවෙයි, නිවසත් අතහැර යන තත්ත්වයක් දකින්න තිබෙනවා. මෙන්න මේවාට විසඳුම් ඕනෑ.

ඊළඟට, පවතින අධ්‍යාපන ක්‍රමය ඇත්තටම ප්‍රායෝගිකද? එහෙම නැත්නම්, මේ විෂය මාලාවට දරුවෝ කැමැතිද? ඒ වාගේම හැම පාසලකම යටිතල පහසුකම් එක විධියද? මෙන්න මේ කාරණා නිසාත් අද දරුවෝ පාසල හැර යන තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා. එම නිසා මම කියනවා, මෙන්න මේ කියපු දොරවල් වැසිය යුතු බව. එහෙම නැතුව දඩය වැඩි කළ පමණින්ම -දඩය වැඩි කිරීම හොඳයි- මේ ප්‍රශ්න විසඳෙන්නේ නැහැයි කියන එක මම මේ සභාවට මතක් කරන්න කැමැතියි.

ඒ වාගේම පසුගිය වසර 5 සලකා බැලුවාම, 2021 ඉඳලා 2026.06.05 දින දක්වා මනුෂ්‍ය ඝාතන - ළමාද, ස්ත්‍රීද, පිරිමිද කියන එක සලකන්නේ නැතුව - 2,964ක් සිද්ධ වෙලා තිබෙනවා. 2025.01.21 ඉඳලා 2025.10.31 දක්වා පමණක්, ඒ කියන්නේ

2025 වසරේ පළමු මාස 10 ඇතුළත සුළු හා බල අපරාධ වශයෙන් ළමා අපරාධ 5,682කුත්, කාන්තාවන්ට එරෙහි අපරාධ 9,809කුත් සිද්ධ වෙලා තිබෙනවා. ඊට අදාළ තොරතුරු ඇතුළත් ලේඛනය මම **සභාගත*** කරනවා.

මේවා දිහා බැලුවාම අපට පෙනෙනවා, මේ සමාජයේ වැඩිපුර තිබෙන්නේ මිනී මැරුම් නොවෙයි, කාන්තාවන්ට හා දරුවන්ට එරෙහිව සිදු වන අපරාධ කියලා. එහෙම නම්, මෙන්න මේවා සඳහා විසඳුම් මේ පාර්ලිමේන්තුව තුළින් ගෙනෙන්න කියලා අපි කියන්න ඕනෑ.

මම විශේෂයෙන් මේ කාරණයත් මතක් කරන්න කැමතියි. "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 83වන පිටුවේ යෝජනා ගණනාවක් තිබෙනවා. කාලය පිළිබඳව ගැටලුවක් තිබෙන නිසා මම එම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 83වන පිටුවේ පිටපතක් **සභාගත*** කරනවා.

"විකල්ප රැකවරණයක් අවශ්‍ය සෑම දරුවෙකුටම පවුල පදනම් වූ පරිසරයන් තුළ රැකවරණය සහ ස්ථාවරත්වය ලැබෙන බව සහතික කිරීම සඳහා කැපකරු සත්කාර ක්‍රමයේ පුළුල් ප්‍රතිසංස්කරණ", "ආබාධ සහිත ළමයින්, වීදි දරුවන් සහ පාසල් නොයන ළමයින් ඇතුළු අවදානම් සහිත දරුවන් කල්තියා හඳුනා ගැනීමට ක්‍රමවේදයක්" ආදී වශයෙන් යෝජනා ගණනාවක් එහි විශේෂයෙන්ම සඳහන්ව තිබෙනවා.

ඒ වාගේම එම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 82වන පිටුවේ තිබෙනවා, "ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සහ පරිවාස හා ළමා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව වැනි ආයතන අතර සම්බන්ධීකරණය විධිමත් කරන්න ඕනෑ" කියලා. හැබැයි, අනුරාධපුරයේ බලවයස්කාර දැරිය අපයෝජනය කිරීමේ සිද්ධියේදී ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙනුවෙන් පෙනී සිටි නීතිඥතුමිය සම්බන්ධව කොයි විධියටද හැසිරුණේ කියන එක අපි දැක්කා. ඊළඟට, "යුක්තිය පසිඳලීම කඩිනම් කිරීම සඳහා ළමුන් සම්බන්ධ නඩු විභාග කිරීමට පමණක් කැප වූ විශේෂිත මහාධිකරණ පිහිටුවීම" කියලා යෝජනාවකුත් එම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙනවා.

ඒ වාගේම පනතේ 54 වගන්තිය යටතේ අද වනකොට දරුවෝ විශාල සංඛ්‍යාවක් බන්ධනාගාර ඇතුළේ ඉන්නවා. ඒ දරුවෝ එළියට ගන්න ක්‍රමයක් හදන්න ඕනෑ. ඇත්තටම කෙරෙන්න ඕනෑ දේවල් මේවායි කියන එක මම මේ වෙලාවේදී මේ සභාවට මතක් කරනවා. හැබැයි, අද අධිකරණය සම්බන්ධයෙන් ඒවාද කෙරෙන්නේ? මහ දවාලේ අධිකරණයේ ස්වාධීනත්වය දූෂණය කරනවා, විනාශ කරනවා කියන එක අපි මේ සභාවට කියන්න ඕනෑ.

අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ වාර්තාවේ වගන්තියක තිබෙනවා, "ශ්‍රී ලංකාවේ භාණ්ඩ හා සේවා සඳහා GSP Plus සහන ලබා ගැනීමට නිෂ්පාදන ක්‍රියාදාමයට අදාළ සැපයුම් දාමය තුළ ළමා ශ්‍රමය නොමැති බවත්, නූතන වහල් ශ්‍රමයෙන් තොර බවට සහතික වීම පිණිස යෝජිත සංශෝධනය මඟින් ධනාත්මක පසුබිමක් සපයනු ලබන බව..." කියලා. අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද වාර්තාවේ එකී කොටස ඇතුළත් පිටු කිහිපය මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

GSP Plus සහනය ලබා ගැනීමේ අරමුණින් පමණක් නම් ඒක කළේ, සිදු වන දේවල් දිහා බැලුවාම දඬුවම් වැඩි කිරීම පමණක්

***** **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

ප්‍රමාණවත් වෙන්නේ නැහැ කියන එක මම මේ සභාවට මතක් කරලා දෙන්න ඕනෑ. ඒ වාගේම ඒ තුළ ප්‍රජාතන්ත්‍රවාදය රැක ගැනීමත්, අධිකරණයේ ස්වාධිපත්‍යය රැක ගැනීමත් ඉතාම වැදගත් බව මම මේ වෙලාවේදී කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, GSP Plus සහනය ලබා ගැනීමේදී බලපෑම් කළ හැකි අය කවුද කියලා අපි මතක් කළොත්, යුරෝපා රටවලට බලපෑම් කිරීමේ හැකියාව තිබෙනවා, ඇමෙරිකාව වාගේ රටවලට බලපෑම් කිරීමේ හැකියාව තිබෙනවා, එක්සත් ජාතීන්ගේ සංගමයට බලපෑම් කිරීමේ හැකියාව තිබෙනවා. අද වනකොට යුරෝපා රටවල් කියලා තිබෙනවා, අධිකරණයට බලපෑම් කරන්න එපා, ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන්න කියලා.

ඒ අදාළ විනිසුරුවරුන්ගෙන්ම නඩු අහලා එතුමන්ලාගේ සේවා කාලය දීර්ඝ කරන්නද කියලා අහන එක හොරාගේ අම්මාගෙන් පේන අහනවා වාගේ දෙයක් නොවෙයි, හොරාගෙන්ම නඩු අහනවා වාගේ වැඩක් කියන එක මම කියන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ වනකොට ජාත්‍යන්තර විනිසුරුවන්ගේ සංගමය, Commonwealth Lawyers Association සහ ජිනීවාවල Centre for the Independence of Judges and Lawyers ඒ අයගේ විරෝධය දක්වා තිබෙනවා, මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට. විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින් අධිකරණයට බලපෑම් වෙනවා, එය කරන්න එපා කියලා ඒ අය කියනවා. ජාත්‍යන්තර විසුරුවන්ගේ සංගමය නිකුත් කළ එම ප්‍රකාශයත් මම **සභාගත*** කරනවා.

ඒ අය කියනවා, ඒ හරහා ප්‍රජාතන්ත්‍රවාදයට විතරක් නොවෙයි, අධිකරණයට විතරක් නොවෙයි, සමස්ත පද්ධතියටම බලපෑම් වෙන බව. විශේෂයෙන් මම මතක් කරන්න ඕනෑ, අපේ රටේ මේ වනකොට ඊට විරුද්ධව පෙත්සම් 40ක් ඉදිරිපත් වෙලා තිබෙන බව. මහනායක ස්වාමීන් වහන්සේලා විරෝධතාව දක්වා තිබෙනවා. ශ්‍රී ලංකා නීතිඥ සංගමය විරෝධතාව දක්වනවා. ඇත්තටම එතුමන්ලාට අද පාර්ලිමේන්තුවට එන්න කිව්වා නම් මේ සභාවේ ඉන්න උගත් නීතිඥයන්ට තිබුණා, එතැනට ගිහිල්ලා තර්ක කරලා හොඳ විද්වත් සාකච්ඡාවකට මඟ පාදා ගන්න. හැබැයි, මොකක්ද කළේ? ඒ අය එන එක වළක්වන්නට අවශ්‍ය දේවල් කළා. නීතියේ ස්වාධිපත්‍යයට ආණ්ඩුවෙන් අභියෝගය එනවිට, මේ ආණ්ඩුව රකින නීතිඥයන්ගේ වෘත්තීය සදාචාරය ගැන ඇත්තටම තිබෙන්නේ කනගාටුවක් කියන එක මම ප්‍රකාශ කරන්න ඕනෑ.

විශේෂයෙන්ම අධිකරණ ඇමතිතුමා මේ අවස්ථාවේදී සභාවේ හිටියා නම් හොඳයි.

එතුමා දන්නේත් නැහැ නේ, විරෝධතාව දක්වලා මහනායක ස්වාමීන් වහන්සේලා එවපු ලියුම පිළිබඳව. ඒක එක්කෝ එතුමා දැකලා නැහැ නැත්නම් එතුමාට පෙන්වලා නැහැ. එහෙම නම්, අපට ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Mrs.) Rohini Kumari Wijerathna, your time is up.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මට තව විනාඩි දෙකක් දෙන්න, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි.

***** **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
විනාඩි දෙකක් දෙනවා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ජනාධිපතිතුමා සහ විෂයභාර ඇමතිතුමා අතර අදහස් හුවමාරුවක් නැහැ කියන එක අපට පෙනෙනවා. එහෙම නම් අධිකරණය සම්බන්ධයෙන් මේ තීන්දු ගන්නේ අධිකරණ ඇමතිතුමාට පරිබාහිරව පැලවත්තේ කණ්ඩායමක්ද, එහෙම නැත්නම් අධිකරණ ඇමතිතුමා ඉන්නේ නමටද කියන ප්‍රශ්නය අපට තිබෙනවා. ඒ වාගේම මම මේ ගරු සභාවේදී කිව්වා, පී.පී. සූරසේන අග විනිසුරුතුමා ගැන මාධ්‍යයේ ගිය ප්‍රචාරයක් තිබෙනවා කියලා. ඒක නිවැරදි කරන්න ඉල්ලුවාම මුලසුනේ හිටපු මන්ත්‍රීතුමා කිව්වා, ඒ කථාව සාවද්‍යයි කියලා. විමර්ශනයක් කළාද, පරීක්ෂණයක් කළාද, වගකීම් සහිතවද එතුමා ඒක ප්‍රකාශ කළේ? ඒ විධියට වගකීම් විරහිතව මගේ කථාව අයින් කළා. මම කියනවා, එතුමා ඔය පුටුවේ වාඩි වෙන්න සුදුසු නැහැ කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. ඔබතුමා දන්නවා, එක්ස්ප්‍රස් පර්ල් නැවුවෙන් මේ රටට ලැබිය යුතු ඩොලර් බිලියනයක මුදල අහිමි කිරීම පිළිබඳව. ඒ වාගේම London P&I Club එක ජනාධිපතිතුමාට මැදිහත් වෙන්න කියලා ලියුමක් එවලා තිබෙනවා. අද ඒක ඕනෑ තරම් සමාජයේ දකින්න තිබෙනවා. මේ මැදිහත්වීම වුණේ අර සිරිකොතේ වැසිකිළිය ඇතුළේ වෙච්ච මැදිහත්වීමද කියන ප්‍රශ්නය තිබෙනවා. එහෙම නම් මේක කොහොමද වුණේ? අග්‍ර විනිශ්චයකාර මුර්දු ප්‍රනාන්දු මැතිනිය ප්‍රමුඛ විනිසුරුවන් පස්දෙනෙක් දීපු තීන්දුව විනිශ්චයකාරවරුන් තුන්දෙනෙකුගෙන් යුත් විනිසුරු මඬුල්ලකට අඩු කරලා එමඟින් තීන්දුවක් දීලා, අද රටට ලැබෙන්න තිබුණු ඩොලර් බිලියනයක් අහිමි කරපු

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

වෙනුවෙන් අද මේ කථා කරන්නේ. එහි කාර්ය සාධන සටහන් බීබීසී එකේ සරෝජ් පතිරණ ඉල්ලා තිබෙනවා. නමුත්, ඒක තවම දීලාත් නැහැ. ඒ වාගේම ලිපි ලැබුණු බවක් දන්වලාත් නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Mrs.) Rohini Kumari Wijerathna, please wind up. We have to suspend the Sitting for lunch.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මට තව තත්පර කීපයක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක වැදගත්. මොකද,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

එහෙම නම් ඒක මේ පාර්ලිමේන්තුවේදී නිවැරදි කිරීම වැදගත්. Dark Room YouTube channel එක කියනවා, KDU එකේ තොරතුරු නැහැ,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

*[බාධා කිරීම්]* වැරදි නම් මේවා නිවැරදි කරන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම නොවේ නම්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියන ප්‍රශ්නය මේ සමාජයේ ඇති වන එක ඔබතුමන්ලාට වළක්වන්න බැහැ කියන එක ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The Proceedings of the House shall stay suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***

*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Prime Minister. You have 13 minutes to speak on the Bill.

[අ.භා. 1.00]

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ළමා ශ්‍රමය පිළිබඳ නීතියට ළමා ආරක්ෂණය පැත්තෙන් ඉතාම වැදගත් සංශෝධනයක් ගෙනැවිත් විවාද කරන මේ මොහොතේ ඒ ගැන කථා කිරීමට ලැබීම පිළිබඳව මම සන්තෝෂ වෙනවා. "ළමා ආරක්ෂණය" කියන්නේ අපේ රජයේ ක්‍රියාවලිය තුළ අපේ ආණ්ඩුවේ ප්‍රතිපත්තියක් හැටියට ක්‍රියාත්මක වන ප්‍රධාන දෙයක්. "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ "ළමා ආරක්ෂණය" පිළිබඳව අපි පුළුල් අර්ථකථනයක් දීලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

එය මූලික වශයෙන් නීති සම්පාදනය තුළින් කරන දෙයක් විතරක් නොවෙයි. අපි අපේ මැතිවරණ ප්‍රකාශනය තුළ ළමා ආරක්ෂණය පිළිබඳව පුළුල්ව සහ දත්ත අනුව ඉදිරිපත් කරන ලද කාරණාවල මූලික අරමුණ වෙලා තිබෙන්නේ ළමුන්ගේ අනාරක්ෂිතභාවයට හේතු වන හෝ අනාරක්ෂිතභාවයට තුඩු දෙන කොන්දේසි සහ තත්ත්වයන් වෙනස් කිරීමයි. ඒ සඳහා පුළුල් මැදිහත්වීම් ගණනාවක් අපි යෝජනා කර තිබෙනවා. ඒවා අතරින් එකක් තමයි, මේ කාලය තුළ අපේ නීති පද්ධතියෙහි සිදු කරන මේ නීතිමය සංශෝධන.

මෙහිදී මතු වන ගැටලු කීපයක් තිබෙනවා. උදාහරණයක් හැටියට ගන්න පුළුවන්, "ළමයා" යන්නට දී ඇති විවිධ නිර්වචන. සමහර නීතිවල ළමයින් හැටියට සඳහන් වන්නේ වයස අවුරුදු 14න් පහළ අය; තවත් සමහර නීතිවල අවුරුදු 16න් පහළ අය; තවත් සමහර නීතිවල අවුරුදු 18න් පහළ අය. මෙවැනි පරස්පරතා නිසා ළමා ආරක්ෂණය පිළිබඳ නීතිමය රාමුව තුළ හිඩැස් ගණනාවක් ඇති වී තිබුණා. ඒ හිඩැස් වැහීම තුළින් දරුවන්ට පුළුල් ආරක්ෂාවක් ලබා දීම සඳහා පියවර ගන්නා අතරම, මා කලින් කියූ පරිදි ළමා ආරක්ෂණය පිළිබඳ තත්ත්වයන්; සමාජ ආරක්ෂණය, අධ්‍යාපනය, ප්‍රවාහනය ඇතුළු පොදු කාරණා තුළින් ළමයින් අනාරක්ෂිත වන තත්ත්වයන් වෙනස් කිරීම සඳහා අපේ රජය පුළුල් වැඩ පිළිවෙළක් හරහා මේ වන කොටත් මැදිහත් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් දන්නා පරිදි අපේ රටේ දරුවන්ගේ අනිවාර්ය අධ්‍යාපන වයස් සීමාව අවුරුදු 16ක් කියන එක දැන් නීතිගත වෙලා තිබෙනවා. ඒ කියන්නේ අවුරුදු 16 වනකල් අධ්‍යාපනය ලැබීම අනිවාර්යයි. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි විශේෂයෙන් දකිනවා දැන් පාසල තුළ දරුවන් රඳවා ගැනීම යම්කිසි විධියක අභියෝගයක් බවට පත් වෙමින් යන බව. විශේෂයෙන්ම පිරිමි දරුවන් වයස අවුරුදු 16න් පස්සේ අධ්‍යාපනය තුළ රැඳෙන ප්‍රමාණය අඩු වන ප්‍රවණතාවක් තිබෙනවා. එය ඉතාම සුළු ප්‍රවණතාවක්. නමුත්, එවැනි ප්‍රවණතාවක් අපි නිරීක්ෂණය කර තිබෙනවා.

අපේ අධ්‍යාපන පද්ධතිය තුළ අවුරුදු 13ක කාලයක් තමයි තිබෙන්නේ දරුවෙකුට පාසල් අධ්‍යාපනය සම්පූර්ණ කරන්න. එම කාලය තුළ දරුවන්, විශේෂයෙන්ම පිරිමි දරුවන් එම පුළුල් අධ්‍යාපනය නොලබා සමාජයට එකතු වුණාම ඔවුන්ට වෙන්න පුළුවන් හානි, අවදානම් තත්ත්ව කිහිපයක් තිබෙනවා. විශේෂයෙන්ම රැකියා ක්ෂේත්‍රයට හෝ ආර්ථික ක්‍රියාවලියට සම්බන්ධ වෙනකොට අවශ්‍ය කුසලතා, qualifications නොමැති වීම තුළ ඔවුන් සමහර අවස්ථාවලදී නීති විරෝධී වැඩවලට පෙළඹීම, පොළඹවා ගැනීම වැනි දේවල් සිදු වෙනවා. අප ගෙනෙන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළ එවැනි දේවල් ද ආමන්ත්‍රණය කරමින් අදාළ සියලු කාරණා සලකා බලමින් තමයි කටයුතු කරන්නේ. 2026 සිට ක්‍රියාත්මක වන අපේ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල මූලික අරමුණක් වෙලා තිබෙනවා, අවුරුදු 13 පුරාවටම දරුවන් පාසල් අධ්‍යාපනය තුළ රඳවා ගැනීමට අවශ්‍ය පාසල් පරිසරය ආරක්ෂිතව, සුරක්ෂිතව නිර්මාණය කිරීම. ඒ සඳහා අපි curriculum review එකකට යනවා වාගේම මේ වසරේ පළමු ශ්‍රේණියට අලුත් විෂය මාලාවක් හඳුන්වා දී තිබෙනවා. එන අවුරුද්දේ -2027 අවුරුද්දේ- 2වන ශ්‍රේණියටත්, 6වන ශ්‍රේණියටත් අලුත් විෂය මාලා හඳුන්වා දීමට අපි කටයුතු සූදානම් කරගෙන යනවා. ඊට එහා ගිහින් පාසල සුරක්ෂිත කිරීම සඳහාත් අපි මැදිහත්වීම් ගණනාවක් කරනවා. උදාහරණයක් හැටියට ප්‍රාථමික අධ්‍යාපනයේ යටිතල පහසුකම් නවීකරණය කිරීම සඳහා අපි 2026 වසර තුළ රුපියල් මිලියන 1,200ක් වෙන් කර තිබෙනවා.

ඒ හරහා තෝරා ගත් ප්‍රාථමික පාසල් නවීකරණය, පාසල් දරුවන්ට සුදුසු, දරුවන්ට පහසු වන ආකාරයේ යටිතල පහසුකම් සකස් කිරීම අපි ආරම්භ කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අපි නිරීක්ෂණය කරපු දෙයක් තමයි, විශේෂයෙන්ම දරුවන්ට සමාජයේත්, පවුල් පසුබිම්වලත් තිබෙන ගැටලු නිසා ඔවුන් පාසල් එනකොට විවිධ මනෝ සමාජයීය ප්‍රශ්නවලට, අභියෝගවලට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා කියන එක. ඒවා ගැන කථා කරන්න, ඒවා විසඳා ගන්න ඔවුන්ට අවස්ථා නැති වීම තුළින් ඔවුන්ගේ මානසික සෞඛ්‍යයට එන බාධා වාගේම යහපත් මානසික සෞඛ්‍යයක් පවත්වා ගෙන යැමට තිබෙන අභියෝගත්, සමහර වෙලාවට ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු කර ගෙන යන්න අපහසු අවස්ථා ගැනත් අපට වාර්තා වෙලා තිබෙනවා. ඒ නිසාම තමයි පාසල් පද්ධතිය තුළ දරුවන්ගේ මනෝ සමාජයීය යහපැවැත්ම දියුණු කිරීම සඳහා අපි නියමු ව්‍යාපෘතියක් 2025දී ආරම්භ කළේ. 2026 වසරේ සිට ඒක ක්‍රියාත්මක කරන්න පටන් අරගෙන තිබෙනවා, C2 centres කියලා. අපි සෑම පාසලකම මෙය සංවිධානය කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ centresවලදී ළමුන්ට මනෝ සමාජයීය උපදේශනය ලබා දීම වාගේම ඔවුන්ට ඇවිල්ලා තමන්ගේ ප්‍රශ්නයක් කථා කරන්න, පොඩි වෙලාවක් නිදහසේ ගත කරන්න, විවේක ගන්න, එහෙම නැත්නම් ඇවිල්ලා රැකවරණය ලබා ගන්න පුළුවන් විධියේ ආරක්ෂිත අවකාශයක් - safe space එකක් - හදන ඒ වැඩ කටයුත්තත් අපි ආරම්භ කරලා තිබෙනවා. එහි නියමු ව්‍යාපෘතිය ඉතාම සාර්ථකයි කියලා වාර්තා වෙලා තිබෙනවා. ඒ සඳහා ගුරුවරුන්ගෙන් ලැබුණු සහයෝගය ගැන අපි ඒ අයට ස්තුතිවන්ත වෙනවා. ඒ අය ඉතා උනන්දුවෙන් මේ වැඩකටයුත්ත සඳහා සහභාගි වෙලා තිබෙනවා. ඒ C2 centresවලට අදාළ guidelines වාගේම ගුරු පුහුණුව ලබා දීමත් අපි මේ වෙලාවේ ආරම්භ කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ඇමතිතුමියත් ප්‍රකාශ කළා, ළමා ආරක්ෂණය කියන එක අධ්‍යාපනයට හෝ වෙනත් එක ක්ෂේත්‍රයකට සීමා වෙන දෙයක් නොවෙයි, ඒක පුළුල් මැදිහත්වීමක් කියලා. ඒ නිසාම ඒ පුළුල් පද්ධතිය තුළ; ළමයා ගැවසෙන පද්ධතිය තුළ ආරක්ෂාව වැඩි කිරීම සඳහා අපි විවිධ පියවර අරගනිමින් තිබෙනවා. අපි මේ වෙලාවේ පෙර පාසල් අධ්‍යාපනය තුළ දැවැන්ත වෙනසක් සිදු කරමින් යනවා. මොකද, පෙර පාසල් අධ්‍යාපනය - අවුරුදු තුනත්, පහත් අතර ලැබෙන ඒ අධ්‍යාපනය - තීරණාත්මක වන බව දැන් සියලුදෙනාම පිළිගන්නා කාරණයක්. ඒ නිසා පෙර පාසල් අධ්‍යාපනයේ විෂය මාලාව පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් වාගේම ගුරුවරුන්ට අත් පොතක් අපි මේ වෙලාවේ නිකුත් කර තිබෙනවා. ඒ ගුරු අත්පොත සමඟ පෙර පාසල් ගුරුවරුන් පුහුණු කිරීම මේ සතියේ 17වැනි දා ආරම්භ කර තිබෙනවා. එන අවුරුද්දේ සිට සියලු පෙර පාසල් තුළ ඒ විෂය මාලාව තමයි ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙන්නේ.

ඒ වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ වෙලාවේ පෝෂණය පැත්තෙනුත් දරුවන්ගේ ආරක්ෂාව ගැන හිතනවා. ඔබ දන්නවා, සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් පාසල් තුළ දරුවන්ට ලැබිය යුතු ආහාර - පෝෂණය - පිළිබඳ guidelines නිකුත් කරලා තිබෙන බව. දරුවන්ට දිය යුතු, නොදිය යුතු ආහාර පිළිබඳ ලැයිස්තුවක් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙතින් නිකුත් කරලා තිබෙනවා. අධ්‍යාපන අමාත්‍යාංශය විධියට අපි මේ පිළිබඳව පසුවිපරමක් කරනවා. මට පෙනෙනවා, Gallery එකේත් ළමයින් ගණනාවක් ඉන්නවා. අපි පාසල් තුළ අයිස්ක්‍රීම් විකිණීම තහනම් කරලා තිබෙන්නේ. නමුත් රස ආහාරයක්; ළමයිනුත් කැමැති දේවල් පෝෂ්‍යදායී විධියට, ඒ කියන්නේ සීනි වැඩි වෙන්නේ නැති විධියට, කාබෝහයිඩ්‍රේට් වැඩි වෙන්නේ නැති විධියට ලබා දීම තමයි සිදුවිය යුත්තේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

මේ ගැන දන්නවා. මොකද, ඔබතුමාත් වෛද්‍යවරයෙක්. ළමා කාලය තුළම පෝෂණය ගැන අදහසක් ආවේ නැත්නම් වැඩිහිටියන් වුණාම තමයි ඒක ප්‍රශ්නයක් වෙන්නේ. එම නිසා පාසල තුළම මේක තවත් හොඳින් ක්‍රියාත්මක කරන්නේ කොහොමද කියන එක ගැන අධ්‍යාපන අමාත්‍යාංශයත්, සෞඛ්‍ය අමාත්‍යාංශයත් එකතු වෙලා සාකච්ඡා කරමින් වැඩ කටයුතු කරනවා.

ඒ වාගේම තමයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රවාහනය තුළ දරුවන්ගේ ආරක්ෂාවත් අතිශයින්ම වැදගත්. School vans, බස් පිළිබඳ නියාමනයක් කිරීම සඳහාත්, ඒවායේ ආරක්ෂිතභාවය වැඩි කිරීමටත්, ඒ සම්බන්ධයෙන් minimum standards, regulations ඇති කිරීම සඳහාත් ප්‍රවාහන අමාත්‍යාංශය කොන්දේසි ගණනාවක් නිකුත් කර තිබෙනවා. අපි සියලු දෙමව්පියන්ගෙන් ඉල්ලා සිටිනවා මේවා ගැන දැනුවත් වෙන්න කියලා.

ඔවුන් තමන්ගේ දරුවන් school vansවල යවනවා නම්, බස්වල යවනවා නම් ඒ අවම පහසුකම්, ඒ අවම කොන්දේසි සපුරනවාද කියන එක තහවුරු කර ගන්න කියා අපි ඉල්ලා සිටිනවා. ඒවා අතර seat belts, security cameras, driversලාට දිය යුතු පුහුණුව ආදි සියල්ල ප්‍රවාහන අමාත්‍යාංශයෙන් තීරණය කර තිබෙනවා. අපි ඒවා පිළිබඳව අවධානය යොමු කළ යුතුයි. ඒ සඳහා දෙමව්පියන්ගේත් සහයෝගය අපට අවශ්‍ය වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආබාධ සහිත දරුවන් වෙනුවෙනුත් අපි විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර තිබෙනවා. අඩු ආදායම්ලාභී දරුවන්ට, ආබාධ සහිත දරුවන්ට දීමනාවක් දීමට, ඔවුන්ගේ අධ්‍යාපනය කරගෙන යෑම සඳහා අවශ්‍ය learner support එක ලබා දීමට අපි වැඩ පිළිවෙළක් ආරම්භ කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන්, මම නැවත වතාවක් දෙමව්පියන්ගෙන් සහ ගුරුවරුන්ගෙන් මේ ගරු සභාව තුළදීම ඉල්ලීමක් කරන්න කැමැතියි. මේ දවස්වල දරුවන්ගේ නිවාඩු කාලය. නිවාඩු කාලය කියන්නේ, නිවාඩු! දරුවන්ටත් නිවාඩුවක් අවශ්‍යයි. විශේෂයෙන්ම විදුහල්පතිවරුන්, ගුරුවරුන් තමන්ගේ පාසල සුපිරි පාසලක් කරන්න මහන්සි වෙනවා. අපි ගරු කරනවා, ඔවුන්ගේ ඒ කැපවීමට. විභාග ප්‍රතිඵල ඉහළ දැමීමට ඔවුන්ට ලොකු වුවමනාවක් තිබෙනවා. ඒක අප ගරු කරන දෙයක්. හැබැයි, දරුවන්ට නිවාඩුවකුත් අවශ්‍යයි. ඒ හින්දා තමයි අපි නිවාඩු දෙන්නේ. දරුවන්ගේ මනස relax වෙන්නත් අවශ්‍යයි. ඒ නිසා නිවාඩු කාලයේදී දරුවන්ගේ මනසට ඕනෑවට වඩා වැඩ පටවන්න එපා කියන ඉල්ලීමත් මා කරනවා. මොකද, අපි අධ්‍යාපනය දිහා බලන්න ඕනෑ, විභාග ප්‍රතිඵල ගැන හිතන්න ඕනෑ දරුවන්ගේ එක දෙයක් ගැන, එක පැත්තක් ගැන විතරක් අවධානය යොමු කරලා නොවෙයි, දරුවන්ගේ සමස්ත වර්ධනය, ගුණාත්මකභාවය ගැන පුළුල් ලෙස හිතලායි. දරුවෙකු ඉස්කෝලේ යන්නේ අවුරුද්දක් දෙකක් විතරක් නොවෙයි; අවුරුදු 13ක්. ඊට පස්සේත් උසස් අධ්‍යාපනයට යන්න පුළුවන්. වැඩිහිටියෙකු වුණාමත් කරන්න, කියන්න ගොඩක් දේවල් තිබෙනවා. විභාග ප්‍රතිඵලවලින් සාර්ථක වුණු පළියටම ඔවුන්ගේ ඉදිරි ජීවිතය සම්පූර්ණයෙන් සාර්ථක වෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා ළමා සංවර්ධනය පැත්තෙන් බලලා, මේවා ගැන සංවේදීව, කල්පනාකාරීව කටයුතු කරන්න කියා අපි ඉල්ලා සිටිනවා. දරුවන්ට නිවාඩුවකුත් අවශ්‍යයි. එම නිසා අපි දෙමව්පියන්ගෙනුත් ඉල්ලා සිටිනවා, දරුවන්ට නිවාඩුවටත් ඉඩ දෙන්න කියලා. ඒ ඉල්ලීම කරමින් මේ වැදගත් පනත් සංශෝධනය ගෙනෙන අවස්ථාවේ මට කාලය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Leader of the Opposition. You have been allotted six minutes to speak.

[අ.භා. 1.13]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මේ අවස්ථාවේ ගරු කාන්තා සහ ළමා කටයුතු ඇමතිතුමිය දරුවන්ගේ සුබසාධනය උදෙසා ගෙන තිබෙන තීන්දු තීරණ පිළිබඳව අපගේත් අනුමැතිය සහ සහයෝගය පළ කරනවා. එසේ කරන ගමන් මේ කාරණයත් කියන්න ඕනෑ. අපේ රටේ දරු පරපුරට නීරෝගී ජන ජීවිතයක් නිර්මාණය වුණොත් පමණයි, නිසි පෝෂණයක් ලැබුණොත් පමණයි සත්‍ය වශයෙන්ම අපි දරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කළා වන්නේ. අපි ඒ කාරණය අවබෝධ කර ගන්නට ඕනෑ.

ගරු අග්‍රාමාත්‍යතුමියත් ගරු සභාවේ සිටින මේ අවස්ථාවේ මම මේ ප්‍රශ්නය අහන්න කැමැතියි. විශේෂයෙන්ම ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ ඔබගේ රජය අනුමත කරමින් සංඛ්‍යාලේඛන ගණනාවක් පදනම් කරගෙන ප්‍රතිපත්ති හදනවා. මා හිතන විධියට, පැහැදිලිව ඒකෙන් සිදු වන්නේ දරුවාගේ අයිතිය සුරක්ෂිත වීම නොවෙයි; ළමා මන්දපෝෂණය, මාතෘ මන්දපෝෂණය සහ පවුලේ මන්දපෝෂණය වැඩි වීමයි. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව කියනවා, 2026 මැයි මාසය දිහා බැලුවොත්, දින 30ක් ජීවත් වෙන්න එක පුද්ගලයෙකුට රුපියල් 17,315ක් ප්‍රමාණවත් කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක පුද්ගලයෙකුට පුළුවන්ද, රුපියල් 17,315කින් දින 30ක් ජීවත් වෙන්න? ඇත්ත වශයෙන්ම බැහැ. මේ වාගේ වැරදි තොරතුරු මත පදනම්ව නිර්මාණය වන සංඛ්‍යාලේඛන හරහා දරුවාගේ නීරෝගී ජන ජීවිතයට තිබෙන අයිතිය අනිවාර්යයෙන්ම, නිසැකවම, සහමුලින්ම උල්ලංඝනය වෙනවා. ඒක අපි දරුවන්ට කරන අසාධාරණයක්; මව්වරුන්ට කරන අසාධාරණයක්; කාන්තාවටද, තරුණ පරපුරටද, ලක්ෂ 220ක් වූ සමස්ත පුරවැසි පරපුරටද කරන අසාධාරණයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ අවස්ථාවේ විශේෂයෙන්ම කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න කැමැතියි. මම ප්‍රධාන වශයෙන් ගන්නේ කරුණු 3යි.

පළමුවැනි කාරණාව මේකයි. දෙමව්පියන්ගේ ජීවනෝපාය අඩපණ වන කොට දරුවන්ගේ අයිතිය සුරක්ෂිත වෙනවාද? රජය ඒ ගැටලුවට උත්තර දෙන්නට ඕනෑ. තිස්සමහාරාම ප්‍රදේශයේ කිරින්ද වරාය ගත්තොත්, එහි ධීවර රැකියාවේ නියැළෙන ධීවර ප්‍රජාව දහස් ගණනක් ඉන්නවා. මේ මොහොත වන විට කිරින්ද ධීවර වරාය සම්පූර්ණයෙන්ම අඩපණ වෙලා තිබෙනවා; එහි ධීවර රස්සාව අඩපණ වෙලා තිබෙනවා. දහස් ගණනක් ජීවනෝපාය කර ගත්තු ඒ ධීවර වරාය අද ගොඩ වෙලා තිබෙනවා. වැලි ඉවත් කරන්න කියලා රජය කෝටි ගණනක් ගෙවනවා. ඉවත් කරන වැලි ටික ඒ වරායේ එහා පැත්තේම දැම්මාට පසුව sea currents නිසා ඒ වැලි ටික ආපහු ඇවිල්ලා වරාය ගොඩ වෙනවා. හැබැයි අර වැලි ගොඩ දාන එකට රජයෙන් මුදලුත් ගෙවනවා. එසේ එම වරාය ගොඩ වීම නිසා දහස් ගණනක් ධීවර ප්‍රජාවගේ ජීවනෝපාය නතර වෙලා; අකර්මණ්‍ය වෙලා තිබෙනවා. ඒ ප්‍රජාවගේ ජන ජීවිතය කඩාකප්පල් වන කොට, ඒ අයගේ ආදායම් මාර්ග කුඩු

පට්ටම් වන කොට ඒ පවුල්වල දරුවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත වෙන්නේ කොහොමද? ඒ අම්මලා, තාත්තලාට තම දූ දරුවන්ට නිසි අහාර වේල් තුනක් ලබා දෙන්න බැරි කොට ඒ අයගේ අයිතිවාසිකම් සුරක්ෂා වෙන්නේ කොහොමද?

ඒ වාගේම, දසදහස් ගණනින් තරුණ පරම්පරාව බලාගෙන ඉන්නවා, ඊශ්‍රායලයට යන්න. ඊශ්‍රායලයට ගිහිල්ලා හොඳ ආදායමක් ලබා ගෙන ඒ ලබන ආදායම ඒ අයගේ පවුල්වලට එව්වාම එක පැත්තකින් ඒ විදේශ ප්‍රේෂණ - foreign remittances - නිසා රටේ ආර්ථිකයට ශක්තියක් ලැබෙනවා. අනෙක් පැත්තෙන්, තමන්ගේ පවුල්වල දූ දරුවන්ට නිසි ආහාර, පෝෂණය, ශක්තිය, පාසල් උපකරණ, අධ්‍යාපනයට උදව් ඇතුළු ඔක්කෝම ලබා දෙන්න පුළුවන් වනවා. හැබැයි අද වන විට රැකියා සඳහා ඊශ්‍රායලයට යවන්න ක්‍රියාත්මක කරන Government-to-Government programme එක සහමුලින්ම අකර්මණ්‍ය වෙලා තිබෙනවා. රජය හරහා ඊශ්‍රායලයට යනවා නම් රුපියල් ලක්ෂ 4ක්, 5ක් තමයි යන්නේ. පෞද්ගලිකව ඊශ්‍රායලයට යනවා නම් රුපියල් ලක්ෂ 35ක්, 40ක්, 45ක් යනවා.

නිකමට සංසන්දනය කර බලලා පොඩ්ඩක් ඉන්දීය රජය ආදර්ශයට ගන්න. ඒ රටේ ඊශ්‍රායලයට යවන්නේ කෙළින්ම රජය සහ රජය අතර එකඟතාව යටතේ හෙවත් G2G ක්‍රමයට. නමුත්, අපේ රටේ 2026 වන කොට ඊශ්‍රායලයට සියයට 92ක්ම යවන්නේ පෞද්ගලික ඒජන්සි හරහා. ඒ සඳහා ඒ තරුණ පිරිස රුපියල් ලක්ෂ 35ක්, 40ක්, 45ක් ගෙවන්න ඕනෑ. එච්චර මුදලක් ගෙවලාත් මේ වන කොට ඒ අය ඇත්ත වශයෙන්ම ඉතාම අසරණභාවයට පත් වෙලා ඉන්නවා. ඒ තරුණ පුරපුරට කොහෙන්ද මුදල්? එක පැත්තකින්, ඒ අයගේ විදේශ රැකියා සිහිනය බොඳ වෙලා. අවශ්‍ය හැම දේම කරලා - පොලිස් වාර්තා අරගෙන, වෛද්‍ය පරීක්ෂණ කරලා - ඒ රටට යන්න waiting list එකේ ඉන්නවා, 3,442ක්. අදාළ ඇමතිවරයාට ඒ පිරිස රාජ්‍ය ක්‍රමවේදය තුළ ඊශ්‍රායලයට යවා ගන්න බැහැ. අද ඒ අයගෙන් අතිබහුතරයක් වූ තරුණ පිරිස රුපියල් ලක්ෂ 35, 40, 45 ගෙවමින් පෞද්ගලික අංශයේ කණ්ඩායම්වලට ගොදුරු වෙලා ඉන්නවා. ඒ වාගේ දෙයක් සිදු වන කොට, ඒ අයට විදේශ රැකියා අහිමි වන කොට, ඒ අයට ජීවනෝපාය අහිමි වන කොට ඒ අයගේ පවුල්වල දරුවන්ට සිදු වන්නේ බරපතළ අසාධාරණයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. විශේෂයෙන්ම අපි සතුටු වෙනවා, දිනපතා මේ ගරු සභාවේ ගොවි ගැටලුව පිළිබඳ කථා කරන එක ගැන.

යම්තම් රජයට පොඩි යම් හෝ අනුකම්පාවක් ඇති වෙලා වී මිලදී ගැනීම සඳහා තවත් රුපියල් මිලියන 7,500ක - රුපියල් බිලියන 7.5ක - අමතර මුදලක් ලබා දීම සඳහා යෝජනාවක් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ අනුමැතියට ඉදිරිපත් කර තිබෙනවා. ඒක හොඳ දෙයක් හැටියට අපි දකිනවා. ඇත්ත වශයෙන්ම මෙකෙන් වී ගොවියාගේ ප්‍රශ්නයට සමස්ත විසඳුමක් ලැබෙන්නේ නැහැ. පැහැදිලිවම, ලාල් කාන්ත ඇමතිවරයා මේ සභාවේ කියපු ආකාරයට වී කිලෝවක් නිෂ්පාදනය කරන්නට යන රුපියල් 137ක පිරිවැය ආවරණය වන ආකාරයට වී කිලෝවට සාධාරණ මිලක් ලබා දීම අත්‍යවශ්‍යයි. ඒක නිකම් වක්‍රලේඛ හරහා ප්‍රසිද්ධ කළාට මදි. ඒ සඳහා වී මිලදී ගැනීමේ විධිමත් වැඩසටහනක් සකස් කළ යුතුයි. රජය වී මිලදී ගන්නේ සියයට 5ක, 6ක, 7ක වාගේ ප්‍රමාණයක්. ඒ නිසා වී සඳහා ස්ථාවර මිලක් ඇති කරන්නේ කොහොමද කියන එක ගැන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නට ඕනෑ.

ඒකට අදාළව මම මේ කාරණයත් කියන්න කැමැතියි. අම්බලන්තොට මහවැලි සංවර්ධන කලාපයේ අක්කර 10,000ක ක්‍රියාත්මක වන මහවැලි වාරි ව්‍යාපෘතිය තුළ අපවහන ඇළ මාර්ග 3ක් - ආඬියන්ගමආර, බොල්හිඳආර, තැලවිල්ආර - හරහා ජලය අතිරික්තයක් පැමිණීම නිසා - මීටර් 250ක බැම්මක් ඉදිකිරීම නිසා - හැම කාලයකම විශේෂයෙන්ම මාස් කන්නයේ ගංවතුර තත්ත්වයක් නිර්මාණය වෙලා අක්කර දහස් ගණනක් පාළුවට යනවා. මේ පිළිබඳව රජයේ අවධානය යොමු කරන්න ඕනෑ. මේ ඉදිකරපු මීටර් 250ක පමණ බැම්මට කිසිම අයිතිකාරයෙක් නැහැ. ඒක මහවැලියටත් අයිති නැහැලු, වාරිමාර්ග දෙපාර්තමේන්තුවටත් අයිති නැහැලු, ගොවිජන සේවා ක්ෂේත්‍රයටත් අයිති නැහැලු. ඒ නිසා ඒ ජනතාවගේ ඉල්ලීම තිබෙන්නේ, අඩි 5ක දොරටු දෙකක් ලබා දීලා මේ ගැටලුව විසඳලා ඔවුන්ගේ ජීවිත සුඛිත මුදිත කරවන ක්‍රියාමාර්ගය ශක්තිමත් කරන්න කියන එකයි. ඒ වෙනුවෙන් මැදිහත් වුණොත් අනාථ වෙලා සිටින ගොවි පවුල්වලට ශක්තියක් ලැබෙනවා. ඒ ගොවි පවුල්වල දූ දරුවන්ගෙත්, ළදරුවන්ගෙත්, දරු පරපුරෙත් අයිතිවාසිකම් සුරක්ෂිත වනවාය කියන එකත් මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දරුවාගේ අයිතිය සුරක්ෂා වෙන්න නම් දෙමව්පියන්ගේ ජීවනෝපාය ශක්තිමත් කරන්නට ඕනෑ. ජීවනෝපාය ඉතාම පහළ මට්ටමකට වැටී තිබෙන ඒ ජන පරපුර වෙනුවෙන් මේ ඉස්මතු කරපු බරපතළ ගැටලුවලට රාජ්‍ය මැදිහත්වීමෙන් කිරින්ද ධීවර වරාය හරහා, රිදියගම ව්‍යාපාරය හරහා, විදේශ රැකියා හරහා විසඳුමක් ලැබුණොත්, නියත වශයෙන්ම ඒ පවුල්වල දූ දරුවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත වනවාය කියන එක මේ අවස්ථාවේ මා ප්‍රකාශ කරනවා.

මට මේ අවස්ථාව ලබා දුන්නාට බෙහෙවින් ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. (Mrs.) Sagarika Athauda. You have eight minutes.

[අ.භා. 1.24]

**ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சாகரிகா அதாவுத)
(The Hon. (Mrs.) Sagarika Athauda, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කථාව ආරම්භ කරන්නට කලින්, මීට පෙර කථා කළ ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය කළ ප්‍රකාශයකට ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. එතුමියගේ කථාව ඇතුළේ මේ රටේ වර්තමාන අග්‍ර විනිශ්චයකාර ධුරය දරන අග්‍ර විනිශ්චයකාරවරයා පිළිබඳව එක්තරා වෙබ් අඩවියක සඳහන් වන කරුණු උපුටා දක්වමින් ඉතා බරපතළ ප්‍රකාශයක් කළා. විශේෂයෙන් රජයක් විධියට අපි එම ප්‍රකාශය හෙළා දකිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක රටේ අධිකරණයේ ස්වාධීනත්වය ගැන වැඩි වැඩියෙන් කථා කරන අවස්ථාවක්. එවැනි අවස්ථාවක ධුරය දරන අග්‍ර විනිශ්චයකාරවරයාගේ පෞද්ගලික චරිතය අළලා හෝ වෙනත් කරුණු ගැන මූලාශ්‍ර මත පදනම් නොවී මෙවැනි ප්‍රකාශ කිරීම ඉතාම කනගාටුදායක තත්ත්වයක් බවයි අපට කියන්න තිබෙන්නේ. මෙවැනි ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ ස්ථාවරයත් අපි දැන ගන්නට කැමැති බවත් මේ අවස්ථාවේ සිහිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපි කථා කරන 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ (සංශෝධන) පනත් කෙටුම්පත යටතේ, දඩ මුදල් සංශෝධනය සම්බන්ධයෙන් වන සාකච්ඡාවට එළඹෙන්න මා කැමැතියි.

[ගරු නිතිඥ සාගරිකා අතාවුද මහත්මිය]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම ගෙවුණු වසර දෙක කියන්නේ අපේ රජය ජාතික වශයෙන් මෙන්ම ජාත්‍යන්තර වශයෙනුත් යම් ප්‍රශස්ත මට්ටමකට ළඟා වුණු වසර දෙකක්. ආර්ථික, සමාජයීය හා සංස්කෘතික කියන මේ සෑම අංශයකින්ම රජය වඩාත් ප්‍රතිඵල පෙන්වූ වසර දෙකක් විධියට අපට මේ වසර දෙක හඳුනා ගන්න පුළුවන්.

මේ රටේ පාර්ලිමේන්තුව විධියට ව්‍යවස්ථාදායකයේ අපි නීති ප්‍රතිසංස්කරණ වැඩිපුර සිදු කරමින්, නීති සංශෝධන ගෙන එමින් රටේ දියුණුවට, උන්නතියට අවශ්‍ය ප්‍රතිසංස්කරණ ගණනාවක් කිරීම නිසා ජාතික වශයෙන් මෙන්ම ජාත්‍යන්තරවත් අපේ රට ඇගයීමට ලක්වෙලා තිබෙනවා. විශේෂයෙන්ම අපේ රට ප්‍රගතිය, විනිවිදභාවය, සාමකාමීභාවය ඇගයීමට ලක් වන ගෝලීය සාම දර්ශකවල ඉදිරියට පැමිණීමත්, අපේ රට සංචාරකයන්ට උචිත මුල් රටවල් අතරට එක් වීමත්, දූෂණ සංජානන දර්ශකයේ 121වන ස්ථානයේ සිට 107 වන ස්ථානය දක්වා ස්ථාන 14ක් ඉදිරියට පැමිණීමත් වැනි සුවිශේෂී සන්ධිස්ථාන අපේ රට පිළිබඳ මෑත කාලීනව අපට දකින්න ලැබුණු වර්ධනීය තත්ත්ව විධියට දක්වන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණාවලට හේතු විධියට ගත්තොත්, 2024 ඉඳලා අඛණ්ඩව අපේ රටේ සිදු වුණු නීති ප්‍රතිසංස්කරණ, රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලියේ විනිවිදභාවය, ඩිජිටල්කරණය, රට තුළ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස තහවුරු වීම, ළමාරක්ෂණ නීති ශක්තිමත් කිරීමට පියවර ගැනීම, රටේ සිදුවන විවිධ සුබසාධන වැඩසටහන් හරහා ආර්ථික, සමාජීය අයිතිවාසිකම් රැකීමට ගෙන ඇති සාධනීය ක්‍රියාමාර්ග අපට හඳුනා ගන්න පුළුවන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම අද මේ සාකච්ඡා වන පනත් කෙටුම්පතට අදාළව ජාත්‍යන්තර කම්කරු සංවිධානය අපරානුමත කර ඇති සම්මුති අනුව වඩාත් ප්‍රගතිශීලී ආරම්භයක්, ප්‍රගතිශීලී පියවරක් විධියට අපේ රටේ ළමා ශ්‍රමය නොමැති බවට සහතික කිරීමේ අභිප්‍රායෙන් මේ ආරම්භ කර තිබෙන නව නීති ප්‍රතිසංස්කරණ අපට දකින්න පුළුවන්. විශේෂයෙන්ම මේ පනත් කෙටුම්පතේ 7 (3) වගන්තිය, 13 (2) වගන්තිය, 20 (අ) (3) යන වගන්තිවල දඩ මුදල් සංශෝධනය කිරීමක් මේ හරහා සිද්ධ වෙනවා. මේ හරහා දරුවන්ගේ ශ්‍රමය නීති විරෝධී ආකාරයට භාවිත කිරීම වැළැක්වීම තමයි අපේ අවශ්‍යතාව තිබෙන්නේ. ඒ අනුව තමයි මේ සංශෝධන සිද්ධ වෙන්නේ. විශේෂයෙන්ම අපි දරුවන්ගේ සුරක්ෂිතභාවය ගැන වැඩි වැඩියෙන් කථා කරපු ආණ්ඩුවක්. ඒ වාගේම, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශනය ඇතුළේ අපි දිගින් දිගටම දරුවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට අවශ්‍ය වැඩසටහන් පිළිබඳව සාකච්ඡා කර තිබෙනවා. ඒ මත ප්‍රතිපත්ති සම්පාදනය කරලා, ඒ අනුව වැඩ පිළිවෙළ ආරම්භ කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දරුවන් ගැන කථා කරද්දී දරුවන් වර්ග දෙකක් අපට හඳුනා ගන්න පුළුවන්. සුරක්ෂිත ගෘහවල ජීවත්වන දරුවන් වාගේම අනාරක්ෂිතවත් ජීවත් වන දරුවන් ඉන්නවා. ඒ වාගේම, රජයේ හෝ ස්වේච්ඡා ආයතනවල රැකවරණය ලබන දරුවන් අපේ සමාජයේ ඕනෑ තරම් ඉන්නවා. රජය විධියට අපි මේ කණ්ඩායම් දෙකම ගැන දැඩි අවධානයක් යොමු කරමින් පාසල් යන දරුවන්ට අනිවාර්යය අධ්‍යාපනය ලබා ගැනීමට අවශ්‍ය වටපිටාව සහ පහසුකම් ටික නිර්මාණය කිරීමේ ලොකු වගකීමක් දරාගෙන, ඒ වෙනුවෙන් අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා පාසල් උපකරණ ලබා ගැනීමට අවශ්‍ය වවුචර් ලබා දීම, සපත්තු ලබා දීම වැනි පහසුකම් ලබා දෙන්නත් කටයුතු කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පෙර පාසල් දරුවන්ගේ ආහාර දීමනාව වෙනුවෙන් ලබා දුන් රුපියල් 60ක මුදල රුපියල් 100 දක්වා වැඩි කරන්න වාගේම, ඒ දරුවන්ට ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීමට අවශ්‍ය වැඩසටහන සකස් කිරීමේ අරමුණින් අපි නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ආරම්භ කර තිබෙනවා. එතැනින් නවතින්නේ නැතිව පෙර පාසල් සඳහා ප්‍රශස්ත අධ්‍යයන ක්‍රමයක් පිළිබඳව මේ වන විට සාකච්ඡා කරලා ඒ සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සකස් කරමින් ඉන්නවා. එවැනි ක්‍රියාමාර්ග අපි අරගෙන තිබෙන්නේ අපේ දරුවන්ගේ අනාගතය සුරක්ෂිත කරන්නයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මුලින් කිව්වා වාගේ, අනාරක්ෂිත දරුවන් වෙනුවෙන් දැවැන්ත වැඩ කොටසක් මේ වන විට අපේ රජය ආරම්භ කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිවාසගත දරුවන් නැවත සමාජගත වීමේදී ලොකු ගැටලුවකට ඒ අය මුහුණ දීලා තිබෙන බව අපි දකිනවා. ඒ අයට ආරක්ෂිත නිවසක් නැහැ, නැවත යන්න තැනක් නැහැ. එවැනි දරුවන් වයස අවුරුදු 18 සම්පූර්ණ වුණාට පස්සේ, වයෝපූර්ණ තත්ත්වයට පත් වුණාට පස්සේ ඒ අයට ජීවත් වෙන්න නිවසක් අවශ්‍යයි. විශේෂයෙන්ම ඒ අය සඳහා "අර්ථ" වැනි වැඩසටහන් ක්‍රියාත්මක කරනවා.

ඒ වෙනුවෙන් රජය මැදිහත්වෙලා නිවාස වැඩ පිළිවෙළක් ආරම්භ කර තිබෙනවා. ඊළඟට අනාරක්ෂිත දරුවන්ට නිවාස ලබා දීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කර තිබෙනවා. ඒ, දරුවන් සම්බන්ධයෙන් සොයා බලා, ඒ සමාජ වටපිටාව අනුව දරුවන්ට එවැනි පහසුකම් අවශ්‍යයි නම්. අපි එතැනින් නවතින්නේ නැතිව, අධිකරණ ක්‍රමවේදය ඇතුළේ වීඩියෝ සාක්ෂි ලබා ගනිමින් අපයෝජනයට ලක් වූ දරුවන්ට නිදහසේ සාක්ෂි ලබා දීමට අවශ්‍ය වාතාවරණය සකස් කර තිබෙනවා.

ඒ වාගේම අපට දිගින් දිගටම අවශ්‍ය වෙලා තිබෙනවා, දරුවන්ට නිදහසේ ජීවත්වෙන්න පුළුවන් සමාජ වටපිටාවක්; පරිසරයක් හදලා දෙන්න. ඒ සඳහා පුළුල් අවස්ථාවක් විධියට මෙම පනත් කෙටුම්පත හරහා දඩ මුදල් වැඩි කරමින්, විශේෂයෙන්ම වයස අවුරුදු 16ට අඩු දරුවන්ගේ ශ්‍රමය යොදා ගැනීම වළක්වාලමින් සහ වයස අවුරුදු 16-18 අතර දරුවන්ට අහිතකර රැකියා අංශ 71ක් මේ පනතින් ආවරණය වෙන විධියට සංශෝධන ඉදිරිපත් කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සියල්ල හරහා අපට අවශ්‍ය වන්නේ මේ රටේ දරුවන්ට විධිමත් සහ වඩාත් සුරක්ෂිත සමාජ වටපිටාවක් සකස් කර දෙන්නයි. මේ සභාව තුළදී කියැවුණා, අපි දරුවන් සම්බන්ධයෙන් පුළුල් අවධානයක් යොමු කරලා නැහැ වාගේ අදහසක්. නමුත්, අපි පසුගිය කාල සීමාවේදී දිගින් දිගටම දැඩිව ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කළා. ඒ වාගේම ළමා අපයෝජන සිදුවීම් සම්බන්ධයෙනුත් ලොකු කතිකාවක් හැදුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි එතැනදී හඳුනා ගත්තා මෙවැනි සිද්ධීන් සම්බන්ධයෙන් ඌනතා පවතිනවා කියලා. අධිකරණ ක්ෂේත්‍රයේ වේවා, නීති ක්‍රියාත්මක කරන ආයතනවල වේවා, ඌනතා පවතිනවා. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියන්ගේ සංසදය මේ පිළිබඳව අධ්‍යයනය කරන්න කමිටුවක් පත් කරලා තිබෙනවා. දරුවන්ගේ නඩු වඩාත් කාර්යක්ෂමව කර ගන්නේ කොහොමද, දරුවන් මෙවැනි සිදුවීම් හරහා නැවත නැවත පීඩාවට පත් නොවන ආකාරයට වේගවත්ව මේ ක්‍රියාවලිය කරන්නේ කොහොමද කියලා ඒ කමිටුව හරහා අපි සාකච්ඡා කරනවා. උදේ කවිරත්න මන්ත්‍රීතුමියගේ කථාවේදී කියැවුණා, එවැනි ප්‍රවේශයන් අපි ලබාගෙන නැහැ වාගේ දෙයක්. නමුත් එම කමිටුවේ චමින්ද්‍රානි කිරිඇල්ල මන්ත්‍රීතුමියත් ඉන්නවා. එතුමිය සහභාගි වෙනවාද නැද්ද කියන එක සම්බන්ධයෙන් මට අදහසක් නැහැ. එතුමිය කාන්තා මන්ත්‍රීවරියක් විධියට එම කමිටුවේ තනතුරක් දරමින් කටයුතු කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, would you please wind up now?

**ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சாகரிகா அதாவுத)
(The Hon. (Mrs.) Sagarika Athauda, Attorney-at-Law)

මේ රටේ දරුවන්ට හැම අතකින්ම - ආර්ථික සහ සමාජයීය වශයෙන් - සුරක්ෂිත වුණු රටක් හදලා දෙන්න, ඒ වාගේම දරුවන්ගේ අනාගතය සුරක්ෂිත කරන්න අපි ඒ කමිටුව හරහා උත්සාහ කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam. The Floor is yours and you have seven minutes.

[பி.ப. 1.34]

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Hon. Deputy Speaker, இன்று இந்தச் சபையில் மிக முக்கியமானதொரு சட்டத் திருத்தம் முன்வைக்கப்பட்டு இருக்கின்றது. அதாவது, சிறுவர்களை வேலைக்கு அமர்த்துதல், பெண்களை dangerous occupationஇல் அமர்த்துதல் தொடர்பில் விதிக்கப்படுகின்ற தண்டப்பணத்தை 10,000 ரூபாயிலிருந்து ஓர் இலட்சம் ரூபாய் வரை அதிகரிக்கும் முக்கியமானதொரு சட்டத் திருத்தம் பாராளுமன்றத்தில் முன்வைக்கப்பட்டு இருக்கின்றது. இவ்வாறான சட்டத் திருத்தங்களை அரசாங்கம் கொண்டுவந்து அமுல்படுத்துவது போல, தீர்க்கப்படவேண்டிய பல முக்கியமான விடயங்கள் இன்னும் இருக்கின்றன.

நேரடியாகப் பெண்களுடன் சம்பந்தப்பட்ட விடயங்கள் என்று பார்த்தால், மலையகத்தில் வேலைசெய்கின்ற பெண்கள் இன்றுவரைக்கும் பாதுகாப்பற்ற நிலையில்தான் பெருந் தோட்டங்களில் வேலைசெய்துகொண்டு இருக்கின்றார்கள். அவர்களுடைய பாதுகாப்பை உறுதிப்படுத்துவதற்கு அல்லது அவர்களுடைய அடிப்படை வசதிகளைப் பூர்த்திசெய்வதற்கு இதுவரைக்கும் சாதகமான முன்மொழிவுகள், சட்டத் திருத்தங்கள் கொண்டுவரப்பட்டதாகத் தெரியவில்லை. அது அவர்களுடைய காணி உரிமை சம்பந்தமான விடயமாக இருக்கலாம்; ஏனைய விடயங்களாக இருக்கலாம்! அவர்களுடைய சம்பளம் மாத்திரம் குறிப்பிட்டதொரு தொகையால் அதிகரிக்கப்பட்டு இருக்கின்றது. 'தித்வா' புயலால் பாதிக்கப்பட்டிருக்கும் மலையகத்தில் இருக்கின்ற மக்களுக்கு இன்றுவரை காணி உரிமையோ, வீடுகளோ வழங்கப்படாமையால் அவர்களுடைய வாழ்க்கை இன்றும் பாதுகாப்பற்ற நிலையிலே இருக்கின்றது. இதன் காரணமாக, அரசாங்கம் தனக்கு எதிராக தண்டப்பணத்தை விதிக்கவேண்டிய கட்டாயம் எதிர்காலத்தில் ஏற்படலாமென நினைக்கின்றேன்.

அடுத்து, இன்னொரு முக்கியமான விடயத்தைக் குறிப்பிட வேண்டும். அதுவும் பெண்களுடன் சம்பந்தப்பட்ட ஒரு விடயமாகும். அண்மையில் தமிழ் பேசும் மக்கள் மத்தியில் பேசுபொருளாக மாறிய விடயம் சம்பந்தமாக நானும் ஒருசில கருத்துகளைக் கட்டாயம் சொல்லத்தான் வேண்டும். கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, ஒருசில வாரங்களுக்கு முன்னர் கல்முனை ஆதார வைத்தியசாலைக்கு சுகாதார உதவியாளர் களாக நியமிக்கப்பட்ட முஸ்லிம் சகோதரிகள் தங்களுடைய மதரீதியான ஆடைகளுடன் கடமைக்குச் சமுகமளித்து இருந்தார்கள். அதன் காரணமாக கடந்த சில நாட்களாக குழப்பமான ஒரு நிலைமை காணப்படுகின்றது.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்று காலையில் கௌரவ சுகாதார அமைச்சர் அவர்கள், தமிழ் பேசும் கட்சிகளின் ஒன்றியம் இந்த விடயம் சம்பந்தமாகப் பார்க்க வேண்டுமென்ற கருத்தைச் சொன்னார். இந்தச் சம்பவத்துடன் தமிழ் பேசும் கட்சிகளின் ஒன்றியம் பஞ்சாகப் பறக்கப் போகின்றதென இன்னொருவர் என்னிடம் சொன்னார். எனவே, நாங்கள் அனைவரும் இதன் பின்னணியைத் தெளிவாகப் புரிந்துகொள்ள வேண்டும்.

ஆறு தமிழ்பேசும் கட்சிகளும் ஒன்றாகச் சேர்ந்து வேலைசெய்வதை விரும்பாத இரண்டு வகையான தரப்பினர் இருக்கிறார்கள். ஒன்று, அரச தரப்பினர். ஆறு தமிழ்பேசும் கட்சிகளும் ஓரணியாக நின்று ஒன்றாக வேலைசெய்தால், அது எதிர்காலத்தில் நிச்சயமாக அரசாங்கத்துக்குச் சவாலாக மாறும் என்பது அவர்களுக்குத் தெரியும். அடுத்த தரப்பினர்தான், இனவாதத்தை மாத்திரம் மையமாகக்கொண்டு செயற்படு பவர்கள். அதாவது, தமிழ் மக்கள் முஸ்லிம் மக்களுக்கு எதிராகவும் முஸ்லிம் மக்கள் தமிழ் மக்களுக்கு எதிராகவும் பேச வேண்டும் என்பதற்காக இந்த இரண்டு சமூகங்களுக்கும் இடையில் முரண்பாட்டை ஏற்படுத்தி - அதனூடாக அரசியல் இலாபம் அடைய நினைக்கின்ற இன்னொரு தரப்பினர் இருக்கிறார்கள். இந்த இரண்டு தரப்பினரும் இவ்விடயத்தை வைத்து குளிர்காய்வதை நாங்கள் அவதானிக்க முடியும்.

நேற்று மாலை நாங்கள் - இலங்கைத் தமிழரசுக் கட்சியின் அரசியல் குழுவினரும் பாராளுமன்றக் குழுவினரும் - இணையவழிமூலம் தொடர்புகொண்டிருந்தோம். இலங்கைத் தமிழரசுக் கட்சி இந்த விடயம் சம்பந்தமாக தெளிவானதொரு அறிக்கையை - தனது நிலைப்பாட்டை - மிக விரைவாக வெளியிடும். கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்த ஆடை சம்பந்தமான விடயத்தில் தமிழ் மக்களையோ, தமிழ் அதிகாரிகளையோ சம்பந்தப்படுத்தி இருக்கவேண்டிய அவசியம் இல்லை என்பது என்னுடைய நிலைப்பாடாகும். ஏனெனில், குறித்த சுற்றுநிருபத்தை வெளியிட்டது அரசாங்கம்; அதன் அடிப்படையில் ஆடை அணிந்து வர வேண்டுமெனச் சொன்னது அரசாங்கம். எனவே, நாங்கள் அந்தச் சுற்று நிருபத்தை மாற்ற வேண்டும் அல்லது அவர்கள் தங்களுடைய மத ரீதியான ஆடையுடன் வருவதற்கான அனுமதியைக் கொடுக்க வேண்டுமென அரசாங்கத்திடம்தான் சொல்ல வேண்டும். சைவ சமயத்தைச் சேர்ந்த ஒரு பெண்மணி பொட்டுவைத்து வருவது அல்லது திருநீறு பூசி வருவது, பௌத்த மதத்தைப் பின்பற்றும் ஒருவர் கையில் வெள்ளை நிறமுடைய 'பிரித்' நூலைக் கட்டி வருவது அல்லது கதிர்காமத்துக்குச் சென்றுவந்தால் சிவப்பு நிற நூலைக் கட்டி வருவது, முஸ்லிம் சகோதரிகள் தங்களுடைய மத ரீதியான உடையுடன் வருவது என்பது அவர்களுடைய மத ரீதியான சுதந்திரம்! மத ரீதியான சுதந்திரத்தை வழங்குவதா, இல்லையா? என்பது அரசாங்கம் சுற்றுநிருபத்தின் ஊடாக வெளியிட்டு இருக்கவேண்டிய விடயம்.

அதைச் செய்யாமல், கடந்த காலத்தில் தமிழ் பேசும் மக்களுக்கு இடையில் குழப்பங்களை ஏற்படுத்திய பலர் - அரசியலமைப்புக்கான இருபதாவது திருத்தச் சட்டமூலத்துக்கு

[ගරු ශාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

ஆதரவாக வாக்களித்து, முஸ்லிம் சகோதரர்களுடைய ஜனாஸாக்களை எரிக்கும்பொழுது அப்போதிருந்த மோசமான ஆட்சியாளர்களுடைய காலடியில் விழுந்துகிடந்தவர்கள் - இன்றைக்கு அரசாங்கத்தின் சுற்றுநிருபத்தைப் பற்றி பேசுவதற்கு வக்கில்லாமல், தமிழ் மக்கள்மீது குற்றத்தைச் சுமத்த முயற்சிப்பது தவறான விஷயமாகும். குறித்த முஸ்லிம் பெண் உத்தியோகத்தர்கள் தங்களுடைய மத ரீதியான அடையாளத்தை வெளிப்படுத்தும் வகையில் ஆடை அணிந்து வருவது என்பது அவர்களுடைய மத ரீதியான சுதந்திரம்! அதைச் சுற்றுநிருபம் அனுமதித்தால் பிரச்சினையில்லை. அதைவிடுத்து, வைத்தியர் சுகுணன் 'மொசாட்' உடன் சம்பந்தப்பட்டவர் எனக் கூறுகிறார்கள். இப்படியே விட்டால், Florence Nightingaleஇல் 'மொசாட்'இன் agent என்று சொல்கின்ற அளவுக்கு இவர்களுடைய செயற்பாடுகள் இருக்கலாம்! கடந்த காலத்தில் சுகாதார அமைச்சின் இராஜாங்க மற்றும் பிரதி அமைச்சுப் பதவிகளை வகித்தவர்கள், ஏன் அந்த நேரத்தில் இந்த விடயத்தைப் பார்க்கவில்லை? வைத்தியர் சுகுணன் அவர்கள் accidentஇல் காயப்பட்டு 4 நாட்கள் unconsciousஆக hospitalஇல் இருந்தவர். இந்த நிலையில்தான், குறித்த வைத்தியசாலையில் நடந்த சம்பவத்துடன் அவரைத் தொடர்புபடுத்தி பேசுகிறார்கள். இன்று காலையிலும் ஓர் அரசியல் கட்சியின் தலைவர் என்னிடம் சொன்னார், "சுகுணன்தான் இதற்கெல்லாம் காரணம்" என்று. அப்போது நான் அவரிடம் கேட்டேன், "சுகுணன் வைத்தியசாலையில் அனுமதிக்கப்பட்டு இருந்தது உங்களுக்குத் தெரியுமா?" என்று. அதற்கு அவர், "அப்படியா! எனக்குத் தெரியாமல் போய்விட்டதே!" என்று சொன்னார். எனவே, நாங்கள் விரும்பியளவு இந்த விடயம் சம்பந்தமாக எங்களுக்குள் பிரிந்திருந்து பேசலாம்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Rasamanickam, your time is up. Would you please wind up?

**ගරු ශාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I will wind up in a minute.

ஆறு தமிழ் பேசும் கட்சிகளும் ஒன்றாகச் சேர்ந்து வேலைசெய்ய வேண்டுமென நாங்கள் தீர்மானம் எடுத்தோம். இருந்தபொழுதிலும், எங்களுக்குள்ளே சில கருத்து வேறுபாடுகள் இருக்கின்றன, தீர்க்கப்படவேண்டிய பல விஷயங்கள் இருக்கின்றன என்பது எங்களுக்குத் தெரியும்! அவற்றை நாங்கள் எங்களுக்குள்ளே பேசித் தீர்த்துக் கொள்வோம் என்ற நம்பிக்கையுடன்தான் ஒன்றாக வேலை செய்வதற்கு இணங்கினோம். குறிப்பாக, 3 விடயங்களை முன்வைத்தே நாங்கள் ஒன்றாக வேலை செய்வதற்கு இணங்கினோம்.

ஒருசில வருடங்களுக்கு முன்னர், Samanthurai Zonal Education Officeக்கு Zonal Education Director ஒருவரை நியமித்தபோது, அவர் ஒரு தமிழன் என்ற காரணத்துக்காக அவரை வேலை செய்யக்கூடாதென அனுப்பினார்கள். நாங்கள் அதைப் பற்றி இன்றுவரை பேசிக்கொண்டு இருந்தால், எதிர்காலத்தை நோக்கி ஒன்றாகப் பயணிக்க முடியாது. அண்மையில் காத்தான்குடியில் கௌரவ ஹிஸ்புல்லாஹ் அவர்கள், 1990ஆம் ஆண்டு நடந்த ஒரு துயரச் சம்பவத்தைப் பற்றி சில கருத்துகளைச் சொன்னபொழுது, "அவரே காளி கோயிலை இடித்ததாக சொன்னார்; அதைப் பற்றி நீங்கள் பொலிஸில் முறைப்பாடு செய்ய வேண்டும்" என்று தமிழ் சமூகத்தினர் சொல்கின்றார்கள். மேலும், வீரமுனையில் வளைவுகட்ட விடுகிறார்கள் இல்லையெனச் செல்கிறார்கள். இப்படியாக எங்களுக்குள்ளே தீர்க்கப்படவேண்டிய பல பிரச்சினைகள் இருக்கின்றன.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Rasamanickam, would you please wind up?

**ගරු ශාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
I am winding up, Sir.

எனினும், நாங்கள் ஒற்றுமையாகச் சேர்ந்து செய்ய வேண்டிய பல முக்கியமான விஷயங்கள் அதைவிட இன்னும் இருக்கின்றன. ஒற்றுமையாகச் சேர்ந்து பயணிக்கவேண்டிய விஷயங்களில் நாங்கள் சேர்ந்து பயணிக்க வேண்டும். அதேநேரத்தில், மேற்குறித்த விடயங்களையும் பேசித் தீர்த்துக்கொள்ள வேண்டும். முஸ்லிம் சகோதரிகள் தங்களுடைய மத ரீதியான அடையாளத்தை வெளிப்படுத்தும் வகையில் ஆடை அணிந்து, எந்தத் தடையும் இல்லாமல் நாடு முழுவதும் வேலை செய்வதற்கு ஏற்ற வகையில் அரசாங்கம் ஒரு சுற்றுநிருபத்தை வெளியிட்டால், அவர்கள் அந்தச் சுற்றுநிருபத்தின் அடிப்படையில் எங்கேயும் வேலை செய்யலாம். அதைவிடுத்து, கல்முனை வைத்தியசாலையை மட்டும் குறிவைத்து, அங்குள்ள அதிகாரிகளையும் குற்றஞ் சாட்டி, அந்த வைத்தியசாலையின் அபிவிருத்திக் குழுவின ரையும் அந்தப் பிரதேசத்திலுள்ள மக்களையும் இனவாதிகளாகக் காட்டுகின்ற சில அரசியல்வாதிகளின் மிகக் கேவலமான செயற்பாட்டை நான் வன்மையாகக் கண்டிப் பதோடு, இந்தப் பிரச்சினைக்கு சுமுகமான தீர்வொன்றை நிச்சயமாக அரசாங்கம் வழங்க வேண்டுமெனக் கேட்டு, என்னுடைய உரையை முடித்துக் கொள்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. (Mrs.) Hemali Weerasekara. You have eight minutes.

[අ.භා. 1.43]

**ගරු හේමාලි වීරසේකර මහත්මිය (නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය)**
(மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர - குழுக்களின் பிரதித் தவிசாளர்)
(The Hon. (Mrs.) Hemali Weerasekara - Deputy Chairperson of Committees)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ පනත යටතේ වන වැරදිවලට අදාළ දඩ මුදල් සංශෝධනය කිරීම පිළිබඳව තමයි අද අපි කථා කරන්නේ. එම විවාදය සඳහා අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අන්තර්ජාතික කම්කරු සංවිධානයට අනුව, ළමා ශ්‍රමය කියන්නේ, ළමා කාලය, ළමයින්ගේ හැකියාවන් සහ අභිමානය අහිමි කරන, එමෙන්ම ඔවුන්ගේ ශාරීරික හා මානසික සංවර්ධනයට හානි කරන දේවල්. වයස අවුරුදු 16ට අඩු ඕනෑම කෙනෙකු ළමයෙකු ලෙස සැලකෙන අතර, පාසල් යන වෙලාවට

පෙර හෝ පසුව පවුලේ සාමාජිකයින් විසින් සිදු කරනු ලබන සුළු කෘෂිකාර්මික හෝ ඒ හා සමාන කටයුතුවල නිරත වීම හැර වෙනත් කිසිදු ආකාරයක රැකියාවක ඔවුන් යෙදවීමට නොහැක.

2017 වසරේදී ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම ඇතුළුව ළමා ශ්‍රමය තුරන් කිරීම සඳහා ශ්‍රී ලංකාව විවිධ පියවර අරගෙන තිබෙනවා. අදාළ සියලු පාර්ශ්ව රැස්වන ළමා ශ්‍රමය තුරන් කිරීම සඳහා වූ ජාතික මෙහෙයුම් කමිටුව තුළ ළමා ශ්‍රමය තුරන් කිරීම සඳහා විශේෂ අවධානයක් යොමු කර තිබෙනවා. ඒ වාගේම ළමා ශ්‍රමය තුරන් කිරීම නිරන්තරයෙන් සිදුවන ක්‍රියාවලියක් විධියට හඳුනාගෙනත් තිබෙනවා. කම්කරු දෙපාර්තමේන්තුව විසින් ළමා ශ්‍රමය තුරන් කිරීම සඳහා රාජ්‍ය නිලධාරින්, මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කර පවත්වාගෙන යන අතර, ළමා ශ්‍රමය පිළිබඳ වැටලීම් සිදු කරනවා. ඒ වාගේම ළමා ශ්‍රමය හා ළමා ශ්‍රමයේ අන්තරායක ස්වරූපයන්ට අදාළ නීති ක්‍රියාත්මක කරමින් පවතිනවා. ඒ වාගේම කම්කරු දෙපාර්තමේන්තුව විසින් වයස අවුරුදු 18ට අඩු ළමයින්ගේ ශාරීරික සහ මානසික සෞඛ්‍යයට වාගේම, ආරක්ෂාවට සහ යහ පැවැත්මට අන්තරායක වන රැකියා වර්ග 71ක් හඳුනාගෙන තිබෙනවා. වයස අවුරුදු 18ට අඩු කිසිම තැනැත්තෙක් අන්තරායකාරී රැකියාවල යෙදවීම තහනම් කරලාත් තිබෙනවා. රටක දරුවන්ගේ හා තරුණ පරපුරේ සුරක්ෂිතභාවය තහවුරු කිරීම කොළයකට, නීතියකට සීමා වුණු දෙයක් නොවෙයි. එය ජාතියේ අනාගත ප්‍රගතිය තීරණය කරන පරම වගකීමක් වනවා.

එක් පැත්තකින් අද දින මේ ගෙන එනු ලබන දඩ මුදල් සංශෝධනය කිරීම ඉතාම කාලෝචිතයි. මොකද, 1956 අංක 47 දරන පනතට 2003 වසරේ සිදු කරන ලද සංශෝධනය මඟින් එම පනතේ විධිවිධානවලට අනුව වරදකරුවන් වන පුද්ගලයෙකුට රුපියල් 10,000ක් නොඉක්මවන දඩ මුදලක් හෝ මාස 12ක් නොඉක්මවන කාලයක සිර දඬුවමක් යන දෙයාකාරයකින් එක් ආකාරයක් හෝ එකී සිර දඬුවම හා දඩය යන දෙයාකාරයමත්, අධිකරණයේ අභිමතය පරිදි අගතියට පත් දරුවා වෙනුවෙන් වන්දි මුදලක් ද නියම කරන විධිවිධාන හඳුන්වා දී තිබුණා. නමුත්, අදාළ දඩ මුදලේ වටිනාකම වර්තමානය සමඟ සැසඳීමේදී කිසිසේත්ම ප්‍රමාණාත්මක නොවන බව තමයි නිරීක්ෂණය වන්නේ.

ඒ වාගේම ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර ඇති ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ 138 සහ 182 සම්මුතිවලට අනුගත වෙමින්, මෙම මුල් පනතේ 7(3) සහ 13(2) හා 20අ(3) වගන්තිවල සඳහන් අවම දඩ මුදල් වටිනාකම යාවත්කාලීන කොට රුපියල් ලක්ෂය දක්වා වැඩි කිරීමට තමයි මේ සංශෝධනය ගෙන එන්නේ. මේ විධියට දඩ මුදල් වැඩි කිරීමෙන්, නීති සකස් කිරීමෙන්, නීති ක්‍රියාත්මක කිරීමෙන් පමණක් සමාජයෙන් සම්පූර්ණයෙන්ම ළමා ශ්‍රමය තුරන් කිරීමට හැකි වෙනවාද කියන එකත් අපි නැවත සිතා බලන්න ඕනෑ. මොකද, කාලයක් තිස්සේ අපේ සමාජයේ මුල් බැසගෙන තිබුණු යම් ක්‍රියාවලි තිබුණා. ප්‍රභූ පවුල්වල දරුවන් සමඟ සෙල්ලම් කරන්න, ඒ වාගේම දරුකමට හදාගන්නා මුවාවෙන්, දරුවන් පාසල් යවන මුවාවෙන් තම තමන්ගේ පවුල්වල, ගෙවල්වල මෙහෙවර කරගන්න, ඒ වාගේම ඔවුන්ගේ ව්‍යාපාරවලට ළමා ශ්‍රමය ලබාගන්න දරිද්‍රතාව සහිත පවුල්වල දරුවන් යොදා ගන්නා යුගයක් තිබුණා. තවමත් ඒ වාගේ ක්‍රියාවල නෂ්ටාවශේෂ සමාජයේ තැනින් තැන දකින්නත් පුළුවන්. ඒ වාගේම එවැනි ක්‍රියා අසරණකමට කරන උදව්වක් විධියටත් සමාජයේ සාමාන්‍යකරණයට ලක්වෙලා තිබුණා. එමෙන්ම තමන්ගේ පවුල්වල ආර්ථික අර්බුදවලට විසඳුම් විධියට ළමා ශ්‍රමය භාවිත කරන ප්‍රවණතාව ද දකින්නට තිබුණා.

සිහමනේ යෙදවීම වාගේ ක්‍රියාවන්ට වැඩිහිටියන් විසින් දරුවන් සම්බන්ධ කර ගැනීම දරුවන්ගේ ශාරීරික හා මානසික සංවර්ධනයට සිදු වන හානියක්. අපේ සමාජයේ මුල් බැහැගෙන තිබුණු වැරදි චින්තනයන්ගෙන් මිදෙන්න ගැඹුරු සමාජ සහ සංස්කෘතික වෙනසකට අපි මේ සමාජය මෙහෙයවන්න ඕනෑ. මෙහිදී අණපනත්, නීති සංශෝධන වාගේම සමාජ හා සංස්කෘතික වෙනසකට අවශ්‍ය සංවාද ගොඩනැඟීමත් අත්‍යවශ්‍ය කාරණයක්. ඒ වාගේම ළමා හා තරුණ - අවුරුදු 16-18 අතර - වයසේ ශ්‍රම යෙදවීම නිර්මාණය වන හේතූන් සොයා බලා අපි ඒ සඳහා පිළියම් යොදන්න ඕනෑ.

කාන්තාවක් ගැබ් ගත් දා සිට ඇයට බිහි වන දරුවා අධ්‍යාපනය ලබා අවසාන වනතුරු රජයක් විධියට සිදු කරන ක්‍රියාවලිය පිළිබඳව මම කෙටියෙන් සඳහන් කරන්න කැමතියි. මුල් ළමාවිය සංවර්ධන ජාතික ලේකම් කාර්යාලය විසින් ගර්භිණී සහ කිරි දෙන මව්වරුන් සඳහා රුපියල් 45,000ක පෝෂණ දීමනාවක් ලබා දෙනවා; මාසිකව රුපියල් 4,500 ගණනේ මාස 10ක්, වවුචර් 10ක් ලැබෙන්න සලස්වනවා. ඒ විතරක් නොවෙයි, එක්වරක් පමණක් ලබා දෙන රුපියල් 5,000ක පෝෂණ දීමනා වැඩසටහනක් ක්‍රියාත්මක වනවා. සාගරිකා අතාවුද සහෝදර මන්ත්‍රීතුමිය කිව්වා, පෙර පාසල් දරුවන්ගේ ආහාර වේල සඳහා වෙන් කර තිබූ මුදල වැඩි කිරීම ගැන. ඒ විතරක් නොවෙයි, මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, පස්අවුරුදු බහුආංශික උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම, UNICEF ආයතනයේ මූල්‍ය අනුග්‍රහය යටතේ මේ වනකොට සකස් කර තිබෙනවා. 2025-2029 දක්වා සියලුම පාර්ශ්වකාර ආයතන සම්බන්ධ කරගෙන එම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට 2025 ඔක්තෝබර් මාසයේදී කැබිනට් මණ්ඩල අනුමැතියත් ලැබිලා තිබෙනවා. ඒ වාගේම අපි පෙර පාසල් ගුරුවරියන් පුහුණු කරන ආයතන 80ක් ලියාපදිංචි කර තිබෙනවා. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය තුළින් ජාතික ළමා ආරක්ෂක කමිටු පිහිටුවීමට කටයුතු කර තිබෙනවා. ඒ සම්බන්ධව විදුහල්පතිවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන්නත් කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම මේ වනකොට දැනුවත් කිරීමේ වැඩසටහන් 14ක් පවත්වා විදුහල්පතිවරු 2,504ක් දැනුවත් කරලා තිබෙනවා. ළමා ආරක්ෂාව සම්බන්ධව පාසල් ශිෂ්‍ය නායකයන් දැනුවත් කිරීම සඳහා පාසල් ශිෂ්‍ය තානාපති ජාතික වැඩසටහන පැවැත්වෙනවා.

ඒ වාගේම අපයෝජනයට ගොදුරු වූ දරුවන් සම්බන්ධව විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක වනවා. අපයෝජනය වුණු දරුවන්ගේ සාක්ෂි වීඩියෝ පට ලෙස ලබා ගැනීම සිදු කරනවා. ඔවුන්ගෙන් නැවත නැවතත් සාක්ෂි ලබා ගන්නේ නැහැ. අපයෝජනයට ලක් වූ දරුවන්ට මනෝ සමාජයීය සහායක් ලබා දීම සිදු කරමින් පවතිනවා. ඒ විතරක් නොවෙයි, "අර්ථ" වැඩසටහන යටතේ ආයතනගත දරුවන් සඳහා ප්‍රතිපාදන ලබා දෙනවා. ඒ ගැන මීට පෙර කථා කළ අපේ ගරු සහෝදර මන්ත්‍රීතුමියත් කිව්වා.

ඒ එක්කම පාසල් යන දරුවන් සඳහාත් සුබසාධන වැඩසටහන් ක්‍රියාත්මක වනවා. ඒ අනුව තෝරා ගත් පාසල් සිසුන්ට සපත්තු ලබා දීමේ වැඩසටහන යටතේ සිසුන් 644,000කට පමණ එම වවුචර් ලබා දෙනවා. ඒ සඳහා වතු පාසල් සිසුන් 53,093ක් මේ වනකොට තෝරාගෙන තිබෙනවා. ඒ වාගේම 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සමත් අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ට ලබා දුන් රුපියල් 750ක මාසික ශිෂ්‍යාධාර දීමනාව රුපියල් 1,500 දක්වා වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම ඔවුන්ට අවශ්‍ය පාසල් උපකරණ ලබා ගන්න අපි රුපියල් 6,000ක දීමනාවක් ලබා දෙනවා. ඒ විතරක් නොවෙයි, තෝරා ගත් පාසල් ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ලබා දුන් රුපියල් 5,000ක මාසික පෝෂණ දීමනාව රුපියල් 10,000ක් දක්වා වැඩි කරලා තිබෙනවා. වෘත්තීය අධ්‍යාපනය හදාරන සිසුන්ගේ මාසික දීමනාව රුපියල් 4,000 සිට රුපියල් 5,000 දක්වා වැඩි කරලා තිබෙනවා. උසස් පෙළ විශිෂ්ට සාමර්ථ දක්වන සිසුන්ට ජාත්‍යන්තර මට්ටමේ විශ්වවිද්‍යාලවල

[ගරු හේමාලි වීරසේකර මහත්මිය]

උපාධිය හැදෑරීම සඳහා ශිෂ්‍යත්ව වැඩසටහන් ආරම්භ කරන්න රුපියල් මිලියන 200ක් වෙන් කර තිබෙනවා. මෙන්න මේ ආකාරයට අපි ආණ්ඩුවක් විධියට දරුවන්ගේ අනාගත සුබසිද්ධිය වෙනුවෙන් කටයුතු කරන්න අමාත්‍යාංශ ගණනාවක් ඔස්සේ වැඩ පිළිවෙළ රාශියක් සකස් කර ක්‍රියාත්මක කරමින් පවතිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තටම මට පෙර විපක්ෂයෙන් කථා කළ බොහෝ මන්ත්‍රීවරු සඳහන් කළේ, අපි දරුවෝ ගැන සොයා බලන්නේ නැති, ඒ සඳහා ප්‍රවේශ වීමක් නැති ආණ්ඩුවක් විධියටයි. නමුත්, අපි හැම දාම කියනවා වාගේ දරුවෝ කියන්නේ අපේ රටේ අනාගතය. ඒක අපි හොඳින්ම දන්නවා.

ඒ දරුවන්ගේ අනාගතය සුරක්ෂිත කරන්න, සාර්ථක කරන්න අපි ආණ්ඩුවක් විධියට, රජයක් විධියට අපට ගත හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගනිමින් පවතිනවා. අපි ඉදිරියටත් එවැනි ක්‍රියාමාර්ග ගන්නා බව සඳහන් කරමින්, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.53]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියවීමේ විවාදය අද දවසේ පැවැත්වෙනවා. අඩු වයසින් දරුවන් සේවයේ යොදවනවා නම් ඒ ගැන රජය වගකිව යුතුයි වාගේම ඒ සම්බන්ධයෙන් රජය සොයා බැලිය යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ හැම දෙයටම බලපාන පැහැදිලි කාරණාවක් තිබෙන බව අපි දන්නවා. ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යොදවා අවසානයේදී ඒ සම්බන්ධයෙන් නඩුවකට අධිකරණයට යනවා නම් ඒ ගැන අවධානය යොමු කරන්න ඕනෑ. ඒ නිසා අධිකරණය, ස්වාධීන අධිකරණයක් බවට පරිවර්තනය විය යුතුයි. ඒක තමයි වෙන්න ඕනෑ. මේ මොහොත වනකොට අධිකරණ ක්ෂේත්‍රය යම් ප්‍රශ්නයකට මුහුණ දීලා තිබෙනවා. රජයක් හැටියට ව්‍යවස්ථා සංශෝධනයක් තුළින් විශේෂයෙන්ම විනිසුරුවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස දීර්ඝ කරන්න බලාපොරොත්තු වන බව අපි දන්නවා.

අද දවසේ නීතිඥ සංගමය මේ උත්තරීතර පාර්ලිමේන්තුවට ඇවිල්ලා ආණ්ඩුවත්, විපක්ෂයත් නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් එක්ක මේ සම්බන්ධයෙන් සාකච්ඡාවක් - කතිකාවක් - ඇති කරගන්න බලාපොරොත්තුවෙන් හිටියා. අපිත් බලාපොරොත්තුවෙන් හිටියා, ඔවුන් දවල් 12.00ට හමු වෙන්න. නමුත් ඒක ක්‍රියාත්මක වුණේ නැහැ. අද ඒක කල් දාලා තිබෙනවා. ඒ අයට එන්න දුන්නා නම් හොඳයි නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එතකොට ආණ්ඩුව පැත්තෙන් යම් ප්‍රශ්නයක් තිබෙනවා නම් ආණ්ඩුවට ඒ ගැන කථා කරන්න පුළුවන්කම තිබුණා. ඒ වාගේම විපක්ෂය පැත්තෙන් අපට පැහැදිලි කර ගැනීමක් කරගන්නත් පුළුවන්කම තිබුණා. හැබැයි, ඒක වුණේ නැහැ. ඒ නීතිඥ සංගමය සජබයට අයිති එකක්වත්, පොහොට්ටුවට අයිති එකක්වත් - පොදුවේ විපක්ෂයට අයිති එකක් - නොවෙයි. ඒක මේ රටේ අධිකරණ පද්ධතිය තුළ ඉතාම වැදගත් නීතිඥ මහත්වරුන්ගේ එකතුවක් හැටියට තිබෙන සංගමයක්. ඒ සංගමය තුළ නොයෙක් දේශපාලන මත තිබෙන, වෙනත් මත තිබෙන වැදගත්, උගත් නීතිඥ මහත්වරු ඉන්න පුළුවන්. නමුත් ඒ අයට ඒ අවස්ථාව ලබා නොදීම ගැන විශේෂයෙන්ම පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට මගේ කනගාටුව ප්‍රකාශ කරනවා.

ප්‍රශ්න ගණනාවක ඉන්න රජයක් හැටියට බලන්න ඕනෑ, අපට දැන් තිබෙන එකම ප්‍රශ්නය මේකද කියලා. දැන් තිබෙන එකම ප්‍රශ්නය විනිසුරුවරුන්ගේ විශ්‍රාම යාමේ වයස දීර්ඝ කිරීම පිළිබඳ ප්‍රශ්නයද? නැහැ. ප්‍රශ්න ගණනාවක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. විනිසුරුවරුන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස වැඩි කිරීම සම්බන්ධයෙන් විරෝධතා තිබෙනවා. කාගෙන්ද විරෝධතා තිබෙන්නේ? ගෞරවනීය මහා සංඝ රත්නයෙන් විරෝධතා තිබෙනවා. ඒ වාගේම මහානායක හිමිවරුන්ගෙන්, නීතිඥ සංගමයෙන්, ජාත්‍යන්තර නීතිඥ සංවිධානවලින්, ජාත්‍යන්තර සිවිල් සංවිධානවලින්, ශ්‍රී ලාංකීය සිවිල් සංවිධානවලින් වාගේම විපක්ෂයෙනුත් විරෝධතා තිබෙනවා. මේ ඔක්කොම අද විරෝධතා පවත්වනවා. ඒකට කැමති වෙන්නත් පුළුවන්, විරුද්ධ වෙන්නත් පුළුවන්. හැබැයි, අපට මතක් වෙනවා, එදා මේ ආණ්ඩුව නියෝජනය කළ අය කියපු දේවල්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

දැන් එක පැත්තකින් කියනවා, විනිසුරුවරුන්ගේ විශ්‍රාම යාමේ කාලය දීර්ඝ කරන්න ඕනෑ, නියමිත කාලයට විශ්‍රාම යන්නේ නැතුව එය දීර්ඝ කරන්න ඕනෑ කියලා. හැබැයි, මේ රට එක්සේසත් කරපු මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාට එදා කිව්වේ මොකක්ද? "නාකි මයිනා" කියලා. වයසට යනකොට "නාකි මයිනා". රනිල් වික්‍රමසිංහ "සුදු සීයා". වැල් පාලමේ යනවා කිව්වා. ඊළඟට කිව්වා, ගෙදර යතුරක්වත් දෙන්න හොඳ නැහැ, ගෙදර ඉන්න වයසක කෙනෙකුට කියලා. එහෙම නේ කිව්වේ. එතකොට එදා එහෙම කියලා දැන් කොහොමද මෙහෙම වෙන්නේ? වයසට ගියාම විශ්‍රාම යවන්නේ නැතුව අපට තව වැඩ ගන්න ඕනෑ කියලා තියා ගන්නවා. හැබැයි, තමන්ට ඕනෑ නැති වුණාම කියනවා, "නාකි මයිනා", සුදු සීයා", නාකින්ට ගෙදර යතුරක්වත් දෙන්න හොඳ නැහැ කියලා. මාර කෙළියක් නේ ඒක. කන්න ඕනෑ වුණාම තලගොයා කබරගොයා මාරු වෙනවා වාගේ වැඩක් නේ මේක. එහෙම නම් නාකි මයිනෝ නාකි මයිනෝමයි. නාකි මයිනෝ කොහොමද තරුණ මයිනෝ වෙන්නේ? එහෙම වෙන්නත් බැහැ නේ. දැන් කන්න ඕනෑ වෙලා මයිනෝ මාරු වෙලා. ඒකද මේ වෙන්නේ? අපි කියන්නේ කරුණාකර මේ කටයුත්ත සද්භාවයෙන් කරන්න කියන එකයි.

එදා ශිරානි බණ්ඩාරනායක අග විනිසුරුතුමියව එම ධුරයෙන් ඉවත් කළා, මේ පාර්ලිමේන්තුවේ ක්‍රමවේදයක් පාවිච්චි කරලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක වැරදියි. මම මේ කොන්ද කෙළින් තියාගෙනයි කියන්නේ. ඒක වැරදියි. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාට ඕනෑ නැති හින්දා ශිරානි බණ්ඩාරනායකව අයින් කළා කියලා ඒක අර්ථකථනයක් කරනවා නම්, දැන් මොකක්ද මේ කරන්න යන්නේ? *[බාධා කිරීමක්]* විනාඩියක් ඉන්න. මේ අහන්නකෝ. මා මිත්‍ර නියෝජ්‍ය ඇමතිතුමනි, අපි පුරුදු වෙලා තිබෙන්නේ වැරැද්දක් වුණා නම් ඒ වැරැද්ද, වැරදි හැටියට තේරුම් ගන්නයි. *[බාධා කිරීමක්]* පොඞ්ඩක් ඉන්නකෝ. *[බාධා කිරීමක්]* අනේ දෙයියෝ, එන්න දෙන්නකෝ හරියට තැනට.

වස්තුවේ, අම්මා, උම්මා දෙන්න එන්න. මේ අහන්න දෙයියෝ, ඒක වැරැද්දක් නම් ඒ වාගේම වැරැද්දක්ද මේ කරන්නෙත්? එදා හොඳ නැති හින්දා නේ ශිරානි බණ්ඩාරනායක මැතිනියව අග්‍ර විනිශ්චයකාර ධුරයෙන් අයින් කළේ. දැන් හොඳ හින්දා ද අග විනිසුරුවරයා තියා ගන්න හදන්නේ? එදා ශිරානි බණ්ඩාරනායක මැතිනිය අග්‍ර විනිශ්චයකාර ධුරයෙන් අයින් කර තිබෙන්නේ හොඳ නැති හින්දාලු, ඒ ආණ්ඩුවට හොඳ නැති හින්දා අයින් කළාලු. දැන් මේ ආණ්ඩුවට හොඳ හින්දාද අග විනිසුරුවරයා තියා ගන්න යන්නේ? ඒක කොහොමද? ඒක ෂෝක්ද? ඒක හොඳයිද? *[බාධා කිරීමක්]* ඔව්, හොඳයි, හොඳයි.

හැබැයි, මතක තියාගන්න. මගේ මිත්‍ර මන්ත්‍රීතුමා, මතක තියාගන්න. ඔබතුමා පාර්ලිමේන්තුවට ඇවිත් තවම අවුරුදු දෙක පිරුණෙත් නැහැ. මතක තියාගන්න, බලය වැඩි වෙනකොට ඔළුව ඉදිමෙනවා කියලා. බලය වැඩි වෙලා ඔළුව ඉදිමුණාට බලය නැති වෙනකොට තමයි කල්පනා කරන්නේ "අනේ අපට මොකද වුණේ" කියලා. අර කථාවක් තිබෙනවා,-*[බාධා කිරීම්]* මිත්‍රවරුනි, අහගන්න. කථාවක් තිබෙනවා, බලය තිබෙනකොට මොළය නැහැ, මොළය එනකොට බලය නැහැ කියලා. හරිද? පොඩ්ඩක් ඉන්න.*[බාධා කිරීම්]* පොඩ්ඩක් ඉන්න. දැන් තමුන්නාන්සේලාට බලය තිබෙනවා. දැන් තමුන්නාන්සේලාට මොළය නැහැ. ඊළඟට වෙන්නේ මොකක්ද? තමුන්නාන්සේලාට බලය නැති වෙනකොට මොළේ නොවෙයි, මේ පැත්තේ ඉන්න - විපක්ෂයට එන්න - පුටුවකුත් නැති වෙනවා. අපි නම් එක්කෝ ආණ්ඩුවේ, එක්කෝ විපක්ෂයේ. අපි අවුරුදු 30ක් මේ පාර්ලිමේන්තුව ඇතුළේ. අපි එක්කෝ ආණ්ඩුවේ, එක්කෝ විපක්ෂයේ. මොකද, අපි ජනතාවත් එක්ක හිටපු මිනිස්සු. තමුන්නාන්සේලාට ඇත්ත කියනකොට බුදු අම්මේ! ගැරඩින්ට භූමිතෙල් ගහලා වාගේ. ඇත්ත කියනකොට හරි අමාරුයි. ඒක තමයි මේ වෙලා තිබෙන්නේ. දැන් මොකක්ද වෙන්නේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් තිබෙන හින්දා මේක සම්මත වෙයි කියලා අපි හිතමු. හැබැයි, මේ වෙනකොට ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් බර ගානක් ගිහිල්ලා තිබෙනවා. නමුත් අපි හිතමුකෝ මේක සම්මත වුණා කියලා. අපි හිතනවා මේක සම්මත වුණා කියලා. සම්මත වුණොත් ඊළඟට තිබෙන කාරණය තමයි, රාජ්‍ය සේවයේ ඉන්නේ ඒ අය විතරද කියන එක. තව කවුද රාජ්‍ය සේවයේ ඉන්නේ? තවත් අය රාජ්‍ය සේවයේ ඉන්නවා නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ත්‍රිවිධ හමුදාව, පොලීසිය ඉන්නවා. සෞඛ්‍ය සේවය ගත්තොත්, වෛද්‍යවරු, හෙද හෙදියන්, කම්කරුවන් ඉන්නවා. අධිකරණ පද්ධතියෙත් තව ඉන්නවා නේ. විනිසුරුවරවයාගේ විතරක් විශ්‍රාම යන වයස වැඩි කරලා වැඩක් නැහැ. Registrarගෙත් වැඩි කරන්න ඕනෑ. Clerksලාගෙත් වැඩි කරන්න ඕනෑ. සියලු නිලධාරින්ගේ වැඩි කරන්න ඕනෑ. එතකොට නේ ඔය කියන වැඩේ වෙන්නේ. දැන් නඩු ටික ඉක්මනින් අවසන් කරගන්න නේ ඕනෑ කියලා නේ කියන්නේ. මේ නඩු ටික ඉක්මනින් අවසන් කරගන්න නම් මුළු අධිකරණ පද්ධතියේම සිටින අයගේ විශ්‍රාම යන වයස වැඩි කරන්න ඕනෑ. ඔක්කොම තනතුරුවල විශ්‍රාම යන වයස වැඩි කරන්න ඕනෑ. රාජ්‍ය සේවයේ දහහත් ලක්ෂයක් ඉන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව පොඩි වෙලාවක් දෙන්න. තමුන්නාන්සේ එක පාරට රතු ලයිට් එක පත්තු කරනකොට බයයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
හොඳයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මම මෙන්න මේ කාරණයත කියන්න ඕනෑ. දහහත් ලක්ෂයම පාරට බැහැලා "අපේ විශ්‍රාම යන වයස අවුරුදු දෙකකින් වැඩි කරන්න" කියලා කිව්වොත්, ඒ ඔක්කොගේම වැඩි කළොත් සිද්ධ වෙන්නේ මේ රටේ මතු පරම්පරාවට රැකියා නැති වීමයි. ඒකද මාලිමාවේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ තිබෙන්නේ? මම ඒ ගැන ඊට වැඩිය කථා කරන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අද බදු බර දැනිලා මිනිස්සු අනාථ වෙලා ඉන්නේ. මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලීමක් කරනවා, ව්‍යාපාරිකයෝ එක්ක කථා කරන්න කියලා. අද ව්‍යාපාරිකයින්ට බදු ගහලා ඒ මිනිස්සු බය වෙලා අනාථ වෙලා ඉන්නේ. එක ව්‍යාපාරයක් වහනවා කියන්නේ ඒ ව්‍යාපාරයෙන් ජීවත් වෙන පවුල් විශාල ගණනක් අන්ත අසරණ වෙනවා කියන එකයි. ඒ නිසා මේ බදු ගැහිල්ල ගැන නැවත හිතන්න. VAT එක ගැන නැවත හිතන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උදාහරණයකට ඔබතුමාව ගනිමු. ඔබතුමාට ඔබතුමාගේ දරුවෙකුගේ මඟුල් උත්සවයක් ගන්න හිතුණා කියමු. ඔබතුමා කොළඹ හෝටලයකට ගිහිල්ලා මඟුල් උත්සවය ගන්නවා. අනේ, දෙයි හාමුදුරුවනේ! මඟුල කනකොට මොකක්ද වෙන්නේ? සියයට 18ක් VAT එක වදිනවා. ඔබතුමාට ඒ VAT එක නැවත claim කරන්න පුළුවන්ද? බැහැ. තමුන්නාන්සේට එහෙම කරන්න බැහැ. මඟුල් කාපු අපි මොකටද VAT ගෙවන්නේ? සාමාන්‍ය පොඩි මිනිසුන්ට නේ මේක වැදිලා තිබෙන්නේ. ව්‍යාපාරිකයාගෙන් VAT ගත්තාට කමක් නැහැ. ඒක එයාට claim කරන්න පුළුවන්. අපට එහෙම නැහැ. දෙයි හාමුදුරුවනේ! මඟුල් කාලා දික්කසාද වෙන්න වෙනවා ඊට පස්සේ. ඇයි? මෙහේ කෙළවෙලා නේ. සියයට 18ක් ගිහිල්ලා නේ. ඒක ගැන බලන්න.

මා මිත්‍ර ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා අද උදේ හොඳ කාරණයක් මතක් කළා. දයාසිරි මන්ත්‍රීතුමාට බොහොම ස්තුතියි. ගල් අරක්කු බෝතලයට රුපියල් 2,200ක් ගහනවා tax එක විධියට, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ගල් කියපු ගමන් ඔබතුමා ඔළුව හරවා ගත්තා. අපි ගල් අරක්කු ගැන කථා කරන්න ඕනෑ. ගල් බෝතලයකට රුපියල් 2,200ක් බදු ගහනවා. ඒක මතක තියාගන්න. ආණ්ඩුව රුපියල් 2,200ක් බදු ගහනවා ගල් බෝතලයකට. ගල් අරක්කු බෝතලයක් විකුණන්නේ රුපියල් 3,800ට. රුපියල් 3,800ට විකුණන ගල් බෝතලයට රුපියල් 2,200ක් බදු ගහනවා. සාමාන්‍යයෙන් ගල් අරක්කු ගහන අය ගල් අරක්කුමයි ගහන්නේ. ගල් අරක්කු ගහන අය කවුද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? ගල් අරක්කු ගහන අය මඟුලක් වෙලාවෙදි ඒවා ගහනවා, මරණයක් වෙලාවේදි ගහනවා. දානෙට, බණට, ලව් එක කැඩුණාම ගහනවා, අලුත් ලව් එක්ක ආවාම ගහනවා. ඔක්කෝටම ගල් අරක්කු ගහන අය ඉන්නවා. එතකොට ගල් අරක්කු ගහන අයගෙන් රුපියල් 2,200 ගාණේ මාසයක්, -*[බාධා කිරීමක්]* එක දිගට ගහන අය ඉන්නවා නේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අහගන්න. ගල් අරක්කු ගහන කෙනෙක් දවසට ගල් බෝතලය ගානේ මාසයක් ගැහුවාම රුපියල් 66,000ක් බදු ගෙවනවා, ආණ්ඩුවට. ආණ්ඩුවට රුපියල් 66,000ක් බදු ගෙවනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ විධියට අවුරුද්දක් ගෙව්වොත්, ගල් අරක්කු බොන සාමාන්‍ය කම්කරුවෙක් රුපියල් 792,000ක් බදු විධියට ගෙවනවා. රුපියල් 792,000ක්! නමුත් ඔහුගේ ආදායම කීයද? අවුරුද්දකට ඔහු ලබන ආදායම කීයද? එහෙම නම් මොකක්ද මේ වෙලා තිබෙන්නේ? ඒ මිනිහා හම්බ කරන එක ආණ්ඩුව උදුරා ගෙන. හැබැයි, ඒ මිනිහා බදු ගෙවනවා කියලා ඒ මිනිහාගේ නම කොතැනකවත් සඳහන් වෙන්නේත් නැහැ. මම මේ කිව්වේ ගල් බෝතලයට ගහන බද්ද ගැනයි. මේක සුදුසු නැහැ. අපි කියන්නේ කරුණාකරලා මේ තරම් ගණනක් අය කරන්න එපා කියලායි. මම මේ පොඩි එකක් කිව්වේ. මේ බදුවලින් මිනිස්සු මිරිකිලා, තෙරපිලා ඉන්නේ. ව්‍යාපාරිකයෝ මේ රට හැර දමා යනවා. ඒ නිසා IMF එකට ඕනෑ විධියටයි, මහ බැංකු අධිපතිට ඕනෑ විධියටයි බදු ගසමින් මෙහෙම කටයුතු කරන්න එපා. කරුණාකර බුද්ධිමත්ව කටයුතු කරන්න කියලා මූලාසනයේ සිටින තමුන්නාන්සේගෙන් සහ මේ රජයෙන් මා ඉල්ලා සිටිනවා. මේ රජයේ බුද්ධිමත් අය නේ ඉන්නේ. දෙයි හාමුදුරුවනේ! අපි වල් පැළ, මේ මල් පැළ. දෙයි හාමුදුරුවනේ! මේවායේ මල් එන්න ඕනෑ. හැබැයි, දැන් මේවා මල් පැළ නොවෙයි. දැන් මේවා ලන්සි පැපොල්. ගහ මහතයි, ගෙඩි එන්නේ නැහැ. ඒකයි වෙන්නේ. දැන් ලන්සි පැපොල්. ඒ නිසා අපි කියනවා, කරුණාකරලා ලන්සි පැපොල් නොවී මල් පැළ බවට පත් වෙන්න කියලා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Lal Premanath. You have eight minutes.

Order, please! The Hon. Deputy Chairperson of Committees will now take the Chair.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

[අ.භා. 2.07]

**ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා.

1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ පනත සංශෝධනය කිරීම සඳහා ව පනත් කෙටුම්පත අද දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අදහස් දක්වන්නට අවස්ථාව ලැබීම ගැන මා හුදෙක්ම සන්තෝෂ වෙනවා.

අපි දන්නවා, විශේෂයෙන්ම අපේ රටේ වයස අවුරුදු 16ට අඩු ළමයින්ගෙන් වැඩ ගැනීම තහනම් කාරණයක් බව. ඒ වාගේම වයස අවුරුදු 16-18 අතර ළමයින් අන්තරායකර රැකියාවල යෙදවීමට විරුද්ධව අදාළ නීති රීති පනවා තිබෙනවා. අපි දන්නවා, 2010 වසර වනවිට එවැනි අන්තරායකර රැකියා 51ක් හඳුනා ගෙන තිබුණු බව. 2021 වසර වනවිට එම ප්‍රමාණය 71ක් දක්වා වැඩි කර තිබෙනවා. අපි දන්නවා, සමහර දෙමව්පියන් හෝ සමහර ජාවාරම්කරුවන් විසින් දරුවන් ඉතා නොසැලකිලිමත් විධියට සේවයේ යොදවන අවස්ථා තිබෙන බව. ඒ නිසා මේ පනතට සංශෝධන ගෙන එමින් එවැනි වැරදි සම්බන්ධයෙන් අය කරනු ලබන දඩ මුදල වැඩි කිරීම අත්‍යවශ්‍ය කාරණයක්ව තිබෙනවා, මේ මොහොත වනවිට. මොකද, ඉතිහාසයේත් එසේ දඩ මුදලක් අය කර තිබුණා. එවකට එය ලොකු දඩ මුදලක්; බරපතළ දඬුවමක් වුණත් අද වනවිට එය ඉතා සුළු මුදලක්. ඒ නිසා වරද කරන්න තිබෙන පෙලඹීම වැඩියි. ඒ වාගේම එම දඬුවම නිරෝධක දඬුවමක් හැටියට ගණන් ගැනෙන්නේත් නැහැ. ඒ නිසා මෙම පනතට මෙසේ සංශෝධන ගෙන ඒම ඉතා කාලෝචිතයි කියා මා විශ්වාස කරනවා. මට කලින් කථා කළ ගරු මන්ත්‍රීතුමා විසින් පිළිගත්තා බලය තිබෙන කාලයේ මොළය නැහැ කියලා. දැන් බලය නැති කාලයේ ඒ අයට මොළය ඇවිල්ලා මෙතැනට ඇවිත් විෂයයට අදාළ නැති සමහර කරුණු කථා කරන ආකාරය අපි දකිනවා. අපි අද වැදගත් මාතෘකාවක් ගැන කථා කරන්නේ. නමුත් ඊට අදාළ නැති දේවල් ගැන කථා කරමින් තමයි එතුමන්ලා මෙතැන කාලය ගත කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි රටේ සෑම පුරවැසියෙක් ගැනම කල්පනා කළ යුතුව තිබෙන නිසාත්, එසේ කල්පනා කරන ආණ්ඩුවක් නිසාත්, විශේෂයෙන්ම ගරු ජනාධිපතිතුමා මේ සියලු ක්ෂේත්‍ර පිළිබඳව ඉතා විමසිලිමත් වෙමින් මුළු රටම ජාත්‍යන්තර තලයට ඔසවා තැබීමට උත්සාහ දරමින් සිටින මොහොතක සහ එවැනි උසස් තත්ත්වයකට රට ගෙන එමින් පවතින අවස්ථාවක අපි රටේ දරුවන් පිළිබඳවත් විශේෂයෙන්ම කථා කළ යුතුව තිබෙනවා.

මම මේ ගරු සභාවට ඉදිරිපත් කරන්න කැමැතියි, මේ ලෝකය තුළ බිහි වුණු දාර්ශනිකයන්, රටවල් ඉහළට ඔසවා තැබූ රාජ්‍ය නායකයන් විසින් දරුවන් සම්බන්ධයෙන් දක්වා තිබෙන අදහස් කිහිපයක්. බුදුන් වහන්සේ මංගල සූත්‍රයේදී පවුලක සහ සමාජයක වගකීම පෙන්වා දෙමින් දේශනා කර තිබෙනවා, "පුත්ත දාරස්ස සංගහෝ" යනුවෙන්. ඒ, අඹු දරුවන්ට නිසි ලෙස සැලකීම සහ ඒ අය රැක බලා ගැනීම සම්බන්ධවයි. එය උතුම් මංගල කරුණක් හැටියට උන් වහන්සේ දේශනා කරනවා. ඒ වාගේම, දරුවන්ට සුදුසු කාලයේදී ශිල්ප ශාස්ත්‍ර ලබා දීම දෙමව්පියන්ගේ සහ සමාජයේ මූලික වගකීමක් බව සිඟාලෝවාද සූත්‍රයේදීත් උන් වහන්සේ පැහැදිලි කර තිබෙනවා. උන් වහන්සේ දේශනා කරන්නේ, දරුවෙකුගේ ළමා කාලය නැති කිරීම යනු, එම ධර්මතාවලට එරෙහි වීමක් කියලායි.

ඒ වාගේම, ඉස්ලාම් ආගමේ ශාස්තෘවරයා වන නබි නායකතුමා දේශනා කරනවා, "සියලු දරුවන් උපත ලබන්නේ පිරිසිදු ස්වභාවයකිනි; දරුවන්ට කරුණාව දැක්වීම සහ අධ්‍යාපනය දීම අනිවාර්යයි; ශ්‍රමය සූරාකෑම නිවැරැදි නැත" කියා.

ඒ වාගේම හින්දු පූජකවරයෙකු සහ දාර්ශනිකයෙකු වූ ස්වාමි විවේකානන්ද දේශනා කරනවා, "දරුවා යනු දේව ආත්මයකි; දරුවන්ට අධ්‍යාපනය ලබා දීම සමාජයේ උසස්ම පූජාවයි; ශ්‍රම සූරාකෑම පාපයක්" කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එකී ආගමික නායකයන් එසේ පවසන අතරේ, රටවලට ආදර්ශය දීපු, රටවල් ගොඩනගපු, අදත් එවැනි ආදර්ශයන් දෙමින් සිටින නායකයන් කිහිප දෙනෙකු කරපු ප්‍රකාශ කිහිපයකුත් මම මේ අවස්ථාවේ ඉදිරිපත් කරන්න ඕනෑ, මේ කියන කරුණු පෝෂණය කිරීම සඳහා.

මහත්මා ගාන්ධිතුමා දරුවන් ගැන කියන්නේ, "අපට ලෝකයේ සැබෑ ශාන්තිය ඇති කිරීමට අවශ්‍ය නම්, අප ආරම්භ කළ යුත්තේ දරුවන්ගෙනි; දරුවෙකුගේ කුඩා අත්වලට මෙවලම් දීම නොව අධ්‍යාපනය දීමෙන් පමණක් අවිහිංසාවාදී සමාජයක් හැදිය හැකියි" කියලායි. අපත් අද "පොහොසත් රටක්- ලස්සන ජීවිතයක්" කියන තේමාව ඔස්සේ "ලස්සන ජීවිතය" කියන ඒ උත්තුංග එලය නෙළා ගන්න නම්, මේ දරු පරපුර වෙනුවෙන් කළ යුතු යුතුකම් අද අදම ඉටු කරන්න ඕනෑ කියන එක මේ සියල්ලෙන්ම අපට පැහැදිලි වෙනවා. ඒ වාගේම තවත් දේශපාලනික දාර්ශනිකයෙකු වූ කාල් මාක්ස් ඔහුගේ "Das Kapital" කෘතිය ලියද්දී එහි සඳහන් කරනවා, "ධනපති පද්ධතිය විසින් ළමුන්ගේ මෘදු ශරීරය සහ මනස නිෂ්පාදන මෙවලම් බවට පත් කිරීම මනුෂ්‍යත්වයට කරන මහත් අපරාධයක්; දරුවෙකුගේ ළමා කාලය වෙළෙඳ පොළට විකිණීම සමාජයක පිරිහීමේ ලක්ෂණයක්" යනුවෙන්. ඔහු ඉතාම පැහැදිලිව සවිස්තරාත්මකව තම "ප්‍රාග්ධනය" නැමැති කෘතියේ එසේ ප්‍රකාශ කර සිටිනවා.

ඒ වාගේම, සෝවියට දේශය ගොඩනගපු ව්ලැඩිමියර් ලෙනින් දරුවන් ගැන ප්‍රකාශ කරනවා, "අපට අනාගතයක් ඇත්තේ දරුවන් වෙනුවෙන් නිවැරදි ලෙස ආයෝජනය කළහොත් පමණයි" යනුවෙන්. ඒ වාගේම, දරුවන්ට නිදහසේ ඉගෙනීමටත්, සෙල්ලම් කිරීමටත් අයිතියක් තිබිය යුතු බවත්, ඔවුන්ගේ ශ්‍රමය සූරා කෑම තහනම් කළ යුතු බවත් ඔහු ඉතාම දැඩි ලෙස ප්‍රකාශ කර සිටියා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඉතිහාසය පුරා මේ රටේ ළමා පරපුර නොසලකා හැරි බව අපි දන්නවා. සමහර අවස්ථාවල ඉතාම නින්දිත දේශපාලන භාවිතාවන් තුළ මේ රටේ දැවැන්ත යුද්ධයක් නිර්මාණය වුණු බවත් අපි දන්නවා. අවසානයේ ළමයා වහලෙකු, ශ්‍රම වහලෙකු විතරක් නොව, යුද්ධයකදී උපකාරයට ගන්නා යුද සෙබළෙකු බවට පත් කරන තැනට මේ රට ගෙන එන්නත් ඒ හිටපු පාලකයන් දැනුවත්ව හෝ නොදැනුවත්ව කටයුතු කර තිබෙනවා. ඒ නිසා අප අද හෝ මෙවැනි අණ පනත් සම්මත කරමින්, මෙය ඉදිරි අනාගතයට කරන ආයෝජනයක් හැටියට සලකා දරුවන් වෙනුවෙන් කළ යුතු යුතුකම් ටික ඉෂ්ට කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙහි සඳහන් දඩ මුදල නිකුත් කිරීමෙන්ම පමණක් දරුවන් පිළිබඳ සියල්ල සොයා බලා කටයුතු කරන්න අපට පුළුවන් වෙයි කියා මා විශ්වාස කරන්නේ නැහැ. මොකද, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, තහනම් කරපු අන්තරායකර රැකියා ක්ෂේත්‍ර 71 අතර අපට අතට හසු වන්නේ නැති, එය වහල් සේවයක් කියලා හිතෙන්නේ නැති තරමේ කාරණාත් තිබෙනවා. එකක් තමයි, ගෘහ සේවයට යොදා ගැනීම. අධීක්ෂණය කරන්න හෝ අත්අඩංගුවට ගන්න හෝ නොහැකි අවස්ථා කිහිපයක්ම ඒවා අතර තිබෙනවා. මම ඒවායෙන් කීපයක් පමණක් කියන්නම්.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය නම් අවසන්.

**ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට තව පොඩි වේලාවක් දෙන්න.

අවන්හලක, ආපන ශාලාවල වැඩ කරන දරුවන් අපි ඕනෑ තරම් දැක තිබෙනවා. අපි ඒ පිළිබඳ වැඩි අවධානයක් යොමු කරන්න ඕනෑ. තොටුපළක් ආශ්‍රිතව වැලි ගොඩදැමීම, වැලි පැටවීම වැනි කාර්යයන් ද මෙහි සඳහන්ව තිබෙනවා.

ඒ වාගේම අපි දන්නවා, සංචාරකයන්ගේ මාර්ගෝපදේශකයන් හැටියට දරුවන් යොදා ගත්තු සහ ඔවුන් ඒ සඳහා පෙළඹුණු අවස්ථා තිබෙන බව. ඒ වාගේම පුද්ගලයන්ට, සතුන්ට ආරක්ෂාව සැපයීම සඳහා දරුවන් යොදවා ගත් අවස්ථා ද තිබෙනවා. මෙන්න මේ වාගේ වැඩි අවධානයක් යොමු කළ යුතු කාරණා තිබෙන බව ප්‍රකාශ කරමින්, මේ ගෙන එන ලද සංශෝධන පනත් කෙටුම්පතට මාගේ පූර්ණ අනුමැතිය, සහයෝගය ලබා දෙන බවත් සඳහන් කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චමින්ද්‍රාණී කිරිඇල්ල මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.15]

**ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ පනතේ වගන්ති කිහිපයක් සංශෝධනය කිරීම සඳහා මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙන සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳ විවාදය පැවැත්වෙන මේ මොහොතේ අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. 1956 අංක 47 දරන ප්‍රධාන පනත ශ්‍රී ලංකාවේ කාන්තාවන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීම සම්බන්ධයෙන්, ඒ අයගේ ආරක්ෂාව සම්බන්ධයෙන් තිබෙන ඉතාම වැදගත් නීතියක්. එය හුදෙක් කම්කරු නීතියක් පමණක් නොව, ස්ත්‍රීන්ගේ, දරුවන්ගේ සහ තරුණ අයගේ අධ්‍යාපනය, සෞඛ්‍යය, ආරක්ෂාව, ගෞරවය සහ අනාගතය සුරක්ෂිත කරන නීතියක් වශයෙන් තමයි හඳුන්වන්න පුළුවන් වන්නේ. මම ඒ පිළිබඳව ඉතාම කෙටියෙන් කරුණු දක්වන්නම්.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය නීතියට අනුව වයස අවුරුදු 16ට වඩා අඩු දරුවෙකුට රැකියාවක නියැළීමට නොහැකි වුණත්, තම අධ්‍යාපනයට බාධා නොවන ආකාරයට තම මව්පියන්, භාරකරු සමඟ සැහැල්ලු කෘෂිකාර්මික උද්‍යාන වගා යනාදී කටයුතුවල නිරත විය හැකියි. ඒ වාගේම වයස අවුරුදු 16-18 තරුණ පුද්ගලයන් සේවයේ යෙදවිය හැකි නමුත් අනතුරුදායක රැකියාවක නිරත කරවීමට නොහැකියි. ඒ වාගේම, කාන්තාවන් සේවයෙහි යෙදවීමේදී ද ඒ අයට විශේෂ ආරක්ෂාවක් මේ මුල් පනත මඟින් සලසා තිබෙනවා.

අද දින විවාදයට ගැනෙන මේ සංශෝධන පනත් කෙටුපත මඟින් මුල් පනතේ වගන්ති තුනක් හෙවත් 7(3), 13(2) සහ 20(අ)(3) යන වගන්ති තුන යටතේ නියම කර තිබෙන දඩය රුපියල් 10,000 සිට රුපියල් 100,000ක් දක්වා වැඩි කිරීම තමයි සිදු වන්නේ. ඒ අනුව, දරුවෙකු කාර්මික ආයතනයක නීති විරෝධීව සේවයේ යොදවන අවස්ථාවක, නීතියට පටහැනිව දරුවෙකු සේවයේ යොදවන අවස්ථාවක, ඒ වාගේම අවුරුදු 18ට අඩු අය අනතුරුදායක රැකියාවක නිරත කරවන අවස්ථාවක අය කරන දඩය රුපියල් 10,000 සිට රුපියල් 100,000 දක්වා වැඩි කරලා තිබෙනවා. 2003 වර්ෂයේදී නියම කරපු මේ රුපියල් 10,000 දඩය රුපියල් 100,000ක් දක්වා වැඩි කිරීම පිළිබඳව අපි ඇත්තටම සතුටු වෙනවා. නමුත් ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අප මේ 1956 මුල් පනත ගත්තොත්, සමස්තයක් වශයෙන් වැරදි 25කට ආසන්න සංඛ්‍යාවක් තිබෙනවා. නමුත් අද මේ සංශෝධන

[ගරු නීතිඥ චමින්ද්‍රානී කිරිඇල්ල මහත්මිය]

පනත් කෙටුම්පත මඟින් දඩය වැඩි කරලා තිබෙන්නේ, එම පනතේ වගන්ති තුනකට අදාළව පමණයි. ඉතින් මම දන්නේ නැහැ, වගන්ති තුනකට අදාළව විතරක් දඩය වැඩි කරලා තිබෙන්නේ ඇයි කියලා. අනෙක් වැරැදි 23 සඳහා 2003දී නියම වූ රුපියල් 5,000-10,000 දඩය තමයි තවමත් ක්‍රියාත්මක වෙන්නේ.

මා විශ්වාස කරන ආකාරයට, අද මේ සංශෝධන පනත් කෙටුම්පත තුළින් ඉදිරිපත් කර තිබෙන වගන්ති තුනට පමණක් සීමා නොකර මුල් පනතේ තිබෙන ඉතිරි වැරැදි_23ට අදාළවත් දඩය වැඩි කළා නම් තමයි එම මුල් පනතේ අරමුණ වඩාත් හොඳින් සුරක්ෂිත කිරීමට අපට හැකියාව ලැබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, උදාහරණයක් වශයෙන් ගත්තොත්, 13(2) වගන්තියට අනුව දරුවෙකු නීති විරෝධීව සේවයේ යෙදවීම වෙනුවෙන් වන දඩය රුපියල් 10,000 සිට රුපියල් 100,000 දක්වා වැඩි කරනවා නම්, එම වරද සැඟවීමට අසත්‍ය තොරතුරු ලබා දීම, ව්‍යාජ ලේඛන ඉදිරිපත් කිරීම, කම්කරු නිලධාරින්ගේ පරීක්ෂණවලට බාධා කිරීම, දරුවෙකුගේ පාසල් අධ්‍යාපනයට බාධා වන ලෙස සේවයේ යෙදවීම යන වැරැදිවලට අදාළ දඩය වැඩි නොකරන්නේ ඇයි? එම දඩ මුදල රුපියල් 5,000-10,000 ලෙස තමයි තවමත් තිබෙන්නේ. ඒ වාගේම 20(අ)(3) වගන්තිය යටතේ වයස අවුරුදු 16-18 තරුණ පුද්ගලයෙකු අනතුරුදායක රැකියාවල යෙදවීමේ වරදට අදාළ දඩය රුපියල් 100,000 දක්වා වැඩි කර තිබෙන නමුත් 20(අ)(3) වගන්තිය යටතේ වයස අවුරුදු 16-18 අතර දරුවෙකු අනතුරුදායක සන්දර්ශනවලට සහභාගි කරවීමේ වරදට අදාළව පනවපු දඩ මුදල තවමත් රුපියල් 10,000ක් ලෙස තමයි තිබෙන්නේ. නමුත්, මෙවැනි වැරැදිවලට අදාළ දඩයත් රුපියල් 10,000 සිට රුපියල් 100,000 දක්වා වැඩි කළා නම් තමයි අපට අද ගොඩක් සතුටු වෙන්න පුළුවන්. අපේ කාන්තා කටයුතු ඇමතිතුමිය නම් මේ අවස්ථාවේ සභා ගර්භයේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දඩ මුදල වැඩි කිරීමේ අරමුණ, වරදක් සිදු වූ පසු දඬුවම් කිරීම සඳහා පමණක් නොව, එවැනි වරදක් සිදු කිරීමට පෙර දෙවරක් සිතීමට සේවා යෝජකයා පෙළඹවීමයි. එය ඉතාම වැදගත්. ඒ වාගේම, අසත්‍ය තොරතුරු ලබා දීම වැළැක්වීම කෙරෙහි ප්‍රබල නිවාරණයක් හැටියට තමයි අපට මේක හඳුන්වන්න පුළුවන් වන්නේ. දඩය සුළු නම් අසත්‍ය තොරතුරු ලබා දී නීතියෙන් ගැලවීමට උත්සාහ කිරීම සේවා යෝජකයාට සුළු දෙයක් විය හැකියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කලින් කථාවලදීත් මේ කරුණ සඳහන් වුණා. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ILO අංක 138 සහ ILO අංක 182 යටතේ ළමා ශ්‍රමය තුරන් කිරීමේ ජාත්‍යන්තර වගකීමක් වර්ෂ 2000 සහ 2001දී ශ්‍රී ලංකාව භාරගෙන තිබෙනවා. එම නිසා මෙම පනත සංශෝධනය කිරීමේ මූලික අරමුණ ක්‍රියාත්මක කිරීමට නම්, අපේ දරුවන් ආරක්ෂා කිරීම මෙන්ම ශ්‍රී ලංකාව භාරගෙන ඇති ජාත්‍යන්තර වගකීම් ඉටු කිරීමද ඉතාම වැදගත්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දැන් මම මේ සභාවේ අවධානය යොමු කරවීමට කැමැතියි, අපේ ශ්‍රී ලාංකික මව්වරුන්ට සහ දරුවන්ට ඉතාම සංවේදී සහ වැදගත් කරුණක් පිළිබඳව. විශේෂයෙන්ම පසුගිය දිනවල කථා බහට ලක් වුණු කරුණක් තමයි, විවාහයෙන් පිටත යම්කිසි දරුවෙක් උපත ලැබූ අවස්ථාවක පීතෘත්වය පිළිබඳ ගැටලු මතු වුණ එක. විශේෂයෙන්ම DNA tests සම්බන්ධ ගැටලු මතු වුණා. මේක අපේ රටේ ශ්‍රී ලාංකික මව්වරුන්ගේ සහ දරුවන්ගේ කීර්ති නාමයට බලපාන ප්‍රශ්නයක් හැටියට තමයි මම දකින්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ රටේ දැනට තිබෙන නීතියට අනුව විවාහයෙන් පිටත යම් කිසි දරුවෙක් උපත ලැබුවාම ඒ පිරිමි පාර්ශ්වය පීතෘත්වය ප්‍රතික්ෂේප කරනවා නම්, එහෙම නැත්නම් DNA test එක ප්‍රතික්ෂේප කරන අවස්ථාවක, ඒ මවට ප්‍රබල සහ විශ්වාසදායක සාක්ෂි අධිකරණයට ඉදිරිපත් කිරීමට නොහැකි වුණු අවස්ථාවක ඒ DNA පරීක්ෂණය බලෙන් කිරීමට, ඒ කියන්නේ අනිවාර්ය කිරීමට නොහැකි තත්ත්වයක් තමයි අධිකරණයට තිබෙන්නේ. එමඟින් ඒ දරුවාගේ සහ ඒ මවගේ කීර්ති නාමයට හානියක් විය හැකියි. විශේෂයෙන්ම බටහිර රටවල්වල වාගේ නොවෙයි, ශ්‍රී ලංකාව වැනි රටවල්වල දරුවාගේ උප්පැන්න සහතිකයේ පියාගේ නම සඳහන් නොමැති සමහර අවස්ථාවල පාසල්වලට ඇතුළත් කිරීමද ප්‍රතික්ෂේප වෙලා තිබෙනවා. එවැනි අවස්ථාවක ඒ මවට උසාවියට ඉදිරිපත් වෙලා ඒ දරුවාට සාධාරණයක් ඉටු කර ගැනීමට සිදුවෙලා තිබෙනවා. ඉතින්, මෙවැනි අවස්ථාවක අපි බැලිය යුත්තේ දරුවාගේ උපරිම යහපත - the best interest of the child - පිළිබඳවයි. ඉතින්, පීතෘත්වය ප්‍රතික්ෂේප කරන අවස්ථාවක විද්‍යාත්මක සාක්ෂියක් මඟින් සත්‍ය තහවුරු කිරීම මඟින් මවගේ මෙන්ම දරුවාගේ කීර්ති නාමය සුරක්ෂිත කිරීමට හැකියි.

මේ දසවැනි පාර්ලිමේන්තුවේ මන්ත්‍රීතුමියන්ලා 22ක් ඉන්නවා. ආණ්ඩු පක්ෂයෙන් 20දෙනෙක් ඉන්නවා, විපක්ෂයෙන් දෙදෙනෙක් ඉන්නවා. අපේ ගරු අගමැතිතුමියත් ඒ අතර ඉන්නවා. ඉතින්, අපි සියලුදෙනාම එකට එකතුවෙලා මේ තිබෙන ගැටලුවලට හොඳ විසඳුමක් ලබා දීමට හැකි වුණොත්, ඒක සාර්ථක වැඩ පිළිවෙළක් වේවි. විශේෂයෙන්ම පීතෘත්වය තහවුරු කිරීමේ සාධාරණ සහ කඩිනම් ක්‍රමයක් ලබා දීලා, DNA පරීක්ෂණ සම්බන්ධයෙන් අධිකරණයට පැහැදිලි බලතල ලබා දුන්නොත් අපේ කාන්තාවන්ට, අපේ අනාගත දරුවන්ට සාධාරණයක් ඉටු කිරීමට අපට හැකි වෙයි කියලා මා විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙන්න මේ කාරණයත් මම කියන්න ඕනෑ. 2027 වර්ෂයේ පළමුවැනි ශ්‍රේණියට ඇතුළත් කරන දරුවන්ට අදාළව 2026දී නිකුත් කර තිබෙන චක්‍රලේඛයේ ප්‍රශ්නයක් තිබෙනවා.

විශේෂයෙන්ම මම නියෝජනය කරන මහනුවර දිස්ත්‍රික්කයේ විශාල සංඛ්‍යාවකට මෙම ප්‍රශ්නය බලපානවා. 2026 චක්‍රලේඛනයට අනුව විහාර ඉඩම්වල පදිංචිකරුවන් සඳහා අවුරුදු 30ක බලපත්‍රයක් අනිවාර්ය කරලා තිබෙනවා. ඒ වාගේම ඒ මුදල් ගෙවපු රිසිට් පත්‍රය අනිවාර්ය කරලා තිබෙනවා. 2022 චක්‍රලේඛය අනුව අවශ්‍ය වුණේ අදාළ විහාරාධිපතිගෙන් පදිංචිය තහවුරු කළ ලිපියක් පමණයි ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඉතින් මම හිතනවා ඒක හොඳටම ප්‍රමාණවත් කියලා. ග්‍රාම නිලධාරි සහතිකයක් තිබෙනවා නම් සහ ඡන්ද හිමි නාම ලේඛනයේ ඒ දෙමාපියන්ගේ නම් ඇතුළත් වෙනවා නම් පදිංචිය තහවුරු කිරීමට ඒවා ප්‍රමාණවත්. ගොඩක් අවස්ථාවල බෞද්ධ විහාර දේවාලගම් පනත යටතේ අවුරුදු 29කට අඩු කාලයකට තමයි බදු පත්‍රිකා ලබාදීලා තිබෙන්නේ. මහනුවර දිස්ත්‍රික්කයේ ගොඩක් විහාරවල විහාරාධිපතිවරු කොවිඩ් වසංගත කාලයේ ඒ ගාස්තු අය කළේ නැහැ. එම නිසා ඒ රිසිට් පත් නැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු නීතිඥ චමින්ද්‍රානී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම අපේ ගරු චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාගේ කාලයෙන් මිනිත්තුවක් ලබා ගන්නවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
හොඳයි.

**ගරු නීතිඥ චමින්ද්‍රානී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
අපි යෝජනා කරන්නේ මේ කොන්දේසිය ගැන නැවත හිතලා බලන්න කියලායි. බෞද්ධ කටයුතු කොමසාරිස් ජෙනරාල්තුමා මේ ගැන ඉඩම් අමාත්‍යාංශයට ලිපියක් යවා තිබෙනවා. මහනුවර දිස්ත්‍රික්කයේ විශාල පිරිසක් මේ විහාර ඉඩම් භුක්ති විඳිනවා. සමහර අය අවුරුදු 30ක, 40ක සිට ඒ විහාර ඉඩම්වල සිටින නමුත් අවුරුදු 30කට වැඩි බදු ඔප්පුවක් නැහැ. එවැනි අවස්ථාවලදී ඒ දරුවන්ට අසාධාරණයක් සිදු වෙනවා. මම කලින් කිව්ව ආකාරයට ග්‍රාම නිලධාරි සහතිකය තිබෙනවා නම්, ඡන්ද හිමි නාම ලේඛනයේ දෙමාපියන්ගේ නම් තිබෙනවා නම් ඒවා හොඳටම ප්‍රමාණවත්.

මට අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සමන්මලී ගුණසිංහ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.27]

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම මුලින්ම මේ ගරු සභාවට මතක් කරන්නට කැමැතියි අපට දීලා තිබෙන බලය පිළිබඳව. අපි මන්ත්‍රීවරු විධියට මේ ව්‍යවස්ථාදායකයට - පාර්ලිමේන්තුවට - පත් වෙලා ඉන්නේ ජනතා කැමැත්තෙන්, ජනතා බලයෙන්. ජනතා පරමාධිපත්‍යය තමයි මේ ව්‍යවස්ථාදායකයේ තිබෙන්නේ. ඒ අනුව අපි පළමුව වග කියන්නේ ජනතාවට. මේ ව්‍යවස්ථාදායකයේ බලය අපි එක එක ආයතනවලට ලබා දෙනවා; පවරනවා. අපට ජනතාව දුන්නු බලය තමයි ඒ පවරන්නේ. ඒ ගැන දන්නවා, හැබැයි සමහර අය නොදන්නවා වාගේ ඉන්නවා.

මේ ව්‍යවස්ථාදායකයට - පාර්ලිමේන්තුවට - ආවාට පස්සේ අපට ස්ථාවර නියෝග අදාළ වෙනවා. ජනතාවගේ බලය මේ ව්‍යවස්ථාදායකය තුළ ක්‍රියාත්මක කරන්නේ කොහොමද කියලා පෙන්වන්න ස්ථාවර නියෝග හදලා තිබෙනවා. ඒ ස්ථාවර නියෝගවල යම් යම් කාරණා තිබෙනවා. අපේ කට තිබුණාට, අපේ හඬ තිබුණාට, අපි ඔක්කෝම දන්නවා කියලා හිතුවාට හරියන්නේ නැහැ. මොකද, අපි ජනතාවට ඕනෑ විධියට මේ සභාව තුළ හැසිරෙන්න ඕනෑ, හිතන්න ඕනෑ, කටයුතු කරන්න ඕනෑ.

මන්ත්‍රීවරියන් විධියට අපටත් ලජ්ජයි. අද රෝහිණී විජේරත්න මන්ත්‍රීතුමිය කාටද ඒ නිග්‍රහ කළේ? මේ සභාවේ බලයට අනුව පිහිටුවා ගත්ත අධිකරණයක් තිබෙනවා, විනිසුරු මණ්ඩලයක් ඉන්නවා. එතුමන්ලා පත් කළේ විධායකයෙන් නොවෙයි, එතුමන්ලා පත් කළේ පක්ෂයකින් නොවෙයි. විනිසුරුවරුන් පත් කළේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන්. අගවිනිසුරුතුමා ඇතුළු ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරු පත් කළේ මේ සභාවේ එක්කෙනෙකුගේ දෙන්නෙකුගේ වුවමනාවට නොවෙයි සියලුදෙනාගේම කැමැත්තෙන්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව තීරණය කළා, මෙන්න මේ අය තමයි ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවන්, මෙතුමා තමයි අගවිනිසුරුවරයා කියලා. එහෙම පත් කරලා තිබෙන වටපිටාවක් තුළ පාර්ලිමේන්තු වරප්‍රසාද අවභාවිත කරමින් රෝහිණී විජේරත්න මන්ත්‍රීතුමිය මොකක්ද කියන්නේ? එක එක යූටියුබ් නාළිකාවල ගියා කියලා ඉතාම කනගාටුදායක විධියට අධිකරණය හෑල්ලු කරනවා, අධිකරණයට නිග්‍රහ කරනවා, අධිකරණයට අවමන් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙම පාර්ලිමේන්තු වරප්‍රසාද තුළින් එහෙම කටයුතු කරන්න ඉඩ දීලා නැහැ. ඒකයි ප්‍රශ්නය. මන්ත්‍රීවරයකු වෙන්න පුළුවන්, මන්ත්‍රීවරියක් වෙන්න පුළුවන්. හැබැයි, අපි කාටත් පොදු වූ ස්ථාවර නියෝග තිබෙනවා. 83 (1)ස්ථාවර නියෝගයෙහි සඳහන්ව තිබෙන්නේ මොකක්ද, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි? එම ස්ථාවර නියෝගයෙහි මෙසේ සඳහන් වෙනවා:

> "ජනාධිපතිවරයාගේ හෝ වැඩබලන ජනාධිපතිවරයාගේ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ, විනිශ්චයකාරවරයන්ගේ හෝ යුක්තිය පසිඳලීමෙහි නියුක්ත අන් තැනැත්තන්ගේ පෞද්ගලික පැවැත්ම පූර්ණ යෝජනාවකින් හැර මතු කරනු නොලැබිය යුත්තේය."

ඒකට ක්‍රමවේදයක් තිබෙනවා. හැබැයි, අපට එහෙම අයිතියක් නැහැ. එම නිසා මම මේ ගරු සභාවට කියනවා, අප විසින් පත් කරපු ව්‍යවස්ථාදායක සභාව තුළින් අප විසින් පත් කරපු ඒ අධිකරණයට අපහාස කරපු එක ව්‍යවස්ථානුකූල නැහැ කියලා. ඒ වාගේම ස්ථාවර නියෝගවලට පටහැනියි. එම ප්‍රකාශ වහාම හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කළ යුතුයි. මීට කලිනුත් මේ ගරු සභාවේ දී ගරු නිලන්ති කොට්ටහච්චි මන්ත්‍රීතුමිය නීතිඥවරියක් වශයෙන් ඒ බව ඉතා පැහැදිලිව පෙන්වා දුන්නා. හැබැයි, අදත් ඒ වැරැද්දම කරනවා. ඒ වැරැද්ද කළාට පස්සේ ඒවා social mediaවල ප්‍රචාරය කර ගන්නවා. හරිම කැතයි. හරිම කැතයි. ඒ නිසා අපි මේ ගරු සභාවෙන් ඉල්ලීමක් කරනවා. මෙවැනි විධියට ස්ථාවර නියෝග කඩ කරමින්, තමන්ගේ වරප්‍රසාද අවභාවිත කරමින් මේ අධිකරණයට කරපු අපහාසය පිළිබඳව ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ අදහස අපි දැන ගන්න කැමතියි. මොකක්ද අදහස? විධායක සභාවට, ඔවුන්ව පත් කරපු මේ නීතියට එරෙහිව ගිහිල්ලා කථා කිරීම ගැන, ඒ වෙනුවෙන් ප්‍රකාශයක් නිකුත් කරන්න ඕනෑ නේද? මොකක්ද, මේ සම්බන්ධව දරන අදහස? මොකද, වැරැද්දක් කරලා තිබෙනවාද, එහෙම ඔප්පු වෙලා තිබෙනවාද? එහෙම කිසි දෙයක් නැහැ. වැරැද්දක් කරලාත් නැහැ, ඔප්පු වෙලාත් නැහැ. තමන් විසින්ම පත් කරපු ඒ අධිකරණයට අපහාස කරන්න දෙන්න බැහැ. ඒක වහාම හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කියලා මම මේ ගරු සභාවට යෝජනා කරනවා. ඒ වාගේම ඒක හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කළාට පස්සේ YouTube එකේ යන්නත් බැහැ. ඊට පස්සේ ඒක අල්ලලා කථා කරනවා, මෙන්න මේක අපි කිව්වා කියලා. ඒ නිසා හිනා වෙන්නේ තමන්ට. ජනතාවට මේ හිනා වෙන්නේ. ජනතාවගේ පරිමාධිපත්‍යයට මේ හිනා වෙන්නේ. එහෙම නැත්නම්, අපිටත් ලජ්ජයි. අත්දැකීම් තිබෙනවා කියන මන්ත්‍රීවරියන්ටත් ලජ්ජයි මේ කරන වැඩේට. මේ අපහාස කරන්නේ අධිකරණයට. ඇයි ඒ? ඒකත් මම කියන්න ඕනෑ. එතුමිය හරි බරපතළ ප්‍රකාශයක් කළා. හොරාගේ අම්මාගෙන් පේන අහනවා නොවෙයිලු, හොරාගෙන් නඩු අහන්නලු, වෙලා තිබෙන්නේ. මේක බරපතළ ප්‍රකාශයක්. එතුමියට අනුව හොරා වෙන්න පුළුවන්, එතුමියගේ නායකයෝ එකතු වෙලා පත් කරපු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව තුළ ගත් තීරණ. හැබැයි, මේ ජනතාව හොඳටම බලාගෙන ඉන්නවා. මොකක්ද? පසුගිය කාලයේ හොරු ඔක්කෝම අල්ලා ගෙන අල්ලා ගෙන යනවා. අධිකරණයෙන් තීන්දු දෙනවා. ඒකට බය වෙලා ඉන්නේ. තමන්ගේ පක්ෂයේ ඉන්න අයවත් දැන් එක්කෙනා දෙන්නා අහු වේගෙන යනවා, දඬුවම් දෙනවා. දැන් ඒකට බය වෙලා කෑගහනවා.

[ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය]

ගරු මන්ත්‍රීතුමියනි, මම ඔබතුමියට මේ කාරණය කියන්න කැමැතියි. ඔබතුමිය දන්නේ නැත්නම්, මේවා කියවාගන්න. කනගාටුයි කියන්න, විපක්ෂ නායකතුමා ළඟත් ස්ථාවර නියෝග නැහැ. ඒ පෙට්ටගමේ තිබෙන්නේ අලිමන්තර පොත. ස්ථාවර නියෝග නැහැ. ඒ නිසා පාඨමාලාවක් හරි කරන්න. ටියුෂන් එකක් හරි දෙන්න. මොකක් ගැනද? මේ අධිකරණය පත් කළේ අපි කියන එක කියලා දෙන්න. අපහාස කරන්න එපා. මේ විධියට අපහාස කරන එක අපි හෙළා දකිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද අපි කථා කරන කාරණාව පිළිබඳව මම යම් දෙයක් කිව යුතුයි. අපි පොරොන්දුවක් වුණා, දරුවන්ට සුරක්ෂිත රටක් හදනවා කියලා. ඒ, අපේ ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ තිබුණු ප්‍රධාන වගන්තියක්. අපි මේ හදන සුරක්ෂිත සමාජයේ ආරක්ෂිත පරිසරය හදන්න අපි නීති සම්පාදනය කරන බව ඇත්ත. ඒ වාගේම නීති සම්පාදනය කරන එකට එහා ගිහිල්ලා, අපි දරුවන්ට ආරක්ෂිතව ජීවත් වන්න පුළුවන් පරිසරයක් සහිත රටක් හදන්න ඕනෑ. ඔවුන්ගේ අම්මලා, තාත්තලාට ජීවත් වෙන්න පුළුවන් නිවාසයක් හදන එක, ඒ වාගේම ඔවුන්ට ආරක්ෂිතව යහපත් මානසික තත්ත්වයකින් යුතුව තමන්ගේ අධ්‍යාපනය කරගෙන යන්න පුළුවන් විධියට අදට ගැළපෙන අධ්‍යාපනයක් ලබා දෙන එකත් අපේ රජයේ වගකීමක් කියලා මම හිතනවා.

මේ එක කාරණාවක් විතරයි. අද දවසේ පනතේ වගන්ති තුනකට සංශෝධන එකතු කරනවා. දඩ මුදල සංශෝධනය වෙනවා, රුපියල් 10,000 ඉඳලා රුපියල් 100,000 දක්වා. හැබැයි, මේ දඩ මුදල රුපියල් 10,000 ඉඳලා රුපියල් 100,000 දක්වා සංශෝධනය කරනවා කියන්නේ, ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ පනත යටතේ වැරැදිවලට අදාළව කරන සංශෝධනයක්. හැබැයි අපි දන්නවා, මේ පනත යටතේ තවත් තිබෙනවා සේවයේ යොදවන්න බැරි අවස්ථා 71ක්. ඒ අවස්ථා 71ත් මේකට අන්තර්ගතයි. ඒ වාගේම ඒ කුමන කාරණාවක් තුළවත් දරුවන්ව සේවයේ යොදවන්න බැහැ. වයස අවුරුදු 16 ඉඳලා අවුරුදු 18 දක්වා වුණත් තරුණ දරුවන් සේවයේ යොදවන්න බැහැ. ඒ කාරණා 71ත් මේ දඩ මුදලට අදාළයි.

අපි මේ දරුවන්ගේ ආරක්ෂාව වෙනුවෙන් කළේ මොකක්ද? ගොඩක් කාරණා මේ වෙලාවේදී කථා වුණා. ඒ නිසා මම ඒ කාරණා නැතුව කරුණු කිහිපයක් මතු කරන්නම්. අපි දන්නවා, විදේශගත වෙලා සිටින දෙමවුපියන්ගේ දරුවන්ට day-care පහසුකම් සඳහා අපි මාසයකට රුපියල් 10,000ක් වෙන් කරලා තිබෙන බව. ඒ වාගේම තමයි, අඩු ආදායම්ලාභී ගෙදරක ඉන්න දරුවා අනාරක්ෂිතයි. සමහර ගෙවල් අනාරක්ෂිතයි, සමහර විට ඒ අයට ආරක්ෂිත ගෙයක් නැහැ. එතකොට දරුවන්ට ඕනෑ කරන මානසික හා ආරක්ෂිත පරිසරයක් නැහැ. ඒ වෙනුවෙන් නිවාස ලබා දීමට, ඒ අනාරක්ෂිත ගෙවල් ආරක්ෂිත ගෙවල් බවට පත් කිරීමේ නිවාස වැඩ පිළිවෙළකුත් මේ වෙලාවේ ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම පාසල් යන්න ඕනෑ දරුවෝ අද වන විට පාසල් නොයන අවස්ථා තිබෙනවා. ඒ විධියට පාසල් නොයන්න විවිධ හේතු බලපාන්න පුළුවන්. හැබැයි නීතියක් තිබෙනවා, සෑම දරුවෙක්ම පාසල්ගත කරන්න ඕනෑ කියලා. ඒ සඳහා දෙමවුපියන්ට අයිතියක් තිබෙනවා. ඒ වාගේම තමයි, සවස් වරුවේ සමහර ළමයින්ව විවිධ ජාවාරම්කරුවන් විසින් විවිධ ව්‍යාපාරවලට භාවිත කරනවා. ඒ නිසා දරුවන් පාසල් වේලාවෙන් පසුවත් ආරක්ෂා කර ගන්නා එක අපේ වැඩක්. මොකද, පාසල තුළ විතරක් නොවෙයි දරුවෝ ආරක්ෂිත විය යුත්තේ. පවුල තුළ ආරක්ෂා වෙන්නත් ඕනෑ; සමාජය තුළ ආරක්ෂා වෙන්නත් ඕනෑ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමියනි, කාලය අවසන්.

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)
මට තව විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

එතකොට මේ දඩ මුදලට අමතරව, නීති-රීතිවලට අමතරව අපි සවස් වරුවේ දරුවන් ආරක්ෂා කර ගන්නේ කොහොමද කියන කාරණාව වෙනුවෙන් ගරු ඇමතිතුමියත් එක්ක එකතු වෙලා, අමාත්‍යාංශයක් විධියට වැඩ පිළිවෙළක් යොදලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට තවත් විනාඩි දෙකක කාලයක් ලබා දෙන්න පුළුවන්.

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)
ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

අද වෙද්දී තවත් දරුවෝ විවිධ මත්ද්‍රව්‍යවලට, විවිධ දේවල්වලට ඇබ්බැහි වෙලා සිටින බව අපි දන්නවා. ඒ දරුවන්ව අපි නැවත සමාජගත කරන්න ඕනෑ. ඒ දරුවන් සමාජගත කරන්න නම්, අනිවාර්යයෙන්ම පුනරුත්ථාපන වැඩසටහනකට යන්න ඕනෑ. ඔබතුමියත් දන්නවා, අද වන විට මේගොල්ලෝ වපුරපු මත්ද්‍රව්‍යවල, අපරාධවල, ගොදුරක් බවට දරුවන් පත් වෙලා සිටින බව. හැබැයි, ඒවා කවුරු වැපුරුවත් ඒ අපේ දරුවෝ. ඒ නිසා, එම දරුවන් පුනරුත්ථාපනය කිරීම සඳහා දරුවන්ට ගැළපෙන විධියේ පුනරුත්ථාපන ආයතන ඇති කරන එක තමයි නව රජයේ වැඩ පිළිවෙළ. ඒ අනුව අද වෙද්දී කාන්තාවන් සඳහා වෙනම පුනරුත්ථාපන ආයතනත්, ඒ වාගේම දරුවන් සඳහා දරුවන්ට ගැළපෙන වෙනම පුනරුත්ථාපන ආයතනත් ඇති කරමින් පවතිනවා. ඒ, මේ වෙලා තිබෙන අපරාධවලින් දරුවන් ගලවා ගැනීම සඳහා. අපි දන්නවා, සමහර අය මෙතැනදී නීතිය ගැනත් කථා කරනවා, දරුවෝ ගැනත් කථා කරනවා. හැබැයි, නීතිය ක්‍රියාත්මක කරන්න යද්දී ඒ අයව නයා කනවා. ඒ නිසා අපිට ඕනෑ, ඇත්තටම මේ හැමෝටම සමානව නීතිය ක්‍රියාත්මක කරන්නයි. මොකද, එක ජනාධිපතිවරයෙක් හිතාගෙන හිටියා, එතුමාගේ කකුල් දෙකටත් යටින් තමයි නීතිය තිබෙන්නේ කියලා. රනිල් වික්‍රමසිංහ මහත්මයා එහෙම හිතාගෙන හිටියා. සමහර අය හිතාගෙන හිටියා, රාජපක්ෂලාගේ වලව්වල ගැවෙන්නවත් බැරි විධියට, එහෙම නැත්නම් තමන්ට ඕනෑ විධියට, තමන්ගේ අතේ තමයි නීතිය තිබෙන්නේ කියලා. හැබැයි, අද අපි ඔප්පු කරලා තිබෙනවා, ජනතාවගේ පරමාධිපත්‍ය බලය අද හැමෝටම සාධාරණව ක්‍රියාත්මක වෙනවා කියලා. ඒකට භය වුණු අය කොච්චර කෑගැහුවත්, නීතිය ක්‍රියාත්මක කරන්න තමයි අපට බලය දීලා තිබෙන්නේ. ඒ නිසා ඒකට විරුද්ධව අධිකරණයට කොච්චර අපහාස කළත්, තමන් වැටෙනවා මිසක් වෙනත් දෙයක් වෙන්නේ නැහැ කියලා මම හිතනවා. "මිදි ඇඹුල්" කියලා දැන් නරි ටික වාගේ කෑගහන්න එපා. මොකද, කඩා ගන්න බැරි වුණාම ඔහොම තමයි.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[பி.ப. 2.40]

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று இந்தப் பாராளுமன்றத்தைப் பார்வையிடுவதற்காக வருகைதந்திருக்கின்ற பொத்துவில் மத்திய கல்லூரி ( தேசிய பாடசாலை) மாணவர்கள், ஆசிரியர்கள் மத்தியிலே, அந்தப் பாடசாலை தொடர்பில் பேசக் கிடைத்தமையையிட்டு சந்தோசமடைகின்றேன்.

1950ஆம் ஆண்டு வரை பொத்துவில் பிரதேசத்தில் ஆரம்பக் கல்வியைப் பெற்றுக்கொள்ளக்கூடிய வாய்ப்புகள் மாத்திரமே காணப்பட்டன. இந்நிலையில் சுதந்திர இலங்கையின் முதலாவது கல்வி அமைச்சரான ஈ.ஏ. நுகவெல அவர்கள் ஒவ்வொரு பிரதேச மட்டத்திலும் அரசினர் கனிஷ்ட பாடசாலையை நிறுவும் திட்டத்தை ஆரம்பித்தபோது, அப்போதைய பொத்துவில் தொகுதி பாராளுமன்ற உறுப்பினர் எம்.எம். இப்ராஹிம் அவர்களது முயற்சியின் விளைவாக பொத்துவில் பிரதேசத்துக்கும் கனிஷ்ட பாடசாலையொன்று கிடைக்கப்பெற்றது. அதுவே இன்று 75 வருட நிறைவு பவள விழா காணும் பொத்துவில் மத்திய கல்லூரி ( தேசிய பாடசாலை) ஆகும். ஆரம்பக் கல்வியைப் பூர்த்திசெய்த மாணவர்களுக்கு இடைநிலைக் கல்வியைப் பெறுவதற்கான வாய்ப்பை பொத்துவில் பிராந்தியத்தில் பொத்துவில் மத்திய கல்லூரியே முதன்முதலாக 1951இல் வழங்கியது. கல்லூரியின் பல்வேறு வளர்ச்சிப் படிகளில், 2019ஆம் ஆண்டே இக்கல்லூரி தேசிய பாடசாலையாகத் தரமுயர்த்தப்பட்டது. தற்போது பொத்துவில் பிராந்தியத்தில் காணப்படும் ஒரேயொரு தேசிய பாடசாலை இதுவாகும். பாடவிதானத்திலும் இணைப்பாடவிதானத்திலும் இப்பாடசாலை பல்வேறு சாதனைகளைப் புரிந்து வருகின்றமை பாடசாலையின் அண்மைக் காலச் செயற்பாடுகள் காட்டி நிற்கின்றன.

எது எவ்வாறிருப்பினும், பல்வேறு சவால்களுக்கு மத்தியில் பொத்துவில் மத்திய கல்லூரி ( தேசிய பாடசாலை) செயற்பட்டுக்கொண்டு இருக்கின்றது. நிரந்தர காவலாளி ஒருவர் இல்லாமல் இப்பாடசாலை இயங்கி வருகின்றது. அதேபோன்று, கல்விசாரா உத்தியோகத்தர்களின் பற்றாக்குறையும் அதிகமாகக் காணப்படுகின்றது. விளையாட்டு பயிற்றுவிப்பாளர், சுத்திகரிப்புத் தொழிலாளி போன்றோர் இல்லாமையும் குறிப்பிடத்தக்கது. ஆனால், அண்மித்த சில தேசிய பாடசாலைகளில் தேவைக்கு அதிகமாக கல்விசாரா உத்தியோகத்தர்கள் காணப்படுகின்றார்கள். முதற்கட்டமாக, மேலதிகமாகக் காணப்படும் கல்விசாரா உத்தியோகத்தர்களில் சிலரையாவது பொத்துவில் மத்திய கல்லூரிக்கு இடமாற்றுமாறு கேட்டுக்கொள்கின்றேன். அவற்றைச் சமப்படுத்தி பொத்துவில் மத்திய கல்லூரியின் கல்விசாரா ஆளணிப் பற்றாக்குறையைத் தீர்க்குமாறு இச்சபையில் பணிவன்புடன் கேட்டுக் கொள்கின்றேன். பொத்துவில் பிராந்தியத்தின் முன்னணிப் பாடசாலையான இப்பாடசாலையில் 18 ஆசிரியர்கள் பற்றாக்குறையாக உள்ளனர். எதிர்வரும் காலங்களில் மேற்கொள்ளப்படும் புதிய நியமனங்களின்போது இப்பாடசாலைக்குக் கூடுதல் முன்னுரிமை வழங்கி, மேற்படி ஆசிரியர்களைப் பெற்றுத்தருமாறு அன்புடன் கேட்டுக்கொள்கின்றேன். தற்போது இப்பாடசாலையிலுள்ள ஆசிரியர்களே பற்றாக் குறையாகவுள்ள ஆசிரியர்களுக்குப் பதிலாகவும் கல்விசாரா உத்தியோகத்தர்களுக்குப் பதிலாகவும் கடமையாற்றிக் கொண்டு இருக்கின்றார்கள்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, பொத்துவில் பிரதேசத்தில் சகல வசதிகளுடனும்கூடிய ஆராதனை மண்டபம் ஒன்று இல்லை. சகல பாடசாலைகளும் பயன்படுத்தக்கூடிய வகையில், பொத்துவில் மத்திய கல்லூரியில் புதியதோர் ஒன்றுகூடல் மண்டபத்தை அமைப்பதன்மூலம் பிராந்தியத்தின் சகல மாணவர்களும் இதனைப் பயன்படுத்த முடிவதுடன், இணைப்பாடவிதான செயற்பாடுகளின் வெற்றியையும் மென்மேலும் அதிகரிக்க முடியுமாக இருக்கும். தூரப் பிரதேசங்களில் இருந்து கடமைக்காக அறிக்கையிடும் ஆசிரியர்களின் நலன்கருதி பொத்துவில் மத்திய கல்லூரியில் ஆசிரியர் விடுதி ஒன்றை அமைப்பது காலத்தின் தேவையாகக் காணப்படுகின்றது. நான் பிரதிநிதித்துவம் செய்யும் மண்ணின் முகவரியாகக் காணப்படும் பொத்துவில் மத்திய கல்லூரி - தேசிய பாடசாலையைக் கட்டியெழுப்புவதற்குத் தேவையான மேற்படி மனித வளங்களையும் பௌதிக வளங்களையும் பெற்றுத்தருமாறு கேட்டுக்கொள்கின்றேன்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, 2026ஆம் ஆண்டுக்காக புதிய அரசானது ஒவ்வொரு பாராளுமன்ற உறுப்பினருக்கும் அபிவிருத்தி நடவடிக்கைகளை மேற்கொள்ளவென 10 மில்லியன் ரூபாயை ஒதுக்கியமைக்காக மாண்புமிகு சனாதிபதி அவர்களுக்கு எனது நன்றிகளைத் தெரிவித்துக்கொள்கின்றேன். எனது நிதியை அம்பாறை, திருகோணமலை மாவட்டங்களது அபிவிருத்திக்காகப் பயன்படுத்தியுள்ளேன். குறிப்பாக, கல்வி, கலாசார விடயங்களுக்காக எனது நிதியைப் பயன்படுத்தியுள்ளேன் என்பதை இந்தச் சபையில் குறிப்பிட விரும்புகின்றேன். இது தொடர்பான விபரங்கள் அடங்கிய ஆவணத்தை ஹன்சாட் பதிவுக்காகச் ***சமர்ப்பிக்கின்றேன்.**

கிழக்கு மாகாண கடலில் மீன்பிடியில் ஈடுபடும் மீனவர்களது மீன்களை "கடல் மீன் கொள்ளையர்கள்" கொள்ளையிடுவது கடந்த காலங்களில் அவதானிக்கப் பட்டுள்ளது. பானம முதல் பெரிய நீலாவணை வரையான கடற்பகுதியிலே இச்செயற்பாடு நடைபெறுகின்றது. இந்தக் கடற்கொள்ளையர்கள் அதிகூடிய horsepower உள்ள motorஐப் பயன்படுத்தியே தப்பிச் செல்கின்றார்கள். இவர்களைக் கைதுசெய்ய நடவடிக்கை எடுக்க வேண்டும் என்பதுடன், இவர்களுக்கு எதிராகச் சட்டம் தன் கடமையைச் செய்யவும் வேண்டும். இவ்வாறு செய்வதன்மூலம் மட்டுமே பாரிய அளவில் மீன்பிடியில் ஈடுபடும் பானம, பொத்துவில், கோமாரி, சாய்ந்தமருது, கல்முனை, பெரிய நீலாவணை மீன்பிடியாளர்களைப் பாதுகாக்க முடியுமென நம்புகின்றேன்.

பொத்துவில் பிரதேச நீர்ப்பாசனக் காரியாலயத்துக்கு உட்பட்ட பாய்ச்சலாற்று வெள்ளத்தடுப்பு அணைக்கட்டானது மிக விரைவாகச் செப்பனிடப்பட வேண்டும். இதற்கு சுமார் 100 மில்லியன் ரூபாய் தேவையாக உள்ளது. இதனை ஆரம்பம்

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා]

செய்ய சுமார் 50 மில்லியன் ரூபாய் அவசியமாகவுள்ளது. எனவே, நீர்ப்பாசனத்துக்குப் பொறுப்பான அமைச்சர் அவர்கள் இதனை விரைவில் செயற்படுத்த ஆவனபுரிய வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். மேலும், மாகாண பொத்துவில் நீர்ப்பாசனக் காரியாலயத்தின் கீழுள்ள நாவுள்ள, செம்மணி ஆகிய இரண்டு குளங்களையும் புனரமைக்கவேண்டிய அவசியம் இருக்கின்றது. இந்தக் குளங்களைப் புனரமைப்புச் செய்வதன்மூலம் பல நூற்றுக்கணக்கான ஏக்கரில் விவசாயம் செய்து, அதன் பிரயோசனத்தை அப்பகுதி விவசாயிகள் அடைவார்களென நான் நம்புகின்றேன்.

சம்மாந்துறை கல்வி வலயத்துக்கு உட்பட்ட ஹிஜ்ரா முஸ்லிம் வித்தியாலயத்திலுள்ள பல்வேறுபட்ட அடிப்படைத் தேவைகளை நிவர்த்திக்கவேண்டிய அவசியம் இருக்கின்றது. கட்டிடங்கள், மலசலகூடம், சுற்றுமதில்கள் உள்ளிட்ட பல அடிப்படைத் தேவைகளைப் பூரணப்படுத்த மாகாணக் கல்வி அமைச்சு விரைவில் நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டும். பல்வேறு தேவைகளுக்கு மத்தியில் சிறந்த கல்வி வசதிகளை வழங்கி வரும் அதிபர் M.S. Muzammil உட்பட அனைத்து ஆசிரியர்களுக்கும் என்னுடைய நன்றிகளைத் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

S.F. Safna, A.M. Haroon, M.M. Izthikath, A.M. Safeek, Buhardeen, M.A. Siyan Suba, M. Razak, Z.A.M. Imthiyaz, L. Nawaz, M.I.M. Manzoor, A. Jeyeraj, Badurdeen, A.B. Meera Mohideen, மாவட்ட செயலாளர் - A. Samaldeen, ஆகியோருக்கு இந்தச் சபையில் எனது பிரதேச மக்கள் சார்பாக நன்றி கூறக் கடமைப்பட்டு இருக்கின்றேன்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, அண்மையில் நாடளாவிய ரீதியில் சுகாதார உதவியாளர்கள் நியமிக்கப்பட்டுள்ளனர். இவ்வாறு எமது பிரதேசத்துக்கு 23 பேர் உட்பட மொத்தம் 219 பேர் எமது மாவட்டத்துக்கு நியமிக்கப்பட்டுள்ளனர். அதற்காக கௌரவ சுகாதார அமைச்சருக்கு என்னுடைய மனமார்ந்த நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன். இந்த நியமனத்தின்போது, கல்முனை வடக்கு ஆதார வைத்தியசாலைக்கு நியமிக்கப்பட்ட 9 முஸ்லிம் பெண் சுகாதார உதவியாளர்களும் தற்காலிகமாக இடமாற்றம் செய்யப்பட்டு இருப்பதை ஏற்றுக்கொள்ள முடியாத ஒரு விடயமாகவே நாங்கள் பார்க்கின்றோம். எங்களுடைய கலாசாரத்தைமீறி உத்தியோகங்களுக்குச் செல்வதை எமது பெண் பிள்ளைகள் மறுத்துவருகின்றார்கள். இருந்தபொழுதிலும், இந்த ஆண்டு அவர்கள் இந்த நியமனத்துக்குள் உள்வாங்கப்பட்டு இருக்கின்றார்கள். அவ்வாறாக இருந்தால், 2019ஆம் ஆண்டு வெளியிடப்பட்ட அரசாங்க சுற்றுநிருபத்தின் பிரகாரம் ஆடைகளை அணிந்து கடமைக்குச் செல்வதற்குரிய வசதிகள் ஏற்படுத்தித் தரப்பட வேண்டும். கௌரவ சுகாதார அமைச்சர் அவர்கள் அந்த சுற்றுநிருபத்தை 2002ஆம் ஆண்டில் -

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
මට තව පොඩි වේලාවක් දෙන්න.

2019ஆம் ஆண்டு வெளியிடப்பட்ட சுற்றுநிருபத்தின் பிரகாரம் தத்தமது சமயம் சார்ந்த ஆடைகளை அணிந்து கடமைக்குச் செல்லலாம். 2022ஆம் ஆண்டு கோட்டாபய அரசாங்க காலத்தில் இந்தச் சுற்றுநிருபம் இரத்துச் செய்யப்பட்டு புதிய சுற்றுநிருபம் வெளியிடப்பட்டதால்தான் இந்த நிலைமை ஏற்பட்டு இருக்கின்றது. கௌரவ சுகாதார அமைச்சர் அவர்கள் இந்த நிலையை நன்கு அவதானித்து, சீருடையுடன் எமது சமயம் சார்ந்த உடைகளை அணிந்து கடமைக்குச் செல்வதற்கு ஆவனபுரிய வேண்டும் என்பதோடு, புதிய சுற்றுநிருபத்தை வெளியிடவும் நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டு விடை பெறுகின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ගීතා හේරත් මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.46]

**ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) கீதா ஹேரத்)
(The Hon. (Mrs.) Geetha Herath, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ළමා ශ්‍රමය තුරන් කිරීම සම්බන්ධයෙන් අපේ ආණ්ඩුව ක්‍රියාත්මක වන මොහොතක ඊට අදාළ වැදගත් සංශෝධනයක් තමයි මේ පාර්ලිමේන්තුවේ අද දවසේදී විවාදයට ගනු ලබන්නේ. එවැනි අවස්ථාවක ඒක යට ගහලා විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා සභාවේ කෑ මොර දෙන තත්ත්වයක් අපට දක්නට ලැබුණා. කලින් කථා කරපු අපේ ආණ්ඩු පක්ෂ මන්ත්‍රීතුමන්ලා ඒ සම්බන්ධයෙනුත් කරුණු තහවුරු කළා.

ඇත්තටම අද දවස තුළ අපි වැඩිපුර කථා කරන්න ඕනෑ, දරුවන් සම්බන්ධයෙන්, එහෙම නැත්නම් ළමා ශ්‍රමය තුරන් කිරීම වෙනුවෙන් මෙතැනින් එහාට කළ හැකි සංශෝධන තිබෙනවා නම් ඒ ගැනයි. කොහොම නමුත් දරුවන්ට උපරිම යහපත සැලසිය යුතුයි, එහෙම නැත්නම් දරුවන්ට හොඳම දේ ලබා දිය යුතුයි කියන තැන විවාදයකින් තොරව අපි ඉන්නවා. හැබැයි, අපි ඒ සංකල්පයේ කොච්චර හිටියත් විවිධ අවස්ථාවලදී දරුවන් සම්බන්ධයෙන් අසංවේදීව කටයුතු කරන අවස්ථා අපි ඕනෑ තරම් දැක තිබෙනවා. එම නිසා දරුවන්ගේ ආරක්ෂාව වෙනුවෙන් මීට වඩා කටයුතු කරන්නට අවශ්‍ය වන මොහොතක ආණ්ඩුවක් විධියට අපි දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා වැදගත් තීන්දු තීරණ රැසක් අරගෙන ඒවා ක්‍රියාත්මක කරමින් තිබෙනවා කියන කාරණය මම මේ සභාවට මතක් කරන්න කැමැතියි. විශේෂයෙන්ම ළමා ශ්‍රමය සම්පූර්ණයෙන්ම තුරන් කළ යුතුයි කියන තැන අපි ඉන්නවා. මේ සංශෝධනයත් ඒ වෙනුවෙන් කළ හැකි වැදගත් සංශෝධනයක්.

දරුවන් ගැන විතරක් නොවෙයි, කාන්තාවන් සම්බන්ධයෙන් ගත්තත්, නිවසේදී වෙන්න පුළුවන්, මහතොටේදී වෙන්න පුළුවන්, එහෙම නැත්නම් රැකියා ස්ථානයේදී වෙන්න පුළුවන්, කාන්තාවන්ගේ ආරක්ෂාව මීට වඩා තහවුරු විය යුතුයි කියන තැන ඉඳිමින් අපි කටයුතු කරනවා. අපට ඒ සම්බන්ධයෙන් විශාල වගකීමක් තිබෙනවා. මොකද තිබෙන තත්ත්වයන්, එහෙම නැත්නම් සමාජ පරිවර්තනයක් එක්ක ඉස්සරහට යන්න තමයි අපට මේ ජන වරම ලැබී තිබෙන්නේ.

විශේෂයෙන්ම 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයේ යෙදවීමේ පනතට අදාළව සිද්ධ වන වැරදිවලට ලබා දෙන දඬුවම්, එහෙම නැත්නම් ඒ දඩ මුදල් සංශෝධනය

කිරීමක් තමයි අද දවසේදී කථා කරන මේ පනත් කෙටුම්පතින් සිද්ධ වන්නේ. ඒ අනුව විශේෂයෙන්ම මෙතැන කථා කරන්නේ ළමයින් සේවයේ යෙදවීම සම්බන්ධවයි.

1956 මුල් පනත ගත්තොත්, එහි වයස අවුරුදු 16ට අඩු ළමයි සේවයේ යෙදවීම සම්පූර්ණයෙන්ම තහනම් කර තිබෙනවා. එතැනින් එහාට ගිහින්, වයස අවුරුදු 16 සහ අවුරුදු 18 අතර දරුවන් ගත්තොත්, ඒ දරුවන් සේවයේ යොදා ගැනීමේදී සේවා යෝජකයින් විසින් අනුගමනය කළ යුතු නීති සහ රෙගුලාසි නියම කර තිබෙනවා. අවුරුදු 16 සහ අවුරුදු 18 වයස් සීමාවේ සිටින දරුවන් ගත්තාම, ඒ දරුවන්ගේ සෞඛ්‍ය තත්ත්වය, ආරක්ෂාව සහ ඔවුන්ගේ සදාචාරයට හානි නොවන ආකාරයට ඔවුන් සේවාවල යොදාගන්න පුළුවන්. ඒ වාගේම ඒ දරුවන්ගේ සෞඛ්‍ය, ආරක්ෂාව, සදාචාරයට හානි වන ආකාරයේ රැකියා අන්තරාදායක රැකියා විධියට වර්ග කරලා ඒ සම්බන්ධයෙනුත් දඬුවම් ලබා දෙන ආකාරය පනතේ දක්වා තිබෙනවා. විශේෂයෙන්ම අන්තරායකාරී රැකියා 51ක් 2006 අංක 24 දරන ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයේ යෙදවීමේ (සංශෝධන) පනතෙන් 2010 වර්ෂයේ සිට හඳුන්වා දී තිබෙනවා. ඊට පසුව නැවත 2021 වර්ෂය වනකොට අන්තරායකාරී රැකියා 71ක් දක්වා එය පුළුල් කර තිබෙනවා.

කාල වේලාව මදි නිසා මම ඒවා එකින් එක ගැන පැහැදිලි කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මේ ගෙනෙන සංශෝධනයෙන් 1956 අංක 47 දරන පනතේ 7 (3)වන උපවගන්තිය, 13 (2)වන උපවගන්තිය සහ 20(අ)(3)වන උපවගන්තිය තමයි සංශෝධනය වෙන්නේ. එතැනදී රුපියල් දහදාහක්ව තිබුණු දඩ මුදල රුපියල් ලක්ෂය දක්වා වැඩි කරලා තිබෙනවා. ඊට අමතරව තිබෙන අනෙකුත් දණ්ඩනයන් ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක වෙනවා. ඒ අනෙකුත් දණ්ඩනයන් වෙන්නේ දඩ මුදල, එහෙම නැත්නම් මාස 12ක් නොඉක්මවන කාලයකට දෙයාකාරයකින් එක් ආකාරයක සිර දඬුවමක් හෝ එහෙමත් නැත්නම් දඩය සහ සිර දඬුවම කියන දෙකම, එහෙමත් නැත්නම් අධිකරණයේ අභිමතය පරිදි වින්දිතයාට ගෙවනු ලබන වන්දි මුදලයි. ඒ තත්ත්වයන් ඒ ආකාරයෙන්ම තිබෙනවා.

රුපියල් දහදාහ කියන දඩ මුදල පමණක් රුපියල් ලක්ෂය දක්වා වැඩි කරන්න තමයි මේ සංශෝධනය ගෙන එන්නේ. විශේෂයෙන් මේ දඩ මුදල සම්බන්ධයෙන් මම කියන්න ඕනෑ. 2003 අවුරුද්දේ තමයි මේක සංශෝධනය වෙලා තිබෙන්නේ. වසර 22ක පමණ කාලයක් ඒ සඳහා ගත වෙලා තිබෙනවා. ඒ ගත වෙච්ච කාල සීමාව ගත්තාම අදාළ වරදට සාපේක්ෂව අය කරන මේ දඩ මුදල සුළු මුදලක්. ඒ මුදල ප්‍රමාණවත් වෙන්නේ නැහැ.

අනෙක් කාරණය මේකයි. මේ වැරැදිවලට යටත් වන සේවා යෝජකයන් ගත්තාම ඔවුන්ට මේක නොසලකා හැරිය හැකි තරම් කුඩා මුදලක්. ඒක නිසා ඒ පිළිබඳව සැලකිල්ලට අරගෙන තමයි දඩ මුදල මෙහෙම වැඩි කරලා තිබෙන්නේ.

ජාත්‍යන්තර කම්කරු සංවිධානයට අනුව ළමා කාලයේ ඔවුන්ගේ හැකියාවන් සහ අභිමානය අහිමි වන ආකාරයට ඔවුන් යම් කටයුත්තක යොදවා ගන්නවා නම් ඒක ළමා ශ්‍රමයක් විධියට දක්වා තිබෙනවා. විශේෂයෙන්ම අපි මේ වනකොට ඒ ළමා ශ්‍රමය ලබා ගැනීම තුරන් කරන තැනට කටයුතු කරමින් ඉන්නවා. විශේෂයෙන් කම්කරු දෙපාර්තමේන්තුව ගත්තාම, එම දෙපාර්තමේන්තුව විසින් රජයේ නිලධාරින්, මහජනතාව දැනුවත් කිරීම වාගේම ඊට අදාළව වැටලීම් සිදු කරනවා. ඒ වාගේ ක්‍රියාමාර්ග මේ වනකොට අනුගමනය කරනවා. විශේෂයෙන් අපි හොයා බලන්න ඕනෑ, දරුවන් මේ විධියට ළමා ශ්‍රමයට යොමු වෙන්නේ ඇයි කියන එක සම්බන්ධයෙන්. ඒකට ප්‍රධානම හේතුවක් විධියට අපි දරිද්‍රතාව හඳුනාගෙන තිබෙනවා.

අපේ ආණ්ඩුව බලයට එද්දී අපි කිව්වේ, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියලා. එහෙම නම් අපේ ආණ්ඩුවේ සමස්ත වැඩ පිළිවෙළ තුළම දරිද්‍රතාව තුරන් කිරීම වෙනුවෙන් අපි කටයුතු කරමින් ඉන්නවා. එතැනින් එහාට ගිහිල්ලා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අපි ගෙනැල්ලා තිබෙනවා. විශේෂයෙන් අපේ ආණ්ඩුව නිතර කියන දෙයක් තමයි, දරුවෙකුට හොඳ අධ්‍යාපනයක් ලැබෙනවා නම් ඒ තුළින්ම ඒ පවුල දරිද්‍රතාවෙන් ගොඩ යන්න පුළුවන් කියන එක. ඒක නිසා අපි අද මේ ගෙනෙන සංශෝධනය අපේ ආණ්ඩුවේ දරිද්‍රතාව තුරන් කිරීමේ වැඩ පිළිවෙළේ එක් ක්‍රියාමාර්ගයක් විතරයි. එතැනින් එහාට ගිය සමස්ත ක්‍රියාවලිය තුළ දරිද්‍රතාව පිටුදැකීම වෙනුවෙන් අපි සැලකිය යුතු කාර්යභාරයක් ආණ්ඩුවක් විධියට ඉටු කරමින් ඉන්නවා.

විශේෂයෙන් තව කාරණයක් මම කියන්න ඕනෑ. විනිසුරුතුමන්ලාගේ විශ්‍රාම යාමේ වයස දීර්ඝ කිරීම සම්බන්ධයෙන් අද මේ සභාවේ කැ මොර දුන්නා. නීතිඥවරියක් විධියට මම මේ කාරණය කියන්න ඕනෑ. මමත් නීතිඥ සංගමයේ සාමාජිකාවක්. නීතිඥ සංගමය මේකට විරුද්ධ වුණත් සමස්ත නීතිඥවරුන් මේකට විරුද්ධ නැහැ. නීතිඥ සංගමයේ සභාපතිවරයා මේකට විරුද්ධ වෙලා මේ අදහස් දැක්වූවාට එතැනින් එළියේ ඉන්න බහුතරයක් නීතිඥවරු මේ සංශෝධනයට එකඟයි කියන කාරණය මතක් කරමින්, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නීතිඥ නිලූෂා ලක්මාලි ගමගේ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.55]

**ගරු නීතිඥ නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலூஷா லக்மாலி கமகே)
(The Hon. (Mrs.) Nilusha Lakmali Gamage, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අදහස් දක්වන්න මටත් අවස්ථාව ලැබීම පිළිබඳව සතුටු වෙනවා. 1956 අංක 47 දරන පනත තුළින් වයස අවුරුදු 16ට අඩු දරුවන් සම්පූර්ණයෙන්ම මෙහෙකාර සේවයේ යෙදවීම, ශ්‍රමය යොදා ගැනීම තහනම් කිරීමක් සිදු කරලා තිබෙනවා. ඒ වාගේම අවුරුදු 16-18 අතර වයසේ සිටින අය සේවයේ යෙදවීමේදී සේවා යෝජකයා අනුගමනය කළ යුතු නීති හා රෙගුලාසිත් ඒ පනතේ දක්වා තිබෙනවා.

ඒ වාගේම, පනතට අනුව අදාළ වයස් සීමාවේ ළමයින්ගේ හා තරුණයන්ගේ සෞඛ්‍යයට, ආරක්ෂාවට හා සදාචාරයට හානි වන ආකාරයේ අනතුරුදායක රැකියාවක යෙදවීම දඬුවම් ලැබිය හැකි වරදක් බවට දක්වා තිබෙනවා. 2006 අංක 24 දරන ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයෙහි යෙදවීමේ (සංශෝධන) පනතින් ලද බලතල අනුව 2021.11.18 දින නිකුත් කළ අංක 2254/35 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් අන්තරායකාරී රැකියා 71ක් හඳුන්වා දී තිබෙනවා, දරුවන් සේවයේ යෙදවිය නොහැකි බවට.

ඒ වාගේම 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ පනතේ 7(3) උපවගන්තිය, 13 (2) උපවගන්තිය සහ 20 (අ) (3) උපවගන්තිය යන වගන්ති කඩ කරන අවස්ථාවල රුපියල් දහදාහ නොඉක්මවන දඩ මුදලක් හෝ එහෙම නැත්නම් මාස 12ක් නොඉක්මවන කාලයකට

[ගරු නීතිඥ නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය]

දෙයාකාරයෙන් එක් ආකාරයක සිර දඬුවමක්, එහෙම නැත්නම් දඩය හා සිර දඬුවම් යන දඬුවම් දෙකම හෝ එහෙම නැත්නම් අධිකරණයේ අභිමතය පරිදි වින්දිත දරුවා වෙනුවෙන් වන්දි මුදලක් නියම කිරීම ආදිය තමයි දැනට වරදකරුවන්ට ලබා දෙන දඬුවම් වෙන්නේ. අද දින මෙම සංශෝධන පනත් කෙටුම්පත මඟින් එම රුපියල් දහදාහක දඩ මුදල රුපියල් ලක්ෂය දක්වා වැඩි කිරීමක් සිද්ධ වෙනවා. ඇත්තටම මෙය ඉතාම කාලෝචිතයි. මොකද, භාණ්ඩ හා සේවා සඳහා GSP Plus සහන ලබා ගැනීම වාගේම බටහිර යුරෝපා වෙළෙඳ පොළට අවතීර්ණ වීමේදී එකී නිෂ්පාදන සඳහා ළමා ශ්‍රමය යොදා නොගත් බව සහ නූතන වහල් ශ්‍රමයෙන් තොර බව සහතික කළ යුතු වෙනවා. ඒ අනුව මෙම යෝජිත සංශෝධන ධනාත්මක පසුබිමක් සකසනවා, විදේශ වෙළෙඳ පොළට අවතීර්ණ වීම සඳහා.

මේ වෙලාවේදී මම මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. ළමුන් ආරක්ෂා කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා පොලීසියේ ළමා හා කාන්තා කාර්යාංශය මඟින් වැඩි වැඩ කොටසක් කරනවා. ඒ වාගේම ළමුන් රැකියාවල යෙදවීම සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුවත් අවශ්‍ය නීති කටයුතු පිළිබඳව සොයා බැලීම් සිදු කරනවා. ඒ වාගේම තමයි, "1929 ශ්‍රී ලංකා ළමා උපකාරක සේවය" පැය 24 පුරාම ක්‍රියාත්මක වන උපකාර පැතිය හැකි දුරකථන සේවා ක්‍රමයක් බව මේ වෙලාවේදී විශේෂයෙන්ම මම මතක් කරන්න ඕනෑ.

පාසල් යන වයසේ දරුවන්ගේ වයස් සීමාව අවුරුදු 16 දක්වා වැඩි කිරීම තුළින් දරුවන් මෙහෙකාර සේවය සඳහා යොදා ගැනීම අවම වන බවත් කියන්න ඕනෑ. පාසල් නොයන ළමුන් පාසල්ගත කිරීම සඳහා සහ ඒ පිළිබඳව පසු විපරම් කිරීම සඳහා අපේ ග්‍රාම නිලධාරිතුමන්ලා, ග්‍රාම නිලධාරිතුමියන්ලාගේ සිට සියලු ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ළමයි පිළිබඳව කටයුතු කරන සියලු නිලධාරින්ගේ මැදිහත්වීම තුළින් වාගේම අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන නිලධාරින්ගේ මැදිහත්වීම තුළින් ඒ කටයුතු දැනට නිවැරදි ආකාරයෙන්ම සිදු වෙමින් පවතිනවා.

ඒ වාගේම තමයි, අඩු ආදායම්ලාභී පවුල්වල ආබාධ සහිත සිසුන් නිසියාකාරව පාසල් යැවීම සඳහා ඔවුන්ට මාසිකව රුපියල් 5,000ක දීමනාවක් ලබා දෙනවා. ඒ වාගේම, දහතුන් වසරක සහතික කළ අධ්‍යාපන වැඩසටහන යටතේ වෘත්තීය විෂය ධාරාවට අදාළව ප්‍රායෝගික පුහුණුව ලබන දරුවෙකුට මසකට රුපියල් 6,000ක දීමනාවක් ලබා දෙනවා. එමෙන්ම රාජ්‍ය හෝ පෞද්ගලික විශ්වවිද්‍යාලයක ඉගෙන ගන්නා දරුවෙකුට අධ්‍යාපනය සඳහා පොලී රහිත ණය ලබා ගැනීමේ හැකියාව තිබෙනවා. මේකේ වැදගත්ම කරුණ තමයි, ණය ගෙවීම සඳහා උපාධිය අවසන් වී වසරක සහන කාලයක් හිමි වීම. මේ ආකාරයට සමෘද්ධි දෙපාර්තමේන්තුව මඟිනුත් අඩු ආදායම්ලාභී "සමෘද්ධි" හෝ "අස්වැසුම" ප්‍රතිලාභී පවුල්වල දරුවන් වෙනුවෙන් NVQ Level 3 and 4 පූර්ණ කාලීන පාඨමාලා සඳහා රුපියල් 150,000 දක්වා ආධාර ලබා දෙනවා. ඒ වාගේම තමයි, අපි රජයක් විධියට හැම වෙලාවේදීම වෘත්තිකයන් බිහි කරමින් මානව සම්පත ශක්තිමත් කරන්න තමයි කටයුතු කරමින් ඉන්නේ.

මේ වෙලාවේදී මම මතක් කරන්න ඕනෑ, මේ තරම් කාලයක් අවධානයට ලක් නොවූ පෙර පාසල් විධිමත් ආකාරයට නියාමනය කිරීම සඳහා දැනට වැඩ පිළිවෙළ සකස් වෙමින් පවතින බව සහ එම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙමින් පවතින බව. මම රත්නපුර දිස්ත්‍රික්කය තමයි නියෝජනය කරන්නේ. අපි රත්නපුර දිස්ත්‍රික්කයේ ආදර්ශ පෙර පාසල් 5ක් හදලා දෙනවා, පෙර පාසල් දරුවන්ගේ අධ්‍යාපනය සඳහා.

ඒ වාගේම කාන්තාවන්ට තමන්ගේ දරුවන් භය නැතිව නිසියාකාරව දිවා සුරැකුම් මධ්‍යස්ථානවල රඳවා තබා සේවයට යාම තහවුරු කිරීම සඳහා ආදර්ශ දිවා සුරැකුම් මධ්‍යස්ථානයකුත් ලබා දෙනවා.

මේ වෙලාවේ අපි විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, පවුලක තිබෙන දරිද්‍රතාව අවම කරන්න තමයි, අපේ ආණ්ඩුව බලයට පත් වෙච්ච වහාම රාජ්‍ය අංශයේ වැටුප් වැඩි කළේ, වතු කම්කරුවන්ගේ වැටුප් වැඩි කළේ, පෞද්ගලික අංශයේ වැටුප් වැඩි කළේ කියන එක. මේ ආකාරයට වැටුප් වැඩි කරලා, දරුවන් අධ්‍යාපනයට යොමු කිරීමේ හැකියාව දෙමව්පියන්ට ලබා දුන්නා. ඒ වාගේම කුඩා තේ වතු හිමියන් සහ පවුල් බලගැන්වීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය එක්ව තේ ගම්මාන 500ක වැඩසටහනක් ක්‍රියාත්මක කරනවා. ඒ වාගේම ප්‍රජා සංවර්ධන සභා මඟින් ජනතාවගේ දිළිඳුකම තුරන් කිරීම සඳහා අවශ්‍ය ව්‍යාපෘති සකස් කරමින් පවතිනවා. මේ සියලු දෙයක්ම කරන්නේ ජනතාව අතර තිබෙන දිළිඳුකම තුරන් කරලා දරුවන්ට සහ ජනතාවට පොහොසත් රටක ලස්සන ජීවිතය ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහායි. විපක්ෂය මේ කිසි දෙයක් දන්නේ නැහැ වාගේ ඉන්නවා. අපි ඔවුන්ට යෝජනා කරන්න කැමැතියි, ඔය බලන පව නාළිකා අත හැරලා සත්‍ය පවසන නාළිකා බලන්න, එතකොට ඔබ ඒ පිළිබඳව දැනුවත් වෙයි කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ වෙලාවේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව අදහසක් නොදැක්වුවොත් ඒක අඩුවක් කියලා දැනෙනවා. මොකද, මමත් වෘත්තියෙන් නීතිඥවරියක්. සමහරු කටයුතු කරන ආකාරය බැලුවාම මම කියන්න කැමැතියි, හැංගි හැංගි වෙස් බැන්දාට නටන්න වෙන්නේ එළිපිටයි කියන එක. දැන් සමහරු අග්‍ර විනිශ්චයකාරතුමාට විරුද්ධව තමන්ගේ අදහස ප්‍රකාශ කරලා, මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ප්‍රතික්ෂේප කරන බව ප්‍රකාශ කරනවා. ඇත්තටම අපට පෞද්ගලික අභිමතාර්ථ නැහැ. ජනතාව වෙනුවෙන් සේවය කිරීම තමයි අපේ අභිමතාර්ථය. ඒ නිසා මේ වෙලාවේ මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සිදු කිරීමෙන් ගොඩ ගැසී තිබෙන නඩු ප්‍රමාණය අවම කරලා අධිකරණ පද්ධතිය තුළින් ජනතාවට ඉක්මනින්ම සහන ලබා දීමට හැකියාව ලැබෙනවා. මම හිතන්නේ, ඒක ජනතාව වෙනුවෙන් සිදු කරන හොඳ සංශෝධනයක් වනවා කියලායි. මෙතැනදී සමහර වෙලාවට අදහස් ඉදිරිපත් වෙනවා, මේ සංශෝධනයෙන් ජනතාවට යම් අපහසුතාවක් වෙයි කියලා. ඇත්තටම කියන්න ඕනෑ, මේ සංශෝධනය විය යුතුම සංශෝධනයක් බව. ඒ නිසා මේකට විරුද්ධ වෙන්නේ ජනතාව නොව විපක්ෂයයි කියන එක මතක් කරමින්, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.03]

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, වයස අවුරුදු 16ට අඩු දරුවන්ගෙන් සේවය ලබා ගැනීමට අදාළව වන වැරදි සම්බන්ධයෙන් වූ දඩ මුදල් වැඩි කිරීම පිළිබඳ අපේ විරෝධතාවක්

නැහැ. එය විය යුතු කාරණයක්. ඒ වාගේම මේ වනකොට එවැනි පැමිණිලි කීයක් රජයේ ආයතනවලට ලැබිලා තිබෙනවාද කියන කාරණය සහ ඒ ලැබුණු පැමිණිලිවලට ඒ අදාළ ආයතන සහ ආණ්ඩුව විධියට ඔබ ගත්ත ක්‍රියාමාර්ග පිළිබඳවත් අපි දැන ගන්න කැමැතියි.

හැමෝම කථා කරන්නේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන නේ. මේ දවස්වල පාර්ලිමේන්තුවේත්, එළියේදීත් ආණ්ඩු පක්ෂයේ අය තමන්ගේ කාලය, සියලු දේ වැය කරලා විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ආරක්ෂා කරන්න කටයුතු කරනවා. අපිත් ඒ කාලයේ ඔහොම කළා, සමහර ඒවාට. හැබැයි, පසු කාලීනව තමයි ඒවායේ යථාර්ථය අපට තේරෙන්න පටන් ගත්තේ. අඩු ගාණේ අපෙන්වත් පාඩම් ඉගෙන ගන්නේ නැතිව ඔබ තමුන්නාන්සේලා ගන්නා ක්‍රියාමාර්ගය පිළිබඳව ඔබ ඉදිරියේදී තේරුම් ගනියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, වයස අවුරුදු 16ට අඩු දරුවන් රැකියා කිරීම තියා වයස අවුරුදු 18ට වැඩි ළමයින්ටවත් රස්සා නැති තත්ත්වයක් අද උදා වෙලා තිබෙන්නේ. එන්න එන්න කර්මාන්තශාලා වැහෙනවා. ගොවි ජනතාව අසරණ වෙලා, වී විකුණා ගන්නා විධියක් නැහැ. ධීවරයාගේ අස්වැන්න විකුණා ගන්න විධියක් නැහැ. අනෙක් පැත්තෙන්, විරැකියා ප්‍රතිශතය දිනෙන් දින වැඩි වෙනවා. ඉස්පිරිතාලවල බෙහෙත් නැහැ. පිළිකා රෝගීන්ගේ ප්‍රතිශක්තිකරණය වැඩි කරන්න අවශ්‍ය බෙහෙත්වල දැඩි හිඟයක් තිබෙනවා, රජයේ සහ පෞද්ගලික රෝහල්වල. ඒවා පිළිබඳ ආණ්ඩුවේ මතය සහ ඒවාට ආණ්ඩුවේ මැදිහත්වීම ඉතාම සුළුයි. හැබැයි, ගරු විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම වයස දීර්ඝ කිරීම සඳහා ආණ්ඩුව සියලු පාර්ශ්වයන්ට විරුද්ධව ගිහිල්ලා හරි කටයුතු කරනවා.

මේ රටේ ජනතාව බලාපොරොත්තු වුණේ ඔබ තමුන්නාන්සේලා මේ system එකේ සියලුදෙනාට විරුද්ධව ගිහිල්ලා රැකියා ප්‍රශ්නයට විසඳුමක් දෙයි, උපාධිධාරීන්ට රස්සා දෙයි, ආයෝජකයන් ගෙනෙයි, කර්මාන්ත ආරම්භ කරයි කියලායි. එහෙම නැතිව, කර්මාන්ත වසා දමයි කියලා නොවෙයි. හැබැයි, ඔබතුමන්ලා කර්මාන්ත වහනවා. කර්මාන්තශාලා අලුතින් ඉදි කරයි, රාජ්‍ය සේවයේ තිබෙන අපහසුතා පිළිබඳව තේරුම් අරගෙන ඒවාට උත්තර දෙයි, වැඩ කරන රාජ්‍ය සේවකයා ආරක්ෂා කරයි, ග්‍රාම නිලධාරි මහත්වරුන්ගේ ප්‍රශ්න විසඳයි කියලායි ජනතාව බලාපොරොත්තු වුණේ. හැබැයි, අද තමුන්නාන්සේලා මොකක්ද කරන්නේ? ඒ සියලු ප්‍රශ්න පැත්තක තියලා ඔබේ අවශ්‍යතාව මත, ඔබේ ගැලවීම සඳහා, ඔබ තමුන්නාන්සේලාගේ ආරක්ෂාව සඳහා ගරු විනිශ්චයකාරවරුන් විශ්‍රාම යැමේ කාලසීමාව දීර්ඝ කරනවා. මම දැක්කා, සමහර මන්ත්‍රීවරු, ඇමතිවරු කියනවා විනිශ්චයකාරවරුන් විශ්‍රාම යැමේ කාලසීමාව දීර්ඝ කරනවාට විරුද්ධ වෙන්නේ හොරු, ප්‍රශ්න තිබෙන අය කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එතකොට ගරු මහා නායක ස්වාමීන් වහන්සේලාත් හොරුද? මේ ආණ්ඩුව කියන විධියට මහා නායක ස්වාමීන් වහන්සේලාත් හොරුද? මේ රටේ නීතිඥ සංගමයේ ඉන්නේත් හොරුද? එතකොට UN එක, පොදු රාජ්‍ය මණ්ඩලීය නීතිඥ සංගමය, ඒ අයත් හොරුද? ආසියාතික නීතිඥ සංගමයේ ඉන්නේත් හොරුද? දැන් ඔබතුමන්ලාගේ ජේවීපී පක්ෂයේ සිටින නීතිඥ සංගමය නියෝජනය කරන අය, ජනාධිපතිතුමා එක්ක නීතිඥ සංගමය පැවැත්වූ සාකච්ඡාවට ගියේ නැද්ද? ගිහිල්ලා ජනාධිපතිතුමාට කිව්වේ නැද්ද මේක කරන්න එපා කියලා? එතකොට ඒ අයත් හොරුද? දැන් ඔබ තමුන්නාන්සේලාගේ න්‍යාය අනුව මේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරු 159දෙනාත්, ජනාධිපතිතුමාත් හැර ඔබේ පක්ෂයේ ඉන්න නීතිඥවරුත් හොරු. එහෙම නේ මේ කියන්නේ. ගරු මහා නායක ස්වාමීන් වහන්සේලාත් හොරු.

මීට පෙර විගණකාධිපති පත් කරන වෙලාවේත් ගරු මහා නායක ස්වාමීන් වහන්සේලා යම් ඉල්ලීමක් කළා. ඔබතුමන්ලා ඒකට ඇහුම්කන් දුන්නේත් නැහැ. අඩු ගාණේ ඒ අහපු දේට පිළිතුරක් දෙන්න තිබුණා. එහෙමවත් දුන්නේ නැහැ. මේ රටේ ඉතිහාසයේ පළමු වතාවට ගරු මහා නායක ස්වාමීන් වහන්සේලාගේ ඉල්ලීමක් හේතු නොදක්වා ප්‍රතික්ෂේප කරනවා. හේතුවක් දක්වනවා නම් ඒක අපට බලන්න පුළුවන්. ඔබතුමන්ලා මේ කිසිම පාර්ශ්වයකට ඇහුම්කන් දෙන්නේ නැතිව කට ඇරපු ගමන් "ඔක්කෝම හොරු" කියලා පැත්තකට වෙනවා. හැබැයි, නීතිඥ සංගමයේ සිටින ඔබ තමුන්නාන්සේලාගේම පාක්ෂිකයෝත් දැන් හොරු වෙලා. දැන් එහෙම නේ කියන්නේ.

මේ සංශෝධනය ගෙනෙන්නේ ඔබේ ආරක්ෂාවටයි. පසුගිය ආණ්ඩුවලට අදාළ නඩු අහන්න නොවෙයි මේ විනිසුරුවරුන්ගේ විශ්‍රාම යැමේ වයස දීර්ඝ කරන්නේ. අධිකරණයට බලපෑම් කරන්න ඔබතුමන්ලා උත්සාහ කරන්නේ ඒ හින්දා නොවෙයි. මේ පාර්ලිමේන්තුවේ ඉන්න ඔබ තමුන්නාන්සේලාගේ පක්ෂයේ මන්ත්‍රීවරු වරෙන්තු වුණාම උසාවි යන්නේ නැහැ. උසාවි මඟ හරිනවා. වරෙන්තු කරන පහළ අධිකරණවල සිටින ගරු විනිශ්චයකාරවරු මාරු කරනවා. පසුගිය දවස්වල පහළ අධිකරණවල ගරු විනිශ්චයකාරවරු මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට විරුද්ධ වුණා. ඒ කියන්නේ, පහළ අධිකරණවල සිටින ගරු විනිශ්චයකාරවරුනුත් හොරු ද? ඔබතුමන්ලාගේ න්‍යාය පත්‍රයට අනුව ඒ අයත් හොරු ද? අද මේ පාර්ලිමේන්තුව ඇතුළේ ඉන්න ඔබ තමුන්නාන්සේලාගේ කී දෙනකුට වරෙන්තු තිබෙනවාද? ඒ අය වරෙන්තු වුණාම උසාවි යන්නේත් නැහැ. සමහර විනිශ්චයකාරවරු මාරු කරනවා. බීලා වාහන පදවලා හැප්පුණාම නියම කරන රුපියල් 20,000ක දඩය රුපියල් 2,500ක් දක්වා අඩු කර ගන්නවා. මේ, ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ අය. ඒවා ආරක්ෂා කරන්නයි මේ දේවල් කරන්නේ. වරායෙන් කන්ටේනර් 323ක් පැන්නුවා. දැන් මේ නඩුව ඉදිරියේදී අහනවා. ඒ නඩුව අහනකොට ඒවාට අවශ්‍ය බලපෑම කරන්නද ඔබ තමුන්නාන්සේලා මේ ලැහැස්ති වෙන්නේ කියන ප්‍රශ්නය අපි අහනවා.

මුදල් අමාත්‍යාංශයෙන් වැරදි ගිණුමකට ඩොලර් මිලියන 2.5ක් මාරු කළා. ඒ සිද්ධියේ ප්‍රධාන සාක්ෂිකරු, පැමිණිලිකරු බල නහර කැපිලා මැරුණා. ඔහුව මරා ගත්තාද, මැරුවාද, සිය දිවි හානි කර ගත්තාද කියන එක ප්‍රශ්නයක්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ගල්අඟුරු සම්බන්ධයෙනුත් එහෙමයි. ගල්අඟුරු වංචාවේ නඩුව එනවා. ඒවා ආරක්ෂා කරන්න තමයි ඔබ තමුන්නාන්සේලා අධිකරණයට බලපෑම් කරන්න උත්සාහ කරන්නේ. එහෙම නැතිව වෙන මොකකටවත් නොවෙයි.

ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවත් වැරදි ගිණුමකට සල්ලි දැම්මා. ජනාධිපති ලේකම්වරයා අන්න වරායෙන් කන්ටේනර් පන්නලා වැරදිකරුවෙක් වෙලා. වරායෙන් කන්ටේනර් පන්නපු නිලධාරියෙක්ව ජනාධිපති ලේකම් බවට ජනාධිපතිවරයා පත් කරලා දැන් හොරු අල්ලන්න කථා කරනවා. ආයෙත් මොන කථා ද, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මේ නඩු එනකොට තමයි ඔබ තමුන්නාන්සේලා පැහැදිලිවම ලැහැස්ති වෙන්නේ, මේ අධිකරණ පද්ධතියට බලපෑම් කරලා තමන්ට ඕනෑ විධියට අධිකරණ පද්ධතිය හසුරුවන්න. හැබැයි, ඔබතුමන්ලා කියන්නේ මොකක්ද? "විපක්ෂය බයවෙලා ඉන්නේ" කියනවා. නැහැ, විපක්ෂය නොවේ භය වෙලා තිබෙන්නේ. ආණ්ඩු පක්ෂය තමයි භය වෙලා තිබෙන්නේ. ඔබතුමන්ලා හිතනවා නම් මැතිවරණ තියන්නේ නැතිව කාලයක් ඇදගෙන යන්න පුළුවන් කියලා, ඒ කාරණා සාර්ථක වෙන්නේ නැහැ. ඔබ තමුන්නාන්සේලා විශ්‍රාම යැමේ වයස් සීමාව දීර්ඝ කරලා කවුරු තියා ගත්තත් මැතිවරණ තියන්න වෙනවා. ඒ කවුරු තියා ගත්තත් මැතිවරණ තියන්නත් වෙනවා; මේ නඩු අහන්නත් වෙනවා.

[ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා]

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අනේ, මම මෙතැනින් ගියාට පස්සේ මාව හොයන්න එපා කියන්න. මම මේ සභාවේ ඉන්න වෙලාවක තිබෙන ප්‍රශ්නයක් මගේ මූණට අහන්න කියන්න. උදේ ඉඳන් හවස් වෙනකම් මාව හොයනවා. මම මෙතැන ඉන්න වෙලාවේදී ඒ අය බුදියාගෙන ඉන්නවා. මෙතැන ඉඳලා මම ගියාට පස්සේ, "කෝ, නාමල් කොහෙද යන්නේ?" කියලා අහනවා. මම කොහේවත් යන්නේ නැහැ, මම මේ ඉන්නවා. ඒ නිසා තිබෙන ප්‍රශ්නයක් දැන් අහන්න කියන්න. අවශ්‍ය නම් මගේ කාලයත් මම දෙන්නම්. හැබැයි, මම ගියාට පස්සේ "කෝ, දැන් කෝ?" කියලා මුළු දවසේම මාව හොයන්න එපා කියා මම ඉල්ලීමක් කරනවා. ආත්ම ශක්තියක් තිබෙනවා නම් තිබෙන ප්‍රශ්නයක් දැන් මගේ මුහුණට අහන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ ගරු රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමිය පාර්ලිමේන්තුවට ගෙන එන කාරණා සම්බන්ධයෙන් කිව යුතු දෙයක් තිබෙනවා. ආණ්ඩු පක්ෂය පුරුද්දක් විදියට ඒවා හැන්සාඩ් එකෙන් ඉවත් කරනවා. ඒවා එහෙම හැන්සාඩ් එකෙන් ඉවත් කරන එක නොවෙයි කළ යුත්තේ. ගරු මන්ත්‍රීවරියක විධියට එතුමිය පාර්ලිමේන්තුවේදී යම් ප්‍රශ්නයක් ඇහුවාම, ඒකට ඇහුම්කන් දීලා අවශ්‍ය පියවර ගන්න. ඔබතුමන්ලාට අවශ්‍ය නම් ඒ සම්බන්ධයෙන් Select Committee එකක් පත් කරන්න කියා අපි ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
මට තව විනාඩියක කාලයක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මෙතුමාට තවත් විනාඩියක කාලයක් ලබා දෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
හොඳයි, ඔබතුමාට තවත් විනාඩියක කාලයක් ලැබෙනවා.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
පාර්ලිමේන්තුවේ Select Committee එකක් පත් කරලා, එතුමිය මේ පාර්ලිමේන්තුවේදී කියන කාරණා පිළිබඳව අධ්‍යයනය කරන්න. එහෙම නොකර එතුමිය ප්‍රශ්නයක් ඉදිරිපත් කරපු ගමන් ආණ්ඩුවේ තවත් කෙනෙකු නැඟිටලා ඒකට විරුද්ධව කථා කරලා ඒක හැන්සාඩ් එකෙන් ඉවත් කරන එක නොවෙයි කළ යුත්තේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එහෙම නම්, අපි ඔබතුමියගෙන් ඉල්ලා සිටිනවා, කරුණාකර මේ ගැන ගරු කථානායකතුමාව දැනුවත් කර ගරු රෝහිණී කවිරත්න පාර්ලිමේන්තු මන්ත්‍රීතුමිය විසින් ගෙනෙන ලද ඒ කාරණා සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කරන්න කියලා. පත් කරලා ඒ කාරණා ගැන සොයන්න. ඒත් එක්කම මම ඉල්ලීමක් කරනවා, විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිට දමලා ජනතාවගේ ප්‍රශ්න යට ගහන්න නම් ලැහැස්ති වෙන්න එපා කියලා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.12]

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ පනත යටතේ වන වැරැදිවලට අදාළව දඩ මුදල් සංශෝධනය කිරීමේ පනත් කෙටුම්පත පිළිබඳව තමයි අද දවසේ විවාද කරනු ලබන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අන්න, නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා පිටව යනවා. *[බාධා කිරීම්]*

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමනි, දැන් කිව්වා නේද, ඔබතුමා ගියාට පස්සේ කියන්න එපා කියලා? ඉතින්, වාඩි වෙලා ඉන්න. වාඩි වෙලා අහගෙන ඉන්න. *[බාධා කිරීම්]* දැන් මේක පුරුද්දක් කරගෙන තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. එතුමා එනවා; විනාඩි 7ක්, 8ක් කථා කරනවා; ඊට පස්සේ දුවනවා. අප කථා කරන කල් ඉන්නේ නැහැ. යන්න එපා, ඉන්න. *[බාධා කිරීම්]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
එතුමා-

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
හරි, ඔයා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඉන්නකෝ. *[බාධා කිරීම්]*

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දවසේ වැදගත්ම සාකච්ඡාව වී තිබෙන්නේ, ළමා ශ්‍රමය යොදවා ගන්න අයට එරෙහිව - ළමා ශ්‍රමය පිටු දැකීම සඳහා - පනවා තිබුණු, මෙතෙක් පැවැති රුපියල් 10,000 දඩය රුපියල් 100,000 දක්වා වැඩි කිරීමයි. නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවෙන් මේ පනතට අදාළව තවත් සංශෝධන - කාන්තාවන් සේවයේ යෙදවීම ද ඇතුළුව - ඉදිරිපත් කරන ලෙස අපේ අමාත්‍යාංශයට දැනුම් දීලා තිබුණා. නමුත් මේ කාරණය අත්‍යවශ්‍ය සහ හදිසි නිසා අපි මෙය ඉදිරිපත් කළා. ගරු චමින්ද්‍රාණි කිරිඇල්ල මන්ත්‍රීතුමිය කිව්වා, මෙහි තවත් සංශෝධන සිදු කළ යුතුයි කියලා. ඔව්, අපි ඒක පිළිගන්නවා. ඉදිරියේදී අපි ඒ සංශෝධන සිදු කරන්න බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂයෙන්ම ILO අංක 138 සම්මුතිය හෙවත් Minimum Age Convention සහ අංක 182 සම්මුතිය හෙවත් Worst Forms of Child Labour Convention අපේ රට අපරානුමත කර තිබෙනවා. ඒවාට අනුව අපේ රට තුළ පවතින නීතිය ද අපි සංශෝධනය කරන්න ඕනෑ. ඒ අනුව තමයි අද දවසේ අපි මේ පනත් කෙටුම්පත සම්මත කර ගන්න බලාපොරොත්තු වන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පුනරුද යුගයකට මේ රට රැගෙන යන්න මේ රටේ ජනතාවගෙන් ජනවරම ගත්තු අපේ ආණ්ඩුවේ වගකීම තමයි අපේ රටේ දරු පරපුරේ ළමා කාලය ආරක්ෂා කරන එක, ඔවුන්ට වඩාත් හොඳ රටක්, වඩාත් හොඳ හෙටක් හදන එක. හැමදාම කියනවා වාගේ හොඳම දේ දරුවන්ට ලබා දීම තමයි අපේ ආණ්ඩුවේ චුවමනාව. ඒ වෙනුවෙන් තමයි අපි සියලු ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නේ. දරුවන් වෙනුවෙන් මෙතෙක් ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව මේ සාකච්ඡාව ඇතුළේ; මේ විවාදය ඇතුළේ අපේ ගරු මන්ත්‍රීවරියන්, ගරු මන්ත්‍රීවරුන් දිගින් දිගටම කරුණු පැහැදිලි කළා. ඒ නිසා තවදුරටත් ඒ පිළිබඳව කථා කරන්න මම බලාපොරොත්තු වන්නේ නැහැ.

නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා දැන් කිව්වා-

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
එයා ගියා.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
එයාගේ ගෝලයා නේ දැන් ඔයා?

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කරුණාකර නාමල්ගේ මේ ගෝල මන්ත්‍රීතුමාට කියන්න, නිහඬව ඉන්න කියලා. මොකද, ඔයා එයා වෙනුවෙන් උත්තර දීලා හරියන්නේ නැහැ. එයා ඉන්න ඕනෑ මෙතැන. *[බාධා කිරීමක්]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
කොන්ද පණ තිබෙනවා නම්, නම කියන්න.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
කොන්ද පණ තිබෙන නිසා තමයි නම කියන්නේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මගේ නම කියලා කියන්න.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ඔයා කවුද, ඔයාගේ නම කියන්න? ඔයා කවුද, ඔයාගේ නම කියන්න, මම? *[බාධා කිරීමක්]* නාමල් රාජපක්ෂ, අපට මතකයි පසුගිය කාලයේ - 2013දී - ඔයගොල්ලන්ගේ ආණ්ඩුව ශිරානි බණ්ඩාරනායක මහත්මිය මේ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා නඩු අහලා අගවිනිසුරු ධුරයෙන් ඉවත් කරපු හැටි. ඒවා මේ රටේ ජනතාවට අමතක නැහැ. මේ රටේ අධිකරණ පද්ධතියට කරපු බලපෑම්, මේ රටේ නීතිය නවපු විධිය අපට අමතක නැහැ. තාජුඩීන් අමු අමුවේ ඝාතනය කරපු විධිය

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කාට අමතක වුණත් මේ රටේ ජනතාවට අමතක කරන්න බැහැ. ඔයා උත්සාහ කළාට ඒක මේ රටේ ජනතාවට අමතක කරවන්න, ඒක අමතක කරන්න බැහැ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

අද සුදු ඇඳගෙන ඇවිල්ලා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

සුදනන් වාගේ කථා කරන්නේ කවුද? එක පැත්තකින්, තාජුඩීන් වැනි රගර් ක්‍රීඩකයෝ ඝාතනය කරපු, කීර්තිමත් මාධ්‍යවේදියකු වෙච්ච ලසන්ත වික්‍රමතුංග වැනි අය ඝාතනය කරපු, සුදු වෑන් සංස්කෘතියක් නිර්මාණය කරපු මිනිස්සු අද සුදු ඇඳගෙන ඇවිල්ලා කථා කරනවා. ඒ වාගේම තවත් කෙනෙක් කථා කරනවා මම දැක්කා. ඒ තමයි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට එන්න කිව්වාට පස්සේ නයි ගහපු මහත්තුරු. ඒ අය අද නීතියේ ආධිපත්‍යය ගැන, ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා. ඒ නිසා අපි කියන්න ඕනෑ ඒගොල්ලන්ට, ජාතික ජන බලවේගය කරන්නේ මොනවාද, කියන්නේ මොනවාද, යන්නේ කොහෙද කියන එක ගැන අපට හොඳ අවබෝධයක් තිබෙන බව.

මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙනැල්ලා තිබෙන විසි දෙවන සංශෝධනයත්, අධිකරණ සංවිධාන පනත සංශෝධනය කිරීමත් කිසිසේත් තනි පුද්ගලයෙකු ඉලක්ක කරගත් එකක් නොවෙයි කියා අපි දිගටම කියලා තිබෙනවා. ඒවා මුළුමහත් අධිකරණ පද්ධතියම වඩාත් හොඳ තැනකට ගෙනෙන්න, අද දවසට ගැළපෙන විධියට ගෙනෙන්න, 11 ලක්ෂයකට ආසන්න නඩු ටික කඩිනමින් අවසන් කරන්න, මේ අධිකරණ පද්ධතිය වඩාත් සුමටව ක්‍රියාත්මක වෙන්න ගෙනාපු සංශෝධන.

අද උදේ ගරු විපක්ෂ නායකතුමා මේ සභා ගර්භයේදී කියපු දේ අපි දැක්කා. නීතිඥ සංගමය ලිපියක් නිකුත් කරලා තිබුණා, ඊයේ දවසේ ආණ්ඩු පක්ෂය බලපෑම් කළා කියලා; නැත්නම් තර්ජනය කළා කියලා. දී කිරට බළල්ලුත් සාක්ෂියි වාගේ අද උදේ විපක්ෂ නායකතුමාත් කිව්වා, ඒක අනුමත කරනවා කියලා. බොහොම හොඳයි. අපි අහනවා, නීතිඥ සංගමයෙන් ප්‍රශ්නයක්.

[ගරු මහින්ද ජයසිංහ මහතා]

විපක්ෂය පැත්තේ ඉන්න ගරු රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමිය අද දවසේ මේ රටේ අගවිනිසුරුතුමාට ඉතාම අපහාසාත්මක ලෙස කථා කළා. *[බාධා කිරීමක්]* දී කිරට බළල්ලුත් සාක්ෂියි වාගේ තමයි, නාමල් රාජපක්ෂත් එයාව අනුමත කරලා තිබුණා. මොකද, දැන් ඒගොල්ලෝ යාළුවෝ නේ.

ස්ථාවර නියෝග 83 (1)හි මෙසේ සඳහන් වනවා:

"ජනාධිපතිවරයාගේ හෝ වැඩබලන ජනාධිපතිවරයාගේ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ, විනිශ්චයකාරවරයන්ගේ හෝ යුක්තිය පසිඳලීමෙහි නියුක්ත අන් තැනැත්තන්ගේ පෞද්ගලික පැවැත්ම පූර්ණ යෝජනාවකින් හැර මතු කරනු නොලැබිය යුත්තේ ය. යම් වැඩකටයුතුවල දී, අමාත්‍යවරයකු වෙත යොමු කරනු ලබන ප්‍රශ්නයක් හෝ වෙනත් යම් විෂයයක් සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන යෝජනාවක් මත සිදු කරනු ලබන විවාදයක දී අදහස් ප්‍රකාශ කිරීම්වල දී එවැනි යම් තැනැත්තකුගේ පැවැත්ම සම්බන්ධයෙන් සඳහන් කිරීම රීත්‍යානුකූල නොවන්නේ ය."

ස්ථාවර නියෝග 83 (2) යටතේ මෙසේ සඳහන් වනවා:

"මෙම ස්ථාවර නියෝගයේ "විනිශ්චයකාරවරයා" යනුවෙන් ජනරජයේ ජනාධිපතිවරයා විසින් ස්වකීය අත්සන යටතේ වූ අධිකාර පත්‍රයක් මඟින් පත් කරනු ලබන අග්‍රවිනිශ්චයකාරවරයා ද අභියාචනාධිකරණයේ සභාපතිවරයා ද ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ වෙනත් සෑම විනිශ්චයකාරවරයෙක් ද අදහස් වේ."

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තිබෙන්නේ තව විනාඩි දෙකක කාලයක් පමණයි.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මට තව විනාඩියක කාලයක් දෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එය එක පැත්තකින් ඉතා පැහැදිලිව ස්ථාවර නියෝග උල්ලංඝනය කිරීමක්. අනෙක් පැත්තෙන්, මේ කාරණය. පසුගිය දවස්වල පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් යම්කිසි ආකාරයකට නීතිඥ සංගමයේ සභාපතිවරයා ගැන සඳහන් කළාය කියලා ඒ සම්බන්ධව ලිඛිතව මාධ්‍ය නිවේදන නිකුත් කළා. දැන් අපි අහනවා, ඒ පිළිබඳව නීතිඥ සංගමයේ ස්ථාවරය මොකක්ද කියලා. ස්ථාවර නියෝගත් උල්ලංඝනය කරලා ඒ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමිය කරපු සඳහන පිළිබඳව නීතිඥ සංගමයේ ස්ථාවරය කියන්න. අද උදේ ගරු විපක්ෂ නායකතුමාත්, නීතිඥ සංගමයේ ස්ථාවරය අනුමත කරනවා කියපු එක, "දී කිරට බළල්ලුත් සාක්ෂි වාගේ" යම් යම් සබැඳියා තිබෙනවා ද කියලා අපට යම් සැකයක් මතු වනවා. මම ඒ කරුණු ටික පැහැදිලි කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙම විවාදයට සෘජුව අදාළ නැතත් වැදගත් කාරණයක් කියන්න මට විනාඩියක් දෙන්න. පසුගිය සඳුදා අපේ අමාත්‍ය මණ්ඩලය අධ්‍යාපන වෘත්තික සභාවක් පිහිටුවීම පිළිබඳව කැබිනට් මණ්ඩල තීරණය ගනු ලැබුවා. පසුගිය වසරේ ජූලි, අගෝස්තු මාසවල වාගේ ඉඳලා අධ්‍යාපන අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව විසින් පාර්ලිමේන්තුවේ අනුකමිටුවක් පිහිටුවනු ලැබුවා, අධ්‍යාපන සභාව පිහිටුවීම පිළිබඳ අනුකමිටුව කියලා. මමත් ඇතුළුව තවත් මන්ත්‍රීවරු පස්දෙනෙක් එම කමිටුව නියෝජනය කළා. ඒ අනුකමිටුවේ මැදිහත් වීමෙනුත්, මහාචාර්ය ඕ.ජී. දයාරත්න මැතිතුමා ඇතුළු විද්වත් කණ්ඩායමේ මැදිහත් වීමෙනුත් ඉතාම කෙටි කාලයක් තුළ අධ්‍යාපන වෘත්තික සභාව පිහිටුවීම පිළිබඳ ඉතා හොඳ සාරගර්භ වාර්තාවක් ලබා දුන්නා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කාලය අවසන්.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මේ කාරණයත් කියලා මම කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය තුනෙන්ම සකස් කරලා එම වාර්තාව පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ටත්, උපදේශක කාරක සභාවටත් ලබා දුන්නා. උපදේශක කාරක සභාව එම වාර්තාව අනුමත කරලා අමාත්‍ය මණ්ඩලයට යොමු කරනු ලැබුවා. ඒ අනුව පසුගිය සඳුදා අමාත්‍ය මණ්ඩලය විසින් අධ්‍යාපන වෘත්තික සභාවට පිහිටුවීම සඳහා වන වාර්තාව අනුමත කරලා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට යොමු කර තිබෙනවා. විශේෂයෙන්ම ගුරුවරුන්ගේ, විදුහල්පතිවරුන්ගේ, ගුරු උපදේශකවරුන්ගේ, ගුරු අධ්‍යාපනඥ සේවය සහ අධ්‍යාපන පරිපාලන සේවය කියන සේවා පහේම වෘත්තිකයන්ගේ වෘත්තිකභාවය ඉහළ නැංවීම සඳහාත්, ඒ වෘත්තිකයන්ගේ ප්‍රමිතිකරණය සඳහාත්, ලියාපදිංචිය සඳහාත්, බලපත්‍රකරණය, තත්ත්ව සහතික කිරීම සහ ප්‍රතීතනය සඳහාත් තමයි අධ්‍යාපන සභාව ගොඩනැඟෙන්නේ. මොකද, අද දවසේත් සමහරු මගෙන් අහලා තිබුණා, අර වැටුප් විෂමතාවේ ඉතිරි තුනෙන් දෙක කවදා, කොහොමද දෙන්නේ කියලා. අපි දිගින් දිගටම පැහැදිලි කළා, අපේ රටේ මේ කියන සේවා පහේම වෘත්තිකභාවය ඉහළ නැංවීම සඳහා අධ්‍යාපන වෘත්තික සභාව ගොඩනඟලා ඒ හරහා අපි මේ සියලු ප්‍රශ්න විසඳීම වෙනුවෙන් මැදිහත් වනවා කියලා. ඒ කාරණයත් සඳහන් කරමින්, මට වැඩිපුර පොඩි වේලාවක් ලබා දීම පිළිබඳවත් ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මා නවතිනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Hon. Deputy Chairperson of Committees, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ස්ථාවර නියෝග 91 (ඒ) යටතේයි මම මෙම රීති ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේ.

අද ගරු විපක්ෂ නායකතුමා ඉදිරිපත් කර තිබුණා, පාර්ලිමේන්තුවේ සියලු මන්ත්‍රීවරුන් කැඳවීම සඳහා එතුමා කළ ආරාධනය සහ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග මත පදනම් වෙමින් මවිසින් කරන ලද ප්‍රකාශය තර්ජනාත්මක ප්‍රකාශයක්ය, ඒක නීතිඥ සංගමය විසින් හෙළා දැක තිබෙනවාය කියලා. එතුමා නීතිඥ සංගමය එච්චාය කියන ලිපියකුත් පෙන්වමින් එය

සභාගත කළාය කියනවා. පළමුව මම පැහැදිලිව කියන්න ඕනෑ, මම කළේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 115 අනුව කරුණු පෙන්වා දීමයි කියන එක. මහ ලේකම්තුමියත් ඒ ගැන මා සමඟ සාකච්ඡා කළා. එම ලියුම ආපු මුල් දවස්වලත් සාමාන්‍යයෙන් කෙරෙන විධිය එතුමිය මා සමඟ සාකච්ඡා කළා. මොකද, පාර්ලිමේන්තුව කවදාවත් කිසිම වෘත්තීය සංවිධානයකට මෙවැනි බෙදීමක් තිබෙන අවස්ථාවලදී අවසර දීලාත් නැහැ. පාර්ලිමේන්තුවට වඩා උසස් ජනතාව තමයි. නමුත්, තනි තනි සංවිධාන පාර්ලිමේන්තුවට වඩා උසස් කියලා මම හිතන්නේ නැහැ. මගේ කථාව සම්බන්ධයෙන් විපක්ෂ නායකතුමා කියපු දේ ගැන පැහැදිලි කරන්න මට තව විනාඩි දෙකක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ඇත්තටම, අපි විපක්ෂ නායකතුමාට ස්තුතිවන්ත වෙනවා, විවිධ සංවිධානවල අය ගෙනැල්ලා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ දැනුම වැඩි කරන්න එතුමා දක්වන උනන්දුව පිළිබඳව. ඒ වාගේම විපක්ෂ නායකතුමා ආණ්ඩු පක්ෂය වෙනුවෙන් තමයි කටයුතු කරන්නේ කියලා ඒ වෘත්තීය සංගමය තේරුම් ගැනීමත්,- මම හිතන හැටියට ඒක එහෙම වෙන්නත් පුළුවන්-

ඇත්තටම, මේ 225දෙනාම දැනුවත් කරන්න අවශ්‍ය නම් ඒ ඉල්ලීම ඉදිරිපත් කරන්න පුළුවන් නේ, කථානායකතුමාට. එහෙම නැත්නම් ආණ්ඩු පක්ෂයට. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඉන්නවා, මම ඉන්නවා, අගමැතිතුමිය ඉන්නවා. එහෙම නැතුව ඒ වෘත්තීය සංවිධානය විපක්ෂ නායකතුමා මඟින් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු දැනුවත් කරන්න කල්පනා කළේ, සමහර විට ඒ අය තේරුම් අරගෙන ඇති, විපක්ෂ නායකතුමා ආණ්ඩුව වෙනුවෙන් තමයි කටයුතු කරන්නේ කියලා. ඒක එහෙම තේරුම් ගන්න එක මට වළක්වන්න බැහැ. නමුත්, අපි තවම විපක්ෂ නායකතුමාට නිල වශයෙන් බලයක් දීලා නැහැ ආණ්ඩුව වෙනුවෙන් කටයුතු කරන්න. ඒ ගැන රටේ ජනතාව දැනුවත් කරන්න තමයි මම මේ ප්‍රකාශය කළේ.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් ලැබෙනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Hon. Deputy Chairman of Committees, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ඔව්, අර්ච්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාගේ point of Order එක කියන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

பாராளுமன்ற நிலையியற் கட்டளை 91(ஏ) - මහින්ද ජයසිංහ මහත්තයාට කියන්න, කට්ටිය ගියාට පස්සේ අරයා මැරුවා, මෙයා මැරුවා කියලා කියන්නේ නැතුව කොන්ද පණ තිබෙනවා නම්,- *[බාධා කිරීමක්]*

[අ.භා. 3.28]

**ගරු සංජීව රණසිංහ මහතා**
(மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ)
(The Hon. Sanjeewa Ranasingha)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද පාර්ලිමේන්තුවේ විවාදයට ගැනෙන්නේ, ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳවයි. මෙහි ප්‍රධානම අරමුණ වෙන්නේ, ළමා ශ්‍රමය සූරා කෑම සහ අන්තරායකර රැකියාවල නිරත කිරීම කියන කාරණයෙන් අපේ දරු පරපුර මුදා ගැනීමයි. මේ රටේ දරුවන් පිළිබඳව ජාතික ජන බලවේගය ආණ්ඩුව ලෙස අපි හිතන්නේ, කල්පනා කරන්නේ, දරුවා ආර්ථික භාණ්ඩයක්, එහෙම නැත්නම් ශ්‍රමය වැගිරිය යුතු කෙනෙකු විධියට නොවෙයි. දරුවෙක් අතට දිය යුත්තේ වැඩට බර වූ උපකරණයක් නොව පොතක් සහ අධ්‍යාපනයේ අවස්ථාවක් කියලා අපි විශ්වාස කරනවා. දරුවෙකුගේ ළමා කාලය සූරා කෑම නොකළ යුතුයි කියලා අපි කල්පනා කරනවා. දරුවාගේ දැනුම, හැකියාව සහ අනාගතය ගොඩ නැඟීම සඳහා අවස්ථා නිර්මාණය කිරීම නූතන සමාජයේ සෑම ස්ථරයකම වගකීම කියලා අපි විශ්වාස කරනවා. ඒ විතරක් නොවෙයි, දරුවා යනු වර්තමානයේ පමණක් නොව අනාගත සමාජය ගොඩ නඟන පරපුර කියලා අපි විශ්වාස කරනවා. ඒ වාගේම දරුවෙකුට අධ්‍යාපනය, ආරක්ෂාව, සෞඛ්‍ය හා නිදහසේ වර්ධනය වීමට අවස්ථාව ලබා දීම සමාජයේ මූලික වගකීමක් කියලා අපි විශ්වාස කරනවා. දරුවන්ගේ ළමා කාලය සූරා කෑම සුදුසු නොවන බවත් ඔවුන්ගේ හැකියා වර්ධනය කිරීම සඳහා උපරිම අවස්ථා නිර්මාණය කළ යුතු බවත් අපි විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි කල්පනා කරනවා, අපි විශ්වාස කරනවා, ළමා කාලය තුළ ලබා ගත යුතු දේවල් ගොඩක් දරුවෙකුට තිබෙන බව. සෑම දරුවෙකුටම ජීවත් වීමේ අයිතියක් තිබෙනවා. අධ්‍යාපනය ලැබීමේ අයිතියක් තිබෙනවා. සෞඛ්‍ය සම්පන්නව වැඩීමට අවස්ථාවක් උරුම වෙනවා. මෙවැනි විවිධාකාර වූ අයිතිවාසිකම් ළමයා සතු වෙනවා. මේ සියල්ල වෙනුවෙන් ජාතික ජනබලවේගයේ ආණ්ඩුව විවිධාකාර සැලසුම් ගොඩනඟමින් යනවා. අපේ මන්ත්‍රී සහෝදර සහෝදරියන් මේ සඳහා වත්මන් ආණ්ඩුව ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව ඉතා ගැඹුරින් විශ්ලේෂණය කර අදහස් දැක්වුවා. ඒ අතරේ අපි දැක්කා, මේ අවස්ථාවට සම්බන්ධ වුණු විපක්ෂයේ කණ්ඩායම් තමන්ගේ පටු දේශපාලන අරමුණු මත පදනම් වෙලා, තමන්ට අහිමි වුණු දේශපාලන අවස්ථා, වරප්‍රසාද, වරදාන හේතුවෙන් කෝපයට පත්වෙලා ඉන්න ආකාරය.

එහෙම වෙන්නේ ඇයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි? වසර ගණනාවක් මේ රටේ තිබුණු ඒ දේශපාලන සංස්කෘතිය විසින්, ඒ වාගේම දේශපාලනඥයා කියන චරිතය තුළ තිබුණු ස්වභාවය විසින් මේ සමාජයත්, රටත් ගිලගෙන තිබුණු බව අපි දන්නවා. ඒ සංස්කෘතිය තුළ හැමදාම යන්න පුළුවන් කියලා හිතපු, කල්පනා කරපු දේශපාලන නායකයන්; කණ්ඩායම්; දේශපාලන පවුල් තමයි අපි ඉතිහාසයේ දැක්කේ. ඒක ඇතුළේ - නූතන ආණ්ඩුව- ජාතික ජන බලවේගයේ රජය මේ අවස්ථාවේ ඒ දේශපාලන සංස්කෘතිය වෙනස් කරලා තිබෙනවා. තව වසර ගණනාවක් ගිහිල්ලා එයාලා බලයට පත් වුණත්, ඒ දේශපාලන සංස්කෘතියට මේ සමාජය තුළ, රට තුළ පැවැත්මක් නැහැ. ඒ හාමුලාගේ දේශපාලනය, බේබිලාගේ දේශපාලනය අවසන් වෙලා තිබෙනවා. හැකි ඉක්මනින් ජාතික ජන බලවේගය ආණ්ඩුව අප්‍රසාදයට පත් කරන්න සමාජය තුළ විකෘති අදහස් වපුරලා, තමන්ට හිතවත් මාධ්‍ය ඒක ඇතුළේ පාවිච්චි කරලා, ඒ මාධ්‍ය හොරණෑ මඟින් සමාජගත කරන පණිවුඩ හරහා මේ සාමාන්‍ය ජන සමාජය වියවුල් කළ හැකි දැයි ඔවුන් කල්පනා කරනවා. ඔවුන්ට අහිමි වෙලා තිබෙන්නේ මොනවාද?

[ගරු සංජීව රණසිංහ මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි ඉතිහාසයේ අධිකරණ ආයතන ඉදිරියට ගියා. අපි කවදාවත් දැක්කේ නැහැ, ඉහළ පෙළේ දේශපාලනඥයන්, ඒ පවුල්වල ආධිපත්‍යය හොබවපු මිනිස්සු නීතිය ඉදිරියට එනවා. හැබැයි, අද නූතන සමාජය තුළ නීතියේ ආධිපත්‍යය කාටත් සමානව ක්‍රියාත්මක වීම ඇතුළේ, ඔවුන්ට ඒවාට දඬුවම් ලැබෙනවා. ඒක නිසා, වැරදි කරපු අය හෙට දවසේ දඬුවම් ලැබිය යුතුයි කියලා විශ්වාස කරන අය භීතියට පත් වෙලා තිබෙනවා, මේ ආණ්ඩුව; මේ රජය තව ඉදිරියට ගියොත් ඒගොල්ලන්ට දැඩි තර්ජනයක් වෙයි කියලා.

ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. අද අපේ රටේ දුක් විඳින දරුවන් ගැන, ළමා අයිතිවාසිකම් ගැන, ළමයින්ගේ ශ්‍රමය ගැන අපි කථා කරනවා. විපක්ෂයේ මන්ත්‍රීවරියක් ළමයින්ගේ ශ්‍රමය අවුරුදු 18 දක්වා සීමා කිරීම ගැන ප්‍රකාශ කළා. ළමා අයිතිවාසිකම් අවුරුදු 16 දක්වා අනිවාර්ය වෙන්න ඕනෑ, හැබැයි අයිතිවාසිකම් තහවුරු කිරීම විතරක් ප්‍රමාණවත් නැහැ, ආර්ථික වර්ධනය, ආර්ථික සමෘද්ධිය මිනිසුන්ගේ ජීවිත ඇතුළේ තිබෙන්න ඕනෑ කියලා කිව්වා. ඒ ආර්ථික සමෘද්ධිය, මිනිසුන්ගේ ජීවිතය, ළමා අයිතිවාසිකම්, ළමයින්ගේ අවස්ථා - ඒ සියල්ල - උදුරා ගැනීම සඳහා කටයුතු කළේ කිනම් පාලනයන් විසින්ද කියලා අපි ප්‍රශ්න කළ යුතු වෙනවා. දරුවාට අධ්‍යාපනයේ අයිතිය අහෝසි කළා. තුන් වේළ කන්න නැති කලා. දරුවාට සපත්තු දෙක, බෑග් එක, පොත් අරගෙන දෙන්නේ කොහොමද කියලා කල්පනා කරන අම්මලා, තාත්තලා මේ සමාජය තුළ නිර්මාණය කළා. අද ඔය කථා කරන, ආණ්ඩුවට ඇඟිල්ල දිගු කරන, විවිධ චෝදනා එල්ල කරන, අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳව කථා කරන ඒ බේබි හාමුලාගෙන් අපි අහනවා, මේ රටේ අහිංසක අම්මා තාත්තාගේ දරුවෝ ශ්‍රම සූරාකෑමට ලක් වුණේ ඇයි කියලා. ඒ ළමයින්ට එම අවස්ථා අහිමි වුණේ වෙන කිසිවක් නිසා නොවෙයි. ඒ ළමයින්ට ළමා කාලය ගත කරන්න අවශ්‍ය කරන සමාජ ආර්ථික වටපිටාවක් නිර්මාණය කළේ නැහැ. ඒ අම්මලා, තාත්තලා තමන්ගේ දරුවාට සපත්තු දෙක අරගෙන දෙන්නේ කොහොමද කියලා කල්පනා කරද්දී, බෑග් එකක් අරගෙන දෙන්නේ කොහොමද කියලා කල්පනා කරද්දී, උදේට කෑවොත් දවල්ට කන්න අරගෙන දෙන්නේ කොහොමද කියලා කල්පනා කරද්දී, ඔබතුමන්ලා ලියෝ බිටෝන් සපත්තු දමන්න කල්පනා කරපු මිනිස්සු. මේ රටේ බස් එකේ යන්න ගාස්තුව නැති මිනිස්සු ඉන්න කාලයේ ඔයගොල්ලන් මොනවාද කළේ? ඔයගොල්ලන් ටවුන් වහලා ලැම්බෝගිනි පදින්න කල්පනා කරපු මිනිස්සු. එහෙම තත්ත්වයක් තමයි තිබුණේ. මේ රටේ දරුවාට පොත පත අරගෙන දෙන්න බැරිව අම්මා තාත්තා කල්පනා කරද්දී, තමන්ගේ දරුවන්ට උගන්වන්නේ ඕස්ට්‍රේලියාවේද, රුසියාවේද, ඇමෙරිකාවේද කියලා කල්පනා කරපු දේශපාලනඥයන් සිටියා. ඒ දේශපාලන කල්ලි කණ්ඩායම් තමයි අද විපක්ෂයේ ඉඳගෙන නීතියේ ආධිපත්‍යය, ස්වාධීනත්වය, සර්ව සාධාරණත්වය පිළිබඳව අපට, ආණ්ඩුවට පාඩම් කියලා දෙන්න එන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ නිසා අපි දකිනවා -

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු සංජීව රණසිංහ මහතා**
(மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ)
(The Hon. Sanjeewa Ranasingha)
හොඳයි. ඔබතුමියට බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මට විනාඩි දහයක කාලයක් තිබුණා නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබුණේ. එයින් ගරු නාමල් මන්ත්‍රීතුමාට විනාඩියක කාලයක් ලබා දුන්නා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
එතුමාට එක විනාඩියයි දුන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔව්, එක විනාඩියක් ලබා දුන්නා. ඒ නිසා ඔබතුමාට ලැබෙන කාලය විනාඩි හයක් වෙලා තිබෙනවා. මෙතැන සඳහන් වෙලා තිබෙනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
පසුව adjust කර ගනිමු.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
හැමෝටම ලබා දීපු කාලය අඩු වෙලා තිබෙනවා, කාලය කළමනාකරණය කරගන්න අවශ්‍ය නිසා.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, නාමල් මන්ත්‍රීතුමා - *[බාධා කිරීමක්]* ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම point of Order එකක් ඉදිරිපත් කරන්නේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Point එකක් නැහැ, වාඩිවෙන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මගේ විනාඩි හය මට ලබා දෙන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
හොඳයි. ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමාට ආණ්ඩු පක්ෂයෙන් කාලය ලබා දෙනවාද?

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මට විනාඩියක් ලබා දෙන්න. *[බාධා කිරීමක්]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Madam, I rise to a point of Order. එහෙම කොහොමද ආණ්ඩු පක්ෂයෙන් කාලය ලබා දෙන්නේ?

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ඔබතුමා පොඩ්ඩක් වාඩිවෙන්නකෝ. *[බාධා කිරීමක්]* මම ඒක බෙරා ගන්නම්, ආණ්ඩු පක්ෂය සහ මූලාසනයත් එක්ක. *[බාධා කිරීමක්]* කවුද මේ? මේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

වාඩිකරවන්නකෝ. *[බාධා කිරීමක්]* ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී, මම කම්කරු අමාත්‍යාංශයේ - *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
Point of Order එකක් අනුව තමයි කටයුතු කරන්න පුළුවන්, ගරු නියෝජ්‍ය ඇමතිතුමා. *[බාධා කිරීමක්]* ඔබතුමාගේ point of Order එක කියන්න. *[බාධා කිරීමක්]*

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
හරි, හරි, කමක් නැහැ. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, point of Order එක සඳහන් කරන්න පුළුවන්ද?

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
හරි, කමක් නැහැ. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ආණ්ඩු පක්ෂය පැත්තෙන් - [බාධා කිරීමක්]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
නැහැ, නැහැ, කවුරුවත් නැහැ. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

[අ.භා. 3.37]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට පෙර කථා කළ මන්ත්‍රීතුමාත්, ඒ වාගේම මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමාත් මාතෘකාවෙන් පිට තමයි වැඩි හරියක් කථා කළේ. ඒ නිසා මම කල්පනා කළා, මට ලැබී තිබෙන විනාඩි හය තුළ මාතෘකාවටම සීමා වෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ස්ත්‍රීන්, තරුණ පිරිස් සහ ළමයින් සේවයේ යෙදවීම නියාමනය කිරීම සඳහා ගෙනෙන මේ සංශෝධන පනත් කෙටුම්පත සම්මත කිරීමට අපේ කිසිම විරුද්ධත්වයක් නැති බව මම පළමුවෙන්ම ප්‍රකාශ කරන්න කැමැතියි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂයෙන්ම වයස අවුරුදු 16ත්, 18ත් අතර ළමයින් සේවයේ යෙදවූ අවස්ථාවලදී ඊට අදාළ කොන්දේසි කඩකළාම මෙච්චර කල් තිබුණු රුපියල් 10,000ක උපරිම දඩය රුපියල් 100,000 දක්වා වැඩි කිරීම කාලෝචිත යෝජනාවක් හැටියට විපක්ෂයේ අපිත් දකිනවා. සමාජයේ වඩාත් අවදානමට ලක් විය හැකි කණ්ඩායම්; විශේෂයෙන්ම කාන්තාවන් සහ දරුවන් ආරක්ෂා කිරීම රජයේ ප්‍රමුඛ වගකීමක්. ඒ වාගේම තමයි තරුණ ප්‍රජාවගේ ප්‍රශ්නවලටත් විසඳුම් ලබා දීමේ වගකීම රජයට බැහැර කරන්න බැහැ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, නීති පොතට අකුරු කිහිපයක් එකතු වූ පමණින් කාන්තාවන්ගේ, තරුණ ප්‍රජාවගේ සහ දරුවන්ගේ ප්‍රායෝගික ගැටලුවලට විසඳුම් ලැබෙන්නේ නැති බව අප තේරුම් ගත යුතුව තිබෙනවා. අද වනවිට හැම අංශයකම කාන්තාවන්ගේ දායකත්වය කැපී පෙනෙනවා. රාජ්‍ය අංශය දෙස බැලුවත්, පෞද්ගලික අංශය දෙස බැලුවත්, පාසලක ගුරු මණ්ඩලය දිහා බැලුවත්, විශ්වවිද්‍යාල දිහා බැලුවත්, රටට විදේශ විනිමය වැඩියෙන්ම ගෙනෙන අංශ දෙස බැලුවත් කාන්තාවන්ගේ දායකත්වය කැපී පෙනෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ පනත්වලින් ළමයින් අන්තරායදායක රැකියාවල යෙදෙන එක වළක්වන්න නීති දැඩි කර තිබීම යහපත් දෙයක්. නමුත් මේ පවතින ආර්ථික දුෂ්කරතා නිසා එක පැත්තකින් දරුවන් පාසල් හැර යාමේ ප්‍රතිශතය ශීඝ්‍රයෙන් ඉහළ යමින් පවතිනවා. මේ පාර්ලිමේන්තුවට ලැබෙන වාර්තාවලට අනුව බැලුවත්, වාර්ෂික පාසල් සංගණන වාර්තා දිහා බැලුවත්, ආර්ථික අර්බුදය උග්‍ර වුණු කාලයේ දරුවන් 260,000ක් විතර අධ්‍යාපනය අතරමඟ නතර කර තිබෙන බව පෙනී යනවා. මේක බරපතළ තත්ත්වයක්. තව පැත්තකින් දෙමව්පියන්ට දරුවන්ගේ අධ්‍යාපන වියදම් දරා ගන්න බැරි වුණාම, පවුලේ ආර්ථිකය බිඳ වැටුණාම මොන තරම් නීති තිබුණත් ළමයින් කළුකඩකාරයින්ගේ සහ විවිධ ජාවාරම්කරුවන්ගේ ගොදුරු බවට පත් වී අවිධිමත් රැකියාවල නිරත වන බව අද සමාජය තුළ බහුලව දකින්නට තිබෙන දෙයක්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම සම්බන්ධයෙන් නීති රෙගුලාසි පැනවීම ඔවුන්ගේ ආරක්ෂාවට වඩාත් වැදගත් වුණාට, ඒවා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන්න ගියාම ඔවුන්ගේ රැකියා අවස්ථා පවා අහිමි වීමේ අවදානමකුත් තිබෙන බව මම පෙන්වා දෙන්න කැමැතියි. කාන්තාවන්ගේ ආරක්ෂාව ගැන හිතලා නීති පැනවූ විට සමහර හාම්පුතුන් කාන්තාවන් වෙනුවට පිරිමින් සේවයට බඳවා ගන්න උනන්දු වන බවකුත් සමහර තැන්වල කැපිලා පෙනෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, රටේ ජනගහනයෙන් හරි අඩකට වැඩිය කාන්තාවන් හිටියාට කාන්තා ශ්‍රම බලකා සහභාගිත්වය සියයට 35ක් වාගේ ඉතා පහළ මට්ටමකයි

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

පවතින්නේ. ඊට බලපාන ප්‍රායෝගික ගැටලු කිහිපයක් පවතින බවත් අපට පෙනෙනවා. එකක් තමයි, ආරක්ෂිත පොදු ප්‍රවාහන සේවයක් නැතිවීම. ඒ වාගේම දරුවන් රැකබලා ගන්නට ආයතන මට්ටමින් දිවා සුරැකුම් මධ්‍යස්ථාන නැතිවීමත් ප්‍රශ්නයක්. මේ වාගේ ගැටලු අපි අවධානයට යොමු කළ යුතුවම තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද අපේ රටේ ළමයින් සහ තරුණයින් ගැන තීන්දු-තීරණ ගන්නකොට, ඒ අය වෙනුවෙන් නීති රීති පනවන විට වෙනදා වාගේ සාම්ප්‍රදායික ක්‍රමවලට හිතලා හරි යන්නේ නැහැ. එදා වාගේ නොවෙයි අද දරුවන් සහ තරුණයින් හිතන විධිය වෙනස් වෙලා තිබෙනවා.

මම ඔබතුමියට උදාහරණයක් මතක් කළොත්, දැන් සමහර දරුවන් සාමාන්‍ය පෙළ විභාගය අවසන් වුණාම, උසස් පෙළ නොකර කෙළින්ම උපාධියක් ගන්න පුළුවන් අධ්‍යාපන ක්‍රම පාවිච්චි කරනවා. ළාබාල වියේදීම අධ්‍යාපනයෙන් ඉහළට ගිහිල්ලා, රැකියා ආදායම් මාර්ග ඇති කර ගන්න තමයි ඒ තරුණයින්, දරුවන් බලන්නේ. ඒ නිසා අද අපට ඔවුන් ගැන අලුත් විධියට හිතන්න වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අලුත් පරම්පරාව ගැන තීරණ ගැනීමේදී ඔවුන් හිතන පතන විධියත් සැලකිල්ලට ගත යුතුය කියන එක මම විශේෂයෙන් මේ වෙලාවේ ආණ්ඩුවට මතක් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, තව විනාඩියක වාගේ කාලයක් නිසා මට තිබෙන්නේ අවසාන වශයෙන් මම මේ කරුණ කියනවා. යම් පුද්ගලයෙකුට රැකියාවක් තිබෙනවා වාගේම ඒ රැකියාවට සාධාරණ වැටුපකුත් හිමිවිය යුතුයි, ආරක්ෂිත සේවා පරිසරයකුත් තිබිය යුතුයි. රටක් දියුණු වනවා කියන්නේ කර්මාන්තශාලා වැඩිවීම පමණක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒ කර්මාන්තශාලාවේ වැඩ කරන මිනිසුන්ගේ ජීවිතත් දියුණු විය යුතුයි. අද රැකියා හීනය බිඳ වැටුණොත් තරුණ පරපුර සැරසෙන්නේ හෙට රට අතහැර යන්නයි. අද අපි ඔවුන්ගේ බලාපොරොත්තු රැක ගත්තේ නැත්නම් හෙට ඔවුන් මේ රට ගැන තිබුණු විශ්වාසය නැති කර ගන්නවා. ඒ නිසා අද තිබෙන ප්‍රශ්නය වන්නේ, අපේ තරුණ පරපුරට මේ රට තුළ අනාගතයක් තිබෙන බවට වූ විශ්වාසයක් ඔවුන් තුළ ඇති කරන්නේ කොහොමද කියන එකයි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ඒ නිසා තරුණයාට පුහුණුව දෙනවා වාගේම ඒ පුහුණුව රැකියාවකට සම්බන්ධ කිරීමත් අත්‍යවශ්‍ය කාරණයක් වනවා. කාන්තාවන්ට වැඩ කරන්න අවස්ථාව ලබා දීම වාගේම ඇයගේ දරුවන් රැක බලා ගැනීමට නිසි පහසුකම් සැපයීමත් තහවුරු කළ යුතුව තිබෙනවා. ඉස්කෝලයේ, විශ්වවිද්‍යාලයේ උගන්වන දේවල් හා රැකියා වෙළෙඳ පොළ අතර තිබෙන පරතරයත් නැති විය යුතුයි. එහෙම නැති වුණොත්, අපේ දරුවෝ එකම විකල්පය හැටියට පිටරට යන එක තෝරා ගන්න එක වළක්වන්න බැරි වනවා. ඒ නිසා විනාඩි 6ක් ඇතුළත මම කියපු මේ කාරණා කිහිපය අවධානයට යොමු කරන හැටියටත් ඉල්ලා සිටිමින්, අද මේ ගෙනෙන සංශෝධනවලට අපේ පූර්ණ සහයෝගය තිබෙන බවත් ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නාමල් සුදර්ශන නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. SANJEEWA RANASINGHA took the Chair.*

[අ.භා. 3.45]

**ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා (කාන්තා සහ ළමා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நாமல் சுதர்சன - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Namal Sudarshana - Deputy Minister of Women and Child Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේදී අපි පාර්ලිමේන්තුව තුළ සාකච්ඡාවට ගන්නේ 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ පනතට කරන සංශෝධන පිළිබඳවයි. විශේෂයෙන්ම 2006 අංක 24 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ (සංශෝධන) පනතින් පස්සේ 2010දී මේ රැකියා ක්ෂේත්‍ර ප්‍රමාණය 51 දක්වාත්, 2021දී 71ක් දක්වාත් වෙනස් කරගෙන තිබෙනවා. උදාහරණයක් විධියට ගත්තොත්, ගෘහස්ථ සේවකයෙකු ලෙස, විකිරණශීලී ද්‍රව්‍ය ආශ්‍රිත රැකියා, පතල් කර්මාන්තය, මද්‍යසාර සහ දුම්කොළ සම්බන්ධ රැකියා ආදී වශයෙන් වූ විශේෂ රැකියා ක්ෂේත්‍ර 71 සම්බන්ධයෙන් සංශෝධන සහිතව ඉදිරිපත් වූ පනතට අද දිනයේදී සම්මත කරන්න යන මේ පනත් සංශෝධනය හරහා ඒ තිබුණු දඩ මුදල වාගේ දහ ගුණයකින් දඩ මුදලෙහි වැඩිවීමක් සිද්ධ වනවා. අපි හිතනවා, දරුවන්ගේ සුරක්ෂිතභාවය වෙනුවෙන් මේක

අතිශයින්ම සාධනීය කාරණයක් කියලා. හැබැයි, නිපුණතා සංවර්ධනයට, ආධුනිකයෙකු ලෙස කටයුතු කිරීමට, අභ්‍යාසලාභියෙකු ලෙස දරුවෙකුට යම් පුහුණුවීමක් ලබා ගැනීමට තිබෙන අවස්ථා මේ පනත් සංශෝධනය හරහා ඇහිරෙන්නේ නැහැ. ඒ අවස්ථා දරුවන්ට ලැබෙනවා.

ඇත්තටම ශ්‍රී ලංකාව විධියට අපරානුමත කරපු ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ - ILOහි - සම්මුති තිබෙනවා. 138වැනි සම්මුතිය, 182වැනි සම්මුතිය යන සියල්ලම රටක් විධියට අපි අපරානුමත කරලා තිබෙනවා. ඉතින්, ඒ තුළ අන්තර්ගත වන කාරණාවන්ට අදාළවත් රජයක් විධියට මේ සාධනීය වෙනස්කම්, සාධනීය සංශෝධන සිදු කිරීම ප්‍රගතිගාමී පියවරක් කියලා අපි හිතනවා. ජාත්‍යන්තර වෙළෙඳ පොළට ප්‍රවේශයේදීත්, ජාත්‍යන්තර වෙළෙඳ පොළට යම් නිෂ්පාදනයක් ඉදිරිපත් කිරීමේදීත් ළමා ශ්‍රමය එම නිෂ්පාදන ජාලය තුළ අන්තර්ගත නොවීම අතිශයින් වැදගත් වන බවත් මම හිතනවා.

ඒ එක්කම තිරසර සංවර්ධන ඉලක්ක ගැන කථා කළොත්, අටවැනි SDG Goal එක වන්නේ, යහපත් රැකියා සහ ආර්ථික වර්ධනයයි. එහි 8.7හි සඳහන් "ළමා ශ්‍රමය සම්පූර්ණයෙන් අවසන් කිරීම" කියන කාරණයට රටක් විධියට අපි එකඟතාව පළ කරලා තිබෙනවා. ඒ සියලු කාරණා සම්බන්ධයෙන් බැලුවාම, රජයක් විධියට අපි මේ ගත්ත තීන්දුව සාධනීය කාරණයක් වනවා.

ඒ එක්කම මේ අවස්ථාවේ මම මේ කරුණත් මතක් කරන්න ඕනෑ. 1990 ජනවාරි 26වැනි දා රටක් විධියට අපි අත්සන් කරනවා, එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට. 1991 ජූලි 12වැනි දා අපි එය අපරානුමත කරනවා. ඒ තුළ දරුවාගේ ජීවත් වීමේ අයිතිය, සංවර්ධනය, ආරක්ෂාව සහ සහභාගිත්වය යන කාරණා සම්බන්ධයෙන්, ඒ වෙනුවෙන් කරන්න පුළුවන් සාධනීය කටයුතු සම්බන්ධයෙන් රජයක් විධියට අපි ජාත්‍යන්තරව එකඟතාව පළ කරලා තිබෙනවා. නමුත් අපි දකිනවා, ඒ සම්මුතිය සඳහා අපි අත්සන් කරලා අවුරුදු ගණනක් ගියත් සමහර සාධනීය කාරණා ඉෂ්ට කර ගන්න තවමත් අපට බැරි වෙලා තිබෙන බව. ජාතික ජන බලවේගය විධියට අපි ඉදිරිපත් කරපු ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දරුවන් සම්බන්ධයෙන් ඉදිරිපත් කරපු කාරණාව තමයි, "සුරක්ෂිත ළමා ලෝකයක් - නිර්මාණශීලී අනාගත පරපුරක්" කියන එක. ඒ තේමාව යටතේ තමයි අපි දරුවන් වෙනුවෙන් මැදිහත් වන්නේ.

ඉතින් අද මේ සාකච්ඡාවේදී කරුණු ඉදිරිපත් කළ විපක්ෂයේ සමහර කථික මන්ත්‍රීවරුන් මේ සංශෝධන පිළිබඳ කාරණා විතරක් මතු කරමින්, ඒකෙන් විතරක් දරුවන්ට ආරක්ෂාව ඇති කරන්න පුළුවන්ද වාගේ අදහස්, තර්ක ඉදිරිපත් කළා. අපි දැක්කා, උසාවිය සම්බන්ධයෙන් කථා කරනකොටත් ඒ කාරණය ඉදිරිපත් වුණු බව. විනිසුරුවරුන්ගේ විශ්‍රාම යැමේ වයස දීර්ඝ කිරීම සම්බන්ධයෙන් කථා කරනකොටත්, ඒ තුළින් විතරක් අපේ අධිකරණ පද්ධතිය කාර්යක්ෂම කරන්න පුළුවන්ද කියලා ඇහුවා. හැබැයි, රජයක් විධියට අපි බොහෝ කාරණා යෝජනා කරලා තිබෙනවා, ඒ සමහර ඒවා දැනටත් ක්‍රියාත්මක වනවා. ඒ වාගේම දරුවන් සම්බන්ධයෙනුත් රජයක් විධියට මේ වනකොට අපි ලොකු මැදිහත්වීමක් කරනවා. දරුවන්ගේ ආරක්ෂාව, රැකවරණය, අධ්‍යාපනය, සෞඛ්‍යය යන සියලු ක්ෂේත්‍ර සම්බන්ධයෙන් අපි ලොකු මැදිහත්වීමක් කරලා තිබෙනවා. කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය විධියට විතරක් නොවෙයි, සෞඛ්‍ය අමාත්‍යාංශය විධියට, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විධියට, පොලිස් ළමා හා කාන්තා කාර්යාංශය විධියට අප සියලුදෙනා එකතු වෙලා දරුවන්ගේ ආරක්ෂාව, රැකවරණය, අධ්‍යාපනය සහ සෞඛ්‍යය වෙනුවෙන් මේ වනකොට රජයක් විධියට ප්‍රශස්ත ක්‍රියාමාර්ග රාශියක් අරගෙන තිබෙනවා. ඒ සඳහා මම උදාහරණ කිහිපයක් කියන්නම්. අපි මේ වනකොට අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඉදිරිපත් කරලා තිබෙනවා. කුලුනු කිහිපයක් යටතේ අධ්‍යාපන පද්ධතිය යාවත්කාලීන කරන්නත්, වෘත්තීය අධ්‍යාපනය අපේ පාසල් අධ්‍යාපනයට ගෙන එන්නත් අවශ්‍ය කටයුතු අපි කරලා තිබෙනවා. එතැනින් එහාට උසස් අධ්‍යාපනය ලබන දරුවන් සඳහා ලබා දෙන මහපොළ ශිෂ්‍යාධාර දීමනාව පවා අපි වැඩි කරලා තිබෙනවා. ඒ සියලු ක්ෂේත්‍ර සම්බන්ධයෙන් අවශ්‍ය මැදිහත්වීම අපි කරලා තිබෙනවා.

මෙතැනදී මම ටිකක් වැඩිපුර මතු කරන්න කැමැතියි, කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය සහ ජාතික අධ්‍යාපන ආයතනය විධියට අපි ඉතිහාසය තුළ අත්හැරුණු ක්ෂේත්‍රයක් වන පෙර පාසල් විෂයය සම්බන්ධයෙන් විශාල මැදිහත්වීමක් කරමින් ඉන්නවා කියන කාරණය. මේ වනකොට අපි ජාතික වශයෙන්, ජාතික පෙර පාසල් ප්‍රතිපත්තියක් ගොඩනහන්න අවශ්‍ය ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. ඒ එක්කම ලංකාවේ පෙර පාසල් සියල්ලටම එකම විෂය මාලාවක් නිර්දේශ කරලා, පසුගිය 14වැනි දා අගමැතිතුමියත් සම්බන්ධ වෙලා ගුරු අත්පොතක් සහ ක්‍රියාකාරකම් මොනවාද යන්න සම්බන්ධයෙන් ගුරුවරියන් සියලුදෙනාම දැනුවත් කරන්න අවශ්‍ය පොත් දෙකක් අපි ඉසුරුපායේදී ඉදිරිපත් කළා. මේ වනකොට පෙර පාසල් විෂය සම්බන්ධයෙන් ඉතිහාසයේ කවදාවත් නොකළ ප්‍රශස්ත මැදිහත් වීමක් කරමින් අපේ රටේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට සමගාමීව පෙර පාසල් අධ්‍යාපනයත් ක්‍රමවත් කරන්න සහ විධිමත් කරන්න පූර්ව ළමාවිය අධ්‍යාපන ක්ෂේත්‍රයට අවශ්‍ය මැදිහත් වීම කරමින් ඉන්නවා. ඉතින්, ඒක සාධනීය කාරණයක් කියන එක අපි මතු කරන්නට අවශ්‍යයි.

ඒ එක්කම සෞඛ්‍ය අමාත්‍යාංශයත් එක්ක සම්බන්ධ වෙලා මව්වරුන්ගේ පෝෂණය වැඩි කිරීම සඳහා අවශ්‍ය මැදිහත් වීම කරමින්, පෙර පාසල් දරුවන්ට ආහාර වේලක් ලබා දෙමින්, ඔටිසම් - ස්නායු ආබාධ සහිත - දරුවන් සම්බන්ධයෙන් අවශ්‍ය මැදිහත් වීමත් කරමින්, අමාත්‍යාංශ සියල්ලම එකතු වෙලා මේ සියලු ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ඉතා කෙටි කාලයක් තුළ විශාල මැදිහත් වීමක් කරමින් ඉන්නවා. සුරක්ෂිත ළමා ලෝකයක් නිර්මාණය කරන එක අභියෝගයක් කියලා අපි දන්නවා. ඒ තුළ මත්ද්‍රව්‍ය විශාල ගැටලුවක් බවට පත් වෙලා තිබෙනවා. ඒ වෙනුවෙන් අපි මේ වනකොට "රටම එකට" වැඩසටහන ක්‍රියාත්මක කරමින් ඉන්නවා. ඒත් එක්කම, පවුලේ ආර්ථික තත්ත්වය ඉහළට ගැනීම, සමාජ සවිබලගැන්වීම කියන මේ සියල්ල වෙනුවෙන් "ප්‍රජා ශක්ති" වැඩසටහන යෝජනා කරලා, ඒ සඳහාත් අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. ඒ වාගේම, ග්‍රාමීය ජනතාවගේ දිළිඳු බව තුරන් කිරීම සඳහාත් අවශ්‍ය මැදිහත් වීම අපි කරමින් සිටිනවා.

අපි දන්නවා, තමන්ටම කියලා ආරක්ෂිත නිවහනක් නැතුව දරුවෙකුට සුරක්ෂිත පරිසරයක් ගොඩනැඟෙන්නේ නැති බව. මේ වනවිට නිවාස සංවර්ධන අධිකාරිය විධියට රට පුරාම නිවාස විශාල ප්‍රමාණයක් ඉදිකරමින්, මූලික මිනිස් අවශ්‍යතාවක් වුණු, දරුවෙකුට සුරක්ෂිත පරිසරයක් ගොඩනැඟීමට අවශ්‍ය "නිවාසය" කියන ජනතා සිහිනය සැබෑ කරමින් ඉන්නවා. ඒ විතරක් නොවෙයි, කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය විධියට නැදෑයෙක් නැතිව, දෙමව්පියන් නැතිව - කාත් කවුරුවත් නැතිව - ළමා නිවාසවල වසර ගණනක් ඉඳලා වැඩි වියට පත් වෙලා සමාජගත වුණු දරුවන්ගෙන් නිවාස නැති අය තෝරාගෙන ඒ අයට නිවසක් ඉදිකර දීම සඳහා "දිවියට සවියක්" වැඩසටහන යටතේ එක් දරුවෙකුට රුපියල් මිලියන 2ක මුදලක් අපි ලබා දෙනවා. ඒ සඳහා රුපියල් මිලියන 2,000ක මුදලක් අපේ අමාත්‍යාංශයට ලැබී තිබෙනවා. මේ වනකොට එවැනි දරුවන් විශාල පිරිසක් ඒ සඳහා තෝරාගෙන තිබෙනවා. ඒ අනුව, දරුවන්ට සුරක්ෂිත අනාගතයක් සහ වටපිටාවක් ගොඩනහන්නට

[ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශ මහතා]

අපි කටයුතු කරනවා. මේ වනකොට ආණ්ඩුව විධියට සියලු අමාත්‍යාංශ මැදිහත් වෙමින් ඒ සඳහා විශාල මැදිහත් වීමක් සිදු කරමින් ඉන්නවා. දරුවන්ට සුරක්ෂිත පරිසරයක් ගොඩනඟන්නට, ප්‍රශස්ත අධ්‍යාපනයක් ලබා දෙන්නට සහ ආරක්ෂිත වටපිටාවක් හදන්නට අවශ්‍ය මැදිහත් වීම කරමින් සිටින මොහොතක, එහි එක කාරණාවක් විධියට විතරයි අද දින අපි මේ සංශෝධනය ඉදිරිපත් කරන්නේ. අපි හිතනවා, මේ සංශෝධන තුළින් දරුවන්ගේ ශ්‍රමය සූරා කෑමට විරුද්ධව යම් පිටිවහලක් ලැබෙයි කියලා. එයට තිත තබන්නට මේ තුළින් යම් ප්‍රවේශයක් ලැබේය කියන බලාපොරොත්තුව අප තුළ තිබෙනවා. මට කථා කරන්න කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා,

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
මට විනාඩි 8ක කාලයක් තිබුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නැහැ, ඔබතුමාට විනාඩි 7ක කාලයක් පමණයි තිබෙන්නේ.

[பி.ப. 3.54]

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற பெண்கள் சார்ந்த விஷயங்கள் குறித்த விவாதத்தில் எனக்குப் பேசுவதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

கடந்த சில தினங்களாக இந்தப் பாராளுமன்றத்தில் மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா உட்பட முஸ்லிம், தமிழ் பாராளுமன்ற உறுப்பினர்கள் கல்முனை வடக்கு ஆதார வைத்தியசாலையில் முஸ்லிம் உதவி சுகாதாரப் பணியாளர்களின் உடை சம்பந்தமாகப் பலவகையான கருத்து களைச் சொல்லி வருகின்றார்கள். இவ்விடயம் தொடர்பில் கௌரவ அமைச்சர் அவர்கள் அளித்த பதிலையும் நான் பார்த்தேன். இந்த விஷயம் எமக்கு மிக வேதனையை ஏற்படுத்தியிருக்கிறது. இந்த நாட்டில் எத்தனையோ வைத்திய சாலைகள் இருக்கின்றன. எந்த வைத்தியசாலையிலும் இவ்வாறானதொரு பிரச்சினை ஏற்படவில்லை.

கல்முனை என்பது தமிழர்களும் முஸ்லிம்களும் சேர்ந்து அன்னியோன்னியமாக வாழ்ந்து வருகின்ற ஒரு பிரதேசமாகும். அங்கிருக்கின்ற குறித்த இரண்டு வைத்தியசாலைகளும் அருகருகே இருந்தாலும், எல்லா இனத்தைச் சேர்ந்த வைத்தியர்களும் தாதியர்களும் அங்கு பணியாற்றுவதை நாங்கள் பார்க்கின்றோம். இந்த நிலையில், கல்முனை வடக்கு ஆதார வைத்தியசாலைக்கு அண்மையில் நியமிக்கப்பட்ட குறித்த 9 உதவி சுகாதாரப் பணியாளர்களுக்கும் குறித்த ஆடையை அணிந்துவருவதை தடைசெய்கிறார்கள் என்ற செய்தியைக் கேள்விப்பட்டவுடன், நான் அந்த வைத்திய சாலையின் பொறுப்பாளரோடு தொலைபேசிமூலம் தொடர்பு கொண்டு கேட்டபோது, “நான் சுகவீனமுற்று இருக்கின்றேன். என்னால் அங்கு போகமுடியவில்லை. நான் இந்த விஷயத்தைப் பார்க்கிறேன்” என்று அவர் சொன்னார்.

அவர் இன்னொரு சந்தர்ப்பத்தில், “குறித்த circularஇல் ஒரு மாற்றத்தைச் செய்து அனுப்பச் சொல்லி அரசாங்கத்திடம் சொல்லுங்கள்! ” என்று என்னிடத்தில் சொன்னார். நான் உடனடியாக கல்முனையில் இருக்கின்ற சகோதரர் ஜபாத் அவர்களுடைய இல்லத்தில் வைத்து, கௌரவ பாராளுமன்ற உறுப்பினர் எம்.ஏ.எம். தாஹிர் அவர்களும் இருக்கையில், மாண்புமிகு அமைச்சர் (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ அவர்களுக்கு இந்த விஷயத்தை எடுத்துச் சொன்னபொழுது, அவர் என்னிடத்தில் கேட்டார், “எத்தனை பேர் இருக்கிறார்கள்?” என்று. அதற்கு நான், “9 பேர்” என்று சொன்னேன். அப்பொழுது, அவர் இது சம்பந்தமாக உடனடி யாக நடவடிக்கை எடுப்பதாகச் சொன்னார். நான் அவரிடத்தில் சொன்னேன், "இதற்குப் பெரிய நடவடிக்கையொன்றும் எடுக்கத் தேவையில்லை. நீங்கள் அங்கிருக்கின்ற RDHSக்கு தொலைபேசியில் சொல்லுங்கள், அவர்களைத் தங்களுடைய மத அடையாளத்துடன்கூடிய ஆடையை அணிந்துகொண்டு பணி செய்வதற்கு அனுமதிக்குமாறு" என்று. அவர்கள் தங்களது தலையையும் காலையும் மறைக்கும் விதத்தில் சீருடை அணிந்துகொண்டு பணி செய்வதற்கு இந்த நாட்டில் எல்லா வைத்தியசாலைகளிலும் அனுமதித்து இருக்கிறார்கள். அவ்வாறு இருக்கும்போது, கல்முனை வடக்கு ஆதார வைத்தியசாலை மட்டும் அதனை அனுமதிக்கவில்லை. அது வேறொரு நாட்டில் உள்ளதல்ல. அது இலங்கையில் இருக்கின்ற குறிப்பாக கல்முனையில் இருக்கின்ற ஒரு வைத்தியசாலை. அந்த வைத்தியசாலையில் மாத்திரம் ஒரு புதிய நிலைப்பாட்டை எடுத்திருக்கிறார்கள்.

இதைவிட வேதனையான விஷயம் என்னவென்றால், அங்கு வேலைசெய்கின்ற ஊழியர்கள் வெளியே வந்து, “நாங்கள் 20 வருஷமாக வேலை செய்கின்றோம். இவ்வாறு இருக்கின்றபோது, ஏன் இவர்கள் இவ்வாறு ஆடை அணிந்து வர வேண்டும்?” என்று கேட்டதுதான். இது புதியதோர் ஆடை அல்ல. அவர்கள் முகத்தை மூடிக்கொண்டு வரவில்லை; வேறு மாற்றத்தோடு வரவில்லை. அவர்கள் வயதுக்கு வந்த காலத்திலிருந்து கால்களை மறைத்து ஆடை அணிந்து வாழ்ந்தவர்கள். தலையில் ஒரு துணியைப் போட்டுக்கொண்டு அல்லது தலையை மறைத்துக்கொண்டு வருவதனால் எந்தவொரு பெரிய ஆபத்தும் அங்கு ஏற்படப் போவதில்லை. ஏன் இவ்வாறானதோர் இனவாதச் சிந்தனை வருகிறது? ஏன் அதனை இனவாதக் கண்ணோட்டத்துடன் பார்க்கிறார்கள்? ஏன் மற்றவர்களுடைய மத ரீதியான உடையை அல்லது மதச் சுதந்திரத்தை மதிக்கத் தவறுகிறார்கள்? இவற்றைப் பார்க்கும்பொழுது, மிகவும் வேதனையாக இருக்கின்றது. சில வேளைகளில் எங்களையும் இனவாதக் கண்ணாடி அணிந்து பார்க்கின்ற, பேசுகின்ற சில ஊடகவியளார்களையும் அரசியல்வாதிகளையும் நாங்கள் பார்க்கின்றோம்.

1990ஆம் ஆண்டு எனக்கு 18 வயதாக இருந்தபொழுது, நான் உட்பட ஓர் இலட்சம் முஸ்லிம்கள் ஆயுததாரிகளால் வடக்கிலிருந்து வெளியேற்றப்பட்டோம். 2009ஆம் ஆண்டு

நான் அமைச்சராக மெனிக்பாம் முகாமுக்குச் சென்றபொழுது, யார் எங்களுடைய பெண்களின் காதுகளில் இருந்த தோடுகளை by forceஆகப் பறித்தெடுத்துக்கொண்டு எங்களை boatஇல் ஏற்றி அனுப்பினார்களோ, அவர்கள் அங்கு நிராயுதபாணிகளாக எங்களைக் கண்டு அச்சத்தோடு நின்றதைக் கண்டேன். நாங்கள் அவர்களைப் பழிவாங்க வில்லை; காட்டிக் கொடுக்கவில்லை; தண்டிக்கவில்லை. மாறாக, நாங்கள் மனிதாபிமானத்தோடு நடந்துகொண்டோம். அகதியாக வந்த நான், அமைச்சராகச் சென்று, அந்த மூன்று இலட்சம் மக்களையும் மீளக்குடியமர்த்தும் பணியை மிக நேர்மையாகச் செய்து காட்டினேன். அவ்வாறு செய்தும், எங்களை இன்னும் இனவாதக் கண்ணாடி அணிந்து பார்க்கின்ற சில அரசியல்வாதிகளும் சந்தர்ப்பவாதிகளும் இருக்கத்தான் செய்கிறார்கள்.

இன்று இந்த ஆடை விவகாரம் பூதாகரமான பிரச்சினை யாக மாறியிருக்கிறது. இதை நாங்களும் கௌரவ அமைச்சர் அவர்களும் அரசாங்கமும் 'சும்மா' விட்டுவிட முடியாது. அரசாங்கம் எல்லா விஷயத்துக்கும், "கடந்த காலங்களில் நீங்கள் அமைச்சராக இருந்தீர்கள். கடந்த காலங்களில் இருந்த அரசுதான் இதனைச் செய்தது" என்று சொல்ல முடியாது. ஏனெனில், இது circular உடன் சம்பந்தப்பட்ட விடயம்.

2019இல் குண்டு வெடிப்பு நடந்த பின்னர், 'ஹிஜாப்' அணிந்துகொண்டு, அதாவது தலையை மூடிக்கொண்டு செல்லலாம். ஆனால், முகத்தை மறைத்துக்கொண்டு செல்லக்கூடாதென circular ஒன்றை வெளியிட்டு இருக்கிறார்கள். அந்தக் காலகட்டத்தில் அவ்வாறுதான் இருந்தது. ஏனெனில், அது ஒட்டுமொத்த முஸ்லிம்களின் வீடுகளையும் சோதனையிட்ட, முஸ்லிம் அரசியல் தலைமைகளையும் ஆன்மீகத் தலைமைகளையும் வியாபாரிகளையும் வைத்தியர்களையும் சட்டத்தரணிகளையும் பழிவாங்கிய காலம்! அந்தக் காலத்தில்கூட, தலையை மூடிக்கொண்டு வரலாம் என்று circularஇல் இருந்தது. அதற்குப் பிறகு, 2022இல் கோட்டாபய ஆட்சிக்கு வந்து, அதற்கு மாறான circular ஒன்றை வெளியிட்டு இருக்கிறார். Circular ஒன்றை மாற்றுவது என்பது அரசாங்கத்துக்கு ஒரு பெரிய விஷயம் அல்ல. சில வேளைகளில், அமைச்சரவைப் பத்திரத்தைச் சமர்ப்பிக்க இரண்டு - மூன்று கிழமைகள் செல்லலாம். ஒரு மாதத்துக்குள் இந்த circularஐ மாற்ற முடியும். தயவுசெய்து, இந்த circularஐ மாற்றுங்கள்! இந்த அரசாங்கத்தின்மீது சிறுபான்மைச் சமூகம் குறிப்பாக முஸ்லிம், தமிழ் சமூகங்கள் பாரிய நம்பிக்கை வைத்திருக்கின்றன; இன்னும் இந்த அரசாங்கத்தை நம்புகின்றன. இந்த circularஐ மாற்றுவதற்கு ஆறு தமிழ் பேசும் கட்சிகளின் ஆலோசனை தேவையென கௌரவ அமைச்சர் அவர்கள் சொன்னதாக நாங்கள் அறிகின்றோம். இந்த ஆறு தமிழ் பேசும் கட்சிகளும் ஒன்றுசேர்ந்திருப்பது, இந்த நாட்டில் ஒரு கலவரத்தை உருவாக்குவதற்காக அல்ல.

எங்களுக்கு இடையில் தீர்க்கப்படவேண்டிய பல பிரச்சினைகள் இருக்கின்றன. ஓட்டமாவடி உட்பட பல இடங்களில் காணிப் பிரச்சினைகள் இருக்கின்றன. முதலில் நாங்கள் இது பற்றி எங்களுக்குள் பேசிவிட்டுத்தான், அரசாங்கத்தோடும் எதிர்க்கட்சியோடும் பேசுவதற்கு எண்ணியிருக்கிறோம். நாங்கள் மூன்று விஷயங்களுக்காக ஒன்றுசேர்ந்து இருக்கிறோம். பலர் சந்தேகக் கண்ணோடு பார்க்கிறார்கள். எங்களைப் பொறுத்தவரையில், நாங்கள் இந்த விடயத்தில் இதயசுத்தியுடன் செயற்படுகின்றோம். தமிழரசுக் கட்சியின் ஒருசில பாராளுமன்ற உறுப்பினர்கள் கல்முனை வடக்கு ஆதார வைத்தியசாலை அபிவிருத்திக் குழுவினருடன் சென்று கௌரவ அமைச்சர் அவர்களைச் சந்தித்து இருக்கிறார்கள். அவர்கள் எதற்காகச் சந்தித்தார்களோ எனக்குத் தெரியாது. நான் அவர்களிடம் கேட்டுக் கொள்கின்றேன், இந்த விடயத்தை மனிதாபிமானத்தோடு பாருங்கள் என்று.

வயதுக்கு வந்த காலத்திலிருந்து உடலை மறைத்து ஆடையணிந்து வாழ்ந்த ஒரு பெண்ணை, கால்களைக் காட்டிக்கொண்டுதான் தொழிலுக்கு வரவேண்டும் என்று பணித்தால் நியாயமா? எனக் கேட்கின்றேன். ஊடகத்தில் வந்துபேசிய குறித்த தாதியிடத்தில் நான் கேட்கின்றேன், உங்களுடைய பிள்ளை காலை மறைக்கும் வகையிலான ஆடையைத் தருமாறு கேட்டால், "இல்லை! நீ காலை திறந்துகொண்டுதான் போகவேண்டும்" என்று நீங்கள் வற்புறுத்துவீர்களா? என்று. உங்களுடைய பிள்ளைகளைப் போன்றவர்கள்தான் இந்தப் புதிய உத்தியோகத்தர்களும். எனவே, இந்த விடயத்தை மனிதாபிமானத்தோடு பாருங்கள்!

நாங்கள் உங்களிடத்தில் எந்தக் குறையையும் பெரிதாகச் சொல்வதில்லை. அரசாங்கம் செய்யட்டும்; நல்லதென்று நாங்கள் இருக்கின்றோம். அமைச்சரவையில் ஒரு முஸ்லிம் இல்லை. அதை குறையாகச் சொன்னால் உங்களுக்குப் பிடிக்காது! அதேபோல், அரசாங்க அதிபராக முஸ்லிம் ஒருவர் இல்லை. அமைச்சின் செயலாளராக நவாவி இருந்தார். அவருக்கும் 60 வயது பூர்த்தியடைந்து விட்டது. எனவே, அமைச்சின் செயலாளராகவும் முஸ்லிம் ஒருவர் இல்லை. இப்பொழுது, தேசிய எல்லை நிர்ணய ஆணைக்குழுவுக்கு முஸ்லிம் ஒருவரை நியமிக்குமாறு கேட்கின்றோம். அதற்கும் உங்களிடமிருந்து சரியான பதில் இல்லை. முஸ்லிம் சமூகம் உங்களுக்கு வாக்களித்தது. உங்களோடு 9 முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்கள் இருக்கிறார்கள். "எங்களுடைய கட்சிதான் பெரிய கட்சி" என்று சொல்லுகின்ற நீங்கள், தயவுசெய்து முஸ்லிம்களுடைய சாதாரண விஷயங்களில் நேர்மையாகவும் இதயசுத்தியோடும் நடந்துகொள்ள வேண்டுமென அன்பாகக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.02]

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම වේලාව ඉල්ලා ගත්තේ අද උදෑසන ගිය සංවාදය ගැන යම් අදහසක් දක්වන්නයි. අපි දන්නවා ඊයේ දවසේත් පාර්ලිමේන්තුවේ සාකච්ඡාවට ලක් වුණා, නීතිඥ සංගමය පාර්ලිමේන්තු මන්ත්‍රීවරු දැනුවත් කරන්න පාර්ලිමේන්තුවේදී රැස්වීමක් ගන්නවා කියන කාරණයක් ගැන. ඊයේ දවසෙත් අපේ සභානායකතුමා, ගරු මන්ත්‍රීවරු සහ මන්ත්‍රීවරියන් එහි තිබෙන ක්‍රියාවලිය ගැන, ක්‍රියාදාමය ගැන අදහස් දැක්වූවා. කෙසේ වුවත්, අද දවල් 12.00ට එහෙම රැස්වීමක් ගන්න නියමිතව තිබුණා කියලා තමයි අපි දැනගෙන හිටියේ. අපි දැනගෙන හිටපු විධියට විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට අදාළව එහෙම රැස්වීමක් ගන්න හිටියා. එහෙම තියාගෙන ඊට පැය දෙකකට කලින් නීතිඥ සංගමයෙන් ලිපියක් නිකුත් කරලා තිබෙනවා. ඒ ලිපිය අනුව ඒ රැස්වීම ගන්නේ නැහැ, කල් දානවා කියා

[ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා]

තිබෙනවා. එහි එක කාරණයක් අපේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා මතු කළා. මේ ලිපියේ තුන්වෙනි ඡේදයේ මෙහෙම කියනවා:

"However, in light of the proceedings in Parliament today, i.e. 19.08.2026, and the position of the Government expressed threat, …" .

එතකොට මේ කියන්නේ ඊයේ දවසේ පාර්ලිමේන්තුවේ සජීවීව - අපි කවුරුවත් ඒගොල්ලන්ට call කළේ නැහැ නේ - කියපු දේ ගැන. එතකොට ඊයේ දවසේ පාර්ලිමේන්තුවේ කථා බහ සජීවීව බලාගෙන හිටියා නම් දන්නවා, අපි කථා කළේ මොකක්ද කියන එක. මේ සභාවේ දිගින් දිගටම අපි කථා කළේ විපක්ෂයයි, විපක්ෂ නායකතුමායි හරහා සියලු මන්ත්‍රීවරුන්ට approach කරන එකේ තිබෙන අවුල, පරස්පරය ගැනයි. අඩුම තරමින් මේක ගැන මතවාදයවත් ඊයේ සංවාදයට ලක් කළේ නැහැ. මීට සති දෙකකට කලින් එක ලියුමක් ගහලා තිබුණා, ඔය වාගේම රැස්වීමක් ගන්න හදලා. මම හිතන විධියට, සභානායකතුමාට copy එකකුත් එක්කම මේක දාලා තිබෙනවා. ඒ ක්‍රියාවලියේ ප්‍රශ්නයක් තිබෙනවා, හැමෝටම එන්න පුළුවන් විධියට ඉල්ලනවා වාගේ එකකුත් තිබෙනවා. එහෙමත් තිබියදී දෙවෙනි වතාවටත් ඒ ආකාරයෙන් විපක්ෂ නායකතුමාටම කථා කරලා ඔක්කෝම මන්ත්‍රීවරු කැඳවන්න හදලා තිබෙනවා. ඒක ගැන තමයි ඊයේ කථා කළේ. එහෙම කථා කළාම තර්ජනය කළාය, ආණ්ඩුව විසින් ඊයේ දවසේ තමන්ට තර්ජනය කළා කියලා ලියුමක් ගහලා තිබෙනවා. මේ ලියුම ගැහුවා විතරක් නොවෙයි, අපේ සංවිධායකතුමා කථා කරලා වාඩි වෙනකොටම විපක්ෂ නායකතුමා නැඟිටලා "I endorse this" කිව්වා. ඒ කියන්නේ, ඒක තර්ජනයක් තමයි කියලා එතුමා ඒ වෙනුවෙන් පෙනී සිටියා වීරෝදාර විධියට. ඒ විතරක් නොවෙයි. අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා කිව්වා "මම අවුරුදු 34ක් නීතිඥ සංගමයේ සාමාජිකයෙක්, මම විධායක කමිටු සාමාජිකයෙක්, මම පාර්ලිමේන්තුවේ තුන් වතාවක් ඉඳලා තිබෙනවා, මමත් පිළිගන්නවා මේක තර්ජනයක් කියලා" යනුවෙන්. ඔක්කෝමලා ඒක තර්ජනයක්ය කිව්වා. ඒ තර්ජනය කියලා කියන්නේ මේ කථා කරපු එකට. දැන් මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැනනේ කථා කරන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ව්‍යවස්ථා සංශෝධන වාගේ ලොකු දේවල් ගැන කථා කරන්න කලින් මූලික පාර්ලිමේන්තු ක්‍රියාවලිය, ස්ථාවර නියෝග, රැස්වීමක් ගන්න විධිය, මන්ත්‍රීවරුන්ට කථා කරන්න පුළුවන් ක්‍රමවේදය ගැන මූලික අවබෝධයක් තිබෙන්න ඕනෑ නේ. ඒක විපක්ෂ නායකතුමාටත් තිබෙන්න ඕනෑ, නීතිඥ සංගමයේ සභාපතිතුමාටත් තිබෙන්න ඕනෑ. එවැනි කිසිම අවබෝධයක් නැතිව threaten කළා කියනවා; දෙනෝදාහක් live බලාගෙන ඉන්න පාර්ලිමේන්තු විවාදය ගැන නේ මේ කියන්නේ. මොකක්ද මේ කියන්නේ?

මේ ක්‍රියාවලිය ප්‍රශ්න කිරීම ගැන කථා කරන එක ඉතාම කනගාටුදායක කාරණයක්. මොකද, අපට ඒක පේන්නේ වෙන විධියකට. මෙච්චර කියද්දීත් විපක්ෂ නායකතුමා හරහා ඇවිල්ලා ඔක්කෝම මන්ත්‍රීවරු කැඳවලා, ඊටපස්සේ ඒක සියලු දෙනා කැඳවනවා වාගේ කථා කිරීමට උත්සාහ කිරීම ගැටලුවක්. මම හිතන විධියට, දැන් මේ ලියුම නිකුත් කරලා පැය 6ක්, 8ක් විතර වෙනවා. ඊයේ දිනය තිබෙන්නේ. එහෙම තිබියදී මීට සුළු මොහොතකට කලින් "දිනමිණ" වෙබ් අඩවියේ වාර්තා කරලා තිබෙනවා, එතැන වචනය "threat" නොවෙයි "thereat" විය යුතුයි කියලා. මම ඒක වෙන කොහේවත් දැක්කේ නැහැ, නිවේදනයක් දැක්කේ නැහැ. "දිනමිණ" වෙබ් අඩවියේ වාර්තා කරලා තිබෙනවා නීතිඥ සංගමයෙන් කිව්වා කියලා ඒක "threat" නොවෙයි, නාම පදයක් නොවෙයි "thereat" කියලා. ඒ කියන්නේ එහෙම තර්ජනයක් නැහැ කියලා. එතකොට ප්‍රශ්නය තිබෙන්නේ, ලියුම නිකුත් කරලා පැය 6ක් ගත වෙලා, මේ ගැන ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා, විපක්ෂ නායකතුමා ඒ සියලු දෙනා කථා කළාට පස්සේවත් අඩුම තරමින් මේක වැරැද්දක් නම් -මේක නම් වචනය ඒකට හේතු දක්වන්න තිබුණා- නිහතමානී වෙලා ඒක නිවේදනයකින් නිකුත් කරන්න ඕනෑ. එහෙමයි සංවිධානයක් වැඩ කරන්නේ. ඒක මූලික දෙයක්, මාධ්‍යයත් එක්ක, රටත් එක්ක ගනුදෙනු කරද්දී. පැය 6ක් ගත වෙලා තිබියදීත් එහෙම දෙයක්වත් කරලා නැහැනේ. අඩුම තරමින් ඒක ගැන කථා කරන්න අවංක වෙන්න ඕනෑ නේ, නිහතමානී වෙන්න ඕනෑ නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නීතිඥ වෘත්තිය අනෙක් බොහෝ වෘත්තීන්ට වඩා serious. නීතිඥවරු කියන්නේ එහෙම කොට්ඨාසයක්. ඒ අයගේ වචනවලට තිබෙනවා බලයක්. ඒ වචනවලින් තීන්දු එනවා. මේ තරම් ලොකු ආකාරයේ වරදක්, පාර්ලිමේන්තුවේ විවාදයකට තුඩු දෙන වරදක් වෙලා තිබෙනවා නම් ඒක නිවැරදි කරන්න තරම් නිහතමානීත්වයක් නීතිඥ සංගමයේ නායකත්වයට තිබිය යුතුයි. එහෙම නැත්නම් වචනය මේක නම්, මේ ගැන හේතු දැක්විය යුතුයි, මොකක්ද මේ නිරපරාදේ කියන්නේ කියලා. අපි බොහොම ගෞරවයෙන් කාරණයක් කියන්න කැමතියි. විපක්ෂ නායකතුමාට ලියුම් ගහමින් සියලු මන්ත්‍රීවරු කැඳවන්න හදන එක නොවෙයි මේකෙදි කරන්න ඕනෑ දේ. අඩුම තරමේ තමන්ට වැරැද්දක් වෙලා තිබෙනවා නම් ඒ වැරැද්ද පිළිගන්න ඕනෑ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන වාගේ ලොකු දේවල් ගැන කථා කරන්න කලින් අඩුම තරමේ ලියුමක් ගහන එක, වචනයක් නිවැරදි කරන එක, වැරැද්දක් වුණාම පිළිගන්න එක ඒගොල්ලන් කරන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මට තව පොඩි වේලාවක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාගේ කථාවේ දී අන්තිමට කිව්වා, "මන්ත්‍රීවරියක් කළ ප්‍රකාශයක් හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කියලා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරියක් කිව්වා. කෙරෙන්න ඕනෑ හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන එක නොවෙයි, කරුණු හොයා බලා කටයුතු කරන එකයි" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම බොහොම ගෞරවයෙන් එතුමාට මේ කාරණය කියනවා. පාර්ලිමේන්තුවේ කටයුතු කිරීමේදී ක්‍රමවේදයක් තිබෙනවා, ස්ථාවර නියෝග තිබෙනවා. ස්ථාවර නියෝග 83 (1) අනුව මේ ගරු සභාවේ කථා කළ නොහැකි දෙයක් ගරු මන්ත්‍රීවරියක් විසින් කථා කළාට පස්සේ ඒ අදාළ ක්‍රමවේදයට අනුව කටයුතු කරන්න ඕනෑ. එහිදී කරන්න තිබෙන දේ තමයි එම ප්‍රකාශය හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන එක. අගවිනිසුරුතුමාට අපහාස කළාට පස්සේ කරන්න තිබෙන්නේ, ඒ ගැන හොයා බලා කථා කරන එක නොවෙයි, එම ප්‍රකාශය හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කිරීමයි. ඒක තමයි ක්‍රමවේදය. එතකොට ඒකවත් දන්නේ නැත්නම් අපිට තේරුම් ගන්න පුළුවන් තිබෙන තත්ත්වය. පාර්ලිමේන්තුවේ ඉන්නේත් නැහැ නේ. අඩුම තරමේ ඒ වාගේ දෙයක්වත් තේරුම් ගන්න බැරි නම් ඒ විනාඩි පහක් පාර්ලිමේන්තුවේ ඉන්න එකත් තේරුමක් නැහැ. මේ පාර්ලිමේන්තුව ගැන කිසිම අවබෝධයක් ඔහුට නැහැ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුජිත් සංජය පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.08]

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ (සංශෝධන) පනත් කෙටුම්පත සභාවට ඉදිරිපත් කර තිබෙන අවස්ථාවේ ඒ සම්බන්ධව අදහස් දක්වන්න අවස්ථාව ලැබීම ගැන මා සතුටු වෙනවා.

විශේෂයෙන් ළමයින් සේවයේ යෙදෙව්වොත් ඊට අදාළව අය කරනු ලැබූ දඩ මුදල රුපියල් 10,000 සිට රුපියල් ලක්ෂය දක්වා වැඩි කිරීමට මෙම පනත් කෙටුම්පත මඟින් යෝජනා වෙලා තිබෙනවා. මේ සම්බන්ධව කිසිම ගැටලුවක් නැහැ. ඒක විය යුත්තක් හැටියටයි අප දකින්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෙසේ වෙතත් මේ තත්ත්වය ඇති වෙන්න හේතුව මොකක්ද කියන එක ගැන තමයි අපි වැඩි වශයෙන්ම සාකච්ඡා කරන්න ඕනෑ. ළමයින් සේවාවන් සඳහා යන්නේ ඇයි? ඒක තමයි මේ රටේ දැන් තිබෙන ලොකුම ගැටලුව. ඒ නිසා මම ආණ්ඩු පක්ෂයෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. දැන් මේ දඩ මුදල් වැඩි කෙරුවා හා සමානවම ළමයින් සේවාවලට යන අවස්ථා, ඒ සම්බන්ධව තිබෙන ගැටලු මොනවාද යන්න හඳුනාගෙන ඒ සම්බන්ධව යම්කිසි විසඳුමක් සොයන්න කටයුතු කරන්න. එහෙම කටයුතු කළොත් වඩාත් කාලෝචිතයි කියන එක තමයි මට කියන්න තිබෙන්නේ.

අපේ රටේ දරු පවුල්වල තිබෙන දරිද්‍රතාව මේකට එක හේතුවක්. ඒ දරිද්‍රතාව නිසා බොහෝ අවස්ථාවලදී ළමයින්ට පාසල් අධ්‍යාපනය අහිමි වෙනවා. ඒ වාගේම ගෙදර ප්‍රශ්න ඇති වෙනකොට නියමිත පාසල් කාල සීමාව අවසන් කරන්න, එහෙම නැත්නම් උසස්පෙළ විභාගයට පෙනී සිටින්න තිබෙන අවස්ථාව ඒගොල්ලන්ට අහිමි වෙලා තිබෙනවා. ඒ නිසා අඩුම තරමින් ඒ වාගේ පවුල් හඳුනා ගෙන ඒ පවුල්වලට යම්කිසි ආධාර මුදලක් ලබා දීලා, එම පවුල්වල දරුවන් පාසල් යන තත්ත්වය වැඩිදියුණු කරන්න, ඒ සඳහා වන ප්‍රවණතා වැඩිදියුණු කරන්න අවශ්‍යයි. එහෙම නැත්නම් එම දරුවන්ට අධ්‍යාපනය ලබන්න බැරිකමක් තිබෙනවා නම් අඩුම තරමින් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන වෙත යොමු කරන්න කටයුතු කරන්න අවශ්‍යයි. පරිගණක පුහුණු වැඩසටහන් වාගේම රජයේ මැදිහත් වීමෙන් කරන නොයෙකුත් වැඩසටහන් ලංකාව පුරා විවිධ ආයතනවල පැවැත්වෙනවා. ඒවා සඳහා යොමු කරන්න පුළුවන්. මේවා සඳහා දරුවන් යොමු කළා වුවත්, සමහර අවස්ථාවල ඔවුන්ගේ ගෙවල්වල ප්‍රශ්න තිබෙනවා. ඒ අයට ඒවාට යන්න අදාළ බස් ගාස්තුව හොයා ගන්න විධියක් නැහැ. එහෙම නැත්නම් පාඨමාලාවට ගෙවිය යුතු ගාස්තුවක් තිබෙනවා නම් ඒක හොයා ගන්න ඔවුන්ගේ දෙමව්පියන්ට හැකියාවක් නැති අවස්ථා තිබෙනවා. ඒවා සම්බන්ධව රජය මැදිහත් වෙලා යම්කිසි ආධාර මුදලක් ලබා දීලා, ප්‍රවාහන ගාස්තුවක් ලබා දීම වැනි දෙයක් කරලා මේ වෘත්තීය පුහුණු වැඩසටහන්වලට ඒ දරුවන් යොමු කළොත් ළමයින් සේවාවන් සඳහා යොමු වීම අපිට නතර කර ගන්න පුළුවන්කම ලැබෙනවා කියන එකත් මා මේ අවස්ථාවේදී කියන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කම්කරු නියෝජ්‍ය ඇමතිතුමාත් මේ ගරු සභාවේ ඉන්න නිසා විශේෂයෙන් කම්කරුවෝ ගැනත් කියන්න ඕනෑ. අපි දන්නා තරමින් වැවිලි ක්ෂේත්‍රයට සම්බන්ධ සේවකයෝ අද මා හිතන හැටියට නොයෙකුත් ආකාරයේ අසාධාරණකම්වලට ලක් වෙනවා. විශේෂයෙන් ඔවුන්ගේ සේවය ලබා ගන්න අවස්ථාවේදී මෙන්ම දිනක වැටුප ගන්නකොට සිදු වන අක්‍රමිකතා මෙන්ම සමාගම්වලින් තිබෙන බලපෑම් සම්බන්ධවත් මේ අවස්ථාවේදී අපි කථා කරන්න ඕනෑ. මා ඒ සම්බන්ධව කාරණා කිහිපයක් කියන්න කැමතියි. විශේෂයෙන් වැවිලි ක්ෂේත්‍රයේ දලු නෙළන කාන්තාවන් ගත්තොත්, - දැන් කාන්තාවන් ගැන මෙතැන කථා කළා - ඒ අය දිනෙක වැටුප ගන්න නම් අනිවාර්යයෙන්ම දලු කිලෝ 18ක් විතර කඩන්න ඕනෑ. එහෙම වුණොත් තමයි තමුන්නාන්සේලා වැඩි කරපු දීමනාවත් එක්ක දිනෙක වැටුප ගන්න පුළුවන් වෙන්නේ. නමුත්, සමහර වෙලාවට දලු කිලෝ 18ක් ගන්න නම් අඩුම ගණනේ දලු කිලෝ 20ක්, 22ක් තමන් නෙළන්න ඕනෑ. ඉතින් ඒක කරන්න අමාරුයි. මොකද, විවිධ හේතූන් මත, විශේෂයෙන් දලුවල ජලය තිබෙන බව, වැස්සට හසු වී තිබෙන බව ආදී නොයෙකුත් ආකාරයේ හේතු දක්වා ඒ පාලනාධිකාරිය තව දලු කිලෝ 4ක් විතර කපන්න කටයුතු කරනවා. මෙතැනදීත් අපි දන්නවා, මහන්සි වෙලා වැඩ කරන කම්කරු ස්ත්‍රියට සාධාරණයක් ඉෂ්ට වෙන්නේ නැහැ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තමයි කිරි කපන අයටත් කරන්නේ. කිරි කපලා කිරි කිලෝ ගණන ගෙනෙන කොට ග්‍රෑම් 100ක්, 200ක් අඩු වන කොට නියමිත ප්‍රමාණයට කිරි කිලෝ 5, එහෙම නැත්නම් කිරි කිලෝ 6 සම්පූර්ණ කළේ නැහැ කියලා දිනක වැටුප අහිමි කරන අවස්ථා තිබෙනවා. මේවා සම්බන්ධවත් කම්කරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න ඕනෑ කියලායි මා හිතන්නේ.

ඊට අමතරව, අප දකින තවත් දෙයක් තිබෙනවා. අද සමහර කම්කරුවන් දීර්ඝ කාලයක් තිස්සේ සමාගම්වල තාවකාලික සේවකයන් - casual workersලා - හැටියට තබා ගෙන ඉන්නවා. එයිනුත් අපේ කම්කරුවන්ට ලොකු අසාධාරණයක් සිද්ධ වෙනවා. මොකද, ඒ අයට ETF, EPF ගන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ඒ වාගේම, තමුන්නාන්සේලා වැඩි කරපු රුපියල් 200, ඒ තාවකාලික සේවයේ, එහෙම නැත්නම් casual සේවයේ ඉන්න කම්කරුවන්ට ලබා ගන්න අවස්ථාව උදා වෙලා නැහැ. ඒකත් කම්කරු ජනතාවට කරන ලොකු අසාධාරණයක් හැටියට තමයි අප දකින්නේ.

ඊට අමතරව, මම මේ අවස්ථාවේදී තවත් එක් කාරණාවක් කියන්න කැමැතියි. ගරු ඇමතිතුමාටත් මම මේක පෞද්ගලිකව කිව්වා. ඒ, යටියන්තොට නගරයේ දැනට පවත්වා ගෙන යන කම්කරු කාර්යාලය ගැනයි. එම ඉවත් නොකර තබා ගන්න කියලා ඒ ප්‍රදේශවාසීන්, කම්කරුවන් දීර්ඝ වශයෙන් ඉල්ලීම් කරලා තිබෙනවා. නමුත්, තවම තීන්දුවක් අරගෙන නැහැ. ගරු ඇමතිතුමනි, සාමාන්‍යයෙන් වෙළෙඳ ව්‍යාපාරවල ඉන්න සේවකයින්, වැවිලි ක්ෂේත්‍රයේ ඉන්න සේවකයින්, අනෙකුත් සේවකයින් ගත්තොත් 4,000ක්, 5,000ක් විතර ඒ ප්‍රදේශය නියෝජනය කරන අය. ඉතින් ඒ අයට තවත් තැනකට, එහෙම නැත්නම් අවිස්සාවේල්ල වැනි ප්‍රදේශයකට යන්න වෙනවා කියන්නේ දුෂ්කර කටයුත්තක්. නාවලපිටිය මායිමට, නුවරඑළිය දිස්ත්‍රික්කයේ මායිමට-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාගේ කාලයෙන් විනාඩි 4ක්, 5ක් ගන්න කියලා මට කියලායි තිබෙන්නේ. මොකද, ගරු චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා

[ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා]

කථා කරන්නේ නැහැ. ඒ කාලය කාටවත් බෙදුණේ නැහැ නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට තවත් විනාඩි 2ක් දෙන්න, මේ කාරණාව කියලා නතර කරන්නම්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඒ මන්ත්‍රීතුමාගේ කාලය බෙදලායි තිබෙන්නේ.

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විනාඩි හතරෙන් පහෙන් මේ ටික කියන්න බැහැ.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ කාර්යාලයෙන් 4,000ක්, 5,000ක් විතර සේවය ලබා ගන්නවා.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ඒක තවම අවසන් කරලා නැහැ නේ.

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
එහෙම නම් හොඳයි, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ, එය එම ස්ථානයේම රඳවා ගන්න කටයුතු කරන්න කියලායි. එතැන ගොඩනැඟිලි පිළිබඳ යම්කිසි ප්‍රශ්නයක් තිබෙනවා නම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තව කාර්යාල කිහිපයක් තිබෙනවා. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමන්ලාට අවශ්‍ය නම් ඒවා ප්‍රයෝජනයට ගන්න පුළුවන්. සේවාවක් හැටියට සලකා ඒ කටයුත්ත කරන්න.

අනෙක් කාරණය මේකයි. විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන, මෙහිදී මීට කලින් දීර්ඝ වශයෙන් කථා කළා. ඒ වාගේම, අපේ ගරු රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමියව විවේචනය කළා. එතුමිය අගවිනිසුරුතුමා විවේචනය කරන්න කටයුතු කෙරුවාලු. මම කියන්න කැමැතියි, එතුමිය එහෙම දෙයක් කළේ නැති බව. එතුමිය කිව්වේ මොකක්ද? අගවිනිසුරුතුමාට විරුද්ධව දැන් මේ සමාජ මාධ්‍ය තුළ නොයෙකුත් ආකාරයේ අදහස් උදහස් ප්‍රකාශ වෙනවා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියලා කියනවා. ඒ වාගේම

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

තිබෙනවා. ඒවා සම්බන්ධවයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කථා කළේ. එය එතුමාට හොඳ නැති නිසා ඒවා සම්බන්ධයෙන් විමර්ශනයක් කරන්න කියලායි කිව්වේ. එතුමිය එක චෝදනාවක් එල්ල කළේ නැහැ. එතුමිය කිව්වේ, මේ සම්බන්ධව විමර්ශනයක් කරලා එතුමාගේ හොඳ නම කැත වෙනවා නම්, ඒ සම්බන්ධයෙන් යම්කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලායි. ඒ ඉල්ලීම තමයි එතුමිය කළේ. එම නිසා ඔබතුමන්ලා ඒ සම්බන්ධව පරීක්ෂණයක් කරන්න, ඒවා ඇත්තක්ද බොරුවක්ද කියන එක ගැන සොයන්න. ඒක තමයි එතුමිය ඉල්ලා සිටියේ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජී.ජී. පොන්නම්බලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.15]

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! இன்று நாங்கள் இந்தச் சபையில் பெண்களையும், இளம் ஆட்களையும் மற்றும் பிள்ளைகளையும் தொழிலுக்கமர்த்துதல் (திருத்தம்) சட்டமூலம் தொடர்பாக விவாதித்துக்கொண்டு இருக்கின்றோம்.

அண்மையில் கல்முனை வடக்கு ஆதார வைத்தியசாலைக்கு நியமிக்கப்பட்ட 9 முஸ்லிம் பெண் சுகாதார உதவியாளர்கள் 'ஹிஜாப்' அணிந்து கடமைக்குச் சென்றபொழுது, அதற்கு எதிர்ப்புத் தெரிவித்து, அவர்கள் அங்கு கடமையாற்ற முடியாதவொரு சூழலை ஏற்படுத்தியது உண்மையிலேயே கண்டிக்கத்தக்க ஒரு விடயமாகும். இன்றைய உலகச் சூழலில், நாங்கள் மனித உரிமைகள் பற்றி அதிகமாகப் பேசுகின்றோம். மனித உரிமைகளில் மிக முக்கியமானதொரு பிரிவுதான் தனிநபர்களின் உரிமை. தனிநபர்களின் உரிமையைத் தாண்டி, ஒரு சமூகமாக மனிதர்கள் தங்களை அடையாளப்படுத்தும் பொழுது - கூட்டு அடையாளத்தைப் பேணும்பொழுது - அதை மதிக்க வேண்டியது உலகமறிந்த மனித உரிமையின் அடிப்படைப் பண்பாகும். இங்கு சமூகம் என்பது இனமாக இருக்கலாம், மதமாக இருக்கலாம்!

இன்று ஆட்சியில் அமர்ந்திருக்கக்கூடிய அரசாங்கத்தினர், எங்களுடைய வட, கிழக்குப் பிரதேசங்களுக்குச் செல்லும் போது, பரவலாகக் கூறுகின்ற விடயம் என்னவென்றால், "நாங்கள் இனவாதிகள் அல்லர். இதற்கு முன்னர் 77 வருடங்களாக இந்த நாட்டை மாறி மாறி ஆட்சி செய்த அனைத்துக் கட்சிகளும் இனவாதக் கோணத்தில் செயற்பட்ட கட்சிகளாகும். எனினும், நாங்கள் அப்படியல்ல. இன ரீதியாக, மத ரீதியாகப் பாதிக்கப்படுகின்ற விடயங்களைத் தீர்த்து வைக்கும் ஓர் அரசாங்கமாகத்தான் நாங்கள் இருக்கிறோம்" என்றுதான். இவ்வாறு அவர்கள் தங்களைத் தாங்களே பெரியளவில் புகழ்ந்து கதைக்கிறார்கள்.

அப்படிப்பட்ட சூழலிலே, கடந்த 2 வாரங்களாக குறித்த 9 முஸ்லிம் சகோதரிகளுடைய ஆடை தொடர்பான பிரச்சினை பேசப்பட்டு வருகின்றது. இதில் நேரடியாகத் தலையிட வேண்டிய பொறுப்பு இந்த அரசாங்கத்துக்கு இருக்கின்றது. ஏனெனில், அரசாங்கத்தின் circularஇலுள்ள ஒருசில பழைய விதிமுறைகளைச் சுட்டிக்காட்டித்தான் இந்தப் பிரச்சினை கிளப்பப்பட்டு இருக்கின்றது. மிக வெளிப்படையாக ஒரு

சமூகத்துக்கு அல்லது அந்தச் சமூகத்தைச் சார்ந்த நபர்களுக்கு அநீதி நடைபெறும்பொழுது, அந்த இடத்தில் அரசாங்கத்துக்கு இருக்கக்கூடிய மிக முக்கியமான கடப்பாடு, அதில் தலையிடுவதுதான். கடந்த காலத்தில் வெளியிடப்பட்ட ஏதோ ஒரு circularஐக் காட்டிக்கொண்டு, அந்த அநீதியைத் தொடரவிடுவதல்ல அரசாங்கத்தின் வேலை. அதில் உடனடியாகத் தலையிட்டு, ஒன்றில் அந்த circularஐ இரவோடு இராவாக மாற்ற வேண்டும் அல்லது ஆகக்குறைந்தது குறிப்பிட்ட பிரச்சினை தொடர்பில் சம்பந்தப்பட்ட அமைச்சர் தெளிவுபடுத்த வேண்டும். இது அவசர அவசரமாகச் செய்யவேண்டிய ஒரு விஷயமாகும்.

இன்றைக்கு நாங்கள் கேள்விப்படுகின்றோம், அவர்கள் அஷ்ரப் ஞாபகார்த்த வைத்தியசாலைக்கு இடமாற்றப்பட்டு இருக்கின்றார்கள் என்று. அது எனக்கு விளங்கவில்லை. உண்மையிலேயே குறித்த விதிமுறைகளைப் பின்பற்ற வேண்டுமென்றால், அவர்கள் அந்த ஆடையை அணிந்து அஷ்ரப் ஞாபகார்த்த வைத்தியசாலையில்கூட வேலைசெய்ய முடியாது. அந்தளவுக்கு முட்டாள்தனமான, இனவாத ரீதியான ஒரு செயற்பாடாகத்தானே இது இருக்கின்றது. இந்த அரசாங்கம் பழையதொரு regulationஐக் காட்டி, சமூகங்களை மோதவைப்பதற்குச் செய்கின்ற ஒரு வேலையென நாங்கள் இதனைச் சந்தேகிக்கின்றோம். அரசாங்கம்தான் இதற்குப் பின்னால் இருக்கின்றதா? என்று நாங்கள் யோசிக்கவேண்டி இருக்கின்றது.

எங்களைப் பொறுத்தவரையில், இந்த அரசாங்கம் அவசர அவசரமாக இந்த விடயத்தில் தலையிட்டு, உடனடியாக இந்தச் செயற்பாட்டை நிறுத்த வேண்டும். பாதிக்கப்பட்ட 9 பெண் உத்தியோகத்தர்களையும் அவர்கள் ஆரம்பத்தில் நியமிக்கப்பட்ட வைத்தியசாலைக்கு மாற்ற வேண்டும். அதுதான் சரி! நாகரிகமான உலகத்தில் ஓர் அரசு செய்யவேண்டிய கடமை அதுதான். அதைத் தட்டிக்கழித்து, 'எதிர்காலத்தில் திருத்துவோம்' என்று சொல்லி, அதை இன்னும் இன்னும் பிரச்சினையாக்குகின்ற வகையிலும், வேண்டுமென்றே கொளுவிவிட விரும்புகின்ற தரப்புகளுக்குத் தீனி போடுகின்ற வகையிலும் செயற்படுவது பொருத்தமற்றது.

நான் இன்னுமொன்றைத் தெளிவாகச் சொல்ல வேண்டும். தமிழ் மக்கள் குழம்பவில்லை. அது கல்முனை வடக்குப் பிரதேசத்திலுள்ள தமிழ் மக்களாக இருக்கலாம் அல்லது வட, கிழக்கைச் சார்ந்த தமிழ் மக்களாக இருக்கலாம். அவர்கள் மதங்களை மதிக்கின்ற மக்கள்; ஏனைய இனங்களுடைய கலாசாரங்களை முற்றுமுழுதாக மதிக்கின்ற மக்கள்; கிழக்கு மாகாணத்திலும் வடக்கு மாகாணத்திலும் பிரிக்க முடியாத அளவுக்கு முஸ்லிம் மக்களோடு ஒன்றாக வாழுகின்ற மக்கள்! அவர்களைப் பொறுத்தவரையில், கல்முனை வடக்கு ஆதார வைத்தியசாலையில் குறித்த முஸ்லிம் பெண்கள் வேலைசெய்வது எந்தவிதத்திலும் பிரச்சினை கிடையாது. இங்கு மக்களுக்கு இடையில் பிரச்சினை கிடையாது. எனவே, திட்டமிட்ட வகையில் குழப்பத்தை ஏற்படுத்த விரும்புகின்ற தரப்புகள் எடுக்கின்ற முயற்சியை இனங்கண்டு, அதை உடனடியாக நிறுத்த வேண்டும். பெண்களையும், இளம் ஆட்களையும் மற்றும் பிள்ளைகளையும் தொழிலுக்கமர்த்துதல் (திருத்தம்) சட்டமூலம் தொடர்பாக விவாதிக்கப்படுகின்ற இந்தச் சந்தர்ப்பத்திலாவது, கல்முனை வடக்கு ஆதார வைத்தியசாலை விடயத்தைத் தெளிவுபடுத்தி, இதற்கு முற்றுப்புள்ளி வைக்கவேண்டிய கடமை இந்த அரசாங்கத்துக்கு இருக்கின்றது. குறிப்பாக, முஸ்லிம் பெண்கள் 'ஹிஜாப்' அணிந்து வேலைக்குச் செல்வதில் எந்தவிதமான தடையும் இல்லை என்பதை கொள்கையளவில் அறிவிக்கவேண்டிய பொறுப்பு இந்த அரசாங்கத்துக்கு இருக்கின்றது.

நான் எங்களுடைய முஸ்லிம் சகோதரர்களிடம் தயவுடன் கேட்டுக்கொள்வது என்னவெனில், இத்தகைய முரண்பாடுகளை எந்தளவுக்குத் தவிர்க்க வேண்டும் என்பது பற்றி சற்று யோசிக்க வேண்டும் என்றுதான். கல்முனை வடக்கை DS பிரிவாக அங்கீகரிக்கச் சொல்லி இருக்கிறோம். அது ஏற்கனவே அங்கீகரிக்கப்பட்டதுதான! அதற்குரிய கணக்காளரை நியமிக்கச் சொல்லி நாங்கள் கேட்பதை முஸ்லிம் சகோதரர்கள் சரியான கோணத்தில் விளங்கிக்கொள்ள வேண்டும். எங்களைப் பிரித்தாளுவதற்கு விரும்புகின்ற தரப்புகளுக்குத் தீனிபோடுகின்ற வகையில் செயற்படாமல், புரிந்துணர்வுடன் செயற்பட வேண்டுமென நான் தயவாகக் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

இறுதியாக, ஒரு விடயத்தை சுருக்கமாகச் சொல்லி முடிக்கிறேன். வட, கிழக்கிலுள்ள பெண்களுக்கு குறிப்பாக தாய்மாருக்கு இருக்கக்கூடிய மிகப் பெரிய சவால், போதைப் பொருளிலிருந்து தங்களது பிள்ளைகளைப் பாதுகாப்பதுதான். இன்று வட, கிழக்கில் போதைப்பொருள் பிரச்சினை புற்றுநோய் போன்று பரவிக்கொண்டு இருக்கின்றது. யுத்த காலத்தில் வட, கிழக்கில் போதைப்பொருள் இராணுவத்தினரால் திட்டமிட்டு பரப்பப்பட்டது என்பதிலும், இன்றைக்கும்கூட அதுதான் நடக்கிறது என்பதிலும் மாற்றுக் கருத்து கிடையாது. நான் சுட்டிக்காட்ட விரும்புகின்ற விடயம் என்னவென்றால், போர் இடம்பெற்ற காலத்தில் இராணுவம் எதிரியாகக் கருதிய ஒரு சமூகத்தை முடக்குவதற்காகத் தொடங்கிய ஒரு விஷயம், இன்றைக்குத் தெற்கிலும் மக்களை மிக மோசமாகப் பாதிக்கின்ற அளவுக்கு புற்றுநோய் போன்று பரவியிருக்கின்றது என்பதைத்தான். இன்றைக்கு வட, கிழக்கில் போதைப்பொருளால் பாதிக்கப்படுகின்ற மக்களை 'புனர்வாழ்வு' என்று சொல்லி rehabilitation centreக்கு அனுப்புவது இதற்கான தீர்வு அல்ல. அவர்களைச் சிறைக்கு அனுப்பினால், அவர்கள் அங்கு இன்னும் மோசமாக தவறான வழியில் போவதற்கு வாய்ப்பு இருக்கிறது. அதற்குத்தான் இந்த system உதவி செய்கின்றது. நீங்கள் அவர்களை rehabilitationக்கு அனுப்பினாலும், அவர்கள் அந்தப் பாதிப்பிலிருந்து மீளுவது கிடையாது. அவர்கள் அந்த இடத்தில் காலத்தைக் கழித்துவிட்டு, வெளியில் வந்து அதற்கு அடுத்த கட்டமாகச் செயற்படுகின்ற ஒரு மோசமான நிலைமையைத்தான் நாங்கள் காண்கின்றோம்.

இந்த அரசாங்கம் பெண்கள், சிறுவர்கள், இளைஞர்களைப் பற்றி உண்மையாகவே யோசிப்பதாக இருந்தால், இந்த விடயங்களையும் சேர்த்துக் கவனத்தில் எடுத்தால் மட்டும்தான் இங்கு கொண்டு வரப்பட்டுள்ள இச்சட்டமூலம் அர்த்தபூர்வமானதாக இருக்கும் என்பதை இந்த இடத்தில் சுட்டிக்காட்டி, விடை பெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සුගත් වසන්ත ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.26]

**ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපවත් වී වදාළ රඹුකන සිද්ධාර්ථ ස්වාමීන් වහන්සේ වෙනුවෙන් සංවේගය පළ කරන්න මා මේක අවස්ථාවක් කර ගන්නවා. උන්වහන්සේ සිංහල සුභාවිත

[ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා]

ගීතයට කරපු සේවය ඉතා ඉහළයි. අපි ඒක අගය කරනවා. උන්වහන්සේ ලියනවා, එක ගීතයක්. එහි මෙහෙම කියනවා.

"බෝ අතු ඉති නැමී නැමී සාදු කියනවා - දහස් වරක් එක දවසට බුදුන් වඳිනවා.

මෙතැන දහම් පාසලක් - ළමා දිවිය සරු කරනා නව තෝතැන්නක්"

උන්වහන්සේ ආදරයෙන් ආමන්ත්‍රණය කරන්නේ දරු පරපුරට; පොඩිහිටියන්ට. හැබැයි, උන්වහන්සේ ගීතයෙන් මේ කාරණය ඉස්මතු කරද්දී මීට දශක කිහිපයකට පෙර අපිත් අත්පුඩි ගගහා නටන්න ඇති. අවලස්සනම ගීතය පිළිබඳව ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දම්ම දිසානායක එක්තරා ගුවන් විදුලි වැඩසටහනකදී කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක තමයි "සකල බුජං කොට කලිසම් තමයි අඳින්නේ" කියන ගීතය. ඒ ගීතයේ කියැවෙන්නේ අවුරුදු අටක දරුවෙක් ගෙදරක මෙහෙකාර වෘත්තියේ යොදවන හැටි. ළමා ගායිකාවක් තමයි ඒක කියන්නේ. ඒ ගීතයේ රිද්මය විසින් අපට ඒ දරුවාගේ ශ්‍රමය සූරාකන හැටි අමතක කරලා තිබෙනවා. හැබැයි, ගෙදරක හුඳු මහත් කටයුතු අප්‍රමාණ දුකක් දරාගනිමින් ඒ දරුවා ඉටු කරනවා.

අද ගෙනෙන මේ සංශෝධනයට පෙරාතුව නම් ඒ දුක්ගැහැටවලට ලැබුණු දඬුවම තමයි, රුපියල් 10,000ක දඩයක්. දැන් ඒ දඩය රුපියල් ලක්ෂය දක්වා මේ සංශෝධනය හරහා වැඩි කරනවා. ඇත්තෙන්ම නෛතික වශයෙන් මේ දඩ මුදල නියම වුණත් මනුෂ්‍යත්වයට එරෙහිව මේ ළමා ශ්‍රමය යොදා ගැනීම කොච්චර බේදනීයද? ළමා ශ්‍රමය ආකාර ගණනාවකින් සූරා කෑමට ලක් වෙනවා. ඒක කිසිසේත්ම මනුෂ්‍යත්වයට එකඟ දෙයක් නොවෙයි. ශිෂ්ට සම්පන්න බවට එකඟ දෙයක් නොවෙයි. අපි දන්නවා, මේ ළමා ශ්‍රමය ලිංගික වශයෙන් සූරාකෑමක් මේ රටේ සිදුවන බව. අපි දන්නවා, කුඩු ව්‍යාපාරය තුළ කුඩු ප්‍රවාහනයට මේ දරු-දැරියන් යොදා ගන්නා බව. නුවරඑළියේ යනකොට මලෛයහම් දුවා-දරුවන් පාර අද්දර ගොටුකොළ වාගේ සුළු සුළු වෙළඳාම්වල යොදවා තිබෙන ආකාරය අපි දකිනවා. අපි කොහොමද ඒක මනුෂ්‍යත්වයට එකඟයි කියන්නේ? ඒවා මනුෂ්‍යත්වයට එකඟ නැහැ. ඉස්සර වතුකරයට මිනිස්සු ගියේ ගෙදර වැඩට කට්ටිය සොයන්න. අපි ඒ සංස්කෘතිය වෙනස් කරන්න ඕනෑ. ඒ වෙනස් කිරීම සඳහා සහ ළමයින්ට ළමා බව කැඳවන්න, වැඩිහිටියන්ගෙන් පොඩිහිටියන් බේරා ගන්න තමයි මේ සංශෝධනය ගෙනෙන්නේ. මේ සංශෝධනය විතරක් නොවෙයි, අපි සෑම විටම හොඳම දේ දරුවන්ට දිය යුතුයි. ඒක අපේ දරුවන්ට නොවෙයි, සමස්ත රටේ දරුවන්ටම හොඳම දේ උරුම කරන දේශපාලන ව්‍යාපාරයක, දේශපාලන දැක්මක අපි ඉන්නේ.

ඒක නිසා මේ දරුවන් ආබාධිතද, නැද්ද කියන කාරණය අපට කිසිසේත්ම අදාළ නැහැ. දරුවෝ නම් දරුවෝ. ඒක නිසා තමයි කැබිනට් මණ්ඩලය විසින් පසුගිය අය වැය ලේඛනයෙන් ආබාධ සහිත දරුවන්ට ඉගෙන ගැනීමට රුපියල් 5,000ක් දෙන්න තීරණය කළේ. හැබැයි, ප්‍රතිපාදන ප්‍රමාණවත් වෙලා තිබුණේ දරුවෝ 1,000කට පමණයි. සමීක්ෂණයකින් ඔප්පු වුණා, මේ වාගේ අවශ්‍යතා තිබෙන දරුවන් 5,230ක් සිටින බව. ඒකට උත්තරයක් විධියට තමයි ඉකුත් කැබිනට් මණ්ඩලය සම්මත කරලා, අඩු ආදායම්ලාභී ආබාධ සහිත දරුවන්ට ඉගෙන ගැනීම සඳහා රුපියල් 5,000ක දීමනාවක් ලබා දෙන්නේ. ඒ විතරක් නොවෙයි. මේ අවුරුද්ද තුළ ආබාධ සහිත දරුවන්ගේ සුරක්ෂිතතාව, කුසලතා සංවර්ධනය සඳහා අපි කුසලතා සංවර්ධන මධ්‍යස්ථාන 10ක් විවෘත කරනවා. සම්පූර්ණයෙන්ම එන අවුරුද්දත් එක්ක ගත්තොත්, සෑම දිස්ත්‍රික්කයකටම මධ්‍යස්ථාන එක බැගින් මධ්‍යස්ථාන 25ක් ආරම්භ කරන්නේ ඇයි? ආබාධ සහිත දරුවන්ගේ කුසලතා සංවර්ධනයටත්, ඔවුන්ට සුරක්ෂිත ජීවිතයක් තහවුරු කරන්නත් තමයි එසේ කටයුතු කරන්නේ. එම තහවුරු කිරීම හරහා ඒ දරුවන්ගේ අම්මා, තාත්තා අනාගතය පිළිබඳ බලාපොරොත්තුවක් ඇති කර ගන්නවා.

ඒ වාගේම ඉතා කනගාටුදායක තොරතුරක් කියන්න තිබෙනවා. ආබාධ සහිත දරු දැරියන් ස්පාවල ලිංගික සේවයේ යොදවන බවට වාර්තා වෙමින් පවතිනවා. මේක කොයි වාගේ රටක්ද? මේක කොයි වාගේ සමාජයක්ද? මේ සමාජයේ සෑම අස්සක් මුල්ලක් නෑරම පවතින දුෂ්ටත්වය, මේ සූරා කෑම අවසන් කිරීම සඳහා තවත් විවිධ පියවර ගත යුතුයි; නෛතික පියවර ගත යුතුයි. ඒ සඳහා අනිවාර්යයෙන්ම අපේ රජය මේ මොහොතෙත්, ඉදිරියේදීත් ක්‍රියාත්මක වන බව සහතික කරමින්, පොඩිහිටියන් සඳහා සුරක්ෂිත ජීවිතයක්, සුරක්ෂිත අනාගතයක් උරුම කර දෙන්න, ලස්සන ජීවිතයක් උරුම කර දෙන්න, ලස්සන අනාගතයක් උරුම කර දෙන්න අපේ කැපවීම, අපේ සහතිකය ඔබ ඉදිරියේ තබමින් මා නිඛහ වෙනවා. මට මිනිත්තු ගණනාවක් ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු තුෂාරි ජයසිංහ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.32]

**ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) துஷாரி ஜயசிங்ஹ)
(The Hon. (Mrs.) Thushari Jayasingha, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින විවාදයට ගෙන තිබෙන මෙම සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳ විවාදයේ දී කථා කළ විපක්ෂයේ ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමා කිව්වා, එතුමන්ලා මේ පනත් කෙටුම්පතට එකඟයි, කැමැතියි, විරුද්ධත්වයක් නැහැ කියලා. හැබැයි, මේ යෝජනාව 2003දී ILO එකෙන් ratify කරපු දවසේ ඉඳලා අද වනකොට කොපමණ කාලයක් ගත වෙලා තිබෙනවාද, ඒ කාලය ඇතුළත තිබුණේ කාගේ ආණ්ඩුද කියලා අපි අහන්න කැමැතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කාලයේ තිබුණේ අපේ ආණ්ඩුව නොවෙයි. 2004 වසර වෙනකන් තිබුණේ එතුමන්ලා පංගුකාරයෝ වෙච්ච එතුමන්ලාගේ ආණ්ඩුව. ඒ වාගේම නැවත 2015දීත් එතුමන්ලා සම්බන්ධ වෙලා ආණ්ඩු කළා. ඒ කොයි අවස්ථාවකදීවත් එතුමන්ලා ඔය හොඳයි කියන නීති, මේ රටට හිතකර දේවල්, රටේ ආර්ථිකය දියුණු කරන්න අවශ්‍ය කටයුතු, මේ රට ඉදිරියට ගෙන එන්න අවශ්‍ය කටයුතු කරලා තිබුණේ නැහැ. නමුත්, දැන් හරි අපි කරන දේට එකඟ වෙන එක ගැන අපි ස්තුතිවන්ත වෙනවා. කොහොම වුණත්, අපට කියන්න තිබෙන කාරණය මේකයි. එතුමන්ලා හැම තිස්සේම කියන කථාවක් තමයි අපි ආධුනිකයි, අපේ ආණ්ඩුව ආධුනිකයි කියන එක. එතුමන්ලා හරි පළපුරුදුයි කියන එක නේ ඒකෙන් කියන්නේ. හැබැයි, ඒ පළපුරුදුයි කියන අයගේ කෙරුවාව තමයි මම දැන් කිව්වේ. මෙතෙක් කාලයක් මේ වාගේ දෙයක්වත් රටේ නීතිගත කරන්න කිසිම ක්‍රියාමාර්ගයක් ගන්නේ නැතිව ඉඳලා, දැන් පළපුරුද්ද ගැන කථා කරනවා.

ඒ වාගේම දැන් අධිකරණය සම්බන්ධයෙනුත් අලුතෙන්ම ප්‍රශ්නයක් ඇති කරගෙන තිබෙනවා. දැන් කියන්නේ මොකක්ද? විපක්ෂයට ඕනෑකම තිබෙනවා, මේ කාරණය පිළිබඳව නීතිඥ

සංගමයත් එක්ක සාකච්ඡා කරන්න. නීතිඥ සංගමය ඒ ගැන සාකච්ඡා කරන්න විපක්ෂ නායකතුමාගෙන් අවස්ථාව ඉල්ලුවාය කියලා තමයි කියන්නේ. විපක්ෂ නායකතුමාට හෝ විපක්ෂයට මේ කාරණය සම්බන්ධයෙන් කථා කරන්න ඕනෑ නම්, - *[බාධා කිරීමක්]* අපි වාගේම එතුමන්ලාත් ජනතා ඡන්දයෙන් මේ සභාවට පත් වෙලා ඉන්න ජනතා නියෝජිතයෝ; ව්‍යවස්ථාදායකය නියෝජනය කරන්න, ජනතාව එතුමන්ලාවත් පත් කරලා එවලා තිබෙනවා. එතුමන්ලා මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් ආණ්ඩුවත් එක්ක කෙළින්ම කථා කරන්නේ නැත්තේ ඇයි? නීතිඥ සංගමයේ blanket cover එකෙන්, ඒ ආවරණයෙන් ඉදිරිපත් වෙන්න හදන්නේ ඇයි? මේකට නැති සුජාතභාවයක් එතුමන්ලාගේ තර්කය වෙනුවෙන් ගොඩනඟා ගන්න, නීතිඥ සංගමය තමන්ගේ අතකොළුවක් විධියට පාවිච්චි කරන්න විපක්ෂය උත්සාහ දරනවා. අපිට ඒක හොඳට පෙනී යනවා. ඒ ගැන කියලා තමයි දැන් වෙනකොට මේක වෙනම පැත්තකට හරවා ගෙන, තමන්ට කෙළින් කථා කරන්න බැරි වෙලා තිබෙන්නේ.

දැන් ලොකුම කථාව බැලුවොත්, විපක්ෂයට මේ අධිකරණ භීතිකාවක් ඇවිල්ලා තිබෙන්නේ ඇයි? අපි දන්නවා, පොදුවේ සමාජයේ තිබුණු අදහස තමයි යම් කිසි නීතියක් ක්‍රියාත්මක වුණොත්, "ඕවා ඔක්කොම පොඩි මිනිහාට" කියන එක. පොල් ගෙඩියක් හොරකම් කළොත් හොරකම් කළ කෙනාට අනිවාර්යයෙන්ම දඬුවම් ලැබෙනවා, රට උළා කාපු හොරුන්ට කවදාවත් දඬුවම් ලැබුණේ නැහැ කියලා තමයි හිතා ගෙන හිටියේ. හැබැයි ඒක එහෙම නොවෙයි, නීතිය කොයි කාටත් එකයි කියන එක මේ ආණ්ඩුවෙන් ඔප්පු කරලා තිබෙනවා. මා නියෝජනය කරන මහනුවර දිස්ත්‍රික්කය උදාහරණයකට ගත්තොත්, ඊයේ පෙරේදා කෙහෙළිය රඹුක්වැල්ල හිටපු ඇමතිවරයාට දෙවැනි වතාවටත් චෝදනා නැඟුවා. ඒ වාගේම තමයි, නාවලපිටිය ප්‍රදේශය තුළ තම බලය කවදාවත් හොල්ලන්න බැරි වෙයි කියලා හිතපු මහින්දානන්ද අලුත්ගමගේ දැන් ඉන්නේ හිරේ. මේවා කවදාවත් ඒ අය බලාපොරොත්තු වෙච්ච දේවල් නොවෙයි. ඒවා කෙරෙනකොට අපේ ආණ්ඩුව වැටෙයි කියලා හිතාගෙන කටයුතු කරනවා. අපේ ආණ්ඩුව වට්ටන්න නොවෙයි, අපිට අමාරු කරන්න එතුමන්ලා කටයුතු කරනවා. කොච්චර අමාරු කළත් අපි භය නැහැ. එදා ඉඳලා කිසිම ප්‍රතිලාභයක් බලාපොරොත්තු නොවී, කහට කොප්පයෙන්, බුලත් විටෙන් වේලක් පිරිමහගෙන වැඩ කරන අපේ පක්ෂයේ ක්‍රියාකාරීන් ඉන්නවා. අපි හැම දාමත් ශක්තිමත්ව ඉන්නවා. මේ ජනතා වරම; ජන බලය වැටෙන්න දෙන්නේ නැහැ. අපි අනිවාර්යයෙන් අපේ වගකීම්, යුතුකම් සියල්ල ඉෂ්ට කරනවා. ආණ්ඩුව වැටෙයි කියලා විපක්ෂය හිතනවා නම් එතුමන්ලා ආණ්ඩුව ගන්න සූදානම් වෙන්න ඕනෑ. එතුමන්ලාගේ සූදානම කෝ? එතුමන්ලාට shadow Cabinet එකක් තිබෙනවාද? නැහැ. ආණ්ඩුව වැටෙන්නේත් නැහැ, ආණ්ඩුව හෙල්ලෙන්නේත් නැහැ කියන එක දැන දැන තමයි එතුමන්ලා මෙහෙම කථා කරන්නේ. හැබැයි එතුමන්ලා ජන මනසේ හොල්මන් මවනවා.

ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය කියන කුලුනු තුනෙන් එකක් වන අධිකරණයේ ප්‍රධානියා වන ගරු අගවිනිසුරුතුමා සම්බන්ධයෙන් මෙතැන අද උදේ ඉඳලා කථාවක් තිබුණා. එතුමාව අවුරුදු 20කට හිරේ යවන්න පුළුවන් කියලා මෙතැන කථා කරමින් කරුණු කියනවා. ඒ වාගේම, "නැහැ, නැහැ, නැහැ. එහෙම කිව්වේ මේ සමාජ මාධ්‍යවල තිබෙන කාරණා නිසා" කියලා විපක්ෂයේ ගරු මන්ත්‍රීවරු ඊට පස්සේ කරුණු දක්වනකොට කියනවා. පලෙයිවල සිද්ධියක් කියලා ඒ අදාළ තැනැත්තන්ට විරුද්ධව නීතිය ක්‍රියාත්මක වෙලා තිබෙනවා. තවදුරටත් සමාජ මාධ්‍යවල තිබෙන දේවල් මෙතැන ඇවිල්ලා සභාගත කරලා ජනතාව නොමඟ යවන්න ඒවා ඇත්තක් කියලා පෙන්වන්න හදන එක වාගේම තහවුරු කරගත්තේ නැති තොරතුරු මත මේ විධියට කටයුතු කරන එක අපි තරයේ හෙළා දකිනවා. අපි ඒ ගැන කනගාටු වෙනවා. ඒ වාගේම, මේ විධියේ තහවුරු නොවුණු නිකම් ඕපාදූප කථාවල් මේ සභා ගැබේ කියලා ගරු අග විනිසුරුතුමාට අපහාසයක් වෙන විධියට අද කරුණු ඉදිරිපත් කිරීම ගැනත් අපි කනගාටු වෙනවා. අධිකරණයේ ස්වාධීනත්වය ගැන හඬ තලන අයගේ දැන් තත්ත්වය මොකක්ද? අපේ නීතිඥ සංගමයේ අදහස මොකක්ද? මමත් එහි විධායක කමිටු සාමාජිකාවක්ව සිටියා. අධිකරණයේ ස්වාධීනත්වය ගැන කථා කරනවා නම්, මේවාට විරුද්ධවත් අපි කථා කරන්න ඕනෑ කියලා ප්‍රකාශ කරමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඔෂානි උමංගා මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.39]

**ගරු ඔෂානි උමංගා මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா)
(The Hon. (Mrs.) Oshani Umanga)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින මෙම විවාදයේදී නාමල් රාජපක්ෂ මැතිතුමා විසින් විමසන ලද ළමා ශ්‍රමයට අදාළ නඩු සම්බන්ධ ප්‍රශ්නයට පිළිතුරක් ලබා දෙමින්, මගේ කථාව පටන් ගන්නම්. එතුමා විමසන පරිදි, ළමා ශ්‍රමයට අදාළ නඩු සම්බන්ධව සම්පූර්ණ පැමිණිලි 43ක් ලැබිලා තිබෙනවා. විමර්ශනය කරන ලද පැමිණිලි 34යි. දැනට පවත්නා විමර්ශන 8ක් තිබෙනවා. ඒවායින් ළමා ශ්‍රමය ලෙස හඳුනාගන්නා ලද අවස්ථා එකක් පවතිනවා. ඒ වාගේම මම එතුමාට තවත් සංඛ්‍යාලේඛනයක් ඉදිරිපත් කරන්න කැමැතියි. ඒ තමයි, අපි "රටම එකට" මත්ද්‍රව්‍ය ජාතික මෙහෙයුම හැදුවාට පස්සේ 2025.10.30 වන දිනට ළමුන් මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනීමට අදාළ වාර්තාවේ තිබෙන සංඛ්‍යාලේඛනය. මොකද, පසුගිය කාලයේ පාතාලය, විෂ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් සහ දේශපාලනඥයා කියන තුන්ගොල්ලෝ එක කුස උපන් නිවුන් සහෝදරයෝ වාගේ තමයි කටයුතු කරමින් සිටියේ. හෙරොයින් සම්බන්ධව අවුරුදු 14 සිට අවුරුදු 18 දක්වා පිරිමි දරුවෝ 90ක්ද, ගැහැනු දරුවෝ එක්කෙනෙක්ද, අයිස් සම්බන්ධව පිරිමි දරුවෝ 243ක්ද, ස්ත්‍රීන් හා ගංජා සම්බන්ධව පිරිමි දරුවෝ 320ක්ද, ඒ වාගේම වෙනත් මත්ද්‍රව්‍ය සම්බන්ධව පිරිමි දරුවෝ 140ක්ද අත්අඩංගුවට අරන් තිබෙනවා. අවුරුදු 18-24 අතර පිරිමි දරුවෝ 8,932ක් සහ ගැහැනු දරුවෝ 173ක් ඇතුළු සම්පූර්ණ වශයෙන් 9,105ක දරුවන් ප්‍රමාණයක් විෂ මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් අත්අඩංගුවට ගන්න සිදු වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය ඉතාම ඛේදජනක තත්ත්වයක්. පසුගිය කාලයේ අපි දැක්කා, විෂ මත්ද්‍රව්‍ය සම්බන්ධ ජාවාරම්කරුවන්ගේ නිවෙස් වටලනකොට එතුමාගේ අප්පච්චි හෙලිකොප්ටරයෙන් බැහැලා ගිහිල්ලා සිප වැළඳගෙන ඔවුන්ව ආරක්ෂා කළේ කොහොමද කියලා. ජනතාවගෙන් ලැබෙන තොරතුරු ජාලයේ ශක්තිමත්භාවය මත තමයි එහෙම පවත්වාගෙන ආපු ජාලය කොඳු නාරටියෙන් සහමුලින්ම බිඳ දමන්න අපේ ආණ්ඩුව කටයුතු කරමින් ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙලෙස ඉදිරිගාමී වැඩ පිළිවෙළක් සහිතව අපේ ආණ්ඩුව කටයුතු කරමින් යනකොට සමහරු බලාගෙන ඉන්නවා, අගෝස්තු මාසයේ ජනාධිපති වෙන්න. තවත් සමහරු බලාගෙන ඉන්නවා, දෙසැම්බර් මාසයේ ජනාධිපති වෙන්න. තවත් සමහරු ඊළඟ අවුරුද්දේ ජනාධිපති වෙන්න බලාගෙන ඉන්නවා. රට බංකොලොත් කරපු සීයලා

[ගරු ඔෂානි උමංගා මහත්මිය]

බලාගෙන ඉන්නවා, නැවත වාරයක් මේ රට බංකොලොත් වෙනකල්. ජනතාවගේ බදු මුදල්වලින් රට සවාරි ගිහිල්ලා ඒ පිළිබඳ නඩු විභාග වනකොට සීයාට තිබෙන ලෙඩවල තත්ත්වය කොහොමද කියලා මුළු ලෝකයටම දැනගන්න නීතිඥවරුන් වාර්තාවක් ඉදිරිපත් කළා. ඒත් එක්කම අපි කියන්න කැමැතියි, ලෙඩ කන්දරාවක් දරාගෙන ඉන්න ගමන් අපේ ආණ්ඩුව වැටෙනකල්, මේ රට වැටෙනකල් වියරු වැටිලා වාගේ බලාගෙන ඉන්න නිසා රනිල් වික්‍රමසිංහ මහත්මයා වැඩි කාලයක් යන්න ඉස්සෙල්ලා මානසිකව වැටිලා ඔළුව පළා ගන්නවා කියන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ පනතට ගෙනෙන සංශෝධන විවාදයට ගන්නා මේ මොහොතේ, අපි අපේ රටේ දරුවන්ගේ අනාගතය, ආරක්ෂාව සහ අයිතිවාසිකම් සම්බන්ධව විශේෂයෙන් සාකච්ඡා කළ යුතුව තිබෙනවා. මෙම මුල් පනත මඟින් වයස අවුරුදු 16ට අඩු දරුවන් සේවයේ යෙදවීම සම්පූර්ණයෙන්ම තහනම් කෙරෙන අතර, වයස අවුරුදු 18ට අඩු දරුවන් සඳහා සේවායෝජකයන් අනුගමනය කළ යුතු නීති සහ රෙගුලාසි නියම කර තිබෙනවා. මෙම මුල් පනත සහ එහි රෙගුලාසිවලට අනුව අදාළ වයස් සීමාවේ ළමයින්, තරුණයින් සෞඛ්‍ය, ආරක්ෂාව සහ සදාචාරයට හානි වන ආකාරයේ අනතුරුදායක රැකියාවල යෙදවීම දඬුවම් ලැබිය හැකි වරදක් බවට ප්‍රකාශ කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2006 අංක 24 දරන පනත යටතේ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග මඟින් වයස අවුරුදු 16-18 අතර දරුවන් අන්තරායකාරී රැකියාවල යෙදවීම තහනම් කරන අතර, අන්තරායකාරී වන රැකියා 51ක් සම්බන්ධව වාර්තා කර තිබෙනවා. ඒක තවත් පුළුල් කරමින් 2021.11.18වන දින අතිවිශේෂ ගැසට් පත්‍රයක් මඟින් අන්තරායකාරී රැකියා ලැයිස්තුව රැකියා 71ක් දක්වා වැඩි කර තිබෙනවා. මෙම පනතේ වැරදිවලට අධිකරණය විසින් නියම කළ දඩ මුදල අවසන් වරට සංශෝධනය කර තිබුණේ, 2003 අංක 8 දරන සංශෝධන පනත මඟින්. ඒ කියන්නේ, වසර 23කට ඉස්සෙල්ලා එකල පැවති සමාජ හා ආර්ථිකය තත්ත්වය පසුබිම් කරගෙන තමයි එම දඩ මුදල තීරණය කරනු ලැබුවේ. අද වනකොට මේ දඩ මුදල සංශෝධනය විය යුතුව තිබෙනවා.

ලෝක වෙළෙඳ පොළ, යුරෝපා සංගමය, අනික් බටහිර රටවල්, භාණ්ඩ ආනයනය කිරීමේ supply chain එක විසින් ඒ සුපිරිසිදුභාවය, මානව හිමිකම් තත්ත්වයන් දැඩිව පරීක්ෂා කරනු ලබනවා. අපේ රටේ තීරු බදු සහනය - GSP Plus - අඛණ්ඩව පවත්වාගෙන යාම සහ ඉදිරි සාකච්ඡා සාර්ථක කර ගැනීමට නම්, අපේ නිෂ්පාදන ක්‍රියාවලිය ඇතුළේ ළමා ශ්‍රමය කිසිදු ආකාරයකින් භාවිත නොකරන තත්ත්වයක් අපි හුවා දැක්විය යුතුයි. අපේ අපනයනය ජාත්‍යන්තරයේ පිළිගැනීමට ලක්ව ඇත්තේ, උසස් කම්කරු ප්‍රතිපත්ති අපි අනුගමනය කරන නිසායි. එම වෙළෙඳ පොළ රැක ගනිමින් අපේ ආර්ථිකය ඉතා ශක්තිමත්භාවයකට මේ වනකොට පත් කර තිබෙන නිසා අපි මෙම පනත් කෙටුම්පත සම්මත කර ගැනීම පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව කළ යුතු බව ගරු සභාවට දන්වා සිටිනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු එම්.ඒ.එම්. තාහිර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.45]

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பெண்களையும், இளம் ஆட்களையும் மற்றும் பிள்ளைகளையும் தொழிலுக்கமர்த்துதல் (திருத்தம்) சட்டமூலம் இன்று விவாதத்துக்கு எடுத்துக்கொள்ளப்பட்டு இருக்கின்றது. சிறுவர்கள் மற்றும் பெண்களை அபாயகரமான தொழில்களில் அமர்த்துவதிலிருந்து பாதுகாப்பதற்காக குறித்த தண்டப் பணத்தை அதிகரிக்கும் நோக்கிலேயே இந்தத் திருத்தச் சட்டமூலம் கொண்டுவரப்பட்டு இருக்கின்றது. இவ்வாறான விடயங்களைக் கொண்டுவருகின்ற இந்த அரசாங்கத்துக்கு எங்களுடைய வாழ்த்துக்கள்! இதுபோன்று இந்த நாட்டில் பல பிரச்சினைகள் தொடர்ந்துகொண்டே இருக்கின்றன. அவற்றுக்கும் தீர்வு காணுமாறுதான் நாங்கள் கூறுகின்றோம்.

சிறுவர்களையும் பெண்களையும் பாதுகாப்பதற்கு நாங்கள் எடுத்திருக்கின்ற நடவடிக்கைகள் என்ன என்பதைத்தான் நாங்கள் பார்க்க வேண்டும். தண்டிப்பதைவிட, சிறுவர்கள் மற்றும் பெண்களுக்கான பாதுகாப்பு என்ன என்பதே முக்கியமானது. எனவே, நாங்கள் இந்த விடயத்தை முன்கொண்டு செல்லவேண்டிய தேவை இருக்கின்றது. குறிப்பாக, அவர்களுக்கான கல்வியைச் சரிவர வழங்குவோமாக இருந்தால், இந்தப் பிரச்சினைக்கான தீர்வை எங்களால் எட்ட முடியும். இன்று இந்த நாட்டில் இலவசக் கல்வி இருந்தாலும்கூட, பொதுமக்களை வறுமைக் கோட்டுக்குக்கீழ் கொண்டுசெல்கின்ற அளவுக்குப் பணம் கொடுத்து கல்வியைப் பெறவேண்டிய நிலைமையே இருக்கின்றது. அதேபோன்றுதான் சுகாதார சேவையும் இருக்கின்றது. நாங்கள் நினைப்பதுபோன்று சுகாதார சேவையும் இந்த நாட்டில் இலவசமாகக் கிடைப்பதில்லை என்பதை எல்லோரும் ஏற்றுக்கொள்ள வேண்டும்.

சுகாதாரத்துறை சார்ந்து கடந்த சில நாட்களாக தொடர்ச்சியாகப் பேசப்பட்டு வருகின்ற விடயம்தான், கல்முனை வடக்கு ஆதார வைத்தியசாலையில் இடம்பெற்ற சம்பவம். இவ்விடயம் சம்பந்தமாக சிறிது நேரத்துக்கு முன்னர் பேசிய கௌரவ சாணக்கியன் அவர்கள் பல விடயங்களைப் பேசியிருந்தார். தங்கள் பிரதேச அரச நிறுவனங்களுக்கு தமிழ் வைத்தியர்கள் மற்றும் ஏனைய தொழில்சார் தமிழ் உத்தியோகத்தர்கள் நியமிக்கப்படுவதை சம்மாந்துறை பிரதேச மக்கள் ஏற்றுக்கொள்வதில்லை என்ற விடயத்தை முன் வைத்திருந்தார். அவர் அந்த விடயத்தைத் தவறுதலாக எடுத்துக் கொண்டாரோ என்னவோ தெரியவில்லை அல்லது அவருக்கு தவறுதலாக தகவல் வழங்கப்பட்டிருக்கலாம்! தற்போது சம்மாந்துறை வைத்தியசாலையின் MSஆக Dr. Prabasankar என்ற ஒரு தமிழ் சகோதரரே இருக்கின்றார். அதேபோன்று, ZDEஆக மஹிந்த குமார என்ற தமிழ் சகோதரர் இருக்கின்றார். இவ்வாறு அங்கு இரண்டு தமிழ் சகோதரர்கள் தொழில்சார் உத்தியோகத்தர்களாக இருக்கின்றார்கள். அங்குள்ள மக்கள் சகவாழ்வை ஏற்றுக்கொண்டு இருக்கிறார்கள். எல்லோருடனும் இணைந்து வாழ்வதற்கான சந்தர்ப்பத்தை நாங்கள் வழங்கியிருக்கின்றோம்.

இந்த பத்தாவது பாராளுமன்றம் ஆரம்பித்த காலம்தொட்டு நாங்கள் பிரச்சினை பற்றி பேசி வருகின்றோம். பிரச் சினைக்குத் தீர்வு காண வேண்டும் என்பதை இங்கிருக்கின்ற அரசாங்க மற்றும் எதிர்த்தரப்பிலுள்ள சகல தமிழ், முஸ்லிம்

உறுப்பினர்களும் ஏகமனதாக ஏற்றுக்கொண்டு இருக்கிறார்கள். அவரவருடைய மதத்துக்கு ஏற்ற வகையில், கௌரவமாக ஆடைகளை அணிந்து வருவதற்கான சந்தர்ப்பத்தை ஏற்படுத்திக் கொடுக்கவேண்டிய பொறுப்பு இந்த அரசாங்கத்துக்கு இருக்கின்றது என்றுதான் எல்லோரும் பேசினார்களே தவிர, அதற்கு எதிரான கருத்தை யாருமே கூறவில்லை. சுகாதாரத் துறையில் 2019ஆம் ஆண்டு இனரீதியான பிரச்சினை ஏற்பட்டது உங்களுக்குத் தெரியும். 2022ஆம் ஆண்டும் அவ்வாறான பிரச்சினை ஏற்பட்டது. அவற்றுக்குத் தீர்வு காண்கின்ற விடயத்தில் இப்பொழுது இருக்கின்ற சுகாதார அமைச்சின் செயலாளரும் முக்கிய ஒருவராக இருந்திருக்கிறார். அவரை நம்பி நாங்கள் இந்தப் பிரச்சினைக்குத் தீர்வு காண முடியாது. எனவே, நான் இவ்விடத்தில் ஒரு விடயத்தைக் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

முப்பது வருடங்களுக்கு முன்னர், நிந்தவூர் பிரதேசத்தில் தமிழ் மக்களுடைய இந்துக் கோவிலொன்று நாட்டில் நிலவிய அசாதாரண சூழ்நிலை காரணமாக செயலிழந்து காணப்பட்டது. ஆறு மாதங்களுக்கு முன்பு, வெளிநாட்டில் வாழுகின்ற தமிழ் மக்களுடைய நிதியைக்கொண்டு மிகப் பிரமாண்டமான முறையில் புனருத்தாரணம் செய்யப்பட்டு, இப்பொழுது மக்கள் அதில் வழிபடுவதை நாங்கள் பார்க்கின்றோம். அந்தப் பிரதேசத்தில் இருக்கின்ற 99 சதவீதமான முஸ்லிம் மக்கள் இன்றுவரை அதற்கு எந்தவித எதிர்ப்பையும் வெளிக்காட்டாத வகையில்தான் வாழ்ந்து வருகின்றார்கள். சுமார் 1,000 மக்கள் வாழ்கின்ற அந்தப் பிரதேசத்தில் எந்தவிதமான எதிர்ப்பையும் காட்டாமல் அவர்களுக்கு ஆதரவாகவே நாங்கள் செயற்பட்டு வருகின்றோம்.

நிந்தவூர் என்பது கிழக்குப் பிராந்தியம்; கல்முனையை அண்மித்த பகுதி. கல்முனையிலும் இவ்வாறானதொரு நிலைமையைத்தான் நாங்கள் பார்க்கின்றோம். இன்று இந்தப் பிரச்சினையின் பின்னணி பற்றி பார்க்க வேண்டும். எங்களுக்குள் இருக்கின்ற பிரச்சினைகளைத் தீர்க்க வேண்டுமென்ற அடிப்படையில், 6 தமிழ் பேசும் கட்சிகள் ஒன்றுசேர்ந்து இருப்பது, முஸ்லிம் சகோதரர்களுக்குள் இருக்கின்ற ஒருசிலருக்கும் தமிழ் மக்களுக்குள் இருக்கின்ற ஒருசிலருக்கும் பிடிப்பில்லாமல் இருக்கின்றது. அதனை நாங்கள் சிலரது பேச்சுக்கள் மூலமும் social mediaஇல் வெளிவருகின்ற விடயங்கள் மூலமும் பார்க்கின்றோம். அதுபோன்றதொரு நிலைமை இந்த அரசாங்கத்துக்கும் இருக்கின்றதா? என்ற சந்தேகம் காணப்படுகின்றது. அதனால்தான் குறித்த முஸ்லிம் பெண் உத்தியோகத்தர்களை 'தற்காலிக இடமாற்றம்' என்று கால நீடிப்பைச் செய்து இருக்கிறார்கள். இந்தப் பிரச்சினைக்கு எரியூட்டுகின்ற ஒரு செயற்பாடாகவே நாங்கள் இதனைப் பார்க்கவேண்டி இருக்கின்றது.

குறித்த 9 சகோதரிகளுக்குமான நீதியை மாத்திரம் நாங்கள் கேட்கவில்லை. எதிர்வருகின்ற காலங்களில் இவர்களைப் போன்ற பல்லாயிரக்கணக்கான எங்களுடைய சமூகம் சார்ந்தவர்களுடைய ஆடை விடயத்திலும் ஏனைய கலாசார விடயங்களிலும் பிரச்சினைகள் ஏற்பட்டுவிடக் கூடாது என்பதற்காகவே அதற்கு உரிய தீர்வைப் பெற்றுத்தருமாறு நாங்கள் இந்த அரசாங்கத்திடம் கேட்கின்றோம். சக வாழ்வையும் இனரீதியான ஒற்றுமையையும் ஏற்படுத்துவோ மென கூறுகின்ற இந்த அரசாங்கம், இதற்கான நிரந்தரத் தீர்வை வழங்குவதற்கு ஏன் தயங்குகின்றது? என்ற கேள்வியை முன்வைத்து விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! අද දින විවාදයේ වැඩකටයුතු අවසන් වනතෙක් කාලය දීර්ඝ කර ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (නීතිඥ) ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.51]

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විශේෂයෙන්ම අද උදෑසනත් මේ කාරණය සම්බන්ධයෙන් කථා වුණා. ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් ලියුමක් එවා තිබෙනවා. ඇත්තටම මේ ලියුම එවා තිබෙන්නේ විපක්ෂ නායකතුමාට. මාධ්‍ය මඟින් තමයි අපි මේ ලියුම දකින්නේ. විපක්ෂ නායකතුමාට එවා තිබෙන ලියුමේ මෙහෙම කියා තිබෙනවා: "However, in light of the proceedings in Parliament today, i.e. 19.08.2026, and the position of the Government expressed threat,…" මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් මම ඊයේත් මේ පාර්ලිමේන්තුවේදීම කථා කළා. ඒ අවස්ථාවේදී ඇත්තටම නීතිඥ සංගමයට නොවෙයි, විපක්ෂ නායකතුමාට තමයි මම නිවැරදි කිරීමක් කළේ. මොකද, එතැනදී එතුමා කිව්වා, වෙලාව සම්බන්ධ ප්‍රශ්නයක් තමයි තිබුණේ කියලා. අපි එතුමාට මතක් කරලා දුන්නා, නැහැ, එහෙම නොවෙයි, නීතිඥ සංගමය මීට පෙර ලියුමකින් සාකච්ඡා bipartisan වෙන්න ඕනෑ කියලා කියා තිබෙනවාය කියන එක. ඒ ස්ථාවරයේ නීතිඥ සංගමය රැඳෙනවා නම් අපි කැමතියි කියන එක තමයි මම ඇත්තටම එතුමාට මතක් කරලා දුන්නේ. අපි පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හැටියට පාර්ලිමේන්තුවේ මේ කරන ප්‍රකාශ threat එකක් කියලා කොහොමද සලකන්නේ කියන කාරණය මම හිතන්නේ අප පැහැදිලි කරන්නට ඕනෑ. විශේෂයෙන්ම මීට පෙර නජිත් ඉන්දික මන්ත්‍රීතුමා කථා කරද්දී කිව්වා, නීතිඥ සංගමයේ සභාපතිතුමාගෙන් විමසීමක් කළාම එතුමා ඒක "threat" නොවෙයි, "thereat" වෙන්න පුළුවන් කියලා කිව්ව කාරණය "ඩේලි නිවුස්" සහ "දිනමිණ" පුවත් පත් වාර්තා කර තිබෙනවාය කියලා. නමුත්, නැවතත් එතුමා තමන්ගේ ස්ථාවරයේ මාර්ගය වෙනස් කරලා තිබෙනවා, නැහැ ඒක "thereat" නොවෙයි, "threat"ම තමයි කියලා.

Hon. Presiding Member, I think this is reaching ridiculous limits. We are discussing a Constitutional Amendment here. The BASL is representing lawyers. What is this ridiculousness? They are trying to engage Parliament, of all places. So, they have to be very clear about their stances, be very transparent in what they want to tell us and if there was a threat, they have to tell us what the threat was. What the Hon. Leader of the House raised here in Parliament was that there was a procedural

[ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය]

error in the way Parliament was approached. There was a procedural error. This is very unfortunate, Sir, because lawyers are supposed to be experts on procedures. This is procedure that we are talking about. If the BASL was not aware of Parliamentary procedure, that is really unfortunate, very unfortunate! If the BASL was trying to undermine Parliamentary procedure, that is even more unfortunate. So, we have to be very clear about that. The BASL also has to be very clear on that. The point raised was that it appeared to the Government that the BASL was continuously corresponding with the Leader of the Opposition on engaging Parliament. They were engaging with the Leader of the Opposition; they were corresponding with him to engage Parliament. Why is that? Parliament has a Speaker. So, first, the Speaker has to be approached, if they want to engage with Parliament, but that was not done. There was some suggestion made to the Opposition, and the Leader of the Opposition today clarifies that he did not intend to do that, that he knows he does not have the power to convene everybody and was just trying to be a facilitator. What is this nonsense? This is utter nonsense! This is undermining Parliament and Parliamentary conduct. The BASL should know whom to write first. That is the first thing that should be done. And, if they want to be bipartisan about their engagement, then they should have written to the Government Party as well. Had they done that? No. They are corresponding with the Leader of the Opposition to somehow reach the Government and have a bipartisan engagement. We do not take that seriously. We do not think that that is a genuine engagement. I think they are undermining Parliament and the functions of the Members of Parliament. And, now, they are saying that we raised the issue with the Leader of the Opposition, that we did not raise it with the BASL directly. Honestly, we do not want to; we do not have to. Whom we have to engage with is the Leader of the Opposition, who brought the matter to this Chamber. When we raised it with the Leader of the Opposition, now, they are saying it was a threat. What was the threat, we want to know. And, was the word "threat" or "thereat"? ඒක "threat" ද, "thereat" ද? ඒක හරියට කියන්න. The BASL has to say that.

Sir, they issued several press releases asking for audio recordings, uninterrupted audio recordings and clear audio recordings of the meeting they had with the President from the President's House. They were asking the President's Media Division, which is supposed to cover the President, to cover them also. That was the audacity they had! Never mind, but the President was graceful enough to accommodate them; the President's Office was graceful enough to accommodate them. And, now, they are trying to undermine Parliament. Let me also remind you, they have already accommodated, undermining the Judiciary; they have already accommodated that. This is a disgraceful behaviour! This is not expected from the BASL and the Members of the BASL should take note of this. So, we urge, since this involves Parliament and the Members of Parliament, including the Leader of the House as well, that Mr. Rajeev Amarasuriya, President of the BASL, clarifies what exactly the threat was, as soon as possible.

Thank you, Sir.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මුහම්මද් ෆයිසාල් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.57]

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**
(மாண்புமிகு முஹம்மட் பைசல்)
(The Hon. Muhammad Faizal)

*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

அஸ்ஸலாமு அலைக்கும்! ආයුබෝවන්! வணக்கம்!

இன்று இந்தச் சபையில் 1956ஆம் ஆண்டின் 47ஆம் இலக்க, பெண்களையும் இளம் ஆட்களையும் மற்றும் பிள்ளைகளையும் தொழிலுக்கமர்த்துதல் சட்டத்தின் கீழ், குற்றங்களுக்கான அபராதத் தொகையைத் திருத்தம் செய்தல் தொடர்பான விவாதம் இடம்பெற்றுக்கொண்டு இருக்கின்றது. இன்றைய விவாதத் தலைப்புக்கு அப்பாற்பட்ட இரண்டு விடயங்கள் இங்கு பேசப்படுகின்றன. ஒன்று, நீதியரசர்கள் மற்றும் நீதிபதிகளின் ஓய்வுபெறும் வயது சம்பந்தமான விடயம். மற்றையது, கல்முனை வடக்கு ஆதார வைத்தியசாலையில் இடம்பெற்ற விடயம்.

கல்முனை ஆதார வைத்தியசாலையில் இடம்பெற்ற விடயத்தை எடுத்துக்கொண்டால், தற்போதைய அரசாங்கத்தில் அமைச்சராக இருக்கின்ற கௌரவ விஜித ஹேரத் அவர்கள் 2005ஆம் ஆண்டில் கலாசார அமைச்சராக இருந்தபோது, பாடசாலையில் கல்வி கற்கும் முஸ்லிம் மாணவிகளுக்கு சீருடைக்கு மேலதிகமாக 'பர்தா'வுக்கான துணியைக் கொடுப்பதற்கான யோசனையை முன்மொழிந்தார். அன்று தொடக்கம் இன்றுவரை முஸ்லிம் மாணவிகளுக்காக 'பர்தா' துணி வழங்கப்பட்டு வருகின்றது. 1980களில் உருவாக்கப்பட்ட குறித்த விதிமுறை இந்த அரசாங்கத்தால் உருவாக்கப்பட்டதல்ல. இதற்கு முன்னர் இருந்த 'நல்லாட்சி' அரசாங்க காலத்திலும் 'ஹிஜாப்' சம்பந்தமான பிரச்சினைகள் எழுந்தன. உதாரணத்துக்கு, 2018ஆம் ஆண்டு திருகோணமலையிலுள்ள ஸ்ரீ சண்முகா இந்து மகளிர் கல்லூரியில் 'ஹிஜாப்' அணிந்து வருவதற்கு தடைவிதிக்கப்பட்டு இருந்தது. அந்த நேரத்திலும் இவ்வாறான விவாதங்கள் இடம்பெற்றன. இன்று கல்முனை வடக்கு ஆதார வைத்தியசாலையில் இடம்பெற்ற பிரச்சினை பற்றி பெரிதாக விவாதிக்கின்ற எதிர்க்கட்சியில் இருக்கின்ற எமது முஸ்லிம் MPsகூட அந்தக் காலத்தில் அமைச்சரவை அமைச்சர்களாக இருந்தவர்கள். இவர்கள் நீண்ட காலமாக சாதாரண அமைச்சர்களாக அல்லாமல் பலமிக்க அமைச்சர்களாக இருந்தார்கள். நீதி அமைச்சராகக்கூட இருந்திருக்கிறார்கள்.

அப்போது அரசாங்கத்தில் பலமிக்க Cabinet அமைச்சர்களாக இருந்தவர்களால்கூட, 2018ஆம் ஆண்டு திருகோணமலை ஸ்ரீ சண்முகா இந்து மகளிர் கல்லூரியில் ஏற்பட்ட 'அபாயா' தொடர்பான பிரச்சினையைத் தீர்க்க முடியவில்லை. அவர்கள் இன்று இந்தச் சபையில் எங்களுடைய அரசாங்கத்தையும் அரசாங்கத்தின் நடவடிக்கைகளையும் விமர்சித்துக்கொண்டு இருக்கின்றார்கள். கல்முனை வடக்கு ஆதார வைத்தியசாலையில் ஏற்பட்டுள்ள பிரச்சினைக்கு இப்போது எடுக்கப்பட்டு இருக்கின்ற தீர்வானது தற்காலிகமானதே ஒழிய, நிரந்தரமானது அல்ல. இதற்கான நிரந்தரத் தீர்வைக் காண்பதற்கு நாங்கள் கௌரவ அமைச்சருடனும்

அரசாங்கத்துடனும் பேசிக்கொண்டு இருக்கின்றோம். வளமான நாடு - அழகான வாழ்க்கையை உருவாக்கும் இந்த அரசாங்கம் இந்தப் பிரச்சினைக்கு நல்லதொரு தீர்வைக் காணும் என்பதில் எந்தவித சந்தேகமும் இல்லை.

இங்கு அதிகமாகப் பேசப்படுகின்ற இன்னொரு விடயம்தான், நீதிபதிகளின் ஓய்வுபெறும் வயதெல்லையை அதிகரிப்பது தொடர்பான விடயம். இது குறித்துப் பேசுகின்றவர்கள், தமக்கு என்ன நடக்குமோ என்ற பயத்தில் கதைத்துக்கொண்டு இருக்கின்றார்கள். கடந்த கால அரசாங்கத்தினர், தங்களுக்குச் சார்பாகத் தீர்ப்பு வழங்கவில்லை என்று சொல்லி, 2013ஆம் ஆண்டு பிரதம நீதியரசராக இருந்த சிராணி பண்டாரநாயக்க அவர்களுக்கு எதிராகப் பாராளுமன்றத்தில் குற்றப் பிரேரணையைக் கொண்டுவந்து, அவரைப் பதவி நீக்கம் செய்தது மாத்திரமல்ல, அந்தப் பதவிக்கு மொஹான் பீரிஸ் அவர்களை நியமித்தார்கள். பின்னர் ஆட்சிக்கு வந்த மைத்திரிபால சிறிசேன தலைமையிலான 'நல்லாட்சி' அரசாங்கம், சிராணி பண்டாரநாயக்கா அவர்களுக்கு நடந்தது அநியாயம் என்று சொல்லி, அவரை மீண்டும் பிரதம நீதியரசர் பதவியில் அமர்த்தியது. அந்தப் பதவியில் ஒருநாள் இருந்துவிட்டு அவர் ஓய்வு பெற்றார்.

இன்று நீதிபதிகளின் விடயத்தில் முதலைக்கண்ணீர் வடிக்கிறார்கள். இவர்கள் முதலைக்கண்ணீர் வடிப்பது நீதிபதிகளுக்காக அல்ல, தாங்கள் தப்பித்துக் கொள்வதற்காகத்தான்! இப்போது இருக்கின்ற நீதிபதிகள் மற்றும் நீதியரசர்கள் பதவியில் தொடர்ந்து இருந்தால், தாங்கள் செய்த குற்றங்களுக்கான தண்டனைகள் கிடைத்துவிடும் என்பதற்காகவே இவர்கள் இங்கு முதலைக்கண்ணீர் வடித்துக்கொண்டும் கோஷமிட்டுக்கொண்டும் இருக்கின்றார்கள் என்று கூறி, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 5.03]

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, வணக்கம்!

இன்றைய தினம் இச்சபையில் இடம்பெறுகின்ற பெண்களையும், இளம் ஆட்களையும் மற்றும் பிள்ளைகளையும் தொழிலுக்கமர்த்துதல் (திருத்தம்) சட்டமூலம் தொடர்பான விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதில் மிக மகிழ்ச்சி அடைகின்றேன்.

எங்களுடைய நாட்டில் மிகவும் நெருக்கடியான சூழ்நிலையில் சிறுவர்களும் பெண்களும் பல இடங்களில் வேலைசெய்துகொண்டு இருக்கின்றார்கள். இதன்போது, அவர்கள் எதிர்நோக்குகின்ற பிரச்சினைகளுக்குத் தீர்வு காணப்படாத நிலையில், தொடர்ச்சியாக துன்பங்களை அனுபவித்துக்கொண்டு இருக்கின்றார்கள். வட, கிழக்கில் இடம்பெற்ற யுத்தத்தில் பெற்றோரை இழந்த பல சிறுவர்கள் வேலைசெய்தே தங்கள் வாழ்நாளைக் கழிக்கவேண்டிய நெருக்கடியான சூழ்நிலையில் இருக்கின்றார்கள். இந்தச் சட்டத்திருத்தத்தின்மூலம் அவர்களுக்கான கல்வியை உறுதிப்படுத்துவதற்காக எடுத்திருக்கின்ற நடைமுறையை வரவேற்கின்ற அதேவேளை, அவர்களுடைய வாழ்வுக்கு அடிப்படையான சமாந்தரமான பாதைகளைச் செப்பனிட வேண்டிய தேவையும் இருக்கின்றது.

உண்மையிலேயே அவர்கள் வாழ்வதற்கு, கல்வி கற்பதற்குரிய கொடுப்பனவுகள் என்ன? அவர்கள் உறுதியாக, பாதுகாப்பாக வாழ்வதற்கான நடைமுறைகள் என்ன? என்பதை அறிந்து, அவற்றைச் சமாந்தரமாகக் கட்டியெழுப்ப வேண்டிய தேவை இருக்கின்றது. இவ்வாறான சட்டத்திருத்தத்தின்மூலம் அவர்களுக்கு எதிர்காலத்தில் மிகச் சிறந்த ஒளிமயமான வாழ்க்கையை உருவாக்குவதற்கு நாம் எமது பூரண ஆதரவை வழங்குவோம்.

அண்மையில் கல்முனை வடக்கு ஆதார வைத்தியசாலையில் ஏற்பட்ட பிரச்சினை சம்பந்தமாகவும் பேசவேண்டிய தேவை இருக்கின்றது. இன்றைய காலகட்டத்தில் இனங்களுக்கு இடையேயான சமத்துவமும் உரிமை பேணப்படுதலும் மதம் சார்ந்த விடயங்களும் மிக முக்கியமானவை; உணர்வுபூர்வமானவை. இந்த விடயம் தொடர்பில் சுகாதார அமைச்சினால் மிக அவசரமாக எடுக்கப்பட்ட நடவடிக்கையை நாம் வரவேற்கின்றோம். ஏனென்றால், கௌரவ அமைச்சருடைய பிரத்தியேகமான செயற்பாட்டின் ஊடாக அந்தப் பிரதேசத்தில் இனமுறுகல் ஏற்படாமல் பாதுகாத்து, இந்த விடயம் தற்காலிகமாக முடிவுக்குக் கொண்டுவரப்பட்டு இருக்கின்றது. இந்த இடத்தில் அவர் மிகச் சாதுரியமாகச் செயற்பட்டதை நான் வரவேற்கின்றேன்.

நான் சுகாதாரத்துறையில் வேலைசெய்தவன் என்ற அடிப்படையில் சில விடயங்களை இங்கு சொல்லவேண்டிய தேவை இருக்கின்றது. எதிர்பார்ப்புடன் வருகின்ற நோயாளிகளுக்கு நம்பிக்கையுடன் சமச்சீரான சேவையை வழங்கவேண்டிய ஓர் இடமாகவே வைத்தியசாலை இருக்கின்றது. நாங்கள் கல்வி கற்ற காலத்தில் - மிகுந்த போர்ச் சூழல் நிலவிய காலத்தில் - யாழ்ப்பாண வைத்தியசாலையின் ஒரு விடுதியில் இராணுவ வீரரும் விடுதலைப் புலிகள் இயக்கத்தைச் சேர்ந்த ஒருவரும் மிகவும் பக்கத்தில் இருந்து சேவைகளைப் பெற்றுக்கொண்டு இருந்த நேரத்தில், எனது வைத்திய நிபுணர் சொன்ன வார்த்தைகள் எனக்கு இப்போது நினைவுக்கு வருகின்றன. "இவர்கள் இரண்டு பேரும் வெவ்வேறு மொழிகளைப் பேசுகின்றவர்களாக இருந்தாலும், வெவ்வேறு இனத்தவர்களாக இருந்தாலும், உங்களுடைய சேவைகள் சமச்சீராக இருக்க வேண்டும்" என அப்போது அவர் குறிப்பிட்டது இன்றும் எனது மனதில் பசுமையாகப் பதிந்திருக்கின்றது. வருகின்ற நோயாளிகளுக்கு மிக நம்பிக்கையுடன் சேவை வழங்கவேண்டிய சேவை வழங்குநர்கள், தங்களது அடையாளங்களை அடையாளப் படுத்திக்கொள்வது பாதகமாக அமையும் என்ற சூழ்நிலையின் அடிப்படையில் தான், இந்தச் சீருடை முறைமைகள் சுகாதாரத் துறையில் கொண்டுவரப்பட்டது என்பதை நாம் ஏற்றுக் கொள்ள வேண்டும். இந்தச் சீருடை விடயத்தில் பிரச்சினைகள் இருந்தால், அவற்றை உரிய அமைச்சிடம் விண்ணப்பங்களாக முன்வைத்து, கடந்த காலங்களில் ஏற்பட்ட நெருக்கடிகளைத் தீர்ப்பதற்கு உரிய முறைகள் பின்பற்றப்பட்டு இருக்க வேண்டும்.

கல்முனை வடக்கு ஆதார வைத்தியசாலையில் நடந்த நிகழ்வைப் பாரியதோர் இனமுறுகலாக அல்லது இன, மத பேத பிரச்சினையாக எடுத்துக்கொள்ளாமல் முகநூல் அல்லது

[ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා]

social media இதனைக் கையாண்டிருக்க வேண்டும். சரி, அவைதான் அவ்வாறு கையாண்டு இருந்தாலும்கூட, அதனைப் பின்பற்றி அரசியல்வாதிகள் இங்கு அந்த விடயத்தைக் கொண்டுவந்த நடைமுறைகள் மிக மோசமானவை. அந்த இடத்திலே கதைத்துப் பேசி, உரிய நடைமுறையைப் பின்பற்றாமல் அதனைப் பெரிதுபடுத்தி, மிக மோசமான முறையில் வைத்தியசாலை நிருவாகத்தைக் குற்றஞ்சாட்டுவது என்பது ஏற்றுக்கொள்ள முடியாத ஒரு விடயமாகும். உண்மையிலேயே வைத்தியசாலையின் பணிப்பாளர் மற்றும் நிருவாகத்தினர் எந்த அடிப்படையில் செயற்படுகின்றார்கள்? தாபன விதிக்கோவை மற்றும் சுற்றுநிருபங்களின் அடிப்படையிலேயே அவர்கள் செயற்பாடுகளை முன்னெடுக்கவேண்டி இருக்கின்றது.

அரசியலமைப்பில் அடிப்படை உரிமைகள் குறிப்பிடப்பட்டு இருக்கின்றன. இலங்கையில் அரசியலில் ஈடுபட எல்லா மக்களுக்கும் உரிமை இருந்தாலும், உயர்நிலை பதவி வகிப்பவர்கள் அரசியலில் ஈடுபட முடியாதென தாபன விதிக்கோவை சொல்கின்றது. அந்த அடிப்படையில், அதை மீறுபவர்களுக்கு எதிராகச் சட்ட நடவடிக்கை எடுக்கப் படுகின்றது. அதை நாம் கண்கூடாகக் கண்டிருக்கிறோம்.

உரிய நடைமுறைகளைப் பின்பற்றி கல்முனை வடக்கு ஆதார வைத்தியசாலை நிருவாகம் முடிவுகளை எடுத்திருக்கிறது. கௌரவ அமைச்சர் அவர்கள் மிகத் தெளிவாகச் சொன்னார், "சமகாலத்துக்கு ஏற்ற வகையில் இந்தச் சீருடையில் மாற்றத்தைக் கொண்டுவர வேண்டிய தேவை ஏற்படும்போது, அதை தேசிய ரீதியில் செய்வதற்குரிய ஏற்பாடுகளை நாம் செய்வோம்" என்று. இன்றிருக்கின்ற நிலைமைகளைச் சமாளித்து, இனமுறுகலை இல்லாமல் செய்வதற்குரிய ஏற்பாடுகளைச் செய்ய வேண்டும் என்பதை நாம் எல்லோரும் ஒத்துக்கொண்டு, உடன்பாட்டுக்கு வரவேண்டிய தேவை இருக்கின்றது. இந்த விடயத்தில் அரசியல்வாதிகள், குறிப்பாக சிறுபான்மையின அரசியல் கட்சிகளைச் சேர்ந்தவர்கள் இனமுறுகல் ஏற்படாத வகையில் மிகவும் பொறுப்புடன் நடந்திருக்க வேண்டும் என்பதுதான் எனது நிலைப்பாடு! இவர்கள் தங்களுக்குள் பேசி இதற்கான ஒரு முடிவை பொதுவாக அறிவித்திருக்க வேண்டும். அதை அமைச்சரிடம் திணைக்களத்தினூடாகக் கொண்டுசெல்வதன் ஊடாக இந்தப் பிரச்சினையைப் பாரியளவில் தடுத்திருக்க முடியும்.

கல்முனையைப் பொறுத்தளவில், அங்கு பல விடயங்கள் இன்னும் தீர்க்கப்படாமல் இருக்கின்றன என்பதை நாம் ஏற்றுக்கொள்ளத்தான் வேண்டும். உதாரணத்துக்கு, கல்முனை வடக்குப் பிரதேச செயலகத்துக்கு கணக்காளர் ஒருவரை நியமிப்பதற்கு இவர்கள் எல்லோரும் ஒருமித்து ஒரு கருத்தைச் சொல்வதற்கு உடன்படுவார்களா? என்ற வினாவை நான் இவ்விடத்தில் முன்வைக்க விரும்புகின்றேன். அரசியல்வாதிகளாக இருந்தாலும்சரி, அதிகாரிகளாக இருந்தாலும் சரி, சிறுபான்மையினரின் உரிமைகள் சார்ந்த விடயங்களை குறிப்பாக மதம் சார்ந்த உரிமைகளைக் கையாளும்பொழுது, கடந்த காலங்களில் ஏற்பட்ட நிகழ்வுகள் ஏற்படாத வகையில் மிகக் கவனமாகவும் பொறுப்புடனும் செயற்பட வேண்டும். தமிழ் பெண்கள்கூட, பல இடங்களில் பொட்டு வைத்துக்கொண்டு வேலைசெய்வதில் நெருக்கடிகளைச் சந்திக்கிறார்கள். இதை நான் கண்கூடாகக் கண்டிருக்கிறேன். இதனையும் தீர்ப்பதற்கு நாம் ஒன்றுபட்ட வகையில் முயற்சிசெய்ய வேண்டும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසන්.

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)
Please give me one more minute, Sir.

நாம் ஒன்றுபட்ட சமூகமாக சமத்துவத்துடன் எல்லோருக்கும் சமநீதி கிடைக்கக்கூடிய வகையிலும், மத சுதந்திரத்தைப் பாதுகாக்கக்கூடிய வகையிலும், இனத்தையும் கவனமாகப் பாதுகாத்துக்கொண்டு செல்லவேண்டுமென்ற வேண்டுகோளை விடுத்து, நன்றி கூறி விடை பெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කිට්නන් සෙල්වරාජ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 5.09]

**ගරු කිට්නන් සෙල්වරාජ් මහතා**
(மாண்புமிகு கிட்ணன் செல்வராஜ்)
(The Hon. Kitnan Selvaraj)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 1956ஆம் ஆண்டின் 47ஆம் இலக்க, பெண்களையும், இளம் ஆட்களையும் மற்றும் பிள்ளைகளையும் தொழிலுக்கமர்த்துதல் சட்டத்தைத் திருத்துவதற்காகக் கொண்டுவரப்பட்டு இருக்கின்ற இந்தச் சட்டமூலம் இந்தக் காலகட்டத்தில் மிகவும் வரவேற்கத்தக்கது. சிறுவர் சம்பந்தமான விழிப்புணர்வு வாசகமொன்று இருக்கின்றது. அதாவது, "குழந்தைகளின் கைகளில் பென்சிலும் புத்தகமும் இருக்க வேண்டுமே தவிர, வேலைக்கான கருவிகள் அல்ல" என்பதே அந்த அரும்பெரும் வாசகமாகும்.

அந்த வகையில், சிறுவர்களின் உழைப்பைச் சுரண்டுவது என்பது உலக தர்மத்துக்கு ஒவ்வாதது. ஐக்கிய நாடுகள் சபையால் பிரகடனப்படுத்தப்பட்ட சிறுவர் தொழிலாளர் எதிர்ப்பு தினம் உலகளாவிய ரீதியில் ஒவ்வொரு வருடமும் அனுஷ்டிக்கப்படும்பொது, புதிய புதிய கருத்துக்கள் முன்வைக்கப்படுவதுடன், புதிய சட்டமூலங்களும் கொண்டுவரப்படுகின்றன. சர்வதேச சிறுவர் தொழிலாளர் எதிர்ப்பு தினம் யூன் மாதம் 12ஆம் திகதி உலகெங்கும் அனுஷ்டிக்கப்படுகின்றது. சிறுவர் தொழிலாளர் முறைமையை ஒழிக்கவும் விழிப்புணர்வை ஏற்படுத்தவுமே சிறுவர் தொழிலாளர் எதிர்ப்பு தினம் 2002ஆம் ஆண்டு சர்வதேச தொழிலாளர் அமைப்பினால் -ILO- தொடங்கி வைக்கப்பட்டது. அதன் பின்னர், இது தொடர்பான சட்டமூலம் 2003ஆம் ஆண்டு இந்தச் சபைக்குக் கொண்டுவரப்பட்டு, நிறைவேற்றப்பட்டு, நடைமுறைப்படுத்தப்பட்டபோதிலும், இன்றுவரை இலங்கையில் சிறுவர் தொழிலாளர்கள் மிக அதிகளவில் பாதிக்கப்பட்டு இருப்பதைக் காணக்கூடியதாக இருக்கின்றது.

விசேடமாக, மலையகத்தில் வெள்ளையர்களின் ஆட்சிமுதல் இன்று வரை பெருந்தோட்டங்களில் வேலை செய்வதற்காகச் சிறுவர்கள் கூலித் தொழிலாளர்களாகச் சேர்த்துக்கொள்ளப்பட்டு வருவதை எங்களால் அவதானிக்கக் கூடியதாக இருக்கின்றது. வெள்ளையர்களின் ஆட்சிக்குப்

பிறகும்கூட - 1948ஆம் ஆண்டுக்குப் பிறகும்கூட - பெருந்தோட்டங்களில் வேலைசெய்வதற்குச் சிறுவர்கள் இணைத்துக் கொள்ளப்பட்டார்கள். பதிவுச் சான்றிதழோ, பெயர் அட்டையோ இல்லாமல் அவர்களை இணைத்துக் கொள்வதனால், அவர்கள் வயது முதிர்ந்து ஓய்வுபெற்று வீடுகளுக்குச் செல்லும்பொழுதுகூட, ஓய்வூதியத்தைப் பெற்றுக்கொள்வதற்கான ஒழுங்கான நிலைமைகள் இல்லாது இருப்பதைக் காணக்கூடியதாக இருக்கின்றது. 2003ஆம் ஆண்டு கொண்டுவரப்பட்ட சட்டத்தை இன்று எமது தேசிய மக்கள் சக்தி அரசாங்கம் மாற்றி அமைப்பதோடு, சிறுவர்களைத் தொழிலாளர்களாகப் பயன்படுத்தும் நிறுவனங்களுக்கும் தனியாருக்கும் எதிராக விதிக்கப்படுகின்ற தண்டப்பணத்தை 10,000 ரூபாயில் இருந்து 100,000 ரூபாய்வரை அதிகரிக்கின்றது. இதனையிட்டு, உலகவாழ் சிறுவர்கள் சார்பாக தேசிய மக்கள் சக்தி அரசாங்கம் மிகவும் மகிழ்ச்சி அடைகின்றது. 2003ஆம் ஆண்டு இந்தச் சட்டம் கொண்டுவரப்பட்டபொழுதும், அதற்கான நடைமுறைகளை முன்னெடுக்கவில்லை என்ற குற்றச்சாட்டு கடந்தகால அரசாங்கத்தின்மீது இருக்கின்றது. அன்று சிறுவர் உழைப்பைச் சுரண்டுதலைத் தடைசெய்தல் தொடர்பிலான சட்டங்கள் கொண்டுவரப்பட்டதன் பிரதான நோக்கம் என்ன? சிறுவர்களுடைய கல்வி மற்றும் பாதுகாப்பை உறுதிசெய்தல், அவர்களை ஆபத்தான வேலைகளில் அமர்த்துவதைத் தடுத்தல், தொழிலுக்கு ஏற்ற ஊதியத்தை உறுதிசெய்தல் போன்ற பிரதான நோக்கங்களை அடிப்படையாகக்கொண்டு இவை கொண்டுவரப்பட்டபோதிலும், இன்றுவரை அவை எவையுமே நடைமுறையில் இல்லை.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று கொழும்பிலுள்ள பிரபுக்களின் வீடுகளில் மலையகத்தைச் சேர்ந்த சிறுவர்கள் பலர் கூலித் தொழிலாளர்களாக இருப்பது கவலைக்குரிய விடயமாகும். இன்று எங்களுடைய அரசாங்கத்தால் கொண்டுவரப்பட்டு இருக்கின்ற இந்தத் திருத்தச் சட்டமூலத்தை மலையக சமூகத்தின் எதிர்கால மேம்பாட்டுக்கான ஓர் அத்திவாரமாகவே நாங்கள் கருதுகின்றோம். அந்த வகையில், நாங்கள் இந்த திருத்தச் சட்டமூலத்தை வரவேற்கின்றோம். இலங்கையில் இருக்கக்கூடிய குறிப்பாக, பெருந்தோட்டப் பகுதியில் இருக்கக்கூடிய சிறுவயது உழைப்பாளர்களை இந்த நாட்டின் தேசிய ரீதியிலான பயணத்துக்குத் தயார்படுத்துவற்கு ஏதுவான ஒரு சட்டமூலமாகவும் இது அமைகின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்தியாவில் 1986ஆம் ஆண்டு சிறுவர் தொழிலாளர் தடை சம்பந்தமான சட்டம் கொண்டுவரப்பட்டது. அங்குகூட, இந்தச் சட்டத்திலுள்ள விடயங்கள் இன்னும் முழுமையாக நடைமுறைக்கு வரவில்லை. இன்று இந்த அரசாங்கம் கொண்டுவந்திருக்கின்ற இந்தச் சட்டமூலம் நிறைவேற்றப் பட்டு, எதிர்காலத்தில் நடைமுறைக்கு வரும் என்பதில் எந்தவிதமான சந்தேகமும் இல்லை.

மலையகத்திலுள்ள அநேகமான சிறுவர்கள் கோவில்களில் சிற்றூழியர்களாகத் தொழில்புரிவதை நாங்கள் அவதானிக்கக் கூடியதாக இருக்கின்றது. அங்கு மட்டுமல்ல, கடைகளிலும் ஹோட்டல்களிலும் வீடுகளிலும் இவ்வாறு சிறுவர்கள் தொழில் புரிவதை நாங்கள் அவதானிக்கக்கூடியதாக இருக்கின்றது. எனவே, இன்று கொண்டுவரப்பட்டு இருக்கின்ற சட்டமூலம் என்பது மிகவும் முக்கியத்துவம் வாய்ந்தது.

இந்த நாட்டில் நடைபெற்ற 30 வருட கால யுத்தத்தின் ஒரு சாராரான தமிழீழ விடுதலைப் புலிகள் இயக்கத்தில் கூடுதலாக இளைஞர் படையணி செயற்பாட்டில் இருந்ததை நாங்கள் காணக்கூடியதாக இருந்தது. உலக நாடுகள் அதனை எதிர்த்து ஐக்கிய நாடுகள் சபையில் கோரிக்கைகளை முன்வைத்தபோதிலும், இறுதி யுத்தத்தின்போது பல்லாயிரக்கணக்கான சிறுவர்கள் தமிழீழ விடுதலைப் புலிகள் இயக்கத்தில் இணைந்து இறந்ததை நாங்கள் அவதானிக்கக் கூடியதாக இருந்தது.

உலக தொழிலாளர் ஸ்தாபனமானது, இலங்கையில் 4,571,442 சிறுவர்கள் இருப்பதாகக் கூறுகின்ற அதேநேரத்தில், அவர்களில் 43,714 பேர் சிறுவர் தொழிலாளர்களாக இருப்பதாகவும் கூறுகின்றது. இது மிகவும் கவலைக்குரிய விடயமாகும். இந்த நிலைமைகளை அவதானித்து, இன்று தேசிய மக்கள் சக்தி அரசாங்கம் முன்மொழிந்திருக்கின்ற இந்தச் சட்டமூலத்துக்கு ஆதரவளிப்பதோடு, என்னுடைய வாழ்த்துக்களையும் தெரிவித்து விடை பெறுகின்றேன். நன்றி! வணக்கம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.16]

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

අද අපි පාර්ලිමේන්තුවේ සම්මත කර ගැනීම සඳහා විවාද කරන්නේ ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ (සංශෝධන) පනත් කෙටුම්පත ගැනයි. ළමා ශ්‍රමය යොදවා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් කරලා ළමා ශ්‍රමය තුරන් කිරීම සඳහා වූ ප්‍රඥප්තියේ වැඩ කටයුතු කරගෙන යන අතරතුර, ළමා ශ්‍රමය යොදවා ගැනීමේ වැරැදි යම් ආකාරයකින් සිදු වනවා නම් අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන ගෙනැල්ලා ඒ සඳහා වන දඩ මුදල් වැඩි කිරීමේ සංශෝධන තමයි මේ පනත් කෙටුම්පත මඟින් ඉදිරිපත් කරන්නේ. මෙම පනත් කෙටුම්පත පිළිබඳ කරුණු සාකච්ඡා කරන්න ප්‍රථමව මම කැමැතියි අදහස් දක්වන්න, ආණ්ඩුව කරගෙන යන වැඩ කටයුතු ගැන.

විශේෂයෙන්ම අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුවත්, අපට දුන්නු ජනවරමට අනුවත් මේ රට සමස්ත පරිවර්තනයකට ගෙන එන්න ඕනෑ. ඒ පරිවර්තනයේ විශාල කොටසක් ආර්ථික පරිවර්තනය මත රඳා පවතිනවා. ඒ සඳහා ආර්ථික වර්ධනය, ආර්ථික සංවර්ධනය ඇති කිරීම අවශ්‍ය කරනවා. එහිදී භෞතික පැත්තෙන් ගත්තාම, අපේ රට සතුව හැකියාවන් වාගේම සීමාකාරී සාධක විශාල ප්‍රමාණයක් තිබෙනවා. අනෙක් පැත්තෙන් ගත්තාම, අපට මේ ක්‍රියාවලියට සීමාවකින් තොරව දායක කර ගත හැකි ඉතාම හොඳ මානව සම්පතක් අවශ්‍ය කරනවා. එම නිසා අපගේ මානව සම්පත දියුණු කිරීම අපගේ ප්‍රධාන පරමාර්ථයක්. මානව සම්පත දියුණු කිරීම සඳහා අධ්‍යාපනයට විශාල වශයෙන් මුදල් වෙන් කරන ගමන්ම, අධ්‍යාපනයේ ප්‍රතිව්‍යුහගත කිරීම් කරන්න, විශාල පරිවර්තනයන් සිදු කරන්න අපි යෝජනා කර තිබෙනවා. ශාස්ත්‍රීය අධ්‍යාපනයට සමගාමීව වෘත්තීය අධ්‍යාපනය විෂය මාලාවලට ගෙන එන්නේ කොහොමද, පන්ති කාමරය වෙනස් කරන්නේ කොහොමද, ඉගෙනුම් ක්‍රමවේද සැලසුම් කරන්නේ කොහොමද, ඒවා තක්සේරු කරන්නේ කොහොමද කියන

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

කාරණා එම පරිවර්තනයට ඇතුළත් වනවා. ඒ සඳහා දීර්ඝ කාලයක් ගත වෙනවා. මේවා එකකට එකක් සම්බන්ධ කරුණු කාරණා. ඒ වාගේම, මේ කටයුතු කරගෙන යද්දී අපි සෞඛ්‍ය සඳහාත් විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරනවා. ඒ වාගේම ග්‍රාමීය ජනතාව, ආර්ථික ක්‍රියාවලියට එකතු කර ගන්න බැරි වුණු ජනතාව සවිබල ගැන්වීම සඳහාත් අපි විශාල වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කරනවා.

මේ සමස්ත වැඩ පිළිවෙළ තුළ ශ්‍රමයට තිබෙන වැදගත්කම විශාලයි. අපට ඉතාම වැදගත් සාධකයක් තමයි ශ්‍රමය. එම නිසා "ශ්‍රමය" කියන සාධකය ඉහළ ප්‍රතිඵල ලබා දෙන එකක් බවට පරිවර්තනය කිරීමේ තීන්දු තීරණ ගන්න කොට, ශ්‍රමය සම්බන්ධයෙන් අපට දැනට තිබෙන දත්ත පිළිබඳව පුංචි විවරණයක් කර ගැනීම වැදගත් වනවා. Sri Lanka Labour Force Survey - 2026 අනුව පළමු කාර්තුවේදී ලංකාවේ සාමාන්‍යයෙන් සම්මතයන්ට අනුව ක්‍රියාකාරීව වැඩ කිරීමට පුළුවන් වයස අවුරුදු 15ට වැඩි ජනගහනය මිලියන 17.089ක් වනවා. නමුත්, එය සමස්ත ශ්‍රම බලකාය බවට පත් වන්නේ නැහැ. Labour force එක බවට පත් වන්නේ, එම කණ්ඩායමෙන් ක්‍රියාකාරීව ආර්ථිකයකට සම්බන්ධ වෙන්න පුළුවන් කොටසයි. දැනට රැකියාවක නියුතු වෙලා ඉන්න, එහෙමත් නැත්නම් රැකියාවක නියුතුව සිටීමට කැමැත්ත ප්‍රකාශ කරන කොටසට තමයි අප කියන්නේ, ශ්‍රම බලකාය - labour force - කියලා. එය මිලියන 8.4ක් වනවා. එම ශ්‍රම බලකායේ ඉන්න ප්‍රතිශතයට අපි කියනවා, labour force participation කියලා. ඒ කියන්නේ, ශ්‍රම බලකායේ තිබෙන දායකත්වය, මැදිහත් වීම. එය ආසන්න වශයෙන් සියයට 50ක්. ඒ කියන්නේ, අවුරුදු 15ට වැඩි වයසේ වැඩ කළ හැකි 100දෙනෙක් ඉන්නවා නම් ඒ අය අතරින් 50 දෙනෙකු පමණයි වැඩ කරන්න පුළුවන් කණ්ඩායමේ - labour force එකේ - ඉන්නේ. එයිනුත් සැබෑ ලෙසම වැඩ කරන්නේ සියයට 96.3යි. අපේ දැනට රැකියා වියුක්තිය සියයට 3.7යි. 2019 ඉඳලා කරපු සමීක්ෂණවලට අනුව දත්ත ගත්තොත්, සියයට 4.8 සිට - එක් අවස්ථාවකදී - සියයට 5.1 දක්වා රැකියා වියුක්තිය වැඩිවෙලා තිබෙනවා. එය, 2024දී සියයට 4.4යි. අපි ආණ්ඩු බලය ගත්තාට පස්සේ, 2025දී එය සියයට 3.9ට අඩුවෙලා තිබෙනවා. ඒ වාගේම 2026 පළමුවැනි කාර්තුව වෙනකොට එය සියයට 3.7 දක්වා අඩු කර ගන්න අපට පුළුවන්කම ලැබුණා. එතකොට රැකියා වියුක්තිය අඩු කිරීම පැත්තෙනුත් අපි යම් ප්‍රගතියක් අත්පත් කරගෙන තිබෙනවා.

ඒ වාගේම අපි අවධානය යොමු කළ යුතු විශේෂ කාරණයක් මෙතැන තිබෙනවා. ශ්‍රම බලකාය ඇතුළේ කාන්තාවට සුවිශේෂී ස්ථානයක් හිමි වුණත්, ලංකාවේ ශ්‍රම බලකාය ඇතුළේ කාන්තාවගේ සහභාගිත්වය, දායකත්වය සියයට 32.5යි. වයස 15ට වැඩි කණ්ඩායම්වලින් රැකියාවේ නිරත වෙන්න සුදුසුකම් ලබන්නේ, ශ්‍රම බලකායට සම්බන්ධ වෙන්නේ සියයට 32.5යි. එයිනුත් රැකියාවල නිරත වෙලා තිබෙන්නේ සියයට 30යි. ලංකාවේ ඉන්නේ කාන්තාවන් 100 දෙනෙක් කියලා උපකල්පනය කළොත්, එයින් රැකියාවල නියුතුවෙලා ඉන්නේ 30දෙනෙක් පමණයි. එතකොට 70ක්ම රැකියාවල නියුතුවෙලා නැහැ. අපි සුරැකුම් ආර්ථිකයක් ගැන කථා කරන්නෙත් ඒකයි. කාන්තාවන් විශාල හැකියා, නිපුණතා සහ අධ්‍යාපනයක් ලබාගෙන තිබුණත් ඔවුන්ට ගෙදර දොරේ වැඩ කටයුතු කරන්න, දෙමව්පියන් බලාගන්න, දරුවන්ගේ වැඩ කටයුතු කරන්න සිද්ධ වෙනවා. එවැනි කාරණා නිසා ඔවුන්ට රැකියාවලට යෑමට බාධාවක් ඇතිවෙලා තිබෙනවා. ඒ නිසා කම්කරු අමාත්‍යාංශය විධියට අපි සැලසුම් සකස් කරමින් ඉන්නවා, අවස්ථා සොයමින් ඉන්නවා, ඔවුන් සවිබල ගන්වමින් ආර්ථික ක්‍රියාවලියට ගෙනඑමින්, සුරැකුම් ආර්ථිකයකට අවශ්‍ය පහසුකම් ලබා දීම සඳහා. අපි ඒ සඳහා අවධානය යොමු කරලා තිබෙනවා. මොකද, ශ්‍රම බලකාය පුළුල් කරලා ආර්ථිකයට වටිනාකම් එකතු කරන්න නම්, ඒ කාන්තාවට අවස්ථාව ලබා දෙන්න ඕනෑ.

ශ්‍රම බලකාය ඇතුළේ දැනට සේවයේ නියුක්ත වෙලා ඉන්න ප්‍රමාණය මිලියන 8.1යි. ඉන්, සත්‍ය වශයෙන්ම සේවකයින් - employeesලා - විධියට ඉන්නේ සියයට 61යි. ඒ වාගේම ශ්‍රම බලකාය ඇතුළේ සේවා යෝජකයන් - employersලා - විධියට ඉන්නේ ශ්‍රම බලකාය ඇතුළේ ම ක්‍රියාකාරීව ඉන්න අය. ඔවුන් සියයට 2.9ක් ඉන්නවා. ඒ වාගේම තමන්ගේම ව්‍යාපාරික කටයුත්තක් කරගෙන තනිවම, ස්වාධීනව වැඩ කරන අය සියයට 31.3ක් ඉන්නවා. ඒ වාගේම ඉතා සුළු ප්‍රමාණයක් පවුල් වශයෙන් ශ්‍රම බලකායට සම්බන්ධ වුණු. මේ දත්ත අපට ඉතාම වැදගත්. මේ දත්ත අධ්‍යාපනය අනුව වර්ගීකරණය කරලා අපට ලබා දීලා තිබෙනවා. අපි මේ දත්තත් උපයෝගී කරගෙන වඩාත් සවිමත් ශ්‍රමය සම්බන්ධ ප්‍රතිපත්ති අනුගමනය කරමින් ඔවුන් ඉදිරියට ගෙනයන්න බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි කථා කරන, ළමා ශ්‍රමය පිළිබඳව තිබෙන නිර්වචනය මොකක්ද? ළමා ශ්‍රමය කියලා කියන්නේ මොකක්ද? ඇයි, අපි ළමා ශ්‍රමයට අනුබල නොදිය යුත්තේ? විශේෂයෙන්ම නිෂ්පාදන ක්‍රියාවලිය ඉදිරියට එනකොට, හුදෙක් නිෂ්පාදන සඳහා ගේන්න පුළුවන් සියලු ශ්‍රමය ගෙනෙන්න පුළුවන් තැනක නොවෙයි අද ලෝකය තිබෙන්නේ. ලෝකය අද සාකච්ඡා පවත්වමින් ඉන්නේ, සදාචාරාත්මක නිෂ්පාදනයකට යන්න. ඒ නිසා කිසිදු ආකාරයකින් බලහත්කාර ශ්‍රමයේ යොදවන්න එපා, ළමා ශ්‍රමය යොදවන්න එපා, නවීන වහල් ශ්‍රමය යොදවන්න එපා කියන තැන තමයි ඔවුන් ඉන්නේ. ඒ නිසා ළමා ශ්‍රමය පිටුදැකීම ඉතාම වැදගත් වෙනවා, හොඳ රටකට. ජාත්‍යන්තර කම්කරු සංවිධානයට - International Labour Organization එකට - අනුව ළමා ශ්‍රමය මේ විධියට නිර්වචනය කර තිබෙනවා. "Child labour" is defined as work that deprives children of their childhood - ළමා කාලය අහිමි කරන ක්‍රියාවලියක් වෙනවා නම් එතැන ළමා ශ්‍රමය තිබෙනවා - their dignity, potential - ඔවුන්ගේ ගරුත්වය, ඔවුන්ගේ හැකියාව අඩපණ කරවන දේවල් තිබෙනවා නම්, එය ළමා ශ්‍රමයට ඇතුළත් වෙනවා - and that is harmful to their physical and mental development. ඔවුන්ගේ භෞතික සහ මානසික ක්‍රියාවලියට, සංවර්ධනයට බාධා පමුණුවන සියල්ලක්ම ළමා ශ්‍රමය ඇතුළේ තිබෙනවා. අන්තරායකාරී කටයුතුවලට ඔවුන්ගේ සේවය යොදවන්න බැහැ. විශේෂයෙන්ම පූර්ව ළමා අවධියේ ඉඳලා ඉදිරියට එනකොට අධ්‍යාපනය තුළින් තමයි ඔහුගේ ධාරිතාව ගොඩනැඟෙන්නේ. සෑම ධාරිතාවක්ම - නිෂ්පාදන ධාරිතාව, සිතීමේ ධාරිතාව, සංස්කෘතිමය ධාරිතාව, සමාජයීය ධාරිතාව - ගොඩ නැඟීමේ පදනම අධ්‍යාපනයයි. ඒ නිසා කිසිදු ආකාරයකින් ළමා ශ්‍රමය සම්බන්ධ කරගන්න බැහැ, අධ්‍යාපනයට බාධාවෙන ආකාරයට. ඒ අනුව තමයි මේ නිර්වචනය කරලා තිබෙන්නේ. ඒ අනුව ශ්‍රී ලංකාව විසින් ජාත්‍යන්තර සම්මුති දෙකකට අපරානුමතිය දීලා එකඟතාව ප්‍රකාශ කරලා තිබෙනවා. මේක ලෝකයේ අනෙක් රටවලුත් පිළිගන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි ඉතිරිව තිබෙන්නේ.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

138, 182 වැනි ජාත්‍යන්තර සම්මුති අපි පිළිඅරගෙන තිබෙනවා. ඒ වාගේම Alliance 8.7 යටතේ විශේෂයෙන්ම Sustainable Development Goals යටතේ මේ ළමා ශ්‍රමය

සම්පූර්ණයෙන්ම පිටුදැකීමට අපි එකඟතාව ප්‍රකාශ කරලා තිබෙනවා. ඒ අනුව තමයි මේ සංශෝධනත් මෙතැනට එකතු කර ගන්නේ, ඒ දිශානතියට ගමන් කිරීම සඳහා.

ඒ වාගේම, කම්කරු අමාත්‍යාංශය හැටියට අපට අවශ්‍ය කරනවා වඩාත් හොඳ නිෂ්පාදන පරිසරයක් ලංකාව ඇතුළේ ඇති කර ගන්න. එය සඳහා වූ කම්කරු අණ පනත් සංශෝධනයක් මේ දවස්වල අපි සිදු කරමින් තිබෙනවා. එය මේ අවුරුද්ද අවසාන වෙනකොට මහජනතාවගේ අදහස් විමසමින් වඩාත් හොඳ සාමකාමී නිෂ්පාදන පරිසරයක් ඇති කිරීම සඳහාත් අදාළ ප්‍රතිපාදන අපි ගෙන එනවා. ඒ වාගේම, කම්කරු අමාත්‍යාංශය යටතේ මේ ක්‍රියාවලියට තාක්ෂණය එකතු කරමින් සේවකයන්ට පහසුකම් සැපයීම කෙරෙනවා. ඔවුන් ඒ සේවා සඳහා ඒ ඒ ආයතනවලට එන්නේ නැතිව ගෙදර සිටම තාක්ෂණය උපයෝගය කරගෙන ඒ සේවාව ලබා දීමේ ක්‍රියාවලියකටත් අපි අවධානය යොමු කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම නිසා අද ඉදිරිපත් කරන මේ සංශෝධන නීතිමය පැත්තෙන් වන සංශෝධන පමණක් වුණාට, අපේ අදහස වෙන්නේ නීතිය පමණක් ක්‍රියාත්මක කරලා මේ කටයුත්ත අවසාන කිරීම නොවෙයි. අපට අවශ්‍ය කරනවා සදාචාර සම්පන්න නිෂ්පාදන පරිසරයක් තුළ සදාචාර සම්පන්න ආකාරයට ශ්‍රමය යොදවා ගැනීම කියන කාරණය. නීතියට පමණක් කොටු නොවී, ලෝකයට ආදර්ශවත් වන විධියට ළමා ශ්‍රමය සම්පූර්ණයෙන්ම පිටුදකින ආකාරයට අපේ රට ඇතුළේ එම නිෂ්පාදන ක්‍රියාවලිය ගෙන ඒම සඳහා විශේෂයෙන්ම මම යෝජනා කරනවා, එම නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ වන සියලුදෙනාට මැදිහත් වෙන්න කියලා. මේවාට තවත් අනුගාමීව සම්බන්ධ වෙමින් උදව් උපකාර කිරීම සඳහා අපේ ජාතික වැඩසටහන් තිබෙනවා. එහි ප්‍රධාන වැඩසටහන තමයි Clean Sri Lanka වැඩසටහන. ඒ අනුව සදාචාර සම්පන්න භාවිතයක් සඳහා ඒ මඟ පෙන්වීම්, ඒ වැඩසටහන් ඇතිව ඉදිරියේදී අපි ක්‍රමිකව බලාපොරොත්තු වෙනවා මේ ශ්‍රම සම්පත ජාතික ආර්ථිකයටත්, සමාජ පරිවර්තනයටත් විශාල වශයෙන් දායක කර ගන්න.

බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]***

*தீர்மானிக்கப்பட்டது:*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Anil Jayantha]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*
*[THE HON. PRESIDING MEMBER in the Chair.]*

***1 සිට 6 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகத்திலிருந்து 6ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 1 to 6 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුය යි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.***
*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*
*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported without Amendment.*

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරදි කර ගැනීම සඳහා සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙසද ඉල්ලා සිටිමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் மூன்றாம் முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the Third time, and passed.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු වෛද්‍ය රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

## මුස්ලිම් කාන්තා සෞඛ්‍ය සේවිකාවන් සඳහා වූ නිල ඇඳුම් පිළිබඳ සීමා ඉවත් කිරීම
## முஸ்லிம் பெண் சுகாதார ஊழியர்களின் ஆடைக் கட்டுப்பாட்டு விதிமுறைகளை நீக்குதல்
## REMOVAL OF DRESS CODE RESTRICTIONS OF MUSLIM FEMALE HEALTH WORKERS

[பி.ப. 5.30]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, என்னுடைய இரண்டு வருட பாராளுமன்றப் பதவிக் காலத்தில் இது என்னுடைய கடைசி உரையாக இருக்கலாம் என்று நினைக்கின்றேன். ගරු නලින්ද ඇමතිතුමනි, සමාවෙන්න. මම පොඩ්ඩක් දෙමළෙන් කථා කරලා සිංහලෙන් කථා කරනවා. இவ்வேளையில் பின்வரும் பிரேரணையை நான் முன்மொழிகின்றேன்:

> " இலங்கை சுதந்திரமடைந்த நாளிலிருந்து இன்றுவரை சுதந்திரமடையாத இரண்டு இனங்கள் இலங்கையிலே வாழ்ந்து வருகின்றன. மதத்தால் வேறுபட்ட அந்த இனங்கள் இரண்டும் மொழியால் ஒன்றுபட்டவை. காலங்காலமாக இருந்துவந்த இனவாத அரசாங்கங்கள் இந்தச் சிறுபான்மை இனங்களின்மீது அடக்குமுறையையும் இனவழிப்பையும் செய்துகொண்டுதான் இருக்கின்றன. இந்த இரண்டு இனங்களையும் வேறுபிரித்து ஆள்வதுதான் பெரும்பான்மையின அரசியல்வாதிகளின் அரசியல் தந்திரமாக இருந்து வருகின்றது. இதன் அடிப்படையில், தமிழ் பேசுகின்ற முஸ்லிம் மற்றும் தமிழ் மக்கள்மீது ஏற்படுத்தப்படுகின்ற திட்டமிடப்பட்ட அரசியல் செயற்பாடுகளை அடையாளம் காண்பதும் அவற்றிலிருந்து முஸ்லிம் மற்றும் தமிழ் இனங்கள் பாதுகாக்கப்படுவதும் காலத்தின் கட்டாயமாக இருக்கின்றது.
>
> அண்மையில் கல்முனை வடக்கு ஆதார வைத்திய சாலையில் புதிதாகப் பணிக்கு அமர்த்தப்பட்ட 9 தாதிய உதவிச் சேவை ஆளணியினரை தற்காலிகமாகவோ அல்லது தேவை கருதியோ இடமாற்றம் செய்திருப்பதை, குறித்த ஒரு சமூகத்தின் மீதான பாரபட்சமாக நோக்கும் அதேநேரம், 'நகமும் சதையும்போல' வாழுகின்ற ஒரேமொழி பேசும் இரு இனங்களிடையே ஏற்படுத்தும் திட்டமிட்ட அரசியல் நகர்வாகவே இரு சமூகங்களும் கருதுகின்றன. அவர்களுடைய மத அடையாளங்களை வெளிப்படுத்துகின்ற அடிப்படைச் சுதந்திரம் மீறப்பட்டதென்பது இந்த நாட்டிலே சுகாதார சேவையில் இணைய விரும்புகின்ற ஒரு சமூகத்தின் அடிப்படை அபிலாஷைகளைப் புறக்கணிப்பதாகவே பொதுமக்களால் பார்க்கப்படுகின்றது. அதேநேரம், இலங்கை காவல் துறையில் விரல்விட்டு எண்ணக்கூடிய அடிப்படையிலே முஸ்லிம் இனத்திலிருந்து பெண்கள் சேவைக்குச் சேர்ந்திருப்பதையும் இங்கே சுட்டிக்காட்ட விரும்புகின்றேன். எனவே, இந்த இனத்தின் மீதான திட்டமிடப்பட்ட அடக்குமுறைக்கு எதிரான இந்த ஒத்திவைப்புவேளைப் பிரேரணை காலத்தின் கட்டாயமாகும். ஆகவே, பாதிக்கப்பட்ட முஸ்லிம் பணியாளர்களை மீண்டும் கல்முனை வடக்கு ஆதார வைத்தியசாலையில் பணிக்கு அமர்த்துவதோடு, முஸ்லிம் பெண்கள் சுகாதார சேவையில் தங்குதடையின்றி இணைந்து கடமையாற்றுவதற்குத் தடையான முக்கியமான அம்சமான உடைக் கட்டுப்பாட்டினைத் தளர்த்துவதற்கான முடிவினை அரசாங்கம் உடனடியாக எடுக்க வேண்டும்.
>
> மேலும், முஸ்லிம் சமூகத்தைச் சார்ந்த பெண்கள் முகத்தை மறைக்காதவாறு சுகாதாரத் துறையில் சகல படிநிலைகளிலும் - முக்கியமாக வைத்திய சேவையிலிருந்து தாதிய உதவிச் சேவை வரை - தங்குதடையின்றி மத சுதந்திரத்துடன் பணியாற்றுவதற் குரிய உள்ளக சுற்றுநிருபம் ஒன்றை உடனடியாக வெளியிடவும், அதனைச் சட்டரீதியாக மாற்றுவதற்குரிய சட்டத்தை இயற்றி அமுல்படுத்தவும் இந்தப் பாராளுமன்றம் நடவடிக்கை எடுக்க வேண்டும்"

என்று கோரி இந்தப் பிரேரணையைச் சமர்ப்பிக்கின்றேன்.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එක දවසක් මගෙන් mediaවලින් ඇහුවා, ඔයාට මේ පාර්ලිමේන්තුවේ සිටින වැඩිපුරම හිතවත් Member of Parliament කවුද කියලා. මට වෙන කවුරුවත් ඔළුවට ආවේ නැහැ. මම කිව්වා, "නලින්ද අයියා" කියලා. හෙට ඉඳලා මට "නලින්ද අයියා" කියන්න බැහැ, "නලින්ද සර්" කියන්න වෙනවා. මම Ministry එකට එනවා, ආපසු. හරිම සතුටින් තමයි මම මේ Adjournment Motion එක ඉදිරිපත් කළේ.

ඇත්තටම ඔබතුමන්ලා දන්නවා, මම දෙමළ. මගේ අම්මා, තාත්තා ඔක්කොම දෙමළ. හැබැයි, මේ ප්‍රශ්න පටන් අරගෙන තිබෙන්නේ Batticaloaවල, කල්මුනේ. කලින් පැවැති රජයන්වලට හොඳටම support කරපු කරුණා අම්මාන්, පිල්ලෙයාන් එක්ක වැඩ කරපු පුද්ගලයා තමයි Kalmunai-North Base Hospital එකේ මේක පටන් අරගෙන තිබෙන්නේ. අයියා දන්නවා, මාව හරියටම. මම administration කටයුතු කළා. 2020 ඉඳලා මම hospital එකේ administration කටයුතු කර කර සිටියා. 2022 දක්වා administration කටයුතු කරගෙන ඇවිල්ලා 2024දී මම leave වුණා. සාමාන්‍යයෙන් ඕනෑ circular එකක් තිබෙනවා, - *[බාධා කිරීමක්]* මම කැමැත්තෙන් කියන්නේ, "අයියා" කියලා. ඔබතුමා හොඳටම දන්නවා, සමහර වෙලාවට අපට මොනවා හෝ programmes තිබුණොත් - සිංහල programme එකක් වෙන්න පුළුවන්, දෙමළ programme එකක් වෙන්න පුළුවන්, මුස්ලිම් programme එකක් වෙන්න පුළුවන් - අපි අපේ dress එකෙන් යන බව. අපි doctorsලා නිසා අපට කිසි අවුලක් නැහැ. හැබැයි, අනෙක් කට්ටියට ඒක කරන්න අමාරුයි. ඒක කරන්න බැහැ. සමහර වෙලාවට ඒගොල්ලන්ගේ dressesවලින් තමයි ඒගොල්ලන්ට එන්න වෙන්නේ. උදාහරණයක් වශයෙන්, nurse කෙනෙකුට ඒගොල්ලන්ගේ dress එකෙන් ඒ programmeවලට එන්න බැහැ. ඒගොල්ලන් ඔවුන්ගේ නිල ඇඳුමින් තමයි එන්නේ. අපට ඕනෑ නම් චෙට්ටියක් ඇඳගෙන හරි, නැත්නම් ඕනෑ විධියකට යන්න පුළුවන්.

ඇත්තටම මම හිතන විධියට මේක පටන් ගත්තේ සතියකට කලින්. පොඩ්ඩක් සොයා බලන්න. මෙතුමා මේ විධියටම 2022දීත් - කොවිඩ් කාලයේත් - ප්‍රශ්න ඇදලා තිබෙනවා. ඊට පසු Vavuniya Hospital එකට ගිහිල්ලාත් ප්‍රශ්න ඇදලා තිබෙනවා. මම හරියටම දන්නවා, මේ ප්‍රශ්නය ඔයගොල්ලන්ට ගෙනැල්ලා හරියටම ගහලා තිබෙන්නේ ආණ්ඩුවට කියන එක. මේකට ඔයගොල්ලන් ගන්න action මොනවාද කියලා බලලා, ඒකෙන් ඔයගොල්ලන්ට මඩ ගහන්න තමයි මේක දාලා තිබෙන්නේ. මම හදවතින් මේ කියන්නේ. අයියා කරපු පළමු වැඩේ වැරදියි; ඒ නවදෙනාව Ashraff Memorial Hospital එකට පත් කරපු එක. ඇත්තටම ඒ කරපු වැඩේ නිසා, ඒකෙන් ඔයගොල්ලන් ගැන තිබෙන විශ්වාසය ටිකක් නැති වෙන්න යන්නේ. ඒ නිසා මම බොහොම ආදරයෙන් ඔබතුමාගෙන් ඉල්ලනවා, කරුණාකර ඒ නවදෙනාම ආපසු එම Hospital එකට පත් කරන්න කියලා.

මම ඒකට හේතුව කියන්නම්. එකම රටක් ඇතුළේ එක hospital එකක ඒ circular එක function වෙන්නේ නැතුව අනෙක් hospitalsවල ඒ circular එක function වෙනවා කියන්නේ, Kalmunai-North is for the Tamils and Kalmunai-South is for the Muslims කියන කථාවට අපිම ඉඩ දෙනවා

කියන එකයි. සමහර වෙලාවට අයියට advice දෙන්න කවුරුහරි නැතුව ඇති. එහෙම නැත්නම් පිට ඉන්න කවුරුහරි අයියාට මේක කියලා නැතිව ඇති. හැබැයි, මේ කාරණය ඕනෑම කෙනෙකුට ඇඳගෙන යන්න පුළුවන්. මෙන්න මෙහෙම දෙයක් මේ රජය කළා කියලා කියන්න පුළුවන්. මම හැම circular එකක් ගැනම දන්නවා. මම system එකේ ඉඳලා තිබෙනවා. 2016දී මම intern කළේ. Administration පැත්තත් මම හොඳට කර තිබෙනවා. Administratorsලාගේ trade unionsවලට මම තමයි ලියුම් ලියන්නේ. ඒ නිසා මම හැම එකම දන්නවා.

මම බොහොම කැමැත්තෙන් මේ ඉල්ලීම කරන්නේ. ඒ නවදෙනා ඒ Hospital එකට නැවත වහාම පත් කරන්න. අයියා කියන්න එපා, මේ පිළිබඳව අපට circular ගහන්න බැහැ කියලා. ඒ කිසිදෙයක් බලන්න එපා. සමහර වෙලාවට කොන්ද පණ තියාගෙන සමහර decisions ගන්න වෙනවා. ඔබතුමාගේ තීරණය සඳහායි මම මේක කියන්නේ. හැබැයි, මේක අහන්න මම ඊළඟට පාර්ලිමේන්තුවේ ඉන්නෙත් නැහැ. හිතලා බලන්න, පොඩි කාලයේ ඉඳලා මම එකම dress එක ඇඳගෙන ජීවත් වෙනකොට, කවුරුහරි කෙනෙක් එක පාරටම ඇවිල්ලා ඒ ඇඳුම ගලවන්න කියලා කිව්වාම ඒක හිතට වදිනවා. එහෙම වුණාම, තවත් අය මේ ක්ෂේත්‍රයට එන්නේ නැහැ. සාමාන්‍යයෙන් අපි doctorsලා විධියට ටයි දමාගෙන යනවා. හැබැයි, එක දවසක් කවුරු හරි කෙනෙක් කිව්වාම scrub kit එකෙන් එන්න කියලා, අපට එහෙම යන්න බැහැ. ඔබතුමා හොඳටම දන්නවා, කොවිඩ් කාලයේ අපි scrub kits එක්ක Food Cityවලට ගිය පින්තූර පවා පළ වුණු බව. Infections ගැන අයියා කථා කළා. සමහර සිංහල වචන මට එදා තේරුණේ නැහැ. මම දන්නවා, ඔබතුමාගේ තීරණය. මේක simple. ආපහු ඒගොල්ලන්ව පත් කරන්න. ඊට පස්සේ ඔබතුමාට ඕනෑ නම් circular එකක් issue කරන්න පුළුවන්. Additional circular එකක් හරි ඕනෑම circular එකක් issue කරන්න පුළුවන්. ඒවාට committee පත් කරලා ඔබතුමා කරන්න යන්නේ හොඳ වැඩක් කියලා මම දන්නවා. හැබැයි, රට දන්නවාද කියලා මම දන්නේ නැහැ. ඔබතුමාගේ හිතේ මොනවා තිබෙනවාද කියලා අපි දන්නවා. හැබැයි, රට දන්නේ නැහැ. ඒ නිසා වැරදි වැඩ කරන්න එපා.

මම කෙළින්ම කියන්න ඕනෑ නම්, සමහර ඒවා කොන්ද කෙළින් තියාගෙන කෙළින්ම කියන පොරක්. ඒ ගැන ඔයගොල්ලන් හොඳට දන්නවා. ඒ නිසා මම බොහොම ගෞරවයෙන් ඉල්ලනවා, මට පොඩි හරි ආදරයක් තිබෙනවා නම්, මේ Motion එක pass කරන්න ඕනෑ කියලා ඔයගොල්ලන් හිතනවා නම්, කරුණාකරලා ඒ අයව ආයෙත් පත් කරන්න. පත් කරලා circular එකක් දමන්න. Circular එකක් දමන්න විනාඩි 20ක්වත් යන්නේ නැහැ. පස්සේ committee එකක් පත් කරන්න. Committee එකක් පත් කරලා මේක විසඳාගන්න. 2029දී හරි 2035දී හරි ඔබතුමා ජනාධිපති ඡන්දෙ ඉල්ලුවොත් මම ඔබතුමාත් එක්ක ඇවිල්ලා වාඩි වෙනවා. මම මේ සභාව ඇතුළේ ඉඳන් ඒක කියන්නේ. කවුරු මොනවා හිතුවත්, හරි දෙයක් නම් අපට decisions ගන්න වෙනවා. ඔබතුමන්ලා දන්නවා, ඕනෑ නම් මට letters අරගෙන ගිහිල්ලා මාව බේරාගන්න තිබ්බා. හැබැයි, ඊළඟ සතියේ ඉඳන් එන්නේ නැත්තේ ඒක මගේ හෘදය සාක්ෂියට හරි නැති නිසා. මම බොහොම ගෞරවයෙන් අපේ ඇමතිතුමාගෙන් - හෙට ඉඳන් මගේ සර්ගෙන් - ඉල්ලනවා, ආපහු ඒ අයව පත් කරන්න කියලා. මම පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයෙන් resign වුණාට පස්සේ ආපහු Ministry එකට තමයි යන්නේ. මට කන්න බොන්න පඩියක් තියෙන්න එපායැ.

බොහොම ආදරයෙන් කියනවා, මම සිංහල ජාතියටත් ආදරෙයි, මුස්ලිම් ජාතියටත් ආදරෙයි කියලා. ඔබතුමාත් එහෙම තමයි කියලා අපි දන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම ඉක්මනින් අවසන් කරනවා. පොඩි වේලාවක් දෙන්න.

මේක ලස්සනට plan කරලා ඔබතුමාගේ ඔළුවට දාලා තිබෙනවා. ඔබතුමන්ලාගේ පක්ෂයේ ඉන්න අනෙක් මුස්ලිම් මන්ත්‍රීවරුන්ටත් ගහනවා, මේ ගැන තොරතුරු කියන්නේ නැහැ කියලා. එතකොට ඔබතුමාට විතරක් නොවෙයි, මේකෙන් බලපෑමක් වෙන්නේ. අනෙක් මුස්ලිම් මන්ත්‍රීවරුන්ටත් මේක බලපානවා. ඒ නිසා වහාම හෙටම එය කරන්න. ඊට පස්සේ ඔබතුමා තීරණයක් ගන්න uniform එකක් අඳින එක ගැන තීරණය කරනවාද, committee එකක් පත් කරන්න තීරණය කරනවාද කියලා. ඒක මගේ ඉල්ලීමක්. ඔබතුමාගේ හෘදය සාක්ෂියට එකඟව ඒක කරන්න.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතරක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.39]

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அண்மையிலே கல்முனை வடக்கு ஆதார வைத்தியசாலை யிலிருந்து அஷ்ரஃப் ஞாபகார்த்த வைத்தியசாலைக்கு இடமாற்றப்பட்ட முஸ்லிம் பெண் சுகாதாரப் பணி உதவியாளர்கள் 9 பேரையும் மீண்டும் கல்முனை வடக்கு ஆதார வைத்தியசாலைக்கு இடமாற்றுமாறும், முஸ்லிம் சமூகத்தைச் சார்ந்த பெண்கள் முகத்தை மறைக்காதவாறு சுகாதாரத் துறையில் சகல படிநிலைகளிலும் - முக்கியமாக வைத்தியர் சேவையிலிருந்து தாதிய உதவிச் சேவை வரை தங்குதடையின்றி மத சுதந்திரத்துடன் பணியாற்றுவதற்குரிய உள்ளகச் சுற்றுநிருபம் ஒன்றை உடனடியாக வெளியிடுமாறும், அதனைச் சட்ட ரீதியாக மாற்றுவதற்குரிய சட்டத்தை இயற்ற நடவடிக்கை எடுக்குமாறும் கோரி இன்று கௌரவ உறுப்பினர் Dr. இராமநாதன் அர்ச்சுனா அவர்களால் சமர்ப்பிக்கப்பட்டிருக் கின்ற இந்தப் இப்பிரேரணையை நான் ஆமோதிக்கின்றேன். இதனை முன்மொழிந்தமைக்காக கௌரவ உறுப்பினர் அவர்களுக்கு நன்றி சொல்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களுக்கு நான் இந்தச் சந்தர்ப்பத்திலே ஒரு விடயத்தைச் சொல்ல வேண்டும். வடக்கு, கிழக்கு மாகாணங்களிலே ஏற்பட்ட சில பிரச்சினைகள் காரணமாக முஸ்லிம் - தமிழ் இன மக்களிடையில் கடந்த 30 வருட காலமாகச் சில பிளவுகள் ஏற்பட்டன. அந்தக் காலகட்டத்தில் கிழக்கு மாகாணத்திலே அவர்களுக்கிடையில் சமாதானத்தை ஏற்படுத்துவதற்காக நாங்கள் மிகவும்

[ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා]

கஷ்டப்பட்டிருக்கின்றோம். கிழக்கு மாகாண சபையிலே இரண்டு தடவை அமைச்சராகப் பதவி வகிக்கும் சந்தர்ப்பம் எனக்குக் கிடைத்திருந்த வேளையில் அபிவிருத்தி ஊடாக சிங்கள, தமிழ், முஸ்லிம் மூவின மக்களுக்கிடையிலும் ஒற்றுமையை ஏற்படுத்துகின்ற பணியை நாங்கள் செய்திருக்கின்றோம். கடந்த பாராளுமன்றத் தேர்தலிலே நானும் கௌரவ எம்.ஏ.எம். தாஹிர் மற்றும் கௌரவ கவீந்திரன் கோடீஸ்வரன் ஆகிய மூவரும்தான் எமது பிரதேசங்களிலே வெற்றி பெற்றோம்.

අපි තුන්දෙනායි දිනාගත්තේ. ඒ කොමසාරිස්තුමාත් කිව්වා, ඔයගොල්ලන් තුන්දෙනා තමයි දිනාගත්තේ කියලා. ඒ දවසෙම ගරු ඇමතිතුමනි මම කිව්වා, - මෙතැන ඉන්න තාහිර් මන්ත්‍රීතුමාත් සාක්ෂි - මොනවා හරි ප්‍රශ්නයක් තිබෙනවා නම් කරුණාකර අපි විසඳාගනිමු කියලා. අවුරුදු 30ක් යුද්ධයක් තිබුණා. ප්‍රශ්න තිබෙනවා. මුස්ලිම් මිනිස්සුන්ගේ ප්‍රශ්න තිබෙනවා නම්, සිංහල මිනිස්සුන්ගේ ප්‍රශ්න තිබෙනවා නම්, Tamil මිනිස්සුන්ගේ ප්‍රශ්න තිබෙනවා නම් කථා කරලා විසඳුමක් ගන්න ඕනෑ කියලා අපි කිව්වා. බලන්න, Kalmunai Hospital එකේ ප්‍රශ්නය මතු වුණාට පස්සේ මෙගොල්ලන් කවදාවත් කථා කළේ නැහැ, ජාති භේදය ගැන. අපේ මුස්ලිම් මන්ත්‍රීතුමන්ලා හිටියා, අපි කවදාවත් ජාති භේදය පැත්තට ගියේ නැහැ. ඊට පස්සේ අපේ ගරු අතම්බාවා මන්ත්‍රීතුමා කිව්වා, "මම නියෝජ්‍ය ඇමතිතුමාට කථා කළා, ඒ ප්‍රශ්නය ඉවරයි" කියලා. අපි සන්තෝෂ වුණා. ඊළඟ දවසේ ඒ දොස්තරලා මෙගොල්ලන්ට explanation ඉල්ලා ලියුම් දැම්මා. ඊට පස්සේ කවදාවත් මුස්ලිම් එක්කෙනාට මේ රෝහලට එන්න එපා කියලා staff එකේ 100ක් විතර duty වෙලාවේ පෙළපාළි ගියා. එතැනින් තමයි ජාති භේදය ඇති වුණේ. ඇත්ත ඔයගොල්ලන්ට කියන්න ඕනෑ. කරුණාකරලා ඔයගොල්ලන් මේ සම්බන්ධයෙන් ගිනි තියන්න එපා, ජාති භේද ඇති කරලා Ministerට වැඩ වැඩි කරන්න එපා කියලා ඉල්ලීමක් කරලා මම message එකක් එව්වා.

දැන් මේ circular එක බලන්න ඕනෑ. ගරු ඇමතිතුමා දන්නවා, ඊයේත් ඔබතුමා කිව්වා, 2009.06.26වැනි දා මේ circular එක දැම්මේ අපේ හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සිටි කාලයේ කියලා. මේකෙන් තමයි කියන්නේ හැම ආගමකම අයට official uniform අඳින්න පුළුවන් කියලා. ඊට පසුව ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ තමයි ආයෙත් මේක cancel කළේ. මේ දෙකම මම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. මම හිතන විධියට, මේ circulars දෙක ඇමතිතුමා ළඟත් තිබෙනවා. දැන් බලන්න, මෙච්චර කාලයක් ප්‍රශ්න තිබුණේ නැහැ. මඩකලපුව ඉස්පිරිතාලයේ අපේ අය වැඩ කරනවා, ප්‍රශ්නයක් නැහැ. හැම බැංකුවකම වැඩ කරනවා, ප්‍රශ්නයක් නැහැ. හැබැයි, කල්මුනේ ඉඳලා තමයි ජාති භේද ඇති කරන්න වැඩ කටයුතු පටන් අරගෙන තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට වෙන් වූ කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
මට විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඇමතිතුමා කිව්වා, අපේ පක්ෂයේ නායකතුමා වන ගරු රවුෆ් හකීම් මැතිතුමා අමාත්‍යතුමා වශයෙන් සිටි කාලයේ තමයි මේ circular එක ආවේ කියලා. මේක ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ තමයි cancel කරලා තිබෙන්නේ. ඒ නිසා ජනාධිපතිතුමාට කථා කරලා ඔබතුමන්ලා අලුත් circular එකක් දාන්න. ද්‍රවිඩ රෝහල්වලට මුස්ලිම් මිනිසුන්ට වැඩට යන්න එපා කියනවා නම්, ආයෙත් මුස්ලිම් මිනිස්සු කියනවා, දෙමළ මිනිසුන්ට අපේ ඉස්පිරිතාලෙට එන්න එපා කියලා. එතැනම වැරැද්දක් වෙලා තිබෙනවා. ඒ නිසා ඒ transfer එක cancel කරලා ඔයගොල්ලන් සුහදව කථා කරලා තීන්දුවක් ගන්න ඕනෑ කියලා ගරු ඇමතිතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. ඔබතුමාට අපි respect කරනවා. ඔබතුමා හොඳට සේවය කරනවා. ඔබතුමා සෞඛ්‍ය අමාත්‍යාංශයට කැපවීමෙන් වැඩ කරන බව අපි දන්නවා. මෙහෙම දේවල් වෙන එක අපට හොඳත් නැහැ. අපි මැරෙනකම් ප්‍රාර්ථනා කරනවා, අපේ අල්ලාහ් දෙවියන්ට. ජාති භේද ඇති කරනවා කියලා කවුරුවත් කියනවාටවත් අපි කැමැති නැහැ. ඒ වාගේ අවංකව අපි වැඩ කරනවා. ඒ නිසා කරුණාකරලා මේකට ඔබතුමා විසඳුමක් දෙන්න ඕනෑ කියලා ඉල්ලීමක් කරමින්, මම නිහඬ වනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුනීර් මුලාෆර් නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි හතරක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.45]

**ගරු මුනීර් මුලාෆර් මහතා (ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு முனீர் முலாபர் - சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Muneer Mulaffer - Deputy Minister of Religious and Cultural Affairs)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! முதலில், மக்காவில் நடைபெற்ற சர்வதேச அல்-குர்ஆன் மனனப் போட்டியில் மூன்றாம் இடத்தைப் பெற்று எமது நாட்டுக்குப் பெருமை தேடித்தந்த எம்.ஐ.எம். இம்தாத் அவர்களுக்கு எனது வாழ்த்துகளைத் தெரிவித்துக் கொள்கின்றேன்.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාව තුළ සඳහන් වෙලා තිබෙනවා, අපි ආණ්ඩුවක් ලෙස දෙමළ සහ මුස්ලිම් ජනතාව අතර බෙදීමක් ඇති කරන්න යම් යම් අවස්ථාවල කටයුතු කළා කියන එක. මම මේ කාරණය පැහැදිලිව කියන්න කැමැතියි. 2015 වර්ෂයේ මේ රටේ ජාතිවාදය වපුරන විටත් අපි ඔක්කෝම මිනිස්සු කියන පණිවුඩය රටට ගෙනිච්චේ ව්‍යාපාරයක් ලෙස ජාතික ජන බලවේගයයි කියන එක විශේෂයෙන් මම කියන්න කැමැතියි. කවදාවත් මේ රටේ ජාතික දේශපාලන පක්ෂයකට උතුරත්, නැගෙනහිරත් දිනන්න බැරි අවස්ථාවක අපට පසුගිය මැතිවරණය තුළ ඒ සියලු ජනතාවගේ ආශීර්වාදය, සහයෝගය ලබා ගන්න පුළුවන් වුණේ අපි පැහැදිලිවම ජාතිවාදය, ආගම්වාදය ප්‍රතික්ෂේප කරන නිසායි. ඇත්තටම සමහර වෙලාවට වේදනාවක් දැනෙනවා, අපි ඇයි මේ තරම් දුරට මේක ගැන කථා කරන්නේ කියලා.

කල්මුනේ රෝහලේ ඇති වෙච්ච සිද්ධිය ගැන අපි පැහැදිලිව දන්නවා. ඒ සිද්ධිය මුල් කරගෙන අද වනකොට සමාජ මාධ්‍ය තුළත්, වෙනත් මාධ්‍යවලත් විවිධ අය විවිධ අදහස් දක්වනවා. අපටත් බණිනවා. රජයක් ලෙස අපේ ස්ථාවරය ඉතා පැහැදිලිව අපි සඳහන් කළා. විවිධ ආගම් අදහන අය සමඟ, විවිධ ජාතීන් සමඟ, විවිධ භාෂා කථා කරන අය සමඟ කටයුතු කරන විට රජයේ උසස්

නිලධාරින් ලෙස නියෝජනය වන පිරිස් රටේ යථාර්ථය ඉතා හොඳින් තේරුම් අරගෙන කටයුතු කළ යුතුයි කියන එක තමයි මගේ විශ්වාසය.

අපි දන්නවා, නිල ඇඳුම පිළිබඳව චක්‍රලේඛයක් තිබෙන බව. හැබැයි එසේ චක්‍රලේඛයක් තිබුණත්, සමහර අවස්ථාවලදී ඇතිවන ප්‍රශ්න මානුෂීයව වළක්වා ගැනීම සඳහා එම චක්‍රලේඛයට එහා ගිහින් කටයුතු කිරීමට මම හිතන විධියට පුරවැසියන් ලෙස අප හැම කෙනාටම වගකීමක් තිබෙනවා. උදාහරණයක් වශයෙන්, නුවරඑළිය වාගේ දිස්ත්‍රික්කයක් ගත්තොත්, ඒ ප්‍රදේශයේ වැඩ කරන කෙනෙක් චක්‍රලේඛය අනුව නිල ඇඳුම ඇන්දත්, ඒ ප්‍රදේශයේ තිබෙන ශීත දේශගුණයත් එක්ක ඇඳුමට උඩින් ජර්සි එකක්, දිග කලිසමක් ඇඳ ගන්නවා. හැබැයි චක්‍රලේඛය තුළ නිල ඇඳුම සම්බන්ධව තිබුණා වුණත්, මම හිතන විධියට ඒ පවතින කාලගුණ, දේශගුණ තත්ත්වයන් ඇතුළේ ඒ ප්‍රදේශවල ඒ දෙයට අනුමැතිය ලබා දෙනවා. ඒ වාගේම මඩකලපුව වාගේ ප්‍රදේශයක් ගත්තාම, ඒ ප්‍රදේශයේ සේවය කරන අය නිල ඇඳුම ඇන්දත්, පවතින දැඩි උෂ්ණත්වයත් එක්ක සමහර වෙලාවට කරපටිය ඉවත් කරලා වැඩ කරන අවස්ථා තිබෙනවා. ඇත්තටම අපි හැම කෙනාටම අවශ්‍ය වන්නේ සාමයෙන්, සහයෝගයෙන්, සහෝදරත්වයෙන් කටයුතු කරන එකයි. අපි හැම කෙනාගේම වුවමනාව ඒකයි. ඒ නිසා අපි හැම කෙනාම නම්‍යශීලීව කටයුතු කළ යුතුයි කියන එක තමයි මගේ හැඟීම.

ඕනෑම ප්‍රශ්නයකදී සියලු පාර්ශ්ව නම්‍යශීලී වනවා නම් අපට ඕනෑම ප්‍රශ්නයක් ඉතා හොඳින් විසඳා ගන්න පුළුවන්. මම කියන්න කැමැතියි, අපේ රටේ ජාතිවාදය, ආගම්වාදය මතින් දේශපාලනය කරන්න අදත් මාන බලන, ඒ සඳහා උත්සාහ දරන පාර්ශ්ව හැම තැනම ඉන්නා බව. ඒ නිසා අපි පරිස්සම් විය යුතුයි. ඔවුන්ගේ උගුල්වලට හසු වන්නේ නැතුව මේ ප්‍රශ්නය සාධාරණව විසඳා හැම කෙනාටම සාධාරණය ඉෂ්ට කරන්න අපි උත්සාහ දැරිය යුතුයි. අපේ ප්‍රාර්ථනාවත්, රටේ ප්‍රාර්ථනාවත් එයයි කියන එකයි මගේ විශ්වාසය.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතරක කාලයක් ලැබෙනවා.

[பி.ப. 5.49]

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, சுகாதார சேவையில் முஸ்லிம் பெண்களின் உடைக் கட்டுப்பாட்டினைத் தளர்த்துதல் சம்பந்தமாக கௌரவ உறுப்பினர் Dr. இராமநாதன் அர்ச்சுனா அவர்கள் முன்வைத்திருக்கின்ற இந்த ஒத்திவைப்புவேளைப் பிரேரணையை நானும் அங்கீகரிப்பதுடன், அவருக்கு எனது மனமார்ந்த நன்றியையும் தெரிவித்துக் கொள்கின்றேன். இது சாதாரணமான ஒரு விஷயமாக இருக்கலாம் அல்லது சிலர் அவ்வாறு நினைக்கலாம். ஆனால், உங்களுடைய அரசாங்கத்தைப் பொறுத்தவரையிலே, எனக்கு முன்னர் பேசிய பாராளுமன்ற உறுப்பினர் சொன்னதுபோல, இந்த நாட்டிலே மட்டக்களப்பு மாவட்டத்தைத் தவிர, கிழக்கு மாகாணத்தில் இருக்கின்ற ஏனைய 2 மாவட்டங்கள் உட்பட வன்னி தேர்தல் மாவட்டம், யாழ்ப்பாணம் மாவட்டம் ஆகிய எல்லா மாவட்ட மக்களும் அதிகபட்ச ஆணையை உங்களுடைய அரசுக்குத் தந்திருக்கிறார்கள். அதன்மூலம் இனவாதம் தோற்கடிக்கப்பட்டது; இனவாதிகளின் வாய் தற்பொழுது கட்டப்பட்டிருக்கின்றது.

ஆனால், இந்த கல்முனை வடக்கு ஆதார வைத்திய சாலையில் ஏற்பட்ட பிரச்சினை வேறு திணைக்களங்களுக்கும் பரவக்கூடிய ஆபத்து இருக்கின்றது; தயவுசெய்து நீங்கள் இதை உணர வேண்டும். இதற்கான குற்றச்சாட்டை முன்னாள் அமைச்சர்கள்மீதோ அல்லது முன்பிருந்த அரசாங்கங்கள்மீதோ சுமத்த முடியாது. ஏனென்றால், 75 வருட கால அரசாங்கங்களும் செய்த தவறுகள் ஒவ்வொன்றையும் சுட்டிக்காட்டி சுட்டிக்காட்டி, அவற்றை மக்களின் உள்ளங்களுக்குள் புகுத்தியதன் விளைவாகவே, ஒரு காலத்திலே தமக்குத் தனிநாடு வேண்டுமென்று கேட்டுநின்ற அந்த இளைஞர்களைப் பெரும்பான்மையாகக் கொண்டிருக்கின்ற யாழ்ப்பாண மாவட்டத்திலும் நீங்கள் வென்றீர்கள்; வன்னித் தேர்தல் மாவட்டத்திலும் வென்றீர்கள். அதேபோலதான் முஸ்லிம்கள் பெரும்பான்மையாக இருக்கின்ற அம்பாறை மாவட்டத்திலே நீங்கள் அதிகபட்ச ஆதரவைப் பெற்றிருக்கின்றீர்கள். அவ்வாறிருக்கின்றபொழுது தயவுசெய்து நீங்கள் காலதாமதம் இல்லாமல் கௌரவ உறுப்பினர் Dr. இராமநாதன் அர்ச்சுனா அவர்கள் முன்வைத்திருக்கின்ற இந்தப் பிரேரணையை நிறைவேற்ற வேண்டும் என்ற வேண்டுகோளை முன்வைக்கின்றேன்.

மேலும், குறித்த circularஐ மாற்றுவதென்பது எல்லோரும் கூடிக்கதைக்க வேண்டிய ஒரு விடயம் அல்ல. கோட்டாபய ராஜபக்ஷ என்ற கொடுங்கோலன் இந்த நாட்டிலே ஆட்சிக்கு வந்து நாட்டைப் பிழையான பாதைக்கு இட்டுச் சென்றதனால் 2 வருடத்தில் துரத்தியடிக்கப்பட்டார். உங்களுடைய கட்சியில் 159 உறுப்பினர்கள் இருப்பதுபோல் அவருடைய ஆட்சியில் ஆளுங்கட்சியில் 146 உறுப்பினர்கள் இருந்தும் அவரால் ஆட்சியில் நின்றுபிடிக்க முடியவில்லை. ஏனென்றால் இனவாதத்தை அடிப்படையாகக்கொண்டு ஆட்சிக்கு வந்த அவர், இனவாதத்தின் அதியுச்சத்திற்குப் போனதால் நின்றுபிடிக்க முடியாமற் போனது. அந்த வகையில், முஸ்லிம் பெண் சுகாதார உதவியாளர்களின் ஆடை விஷயத்தில் கல்முனை வடக்கு ஆதார வைத்தியசாலை நிர்வாகம் நடந்துகொண்ட விதத்தை எம்மால் ஏற்றுக்கொள்ள முடியாது.

ஏனென்றால், இந்த நாட்டிலே NHSLஇல் அது முடியுமாக இருந்தால், யாழ்ப்பாண வைத்தியசாலையிலே முடியுமாக இருந்தால், அம்பாந்தோட்டை வைத்தியசாலையிலே முடியுமாக இருந்தால், ஏன், எங்களுடைய பிரதி அமைச்சர் கௌரவ முனீர் முலாபர் சொன்னதுபோல நுவரெலியாவில் season காலங்களில் அவர்கள் அணியும் உடையை அனுமதிக்க முடியுமாக இருந்தால், தமிழ் - முஸ்லிம் மக்கள் சேர்ந்து வாழுகின்ற ஒரு பிரதேசமான கல்முனையில் உள்ள வைத்தியசாலையில் ஏன் இதைத் தடுத்துநிறுத்த வேண்டும்? இந்த ஆடைப் பிரச்சினை காரணமாக பல நூறு தாதியர் வீதிக்கு இறங்கிப் போராடுகின்ற நிலைமை ஏற்பட்டிருக்கின்றது. ஓர் இனத்தவர் உடுக்கின்ற ஆடையினால் மற்றைய இனத்தவர்களுக்கு என்ன பிரச்சினை? இங்கு ஒரு தமிழ்ப் பாராளுமன்ற உறுப்பினரான கௌரவ Dr. இராமநாதன் அர்ச்சுனாதான் இந்தப் பிரேரணையைக் கொண்டுவந்திருக்கின்றார். கௌரவ கஜேந்திரகுமார் பொன்னம்பலம் இதனை ஆதரித்துப் பேசுகிறார், கௌரவ மனோ கணேசன் ஆதரித்துப் பேசுகிறார். கௌரவ

[ගරු රිෂාඩ් බදියුදීන් මහතා]

சாணக்கியன் MP சொல்லுகிறார், முஸ்லிம் தாதியரின் உடை விஷயத்தில் அரசாங்கம் உடனடியாக ஒரு முடிவெடுக்க வேண்டும் என்று. கல்முனை வடக்கு ஆதார வைத்திய சாலையில் நிகழ்ந்த விஷயம் குறித்து பேசிய, தமிழ், முஸ்லிம், சிங்களப் பாராளுமன்ற உறுப்பினர்கள் யாரும் இதைத் தொடந்தேர்ச்சியாக நடைமுறைப்படுத்த வேண்டும் என ஆதரித்துப் பேசவில்லை. எனவே, இதனைச் செய்வதற்குக் குழுவும் தேவையில்லை, கூட்டமும் தேவையில்லை.

இந்த அரசாங்கத்தின்மீது பெரிய நம்பிக்கையைச் சிறுபான்மைச் சமூகம் கொண்டிருக்கிறது. எனவே, உடனடியாக இந்த circularஐ மாற்றியமையுங்கள் என மிக அன்பாக உங்களிடத்தில் நான் வேண்டுகோள் விடுக்கின்றேன். கௌரவ சுகாதார அமைச்சர் அவர்களே, நீங்கள் மிகவும் நேர்மையான ஓர் அமைச்சர். இந்தப் பாராளுமன்றத்தில் உங்களைப் பற்றி யாரும் குறை சொல்வது கிடையாது. எதிர்க்கட்சியினரும் கூட வரவேற்றுப் பேசுகின்ற ஓர் அமைச்சர் நீங்கள். எனவே, இதற்கு அஞ்ச வேண்டாம். தயவுசெய்து நீங்கள் உடனடியாக இந்த circularஐ மாற்றியமையுங்கள்! இல்லையென்றால், கல்முனை வடக்கில் விதைக்கப் பட்டிருக்கின்ற நச்சு விதை முளைத்து, தீயாகப் பரவி நாடு முழுக்க இதனால் பெரியதோர் ஆபத்து ஏற்படக்கூடிய நிலை உருவாகலாம். கோட்டாபய ஆட்சியில் நாங்கள் அமைச்சர்களாக இருக்கவில்லை. எங்களுடைய மக்களின் மையத்துகளைப் பகிரங்கமாக எரித்து அநியாயம் செய்த கோட்டாபய அரசாங்க காலத்தில் 2022இல்தான் அந்த circularஇல் சிறிய திருத்தம் செய்யப்பட்டது. அதை நீங்கள் தொடர வேண்டாம்! நீங்கள் நினைத்தால் இதனை மாற்றி அமைப்பதற்கு ஒரு நாள் போதும் அல்லது அடுத்த அமைச்சரவைக் கூட்டத்திலாவது ஒரு cabinet paperஐத் தாக்கல் செய்து, ஒரு வார காலத்திற்குள் அல்லது இரு வார காலத்திற்குள் தயவுசெய்து குறித்த circularஐ மாற்றியமைக்க வேண்டும்; மீண்டும் அந்த officers கல்முனை வடக்கு ஆதார வைத்தியசாலைக்கு கடமைபுரியச் செல்ல வேண்டும். இல்லையென்றால், இது ஒரு வழமையாக மாறிவிடும்; இது ஆபத்தானது. உங்களுடைய காலத்தில் இது நடக்கக் கூடாது என்று கூறி, விடை பெறுகின்றேன் நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු එම්.කේ.එම්. අස්ලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.54]

**ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා**
(மாண்புமிகு எம்.கே.எம். அஸ்லம்)
(The Hon. M.K.M. Aslam)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கல்முனை வடக்கு ஆதார வைத்தியசாலைக்கு நியமனம் பெற்றுச் சென்ற முஸ்லிம் பெண் சுகாதார உதவியாளர்களுக்கு ஏற்பட்ட நிலை என்பது கண்ணியத்துடன் பார்க்கப்பட வேண்டிய ஒரு விஷயம். இந்த விடயத்தில் இன்றைக்கு எமது நாட்டில் முஸ்லிம், தமிழ், சிங்களப் பாராளுமன்ற உறுப்பினர்கள் அனைவருடைய முயற்சியையும் நான் கண்ணியமாகப் பார்க்கின்றேன். இந்த நாட்டின் மக்கள் அனைவரும் ஒன்று சேர்ந்து வாழக்கூடிய பொருத்தமான சூழலை, அனைவரும் கௌரவமாகத் தொழில்புரியக்கூடிய ஒரு சூழலைக் கொண்டுவர வேண்டுமென்று நிறையக் கருத்துகள் அவர்களிடமிருந்து வெளிவந்ததை நான் காண்கின்றேன். Social media மூலமாக இருக்கலாம், பாராளுமன்ற உரைகளாக இருக்கலாம், பிரேரணையாக இருக்கலாம், எந்த வகையிலும் நாங்கள் இந்தச் சூழலை உருவாக்குவது மிகத் தேவையாக உள்ளது. நான் நினைக்கிறேன், ஒரு பிரச்சினையை நாங்கள் அணுகும்போது, அந்தப் பிரச்சினையின் வரலாற்றைப் பார்க்க வேண்டும்; அந்தப் பிரச்சினை உருவான சூழலைப் பார்க்க வேண்டும்; அதன் பின்னர் அனைவரும் ஒன்று சேர்ந்து இந்தப் பிரச்சினைக்கான காரணங்களைத் தேடி அதற்குத் தீர்வு காண வேண்டும். ஆவேசமாகப் பேசுவதனூடாகவோ அல்லது யாரையும் குறை சொல்வதனூடாகவோ இந்தப் பிரச்சினைக்கு ஒரு நாளும் தீர்வு காண முடியாது. அது அந்தப் பிரச்சினையை தீர்க்க முடியாதவாறு ஒரு தடையைத்தான் உருவாக்கும்.

உண்மையில் இந்த NPP அரசாங்கம் ஆட்சிக்கு வந்ததி லிருந்து இந்த நாட்டின் முஸ்லிம் மக்கள் நிம்மதியாக நோன்பு நோற்கிறார்கள். இந்த நாட்டுக்கு வந்த ரோஹிங்கியா முஸ்லிம் மக்களுக்குப் பாதுகாப்பு வழங்கப்பட்டது. இந்த நாட்டில் ஈரானியக் கப்பல் தாக்கப்பட்டபோது, அவர்கள் கண்ணிய மாகப் பாதுகாக்கப்பட்டார்கள். அதேபோன்று, எமது வியாபாரிகளுக்கும் பாதுகாப்பான சூழல் ஏற்பட்டிருக்கிறது. இந்த நாட்டில் வாழக்கூடிய எந்தவொரு முஸ்லிமும், எந்தவொரு தமிழ் மகனும், எந்தவொரு சிங்கள மகனும் NPP அரசாங்கம் இந்த நாட்டுக்குத் துரோகம் செய்துள்ளது என்றோ அல்லது இந்த நாட்டினுடைய அமைதியான சூழலைக் குழப்பியுள்ளது என்றோ சொல்லவில்லை; யாராலும் அவ்வாறு சொல்ல முடியாது. முஸ்லிம்களாக இருக்கலாம், தமிழர்களாக இருக்கலாம், அனைவரதும் உரிமைகள் பாதுகாக்கப்படுகின்ற ஓர் அழகான சூழல் இந்த NPP அரசாங்க காலத்தில்தான் உருவாகியுள்ளது என்பதை அவர்கள் நம்புகிறார்கள். அதுதான் உண்மை!

இன்றைய இந்த களம் - இந்தச் சூழல் என்ன சொல்கிறது? இந்தச் சுற்றுநிருபத்தை NPP அரசாங்கத்தால் மாற்ற முடியும்; அந்த மக்களுடைய உரிமையை வென்று கொடுக்க முடியும் என்ற நம்பிக்கையில்தான் நாங்கள் அனைவரும் கருத்துகளை முன்வைக்கின்றோம். பிரச்சினையை நாங்கள் இனங்கண்டு விட்டோம்; அதைக் கண்ணியமாக அணுகப் பார்க்கின்றோம். அந்தச் சகோதரிகளுக்கும் சரி, ஏனைய அரச துறைகளில் வேலை செய்யக்கூடிய அனைத்துச் சகோதரிகளுக்கும் சரி, பாதுகாப்பான ஒரு சூழலை உருவாக்குவது எமது கடமை. அதற்காகப் பல்வேறு மட்டக் கலந்துரையாடல்கள் நடைபெறுகின்றன. நாங்கள் அதற்குக் கண்ணியமளிப்போம். அதற்கு குறிப்பிட்ட கால அவகாசத்தை எங்களுக்குத் தாருங்கள்! அழகான முறையில் எல்லோரும் ஏற்றுக்கொள்ளக் கூடிய சூழலை உருவாக்கச் சந்தர்ப்பம் தாருங்கள்! இந்த வைத்தியசாலையாக இருக்கலாம் அல்லது ஏனைய அரசாங்க மற்றும் தனியார் நிறுவனங்களாக இருக்கலாம், அங்கு வேலை செய்கின்ற அனைவருக்கும் பாதுகாப்பான சூழலை உருவாக்க நாங்கள் கடமைப்பட்டுள்ளோம்; நாங்கள் அதைச் செய்வோம். இந்த அரசாங்கத்தில் இருக்கின்ற எட்டு முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்கள் மட்டுமல்ல, தமிழ் பாராளுமன்ற உறுப்பினர்கள், சிங்களப் பாராளுமன்ற உறுப்பினர்கள் என அனைவரும் சேர்ந்து முஸ்லிம்களுடைய உரிமையைப் பாதுகாப்போம்! அனைவரும் சேர்ந்து தமிழ் மக்களுடைய உரிமையைப் பாதுகாப்போம்! அதேபோன்று, அனைவரும் சேர்ந்து சிங்களச் சகோதரர்களுடைய உரிமையைப் பாதுகாப்போம்!

நாங்கள் ஒன்றை மட்டும் நினைவில்கொள்ள வேண்டும். இந்த சந்தர்ப்பத்தில் NPP அரசாங்கம் இல்லையென்றால், அன்று முஸ்லிம்களின் மையத்து எரிக்கப்பட்டது போன்று,

கடைகள் எரிக்கப்பட்டது போன்று, நோன்பு நோற்க முடியாத சந்தர்ப்பம் ஏற்பட்டதுபோன்று, மூன்றுவேளைத் தொழுகை கூட நடத்த முடியாத சந்தர்ப்பம் ஏற்பட்டது போன்று இந்த நிலைமையும் நெருப்பெடுத்திருக்கும்! இவ்விடயத்தில் சுமுகமான சூழலை உருவாக்க எமது கௌரவ அமைச்சர் அவர்கள் இப்பிரச்சினைக்குத் தற்காலிகத் தீர்வை வழங்கியுள்ளார். எனவே, இந்தப் பிரச்சினைக்கு அழகான முறையில் தீர்வைக் காண்பதற்காக எதிர்க்கட்சி உறுப்பினர்கள், எமது சமூக ஊடகவியலாளர்கள், புத்திஜீவிகள் மற்றும் சிங்கள, தமிழ், முஸ்லிம் மக்கள் என அனைவரும் கைகோர்க்க வேண்டும். இந்த உரிமைகளைப் பாதுகாப்பதற்காக நாம் அனைவரும் ஒன்றிணைந்து செயற்படுவோம்! இந்த விடயத்தில் நாங்கள் யாரையும் எதிரிகளாகப் பார்க்கவில்லை. அதனால் நிதானமாகவும் ஆவேசம் இல்லாமலும் பொறுமையாக இந்தப் பிரச்சினையைத் தீர்ப்பதற்கு நான் உங்களுக்கு அழைப்புவிடுத்து, விடைபெறுகிறேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.58]

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කල්මුණේ උතුර රෝහල තුළ ඇති වුණු ප්‍රශ්නය සම්බන්ධයෙන් මම පිළිතුරු දෙන තුන්වන අවස්ථාවයි, මේ. ඒ නිසා මම හිතනවා, මේ සම්බන්ධයෙන් මේ වනවිට ඇති තරම් කරුණු ප්‍රකාශයට පත් කර තිබෙනවාය කියලා. ඒ වාගේම මේ පිටුපස තිබෙන දේශපාලන අරමුණු මොනවාද, ඇයි මේ ප්‍රශ්නය මේ තරම් දුර දිග අරගෙන යන්න හදන්නේ කියන එකත් අපට පැහැදිලියි.

විශේෂයෙන්ම අපේ මුස්ලිම් ජනතාව ජීවත් වන ප්‍රදේශ නියෝජනය කරමින්, ඒ ජනතාව ජීවත් වන දිස්ත්‍රික්කවලින් පැමිණි මහජන නියෝජිතයන් ආණ්ඩු පක්ෂය තුළ විශාල සංඛ්‍යාවක් ඉන්නවා. ඒ අයත් ඉතා සංවේදීව මේ ප්‍රශ්නය දිහා බැලුවා. කිසිදු ආකාරයක ජාතිවාදී ගැටුමක් ඇති නොවන තැනට ඒ අය මැදිහත්වීම් කළා සහ කරමින් ඉන්නවා. අපිට අවශ්‍ය වන්නේ මේ රටේ කිසිදු ආකාරයකින් සුළු හෝ ජාතිවාදී ගැටුමක් ඇතිවීම වැළැක්වීම සහ අපි මහජනතාවට සපයන අධ්‍යාපනය, සෞඛ්‍යය, ප්‍රවාහනය ආදී සේවාවන් අඛණ්ඩව පවත්වා ගෙන යැමට කටයුතු කරන එකයි.

ගරු රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමාත් දන්නවා, මේ අවුරුද්දේ පසුගිය මාස හය හතක කාලය තුළදී වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය විසින් වැඩ වර්ජන කිහිපයක් රෝහල් හතරක පමණ දියත් කළ බව. ඒ අවස්ථාවලදී එම රෝහල්වල කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා අපට තාවකාලික වශයෙන් පියවර ගන්න සිදු වුණා. ඒ අනුව එම කාරණාවලට හේතු වුණු සමහර වෛද්‍ය නිලධාරීන්, වෛද්‍ය පරිපාලකයන් මාරු කරන්නට සිදු වුණා.

අක්කරෙයිපත්තුවේ එහෙම දෙයක් සිදු වුණා. රත්නපුරේ එහෙම දෙයක් සිදු වුණා. කුලියාපිටියේ එහෙම දෙයක් සිදු වුණා. ඇඹිලිපිටියේ එහෙම දෙයක් සිදු වුණා. ඒ වෙලාවේදී අපි කල්පනා කළා, ඒ ප්‍රශ්නය පිළිබඳව විමර්ශනය කරන්න කාලයක් අර ගන්නවා; නමුත් ඒ මොහොතේදී සෞඛ්‍ය සේවාව පවත්වා ගැනීම සඳහා තිබෙන අවස්ථාව සලසනවා කියන එක. විමර්ශන අවසන් වෙනකොට සමහර විට අපි මාරු කරපු අය නිවැරදි වෙන්නට පුළුවන්. සමහර අයට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සහිතව වෙන ස්ථාන ලබා දීලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒවා කරන්නේ ජනතාවට අඛණ්ඩව සේවාව සපයන්නයි. රත්නපුර වාගේ තැනකටත් වඩා අක්කරෙයිපත්තුව පිළිබඳව කථා කරනකොට, ඒ ප්‍රදේශයේ ජනතාවට සෞඛ්‍ය පහසුකම් ලබා ගන්න වෙන විකල්ප නැහැ. ඒ වෙනුවෙන් අපට මේ තීන්දුව ගන්න සිදු වුණා.

මෙතැනදී චක්‍රලේඛ කිහිපයක් සම්බන්ධයෙන් අවධානය යොමු කළා. මම හිතනවා, අදහස් විකෘති නොකර සමාජයට අරගෙන යන්නට ඒ චක්‍රලේඛ පිළිබඳව දැන ගැනීම වැදගත් වේවි කියලා. රජයේ සේවකයන්, රජයේ නිලධාරීන් සමහර කෙනෙකුට තිබෙනවා, dress code එකක්. සමහර කෙනෙකුට තිබෙනවා, නිල ඇඳුමක්. මේ සම්බන්ධයෙන් අපට පළමුවෙන්ම හමු වන චක්‍රලේඛය තමයි, 1989 පෙබරවාරි මාසයේ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය නිකුත් කරපු චක්‍රලේඛය. එහි තිබෙන්නේ මාණ්ඩලික ශ්‍රේණිවල නිලධාරීන්ගේ නිල ඇඳුම සම්බන්ධයෙන්. ඒක තමයි අපට තිබෙන පළමුවන චක්‍රලේඛය. ඊට වසර ගණනාවකට පසුව 2019දී රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා වාගේම ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන, රනිල් වික්‍රමසිංහ අගමැතිවරයා හිටපු ආණ්ඩුව, ඔබතුමා ඇමති විධියට, හකීම් මැතිතුමා ඇමති විධියට, සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමා ඇමති විධියට කටයුතු කරපු ආණ්ඩුව විසින් චක්‍රලේඛයක් නිකුත් කළා, 2019.06.26 දින. එහි බොහොම පැහැදිලිව කියනවා, රජයේ නිලධාරීන්ගේ නිල ඇඳුම පිළිබඳව. එහි 3.II ඡේදයේ මෙසේ සඳහන් වෙනවා:

> "දැනටමත් නිල ඇඳුමක් හෝ නිල ඇඳුම් දීමනා ලබන නිලධරයන් තමාගේ අනුමත නිල ඇඳුමින් සැරසී රාජකාරියේ යෙදී සිටිය යුතුය"

මේක ඔබතුමන්ලා හිටපු ආණ්ඩුව අනුමත කරපු චක්‍රලේඛය. මම හිතනවා, ඔබතුමාත් මේකට විරුද්ධ වුණේ නැහැ කියලා. ඔබතුමා කිව්වේ, 2022දී මේක අහෝසි කළා නම්, යළි මෙතැනට එන්න කියලා. ගරු මන්ත්‍රීතුමා, 2019ට ආවාම තිබෙන්නේත්, "දැනටමත් නිල ඇඳුමක් හෝ නිල ඇඳුම් දීමනා ලබන නිලධරයන් තමාගේ අනුමත නිල ඇඳුමින් සැරසී රාජකාරියේ යෙදී සිටිය යුතුය" කියලායි. අනුමත නිල ඇඳුම් තිබෙනවා. නිල ඇඳුම් දීමනා හම්බ වෙනවා. මීට අමතරව dress code එකට අනුව අඳින නිලධාරීන් ඉන්නවා. එතකොට dress code එකට අනුව ඇඳුම් අඳින අයට තමයි මේ විවිධ වෙනස්කම් කරලා තිබෙන්නේ. 2022දී අලි සබ්රි මැතිතුමා හිටපු ආණ්ඩුවෙන්, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා හිටපු ඒ ආණ්ඩුවෙන් අර චක්‍රලේඛය අහෝසි කළා කියලා ඔබතුමා කිව්වා. යම් ප්‍රමාණයක් සංශෝධනය කළා. හැබැයි, ඒකෙත් කියැවෙනවා, 2022දීත් මේ නිල ඇඳුම් අඳින අය සම්බන්ධයෙන් ඒ තිබෙන චක්‍රලේඛය එහෙමම පවත්වාගෙන යනවා කියන එක. මේක තමයි චක්‍රලේඛ සම්බන්ධයෙන් තත්ත්වය. ඒ නිසා චක්‍රලේඛ ගැන කථා කළොත්, කලින් අවස්ථාවලත් ඕනෑ නම් තිබුණා මේවා වෙනස් කරන්නට. නමුත් වෙනස් කරලා නැහැ. එහෙම තමයි මේක මේ දක්වා ඇවිල්ලා තිබෙන්නේ. එතකොට ඒ චක්‍රලේඛ මේ රටේ ක්‍රියාත්මක වෙනවා. *[බාධා කිරීමක්]* ඔව්. කියන්න, කියන්න.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)

ගරු ඇමතිතුමා, මෙච්චර කාලයක් මේ වාගේ ප්‍රශ්නයක් ආවේ නැහැ. මමත් ඔබතුමාට දුරකථනයෙන් call කරලා කිව්වේ, ඒ නිලධාරියාට කිව්වොත් මේ ප්‍රශ්නය විසඳෙනවා කියලා. ඒ නිලධාරියා නේ, මේ ලොකු දුරට මේක ගෙනාවේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ඔබතුමා කියන විධියට ඒක ඇත්ත. මේ චක්‍රලේඛය තිබියදීත් සමහර තැන්වල වෙනස්කම් සිදු වෙනවා. ඒක මම පිළිගන්නවා. නමුත් දැන් මේ ප්‍රශ්නයේදී කල්මුණේ උතුරේ සෞඛ්‍ය කාර්ය සහායකයන් හැටියට වැඩ කරන්නේ දෙමළ අය පමණක් නොවෙයි. සිංහල අය ඉන්නවා; මුස්ලිම් අයත් ඉන්නවා. එතැන කලිනුත් මුස්ලිම් කාන්තාවක් හිටියා. එතකොට ඒ කාලයේ නිල ඇඳුම් ප්‍රශ්නයක් තිබුණේ නැහැ. බොහොම සාමකාමීව මේ කටයුතු කරගෙන ගියා. අලුතෙන් සෞඛ්‍ය කාර්ය සහායකයන් 9දෙනෙක් - විශේෂයෙන් මුස්ලිම් ජාතික කාන්තාවන් - මෙතැනට ආවාට පස්සේ තමයි මේ ප්‍රශ්නය පැන නැඟුණේ. එතකොට දැන් මේ සෞඛ්‍ය සේවාව පවත්වාගෙන යාමට සහ මේ ඇඳුම පදනම් කරගෙන ඒ ප්‍රදේශයේ ඇති වන නොසන්සුන්තාව වැළැක්වීම සඳහා අපට මේ වෙලාවේ ගත හැකි ප්‍රායෝගික ක්‍රියාමාර්ගය තමයි, මේ ප්‍රශ්නය අවසන් කර ගන්නා තුරු තාවකාලික පදනමින් ඉතාම ආසන්න රෝහලට ඔවුන් අනුයුක්ත කරන එක. ඒ වෙලාවේදී අපි පළාත් සභා රෝහලකට ඔවුන් දැම්මේ නැහැ. අපි ඔවුන්ව දැම්මේ මධ්‍යම රජයට අයිති රෝහලකට.

අපි මේ ප්‍රශ්නය විසඳා ගන්න බලමු. මට ඒකට ඔබ සියලුදෙනාගේ සහයෝගය අවශ්‍යයි. අවශ්‍ය නම් අපි circular එක වෙනස් කරමු. හැබැයි, වසර ගණනාවක් තිස්සේ circular එකක් තිබිලා තියෙනවා. ඒ මත පදනම් වෙලා රජයේ නිලධාරින් කටයුතු කර තිබෙනවා. එහෙම තිබියදී අපි අතරට සාකච්ඡාවක් ඇවිත් තිබෙනවා. ඇත්තටම මම මේ පිළිබඳව සොයා බැලුවා. 1992 වර්ෂයේදී මේ සම්බන්ධව පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. හැබැයි, එවකට පැවැති ආණ්ඩු එකක්වත් ඔය circular එක වෙනස් කර නැහැ. මම නිතරම කිව්වා, රාජ්‍ය සේවයට, විශේෂයෙන්ම සෞඛ්‍ය සේවාවට මුස්ලිම් ජාතික තරුණියන් ප්‍රමාණයක් එන ප්‍රවණතාවක් තිබෙන බව. අපි ඒක අගය කරනවා. එසේ එන්න ඕනෑ. දෙමළ අය එනවා; මුස්ලිම් අය එනවා; සිංහල අය එනවා. ඒ හැමෝම එන්න ඕනෑ. එහෙම ඇවිත් මේ සේවාව සපයන්න ඕනෑ. ඇත්තටම රාජ්‍ය සේවාවට ඇතුළත් වෙලා, පොදු කටයුතුවලට මැදිහත් වෙලා එසේ සේවාව සැපයීම ඇතුළේම තමයි සමහර ජාතිවාදී ප්‍රවණතා පරාජයට පත් කිරීමට පුළුවන්කම ලැබෙන්නේ.

මෙහිදී අපි ඡන්ද ගැන විතරක්ම නොවෙයි බැලිය යුත්තේ. පරිණත මහජන නියෝජිතයන් හැටියට මේ මොහොතේදී පැන නැඟී තිබෙන ගින්න ඉස්සෙල්ලා නිවාගෙන ඉන්න ඕනෑ. පොඩි ගිනි පුපුරක් ඇවිල්ලා තිබෙනවා නේ. ඒක නිවාගෙන ඊට පසුව අපි මේ සම්බන්ධයෙන් වන ස්ථිරසාර විසඳුමකට යමු. ඒකට ඔබතුමන්ලාත් යෝජනා ඉදිරිපත් කරන්න. ඒවා අපි සාධනීයව පිළිගන්න සූදානම්. නමුත් මම කියන්නේ මේ ප්‍රශ්නය දැන් අපි අවසන් කරගන්න ඕනෑය කියන එකයි. මොකද, මේ ප්‍රශ්නය දඩමීමා කරගෙන එතැන ගැටුමක් ඇති වුණා නම්, කෙනෙකුට පහර දුන්නා නම් තත්ත්වය මීට වඩා බරපතළ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එහෙම නොවිය හැකියි කියලා අපට කියන්න බැහැ. මොකද, තවම රට තුළ ජාතිවාදී මනෝභාවය සම්පූර්ණයෙන්ම තුරන් කරලා කියලා අපට කියන්න බැහැ. තැන් තැන්වල එහෙම මතු කරන්න උත්සාහයන් පවතිනවා. එවැනි අවස්ථාවලදී අපි මැදිහත් වෙලා එක්කෝ සාකච්ඡා මාර්ගයෙන්, එහෙම නැත්නම් සම්මුතියෙන්, එහෙමත් නැත්නම් නීතියෙන් අපි ඒවා සම්බන්ධව කටයුතු කර තිබෙනවා. මේ අවස්ථාවේදීත් අපි නීතිමය ක්‍රියාමාර්ග නොවෙයි, ඉතාම ප්‍රායෝගික විසඳුමක් ගන්න ගියේ.

සමහර තැන්වල ඉල්ලා ගෙනත් ස්ථාන මාරු වෙනවා නේ. ඉල්ලා ගෙන යන අයත් ඉන්නවා. සමහර විට මේ අයට ඒ රෝහල හොඳ වෙන්න පුළුවන්, ආයෙත් කාලයකින් එන්න පුළුවන්කමත් තිබෙනවා. සෞඛ්‍ය කාර්ය සහායකයන් වශයෙන් පත්වුණු මුස්ලිම් ජාතික කාන්තා, පිරිමි ගොඩක් දෙනා රෝහල්වල සේවය කරනවා. ඒ නිසා මම හිතනවා, මේ ප්‍රශ්නය තවදුරටත් ඇද ගෙන යා යුතු නැහැ කියලා. අපි තාවකාලිකව විසඳුමක් ලබා දීලා තිබෙනවා. අපි බලමු. ඔබතුමන්ලා කියන හැටියට ඒ වෛද්‍ය පරිපාලනය සම්බන්ධයෙන් චෝදනා තිබෙනවා නම් ඒවාත් විමර්ශනය කරන්න අපි සූදානම්. මේ ගැටලුව ඇති වුණේ කොහොමද කියන කාරණය පිළිබඳවත් අපේ අවධානය යොමු කර තිබෙනවා. මේ සියල්ල සම්බන්ධව සලකා බලමින් තමයි අපි කටයුතු කරන්නේ. ඒ නිසා අපි ඉදිරියේදී මේ පිළිබඳව වඩාත් පුළුල් ප්‍රවේශයකට එමු කියා යෝජනා කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. ස්තුතියි.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක කාලයක් ලබා දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

කියන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)

ගරු ඇමතිතුමනි, ඔබතුමා පිළිබඳව අප තුළ ලොකු ගෞරවයක් තිබෙනවා. මේ ප්‍රශ්නය මෙතැන පටන් ගත් නිසා වෙන ආයතනවලත් මේ වාගේ ප්‍රශ්න පටන් ගන්න පුළුවන්, ඇමතිතුමනි. දන්නවා නේ, ඔබතුමන්ලාගේ ආණ්ඩුව තුළ ජාතිවාදය නැති නිසා, මේ වාගේ දේවල් ඇති කරන්න මේක ආරම්භයක් විධියට එන්න පුළුවන්. ඒ නිසා අපි කියන්නේ පොඩි කාලයක් ඇතුළත; at least මාසයක හෝ මාස දෙකක හෝ කාලයක් ඇතුළත මේ සම්බන්ධව පියවරක් ගන්න. දෙමළ මන්ත්‍රීවරුන් කවුරුවත් මේක එපා කියලා මෙතැනට ඇවිල්ලා කිව්වේ නැහැ. පෞද්ගලිකව ඔබතුමාට මොනවා කිව්වාද කියලා මම දන්නේ නැහැ. හැබැයි, ගරු ඇමතිතුමනි, මෙතැන කථා කළ ඔක්කෝම අය ඉල්លුවේ, මේක වෙනස් කරන්න කියලායි. කවුරුත් බැහැ කියලා කියන්නේ නැහැ. සමහර විට එළියේ කවුරු හරි කිව්වාද දන්නේ නැහැ. දැන් ඔබතුමන්ලා විසි දෙවන Amendment එක ගෙනෙනවා. ඔක්කෝමලා කැමති නැහැ නේ, ඔයගොල්ලන්ට ඕනෑ නම් ගෙනෙනවා. ඒ වාගේම මේකත් පුළුවන් නම් ගෙනෙන්න කියලා මම කියන්න කැමැතියි. ඔබතුමා කැමැති නම් ගෙනෙන්න පුළුවන්. ඒකයි මම කියන්නේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

අපි ඒවා ගැන සාකච්ඡා කරන්නත් සූදානම්. හැබැයි අර්ච්චුනා මන්ත්‍රීතුමා, ඔබතුමා ඉදිරිපත් කළ මෙම යෝජනාව තුළ, "...මෙම ජනතාවට එරෙහිව සිදුවන සැලසුම් සහගත මර්දනයට එරෙහිව..." කියලා සඳහන් කළාම, ඒක මේ පාර්ලිමේන්තුවේ කළ ඉතාම බරපතළ ප්‍රකාශයක් කියා මම හිතනවා. එහෙම මර්දනයක් කිසිම

ආකාරයකින් කිසිම ජාතියක් හෝ ආගමක් මත අපි දියත් කර නැහැ. කිසිම ප්‍රදේශයක ජීවත් වන ජනතාවකට විරුද්ධව එවැනි මර්දනයක් දියත් කර නැහැ.

ඇත්තටම මම මෙතැනදී සතුටින් කියන්න කැමැතියි, ඉතිහාසයේ පළමුවැනි වතාවට සෞඛ්‍ය කාර්ය සහායකයන් බඳවා ගත්තේ කිසිදු ආකාරයේ දේශපාලන මැදිහත්වීමක් නැතුවයි, කිසිදු මන්ත්‍රීවරයෙකුගේ, ඇමතිවරයෙකුගේ ලැයිස්තුවක් නැතුවයි කියන එක. අපි එහෙම බඳවා ගෙන රෝහල් සේවාව සැපයීමේදී අනවශ්‍ය ලෙස තැනක ඇති වුණු ප්‍රශ්නයක්, මේක. අපි තව බලමු, මේ කාරණයට අදාළ පරිසරය මොකක්ද කියන එක.

ගරු මන්ත්‍රීතුමනි, මෙවැනි ප්‍රශ්නයක් අපි වුවමනාවට වඩා සීමාවෙන් එපිට සංවාදයට, සාකච්ඡාවට සහ කතිකාවට ගැනීම ඇතුළේ අනවශ්‍ය ප්‍රශ්න ප්‍රමාණයක් පැන නඟිනවා. ඒකත් මතක තබා ගන්න. මම හිතනවා, ඔබතුමාට ඒ ගැන අවබෝධයක් ඇති කියලා. අපි එකඟතාවෙන්, අවබෝධයෙන් ජාතික සමඟිය වෙනුවෙන් සහ සංහිඳියාව වෙනුවෙන් කටයුතු කරගෙන යනවා. ඊට වඩා සීමාව ඉක්මවා යාම එච්චර හොඳ නැහැ, රටකට. ඒ නිසා ඒවාත් සලකා බලන්න කියා මා ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 6.10ට, 2026 අගෝස්තු 21වන සිකුරාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 6.10க்கு, பாராளுமன்றம் 2026 ஓகஸ்ட் 21, வெள்ளிக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 6.10 p.m. until 9.30 a.m. on Friday, 21st August, 2026.*

## ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
## வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
## WRITTEN ANSWERS TO QUESTIONS

### කෝරළේපත්තු උතුර, වාකරේ ප්‍රා.ලේ. කොට්ඨාසයේ රජයේ ඉඩම්වල පදිංචිකරුවන්: නඩු පැවරීම
### கோரளைப்பற்று வடக்கு, வாகரை பிரதேச செயலாளர் பிரிவிலுள்ள அரச காணிகளில் வசிப்போர்: வழக்குத் தாக்கல்
### PERSONS RESIDING ON STATE LAND IN KORALAIPATTU NORTH, VAKARAI DS DIVISION: LITIGATION

893/2025

**1. ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) රජය විසින් පිරිනමනු ලබන 'දීමනා පත්‍ර' හෝ 'ඉඩම් බලපත්‍ර' නොමැතිව මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරළේපත්තු උතුර, වාකරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති රජයේ ඉඩම්වල පුද්ගලයන් පදිංචි වී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන්ගේ සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම රජයේ ඉඩම්වලින් ඉහත පුද්ගලයන් නීත්‍යානුකූලව ඉවත් කිරීම සඳහා 2017.01.01 සිට 2025.03.31 දින දක්වා වූ කාල සීමාවේදී අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ඔවුන්ට එරෙහිව අධිකරණයේ නඩු පවරා තිබේද;

(iv) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(v) අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නඩු පැවරූ පුද්ගලයන් අතරින් ඉහත කාල සීමාවේදී අධිකරණ නියෝග මත රජයේ ඉඩම්වලින් ඉවත් කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(vi) නඩු පැවරිය යුතු, එහෙත් අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නඩු නොපවරන ලද පුද්ගලයන් සිටීද;

(vii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(viii) කිහිපදෙනෙකුට එරෙහිව පමණක් නඩු පැවරීමටත්, වැඩි පිරිසකට එරෙහිව නඩු නොපැවරීමටත් හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அரசாங்கத்தால் வழங்கப்படுகின்ற 'அளிப்புப் பத்திரம்' அல்லது 'காணி உரிமம்' இல்லாது மட்டக்களப்பு மாவட்டத்தின், கோரளைப்பற்று வடக்கு, வாகரை பிரதேச செயலாளர் பிரிவிலுள்ள அரசாங்க காணிகளில் ஆட்கள் குடியிருக்கின்றமையை அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி ஆட்களின் எண்ணிக்கை, அவர்களின் பெயர்கள் மற்றும் ஏற்புடைய விபரங்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி அரசாங்க காணிகளிலிருந்து மேற்குறிப்பிட்ட ஆட்களை சட்டரீதியாக வெளியேற்றுவதற்கு 2017.01.01 தொடக்கம் 2025.03.31ஆம் திகதி வரையான காலப்பகுதியில் ஏற்புடைய பிரதேச செயலாளர் அவர்களுக்கு எதிராக நீதிமன்றத்தில் வழக்குத் தாக்கல் செய்துள்ளாரா என்பதையும்;

(iv) ஆமெனில், மேற்படி ஆட்களின் எண்ணிக்கை, அவர்களின் பெயர்கள் மற்றும் ஏற்புடைய விபரங்கள் யாவை என்பதையும்;

(v) வழக்குத் தாக்கல் செய்யப்பட்டுள்ள ஆட்களில் மேற்குறிப்பிட்ட காலப்பகுதியில் நீதிமன்ற உத்தரவுகளுக்கமைய அரசாங்க காணிகளிலிருந்து வெளியேற்றப்பட்ட ஆட்களின் எண்ணிக்கை, அவர்களின் பெயர்கள் மற்றும் ஏற்புடைய விபரங்கள் யாவை என்பதையும்;

(vi) வழக்குத் தாக்கல் செய்யவேண்டி இருப்பினும், ஏற்புடைய பிரதேச செயலாளரினால் வழக்குத் தாக்கல் செய்யப்படாத ஆட்கள் இருக்கின்றார்களா என்பதையும்;

(vii) ஆமெனில், மேற்படி ஆட்களின் எண்ணிக்கை, அவர்களின் பெயர்கள் மற்றும் ஏற்புடைய விபரங்கள் யாவை என்பதையும்;

[ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා]

(viii) குறிப்பிட்ட சிலருக்கு எதிராக மாத்திரம் வழக்குத் தாக்கல் செய்யப்பட்டமைக்கும், கூடுதலான ஆட்களுக்கெதிராக வழக்குத் தாக்கல் செய்யப்படாமைக்குமான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) whether he is aware that persons are residing on State lands in the Koralaipattu North, Vakarai Divisional Secretary's Division of the Batticaloa District without a Deed of Grant or a Land Permit awarded by the Government;

(ii) if so, the number of such individuals, their names and relevant details;

(iii) whether the respective Divisional Secretary has filed action at the court of law against them during the period from 01.01.2017 to 31.03.2025 to legally evict those individuals from the State lands referred to above;

(iv) if so, the number of such individuals, their names and relevant details;

(v) the number of evicted individuals from the State lands on court orders during the said period along with their names and relevant details, out of the total number of individuals prosecuted by the relevant Divisional Secretary;

(vi) whether there are persons against whom the Divisional Secretary has not filed action although he should have;

(vii) if so, the number of such persons, their names and relevant details; and

(viii) the reasons for filing action against only a few of them while not filing action against most?

(b) If not, why?

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)

(අ) (i) ඔව්.

(ii) පුද්ගලයන් සංඛ්‍යාව 36කි. විස්තර **ඇමුණුම 01*** මඟින් දක්වා ඇත. (දෙමළ භාෂාවෙන් ඇති ඇමුණුම 01 බලන්න.)

(iii) ඔව්.

(iv) පුද්ගලයන් සංඛ්‍යාව 13කි. විස්තර **ඇමුණුම 02*** මඟින් දක්වා ඇත. (දෙමළ භාෂාවෙන් ඇති ඇමුණුම 02 බලන්න)

(v) ග්‍රාම නිලධාරි මාර්ගයෙන් ඉවත් කරන පුද්ගලයන් සංඛ්‍යාව 07කි.

අධිකරණ නියෝග අනුව රජයේ ඉඩම්වලින් ඉවත් කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව 09කි. විස්තර **ඇමුණුම 03**** මඟින් දක්වා ඇත. (දෙමළ භාෂාවෙන් ඇති ඇමුණුම 03 බලන්න.)

(vi) නැත.

අලුතින් ඉඩම් අනවසරයෙන් අත් පත් කරගනු ලබන අවස්ථාවලදී ඔවුන්ට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගනු ලැබේ.

(vii) නැත.

අලුතින් ඉඩම් අනවසරයෙන් අත් පත් කර ගන්නා අවස්ථාවකදී පමණක් මෙම කරුණ පිළිබඳව තොරතුරු අනාවරණය කරනු ලැබේ.

(viii) එවැනි තත්ත්වයක් නොමැත. රජයේ ඉඩම් අනවසරයෙන් අත් පත් කර ගන්නා සියලුම පාර්ශ්වයන්ට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

(ආ) අදාළ නොවේ.

(அ) (i) ஆம்.

(ii) ஆட்களின் எண்ணிக்கை 36 ஆகும். விபரம் **இணைப்பு 01***இல் தரப்பட்டுள்ளது.

(iii) ஆம்.

(iv) ஆட்களின் எண்ணிக்கை 13 ஆகும். விபரம் **இணைப்பு 02***இல் தரப்பட்டுள்ளது.

(v) கிராம அலுவலர்மூலம் வெளியேற்றப்பட்ட ஆட்களின் எண்ணிக்கை 7 ஆகும்.

நீதிமன்ற உத்தரவுகளுக்கமைய அரசாங்க காணிகளிலிருந்து வெளியேற்றப்பட்ட ஆட்களின் எண்ணிக்கை 9 ஆகும். விபரம் **இணைப்பு 03***இல் தரப்பட்டுள்ளது.

(vi) இல்லை.

புதிதாக அரசாங்க காணிகளை சட்டவிரோதமாக ஆக்கிரமிக்கும் சந்தர்ப்பங்களில், அவர்களுக்கு எதிராக நீதிமன்ற நடவடிக்கைகள் மேற்கொள்ளப்படுகின்றன.

(vii) இல்லை.

புதிதாக காணிகள் சட்டவிரோதமாக ஆக்கிரமிக்கப்படும் சந்தர்ப்பங்களில் மட்டுமே இவ்விடயம் தொடர்பான தகவல்கள் வெளிப்படுத்தப்படுகின்றன.

(viii) அவ்வாறான நிலைமை எதுவும் இல்லை. அரசாங்க காணிகளை சட்டவிரோதமாக ஆக்கிரமிக்கும் அனைத்துத் தரப்பினருக்கும் எதிராக நீதிமன்ற நடவடிக்கைகள் தொடர்ந்து மேற்கொள்ளப்பட்டு வருகின்றன.

(ஆ) ஏற்புடையதாகாது.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

(a) (i) Yes.

(ii) The number of individuals is 36. Details are given in Annex 01*. (Refer to Annex 01 in Tamil)

(iii) Yes.

(iv) The number of individuals is 13. Details are given in Annex 02*. (Refer to Annex 02 in Tamil.)

(v) The number of persons evicted through the Grama Niladhari is seven.

The number of persons evicted from State lands pursuant to court orders is nine. Details are given in Annex 03*. (Refer to Annex 03 in Tamil)

(vi) No.

In cases where they newly occupy State lands unlawfully, court action will be taken against them.

(vii) No.

Information on this matter will be disclosed only in cases where land is newly occupied unlawfully.

(viii) There is no such situation. Court action is being taken against all parties who unlawfully occupy State lands.

(b) Not applicable.

## දීමනා පත්‍ර/ඉඩම් බලපත්‍ර සහිත රජයේ ඉඩම්වල පදිංචිකරුවන්: කෝරළේපත්තු දකුණ, කිරාන් ප්‍රා.ලේ. කොට්ඨාසය

අளிப்புப் பத்திரங்கள்/காணி உரிமம் ஊடாக வழங்கப்பட்ட அரச காணிகளில் வசிப்போர்: கோரளைப்பற்று தெற்கு, கிரான் பிரதேச செயலாளர் பிரிவு

PERSONS SETTLED ON STATE LAND WITH DEEDS OF GRANT/ LAND PERMITS: KORALAIPATTU SOUTH, KIRAN DS DIVISION

894/2025

2. **ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, කොරළේපත්තු දකුණ, කිරාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඇති රජයේ ඉඩම් සඳහා 2017.01.01 සිට 2025.03.31 දක්වා කාල වකවානුව තුළ රජයේ 'දීමනා පත්‍ර' හෝ 'ඉඩම් බලපත්‍ර' ලබා දුන් ඉඩම්වල ජනතාව පදිංචි වී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ තොරතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

*  පුස්තකාලයේ තබා ඇත.
*  நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
*  *Placed in the Library.*

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2017.01.01ஆம் திகதி தொடக்கம் 2025.03.31ஆம் திகதி வரையான காலப்பகுதியில், மட்டக்களப்பு மாவட்டத்தின், கோரளைப்பற்று தெற்கு, கிரான் பிரதேச செயலாளர் பிரிவில், அரசாங்கத்தினால் ' அளிப்புப் பத்திரங்கள்' அல்லது ' காணி உரிமம்' ஊடாக வழங்கப்பட்ட அரச காணிகளில் மக்கள் வசிக்கின்றார்கள் என்பதை அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், அவ்வாட்களின் எண்ணிக்கை, அவர்களின் பெயர்கள் மற்றும் ஏற்புடைய தகவல்கள் என்பன யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform the House -

(i) whether he is aware that people have settled in State lands for which Deeds of Grant or Land Permits were given during the period from 01.01.2017 to 31.03.2025 out of the State lands situated in the Divisional Secretary's Division of Koralaipattu South, Kiran in the Batticaloa District; and

(ii) if so, total number of such people, their names and relevant details?

(b) If not, why?

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)

(අ) (i) ඔව්.

(ii) පුද්ගලයන් සංඛ්‍යාව 1,895ක් සහ 477කි. විස්තර **ඇමුණුම*** මඟින් දක්වා ඇත. (දෙමළ භාෂාවෙන් ඇති ඇමුණුම බලන්න.)

(ආ) අදාළ නොවේ.

(அ) (i) ஆம்.

(ii) ஆட்களின் எண்ணிக்கை 1,895 மற்றும் 477 ஆகும். விபரம் **இணைப்பில்** தரப்பட்டுள்ளது.

(ஆ) ஏற்புடையதாகாது.

(a) (i) Yes.

(ii) The number of persons is 1,895 and 477. Details are given in Annex*. (Refer to Annex in Tamil)

(b) Not applicable.

*  පුස්තකාලයේ තබා ඇත.
*  நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
*  *Placed in the Library.*

## කෝරළේපත්තු දකුණ, කිරාන් ප්‍රා.ලේ. කොට්ඨාසයේ ඉඩම් සඳහා ඉල්ලුම්කරුවන්: විස්තර
கோரளைப்பற்று தெற்கு, கிரான் பிரதேச செயலகத்தில் காணிக்காக விண்ணப்பித்தோர்: விபரம்
APPLICANTS FOR LAND IN KORALAIPATTU SOUTH, KIRAN DS DIVISION: DETAILS

895/2025

**3. ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) ඉඩම් නොමැති පුද්ගලයන් විසින් ඉඩම් ලබා ගැනීම සඳහා 2017.01.01 සිට 2025.03.31 දින දක්වා වූ කාල සීමාවේදී කෝරළේපත්තු දකුණ, කිරාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත අයදුම් කර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම පුද්ගලයන්ට දීමනා ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබා දී තිබේද;

(iv) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) කෝරළේපත්තු දකුණ, කිරාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති රජයේ ඉඩම්වල පදිංචි වී ඇති පුද්ගලයන්ගෙන් බහුතරයකට මේ දක්වා දීමනා ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබා දී නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම පුද්ගලයන්ට මේ දක්වා ඉඩම් ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබා නොදීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) காணியற்ற மக்கள் தங்களுக்குக் காணியொன்றைப் பெற்றுக்கொள்வதற்காக 2017.01.01 முதல் 2025.03.31 வரையான காலப்பகுதிக்குள் கோரளைப்பற்று தெற்கு, கிரான் பிரதேச செயலகத்தில் விண்ணப்பித்துள்ளார்கள் என்பதை அவர் அறிவாரா;

(ii) ஆமெனில், அம்மக்களின் எண்ணிக்கை, பெயர்கள் மற்றும் ஏற்புடைய விபரங்கள் யாவை;

(iii) அம்மக்களுக்கு அளிப்புப் பத்திரம் அல்லது காணி உரிமம் வழங்கப்பட்டுள்ளதா;

(iv) ஆமெனில், அம்மக்களின் எண்ணிக்கை, பெயர்கள் மற்றும் ஏற்புடைய விபரங்கள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) கோரளைப்பற்று தெற்கு, கிரான் பிரதேச செயலாளர் பிரிவிலுள்ள அரச காணிகளில் குடியிருப்பவர்களில் பலருக்கு இன்றுவரை அளிப்புப் பத்திரம் அல்லது காணி உரிமம் வழங்கப்படாதுள்ளது என்பதை அவர் அறிவாரா;

(ii) ஆமெனில், அம்மக்களின் எண்ணிக்கை மற்றும் பெயர் விபரங்கள் யாவை;

(iii) அம்மக்களுக்கு இதுவரை காணி உறுதி அல்லது காணி உரிமம் வழங்கப்படாமைக்கான காரணங்கள் யாவை;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) whether he is aware that landless persons have applied to the Koralaipattu South, Kiran Divisional Secretariat with the aim of acquiring land during the period from 01.01.2017 to 31.03.2025;

(ii) if so, the number of such persons, their names and relevant details;

(iii) whether such persons have been issued with Deeds of Grant or Land Permits; and

(iv) if so, the number of such persons along with their names and relevant details?

(b) Will he also inform this House -

(i) whether he is aware that the majority of the persons who have settled down in government lands in the Koralaipattu South, Kiran Divisional Secretary's Division have not been issued with Deeds of Grant or Land Permits so far;

(ii) if so, the number of such persons, their names and relevant details; and

(iii) the reasons for not issuing Deeds of Grant or Land Permits to the aforementioned persons so far?

(c) If not, why?

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)

(අ) (i) ඔව්.

(ii) පුද්ගලයන් සංඛ්‍යාව 380කි. විස්තර **ඇමුණුම 01*** මඟින් දක්වා ඇත. (දෙමළ භාෂාවෙන් ඇති ඇමුණුම 01 බලන්න.)

(iii) ඔව්.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

(iv) 2008/4 (1) චක්‍රලේඛයට අනුකූලව, පළාත් ඉඩම් කොමසාරිස්වරයාගේ අනුමැතිය ඇතිව ඉඩම් නොමැති පුද්ගලයන් සඳහා ඉදිරියේදී ඉඩම් කොටස් ලබා දීමට පියවර ගනු ලැබේ.

(ආ) (i) ඔව්.

(ii) පුද්ගලයන් සංඛ්‍යාව 2,756කි. **ඇමුණුම 02*** මඟින් විස්තර දක්වා ඇත. (දෙමළ භාෂාවෙන් ඇති ඇමුණුම 02 බලන්න.)

(iii) රජයේ ඉඩම් සඳහා ලේඛන ඉල්ලා, ලැබුණු අයදුම් පත් 2,756 අතුරින් නේවාසික ඉඩම්වලට අදාළ අයදුම් පත් 580ක් සඳහා ජනපද නිලධාරි විසින් සකස් කරන ලද KML භූමි සිතියම් ලබා ගෙන ඇති අතර, පුද්ගලයන් 146දෙනෙකු වෙනුවෙන් ඉඩම් කච්චේරි පවත්වා ඇත. අනෙකුත් අයදුම්පත් 434 සඳහා පවත්වන ලද ඉඩම් කච්චේරියට අදාළ අනුමැතිය ලබා ගැනීම වෙනුවෙන් e-SLIMS එක හරහා ඉදිරි පියවර ගනිමින් පවතී.

තවද, පේරිල්ලාවේරි, කුඩුම්බිමලෙයි, මුරුත්තානෙයි, වඩමුනෙයි, ඌත්තුච්චේනෙයි සහ පූනානෙයි බටහිර යන ග්‍රාම නිලධාරි වසම්වල පිහිටි රජයේ ඉඩම් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පාලනය යටතට අයත් වේ.

(ඇ) අදාළ නොවේ.

(அ) (i) ஆம்.

(ii) ஆட்களின் எண்ணிக்கை 380 ஆகும். விபரம் **இணைப்பு 01***இல் தரப்பட்டுள்ளது.

(iii) ஆம்.

(iv) 2008/4(1)ஆம் இலக்க சுற்றறிக்கைக்கு அமைவாக, மாகாண காணி ஆணையாளரின் அனுமதியுடன் காணியற்ற நபர்களுக்கு எதிர் காலத்தில் காணித் துண்டுகள் வழங்குவதற்கு நடவடிக்கை எடுக்கப்படும்.

(ஆ) (i) ஆம்.

(ii) ஆட்களின் எண்ணிக்கை 2,756 ஆகும். விபரம் **இணைப்பு 02***இல் தரப்பட்டுள்ளது.

(iii) அரச காணிகளுக்காக ஆவணங்கள் கோரி பெறப்பட்ட 2,756 விண்ணப்பங்களில், குடியிருப்பு காணிகளுக்குரிய 580 விண்ணப்பங்களுக்கு குடியேற்ற அலுவலரால் தயாரிக்கப்பட்ட KML நிலப்படங்கள் பெற்றுக் கொள்ளப்பட்டுள்ளன. அவற்றில் 146 ஆட்களுக்காக காணிக் கச்சேரிகள் நடத்தப் பட்டுள்ளன. மேலும், மீதமுள்ள 434 விண்ணப்பங்கள் தொடர்பாக காணிக் கச்சேரி நடத்துவதற்குத் தேவையான அனுமதிகளைப் பெறும்பொருட்டு e-SLIMS முறைமையின் ஊடாக மேலதிக நடவடிக்கைகள் முன்னெடுக்கப்பட்டு வருகின்றன.

அத்துடன், பேரில்லாவெளி, குடும்பிமலை, முறுத்தானை, வடமுனை, ஊத்துச்சேனை மற்றும் பூனானை மேற்கு ஆகிய கிராம அலுவலர் பிரிவுகளில் அமைந்துள்ள அரச காணிகள் இலங்கை மகாவலி அதிகாரசபையின் நிருவாகக் கட்டுப்பாட்டின்கீழ் உள்ளன.

(இ) ஏற்புடையதாகாது.

(a) (i) Yes.

(ii) The number of individuals is 380. Details are given in Annex 01*. (Refer to Annex 01 in Tamil.)

(iii) Yes.

(iv) In accordance with Circular No. 2008/4(1), steps will be taken in due course to provide plots of land to landless persons with the approval of the Provincial Land Commissioner.

(b) (i) Yes.

(ii) The number of individuals is 2,756. Details are given in Annex 02*. (Refer to Annex 02 in Tamil.)

(iii) Of the 2,756 applications received requesting for documents for State lands, KML land maps prepared by the Colonization Officer had been obtained for 580 applications relating to residential lands, and Land Kachcheris had been held in respect of 146 persons. For the remaining 434 applications, further action is being taken through the e-SLIMS to obtain relevant approval for conducting Land Kachcheris.

Furthermore, the State lands situated in the Grama Niladhari Divisions of Perillaveri, Kudumbimalai, Muruththanai, Vadamunai, Ooththuchchenai and Poonanai West are under the purview of the Sri Lanka Mahaweli Authority.

(c) Not applicable.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.